# සූවිසි පට්ඨාන නය නිරූපණය

**(තුන්වෙනි වෙළුම)**

**(උපනිස්සය පච්චය)**

**පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ**

ප්‍රථම මුද්‍රණය - 2024 ජුලි (පිටපත් 500)

පිටපත් කිරීම : කුමාර් ප්‍රනාන්දු
චන්ද්‍රා රත්නපාල (විසි හතරවෙනි දේශනාව)

සංස්කරණය : කුමාර් ප්‍රනාන්දු

සෝදුපත් බැලීම : ගීතා ප්‍රනාන්දු

**පොත් පිළිබඳව විමසීම් :**

**කුමාර් ප්‍රනාන්දු පිටකෝට්ටේ**

**0777 802 007**

මුද්‍රණය

**කොලිටි ප්‍රින්ටර්ස්**

17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල. නුගේගොඩ

0112 809 499

ලෝකයා හට අභිධර්මය ඉගැන්වීමෙහි ලා මුල්ගුරු වූ ප්‍රඥාවට අගපත් වූ මහ අගසවු සැරියුත් මහරහතන් වහන්සේට මේ උතුම් ග්‍රන්ථ රත්නය මා ප්‍රාර්ථනා කරන්නා වූ ඒ උතුම් බෝධියෙන් නිවන් මගට පිවිසීම පිණිසම පූජා වේවා.

# සූවිසි පට්ඨාන නය නිරූපණය

**නැමැති මේ උතුම් ග්‍රන්ථ රත්නය**

**.................................................................... විසින්**

**...................................................................... වෙත**

**..............................................................................................**

**..................................... නිවන් පතා පූජා කරන ලදි.**

**දිනය .....................................**

සති යු ටියුබ් නාළිකාව ඔස්සේ විකාශය වන සූවිසි ප්‍රත්‍යය දේශනාවන් ඉමහත් කරුණාවෙන් සහ ශ්‍රද්ධාවෙන් ඔබ සැම කෙරෙහි උපන් කරුණාවෙන් යුතුව හැකිතාක් දුරට උන්වහන්සේගේ දේශනා විලාසයෙන් ම ලිඛිත මාධ්‍යයෙන් සකස් කොට අතට පිදීමකි. සාකච්ඡාවක් ලිඛිතව සකස් කිරීමේ දී, දේශනා විලාශය, වචන උච්චාරණ විලාශය, ශ්‍රවණ තත්ත්වය, ආදී විවිධ ගැටලු හමුවෙන තැන් කීපයක් වරින් වර විද්‍යමාන වේ. කෙසේ වුව ද වර්තමානයෙහි බොහෝ දෙනා ඉතාමත් ම ශ්‍රද්ධාවෙන් යුක්තව ශ්‍රවණය කරන ලද මේ දේශනාවන් ඔබ අතට ධර්ම ග්‍රන්ථයක් ලෙස සකස් කිරීමේ දී දේශනාවට පරිබාහිරව ඇතැම් කරුණු ත්‍රිපිටකය අනුශාරයෙන් පමණක් ගෙන හැර දක්වා ඇත. එම ඇතුළත් කිරීම් මොනයම් ආකාරයකින් හෝ ස්වාමීන් වහන්සේ විසින් දේශනා කොට වදාළා වූ මුල් දේශනා ඉක්ම යෑමක් නොවේ. එම නිසා මෙහි යම් දෝෂ තිබේ නම්, ඒ සියල්ල මා විසින් මෙම දේශනාවන් ලිඛිත මාධ්‍යට ගැනීමේදී වූ අතපසු වීම් ලෙස සලකන ලෙසත්, එසේම පූජ්‍යපාදයන් වහන්සේ මෙම සියලු දෝෂයන්ගෙන් නිදහස් කොට මාගේ අතපසු වීම් ලෙස සලකන මෙන් ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

කුමාර් ප්‍රනාන්දු
පිටකොට්ටේ
0777 802 007

# 20.01.2024 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණාය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසිවෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සූදානම් වන්නේ.

ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඒ උතුම් ඒ පරම ගම්භීර ධර්මයෙන් ස්වල්පයක් නමුත් ශ්‍රවණය කර ගන්නට ඔබ හැම දෙනාම සූදානම්ව සිටින මොහොත. පට්ඨානප්‍රකරණයෙහි විග්‍රහ වන ඒ සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව මූලික හඳුනා ගැනීමකුයි මේ දේශනා මාලාව ඔස්සේ සිදු කරගනු ලබන්නේ.

භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළ විස්තාරිත හේතුඵල ධර්මය පිළිබඳව යම්කිසි කෙනෙක් අවබෝධ කරගනු ලබන්නේ නම් ඒ කෙනාට අත්‍යන්තයෙන්ම මේ සූවිසි ප්‍රත්‍යය විභාගය පිළිබඳව හඳුනාගන්නට සිද්ධ වෙනවා. සිතෙහි ක්‍රියාකාරිත්වය සහ ලෝකයෙහි හට ගැනීම පිළිබඳව නිරවද්‍යය අවබෝධයකට පත්වෙන කෙනකු මේ කියන කරුණු කාරණාවන් පිළිබඳව තේරුම් ගැනීම ඉතාම අත්‍යවශ්‍යයි.

**පටිච්චසමුප්පාද ධර්මය තේරුම් ගැනීම තුළ නිර්වාණය අවබෝධ කරනව කියල කියන්නේ මේ හේතුඵල ධර්ම සිද්ධාන්තය පිළිබඳව තේරුම් ගැනීම. නැතිනම් මේ සූවිසි**

**ප්‍රත්‍යය ධර්ම විභාගය පිළිබඳව තේරුම් ගැනීම. චතුරාර්‍යය සත්‍යය ධර්ම විභාගය පිළිබඳව කෙනකු අවබෝධ කර ගන්නව කියල කියන්නෙත් මේ සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳවම අවබෝධ කර ගන්නවා කියන එක.**

ඉතින් ඒ නිසා මේ අවබෝධය කෙනකුට වැදගත්. පටිච්චසමුප්පාදය අවබෝධ කරනව කීවත්, චතුරාර්‍යය සත්‍යය ධර්මය අවබෝධ කරනව කිව්වත් මේ අවබෝධය ඉතාම වැදගත් වෙනව. ඒ වගේම විවිධ දහම් කරුණු පිළිබඳව පැටලීමකින් තොරව නිරවද්‍ය අවබෝධයක් ඇතිකර ගැනීමේදි මේ ක්‍රමයන් පිළිබඳව තේරුම් ගැනීම බොහොම වැදගත්. ඒ කියන්නේ මේව ඔක්කොම ඉගෙන ගෙන ඉවර වෙලා නිවන් දකින්න උත්සාහවත් වෙන්න ඕන කියල එහෙම නෙමෙයි ඒකෙන් කියන්නේ.

යම්කිසි විදියකින් මේ හේතුඵල දහම පිළිබඳව මේ කියන වචන මේ ආකාරයෙන් තේරුම් නොගෙන වුණත් කෙනකුට ධර්මය අවබෝධ කරන්නට පුළුවන්කම තියෙනව. එහෙනම් කෙනකුට හිතෙන්න පුළුවන් ඇයි මේව ඉගෙන ගන්නේ කියල. ඇයි දැන ගන්නේ කියල. **දැන ගැනීම ඇතුළත බහුශ්‍රැත බව ඇති වෙනවා. ඒ බහුශ්‍රැත භාවය කියන එක තුළ ධර්මය අවබෝධය කර ගැනීමට අවශ්‍ය ප්‍රඥා ඉන්ද්‍රිය දියුණු වීම තමයි සිද්ධ වෙන්නේ.** ඒ හින්දා මේක වැදගත් වෙනව අපිට විස්තාරිතව මේ කරුණු කාරණා පිළිබඳව දැන ගැනීම කියන දේ.

ඒ වගේම ධර්මය කියල විවිධ දේවල් ඇහෙන කොට නැතිනම් සම්මර්ශනයන් සිද්ධ කරන කොට, ඒ කියන්නේ අපි මෙනෙහි කරනව දහම් කරුණු පිළිබඳව. අර වැරදි තැන්වල අපි නතර නොවන්නට හේතුවක් බවට පත් වෙනව ඒ දහම් කරුණු අතර නිර්වද්‍යතාවය පෙන්වල දෙනව නම්. මේ මේ ආකාරයන්ගෙන් මේ ප්‍රත්‍යය ධර්ම විභාගය පිළිබඳව නිර්වද්‍යතාවය ඇතිවීම තුළ

වෙනස්කම් තේරුම් ගැනීම ඇතුලේ අපිට අර ගැටළු නිරාකරණය කර ගන්නට පුළුවන්කම තියෙනව. ඒ හින්දා සමාජය තුළ මිනිස්සු අතර ධර්මය පිළිබඳව ඇතිවෙන ප්‍රායෝගික විවිධ ගැටළුකාරී තත්ත්වයන් අපි ගත්තොත් මේ ප්‍රත්‍යය ධර්ම විභාගය පිළිබඳව තේරුම් ගන්න කෙනකුට බොහොම පහසුවෙන් ඒව නිරවුල් කර ගන්නට පුළුවන්.

යම් කෙනකු ලෞකික කුසල් කරල වැඩක් නෑ නැතිනම් පින් කරල වැඩක් නෑ, ඒකෙන් සසර දික් වෙනව, ඒ හැම දෙයක්ම අවිද්‍යාවෙන් තමයි සිද්ධ වෙන්නේ, ඔය වගේ දේවල් කතා කරන කොට මේ අවිද්‍යාවෙහි නියෝජනය කුසලයකට මොන ආකාරයකින්ද සිද්ධ වෙන්නේ කියන එක පිළිබඳව මේ ප්‍රත්‍යයන්ගෙන් තමයි අපිට තේරුම් ගන්නට වෙන්නේ. ලෝකෝත්තර කුසලයකට පදනම බවට පත්වන්නේ මොන ආකාරයකටද කියල ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව අපිට ඒ විදියට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව. ඒ අවබෝධයත් එක්ක අර වගේ විවිධ විකාර අර්ථ කථනයන්ට, ඒ කියන්නේ පින් කරන්න එපා, සසර දික් වෙනව, ඒ වගේ දේවල් වලට අපි පත්නොවී ධර්මය නිවැරදිව තේරුම් ගැනීමේ හැකියාව ලැබෙනව මේ කරුණු කාරණා පිළිබඳව ඔබ බහුශ්‍රැත බව උපදවා ගැනීම කියන දේ තුළ. ඉතින් අන්න ඒ නිසයි මේ කාරණාව ඔබ තේරුම් ගැනීම වැදගත් වෙන්නේ.

ඒ වගේම ධර්මය සම්මර්ශනය කරන කෙනකුට හාත්පස අවබෝධයක් ඇතිව ඒ කාරණා දකින්නට පුළුවන්කම තියෙනව මේ කාරණාවන් තමන්ගේ ජීවිතය තුළින් තේරුම් ගැනීම ඇතුලේ. ඒ හින්දා පාඩමක් හැටියට පමණක් සීමාවකට පත්නොකට තමන්ගේ ජීවිතය දිහා බලන විදිහට, තමන්ගේ ජීවිතය කියන තැන මේ ප්‍රත්‍යය ධර්මයන්ගෙන් ඔසවා තැබීම වන්නේ මොන ආකාරයෙන්ද කියන එක පිළිබඳව තේරුම් යන

විදියට ඔබ මේ කාරණාවන් පිළිබඳව ඉගෙන ගැනීම සහ අවබෝධ කර ගැනීමයි වැදගත් වෙන්නේ.

අවසාන වශයෙන් අපි සාකච්ඡා කරන්නට යෙදුනේ නිස්සය ප්‍රත්‍යය පිළිබඳව. නිස්සය ප්‍රත්‍යය පිළිබඳව කතා කිරීමේ දී නිස්සය නිඃශ්‍රිත කියන මේ දෙදෙනාගේ ස්වභාවයන් පිළිබඳව අපි හඳුනාගන්නට යෙදුනා. එහිදි අවසාන වශයෙන් අව්‍යාකෘතයක් නිසා අව්‍යාකෘතයක් උපදින්නේ කොහොමද නිස්සය ප්‍රත්‍යය ප්‍රත්‍යය වීමෙන් කියන එක විසඳ කර ගැනීම ඇතුලේ අපි තේරුම් ගත්තා අව්‍යාකෘත ධර්මයක් අනිකුත් අව්‍යාකෘත ධර්මයන්ට නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක පිළිබඳව.

ක්‍රියා සිතක යෙදෙන එක් එක් ස්කන්ධයන් අනිත් ස්කන්ධයන්ටත්, විපාක සිත්වල යෙදෙන එක් එක් ස්කන්ධයන් අනිකුත් ස්කන්ධයන්ටත් මෙන්න මෙබඳු ආකාරයේ යෙදීම් සහ ඒ වගේම ඒ සිතෙන් උපදවනු ලබන යම් එබඳු ආකාරයක රූප තියෙනව නම් ඒ රූප ධර්මයන් අනිකුත් ස්කන්ධයන්ට ප්‍රත්‍යය වෙන විදිය, ඒ වගේම වස්තු රූපය ධාරණ වශයෙන් ඒ සිතට ප්‍රත්‍යය වන ආකාරයන් පිළිබඳව එහිදි අපි ඉතාමත් විස්තාරිතව කරුණු කාරණා පිළිබඳව තේරුම් ගන්නට යෙදුනා.

ඉතින් ඒ නිස්සය ප්‍රත්‍යයටම අදාළ කර ගත්ත තවත් ධර්ම කොට්ඨාසයක් තමයි අද දවසෙදිත් අපිට හඳුනාගන්නට තියෙන්නේ. හැබැයි මේක වෙනම ම ප්‍රත්‍යයක් විදියටත් අපිට දකින්නට පුළුවන්කම තියෙනව. අර කලින් කතා කරපු නිස්සය ප්‍රත්‍යය කියන එකේ තියෙන ස්වභාවයත් ඇතුළත්ව තවත් වෙනස්ව ගියපු ස්වභාවයනුත් ඇතුළත්ව මේක වෙනම ප්‍රත්‍යයක් හැටියට දකින්න පුළුවන්කම තියෙනව.

# උපනිස්සය ප්‍රත්‍යය

මේ ප්‍රත්‍යය හඳුන්වන්නේ අපි උපනිස්සය පච්චය කියල. දැන් නිස්සය පච්චය සහ උපනිස්සය පච්චය කියන වචන දෙක දිහා බැලුවහම අපිට එක හා සමානව දකින්නට පුළුවන්කම තියෙනව. මුලින් අපි දැන ගත්ත එක නිස්සය වුණා. මේක උපනිස්සය වුණා. ඉතින් මේ දේ තමයි මෙතනදි අපිට වචනයෙහි වෙනස හැටියට දකින්න පුළුවන්කම තියෙන්නේ. හැබැයි මේක විග්‍රහ වීමේදී අර නිස්සය ප්‍රත්‍යය තියෙන තැන්වල උපනිස්සය නැද්ද කියල ඇහුවොත්? **නෑ, නිස්සය ප්‍රත්‍යය තියෙන තැන්වල මේ උපනිස්සය භාවය කියන එකේ යෙදීම අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.**

**එහෙනම් ඇයි උපනිස්සය ප්‍රත්‍යය කියල මේ වෙනම ම ප්‍රත්‍යයක් හඳුන්වන්නේ? ඇයි වෙනම ම ප්‍රත්‍යයක් දක්වන්නේ? උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ වෙනම ම බලවත්ව ගියපු ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වයක් තමයි උපනිස්සය ප්‍රත්‍යය තුළ අපි හඳුනාගන්නේ. ඒ කියන්නේ ඒක සාමාන්‍යයෙන් නිස්සය නිඃශ්‍රිත දෙදෙනාගේ ක්‍රියාකාරිත්වයට වඩා ඉතාම බලවත්ව ගියපු ප්‍රධාන ඇසුරු වීමක් තමයි නිස්සය කර ගැනීමක් තමයි උපනිස්සය ප්‍රත්‍යය තුළදි අපි හඳුනා ගනු ලබන්නේ.**

කුසලයක් කුසලයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන තැනදි අර අපි උපනිස්සය ප්‍රත්‍යය හඳුනා ගැනීමේදී අර නිස්සය ප්‍රත්‍යය පිළිබඳ බෙදා දැක්කපු ආකාරයන්ට වඩා ටිකක් වෙනස් විදියකට තමයි අපිට උපනිස්සය ප්‍රත්‍යයෙහි බෙදී යෑම හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.

**මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන ප්‍රභේද පිළිබඳව සලකා බැලීමේ දී අපිට දකින්නට පුළුවන්කම තියෙනව**

***ආරම්මණූපනිස්සය*** **කියන මේ ආකාරයට මේ උපනිස්සය ප්‍රත්‍යය හඳුන්වනව, යම්කිසි දෙයක් අරමුණු කර ගැනීම ඇතුලේ නිස්සය කර ගන්නට පුළුවන්කම තියෙනව තවත් දෙයක් බලවත්ව නිස්සය කර ගැනීමක්.**

**ඒ වගේම** ***අනන්තරූපනිස්සය*** **කියල මේ උපනිස්සය ප්‍රත්‍යයම තවත් අනන්තර ආකාරයකින් ඒ කියන්නේ අතුරක් නැතුව අනික් ධර්මයක් උපදවන්නට ප්‍රත්‍යය වීම කියන අර්ථයෙනුත් අපිට මේ උපනිඃශ්‍රය භාවය හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.**

**ඒ වගේම** ***පකතූපනිස්සය*** **කියල අපි සාමාන්‍යයෙන් කතා කලොත් පකති උපනිස්සය කියල පකති බවෙන් උපනිස්සය බවට පත්වෙනව. (යම් යම් කරුණු ස්වභාවයෙන්ම කුසල් හා අකුසල් සඳහා උපකාරී වනවා.) නැතිනම් පකති උපනිස්සය පච්චය කියල ඒක හඳුන්වා දෙනු ලබනව.**

ඉතින් මේ උපනිස්සය පච්චය - ආරම්මණ උපනිස්සය, - අනන්තර උපනිස්සය, ඒ වගේම පකති උපනිස්සය කියල මේ ප්‍රත්‍යය ප්‍රධාන වශයෙන් තුන් ආකාරයකට මේ ප්‍රත්‍යයෙහි බෙදී යෑම් පිළිබඳව විස්තර කිරීම් අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

**එතකොට නිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ යම් ධර්මයක පැවැත්මට, යම් ධර්මයක ඉපදීමට ඉතාමත් බලවත් ලෙස නිඃශ්‍රය වීමක්. ඉතාමත් බලවත් ලෙස ඇසුරු කරගෙන පවතින කොට අන්න ඒකට තමයි මේ උපනිස්සය කියන වචනය අපි හඳුනාගන්නේ.**

එතකොට නිස්සය කියන වචනයෙහි තේරුම නිස්සය ප්‍රත්‍යය අපි හඳුනා ගැනීමේදිත් හඳුනාගත්තා. ඉතින් උපනිඃශ්‍රය කියන කොට තියෙන වෙනස තමයි අර නිස්සය ප්‍රත්‍යය කතා කලාට

වඩා ***ඉතාම බලවත් කියන අර්ථයෙන්*** තමයි මෙතනදි මේක හඳුන්වන්නේ.

**ඒ කියන්නේ තස්මා බලව කාරණ භාවෙන උපකාරකො ධම්මො උපනිස්සය පච්චයොති වෙදිතබ්බො** කියල කියනව, එහෙයින් බලවත්ව කියපු උපකාරක බව ඇති කරන නිසා ඒ ධර්මය හඳුන්වනව උපනිස්සය පච්චය කියල.

ඉතින් මේකත් නිස්සය සහ නිඃශ්‍රිතය කියන මේ දෙපැත්තට බෙදල දකින්නට පුළුවන්කම තියෙනව. නිස්සය කියන්නේ යම්කිසි දෙයක් ඇසුරු කරගෙන පවතී නම් ඒ දේ තමයි නිස්සය කියල කියන්නේ. ඇසුරු කර ගන්නා වූ දෙය නිඃශ්‍රිතය බවට පත්වෙනව. බිත්තියක් අසුරු කරගෙන චිත්‍රයක් තියෙනව නම් මේ බිත්තිය ඇසුරු කරගත්ත චිත්‍රය කියන එක නිස්සය සහ නිඃශ්‍රිත වශයෙන් බෙදා දක්වන්නට පුළුවන්කම තියෙනව. බිත්තිය කියන එක නිස්සය බවට පත්වෙන කොට, ඒ බිත්තිය ඇසුරු කරගෙන පවතින ඒ චිත්‍රය, නිඃශ්‍රිතය බවට පත්වෙනව. ඒ පිළිබඳව අපි මීට ප්‍රථම හඳුනාගෙන තියෙන දෙයක්. නැවත සිහිපත් කිරීමක් කලේ.

**මේ උපනිස්සය පච්චය කියල කියන කොට මේ උපනිස්සය පච්චයෙහි තියෙන විශේෂත්වය මොකද්ද? ඒ කියන්නේ යම් ධර්මයක ඉපැත්මට නැතුවම බැරි, ඒ ධර්මයෙහි පැවැත්මට වෙන වෙන්න විදියක්ම නැති බලවත්ම දෙයක් තමයි උපනිස්සය වශයෙන් හඳුනාගනු ලබන්නේ. ඒ කියන්නේ යම්කිසි ධර්මයක ඇතිවීමට හෝ පැවැත්මට අත්‍යන්තයෙන්ම අවශ්‍යයි ඒක. අන්න ඒ දේවල් වලදි තමයි මේ උපනිස්සය පච්චය කියන දේ පිළිබඳව කතා කරන්නේ.**

දැන් අපි ගත්තහම පාරේ වාහනයක් යන කොට මේ වාහනයේ පිටස්තර දේවල් තියෙනව. මේක අත්‍යන්තයෙන්ම අවශ්‍ය දේවල්

ඇසුරු කරගෙන පවතින දේවල්. ඒවට කියන්නේ අත්‍යන්තයෙන්ම අවශ්‍යයි කියන එක නෙමෙයි. ඔය වාහනයේ තියෙන ආසන, ආසන පටි, තව දේවල් තියෙනව නේ, එතකොට වාහනය පාරේ ගමන් කරනව කියන මේ ක්‍රියාවට අර දේවල් වල කිසිම සම්බන්ධයක් ඇත්තේ නෑ. ඒ කියන්නේ සම්බන්ධයක් නෑ කියල කියන්නේ ඒව උපකාරක දේවල් වෙලා තියෙන්න පුළුවන් යම් යම් විදියකින්. හැබැයි ඒව අත්‍යන්තයෙන්ම අවශ්‍ය නෑ.

එතකොට මේ ගමන් කරනව කියන දේ කරන්න මේ රෝද ටික, ඊට පස්සේ යම් මටමකින් අපි ගත්තහම විදුලියෙන් හරි ඉන්ධන වලින් හරි ක්‍රියාත්මක වන දෙයක් නම් ඒකට අවශ්‍ය ඒ යාන්ත්‍රණය තියෙන්නට ඕනේ. ඉංජිම තියෙන්නට ඕනේ. රෝද ටික තියෙන්නට ඕනේ. ඒක පිහිටුවා තියෙන දේවල් ටික තියෙන්නට ඕනේ. ඒක නියාමනය කිරීමට අවශ්‍ය උපාංග ටික තියෙන්න ඕනේ. ඔය ටික තිබ්බ නම් පාරේ යන්න පුළුවන්කම තියෙනව.

**අන්න ඒ වගේ මේ යෑම කියන දේට, ඒ කියන්නේ මේක පාරේ ගමන් කරගෙන යන්න පුළුවන් කියන මට්ටමට අත්‍යන්තයෙන්ම අවශ්‍ය වන දේවල් ටිකක් තියෙනව නම් අන්න ඒ ධර්ම ටික අපි හඳුන්වනව, නැත්නම් අන්න එබඳු ආකාරයෙන් යම්කිසි ඵලයක ඉපැත්මට අත්‍යන්තයෙන්ම තිබිය යුතු මූලික අංග ටික උපනිස්සය ප්‍රත්‍යය විදියට අපිට දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.** ඉතින් මෙන්න මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම මෙන්න මේ ආකාරයට තමයි වෙන්නේ.

එතකොට උපනිස්සය කියන මේ වචනය අපිට ගොඩක් තැන් වලදි දකින්නට පුළුවන්කම තියෙනව. මේ පිළිබඳව අපි ධර්මය විග්‍රහ කර ගැනීමේදී විශේෂයෙන්ම නොයෙක් තැන් වලදි අපිට ධර්මයෙහි දක්වනවා උපනිස්සය වශයෙන් අපිට නිර්වාණය

අවබෝධ කර ගැනීමට උපනිඃශ්‍රය වන ධර්ම මොනවද කියන කොට **දානුපනිස්සය, සීලුපනිස්සය, භාවනූපනිස්සය** ***(නිවන් දැකීමට නැතුවම බැරි බලවත් උපනිඃශ්‍රය කරුණු තුන)*** මේ වගේ දේවල් දකින්න පුළුවන්කම තියෙනව.

ඉතින් මෙන්න මේ වගේ උපනිස්සය වීම කියන එක ඔබට හඳුනාගන්නට පුළුවන්. **ඒ කියන්නේ ඒක බොහොම බලවත් ලෙස පිහිටා සිටිනවා කියන එක.** උපනිස්සය ප්‍රත්‍යය කියල කියන කොට උපනිස්සය ප්‍රත්‍යය එතකොට අපිට වැදගත් වෙලා තියෙන්නේ නැතිනම් ඒකෙන් කියවෙල තියෙන්නේ මොකද්ද? **අර බලවත් ලෙස යම්කිසි ඵලයක් ඉපදවීමට බලපාන්නා වූ දේ කියන එක තමයි ප්‍රධාන වශයෙන් අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙන්නේ.**

ඉතින් මේ කාරණාවන් පිළිබඳව ඔබට පිළිවෙලින් අධ්‍යනය කර ගැනීමේදී ඔබට ධර්ම ග්‍රන්ථ දකින්නට පුළුවන්කම තියෙනව බොහෝමයක්. විශේෂයෙන්ම **පට්ඨාන දේශනා සාරය** ***(පට්ඨාන දේශනා සාරය පූජ්‍ය වනවාසී යාගොඩ ධර්මප්‍රභ ස්වාමින් වහන්සේ, ප්‍රකාශනය, පට්ඨාන ධර්ම සභාව නාරාහේන්පිට, දුරකථනය 011 258 041 77)*** කියන මේ ධර්ම ග්‍රන්ථය අපි ගොඩාක් මේකට උපකාර කර ගන්නව මේ ධර්මය පිළිබඳව පැහැදිලි කරන්නට. මේ කාරණා පිළිබඳව ඔබට වැඩි දුර අවධානයට යොමු කිරීමේදී ඒ ධර්ම ග්‍රන්ථය ඇසුරු කර ගැනීම තුළ, ඒක තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව මේ කියන කාරණා පිළිබඳව අධ්‍යනය කිරීමේදී.

### ***ආරම්මණූපනිස්සය***

ඉතින් එතනදි ආරම්මණ උපනිස්සය පිළිබඳව හඳුනා ගැනීමේදී ඔබට මතක ඇති අපි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව කතා කිරීමේදී ආරම්මණ ප්‍රත්‍යය පිළිබඳව හඳුනාගත්තා. ආරම්මණ ප්‍රත්‍යය

කියන කොට යම්කිසි ධර්මයක් ඉපදීමට සිතක් උපදීමට ***අරමුණක් අනිවාරයෙන්ම*** තියෙන්නට ඕනේ. ***යම්කිසි අරමුණක් අරගෙනම තමයි සිත සහ චෛතසික ධර්මයන් උපදින්නේ*** කියල අපි එතනදි හඳුනාගන්නට යෙදුනා. අන්න ඒ යමක් අරමුණු කිරීම කියන එක. සිත ඕනෑම දෙයක් අරමුණු කරනව. ඉතින් ඒ අරමුණු කිරීම කියන තැනදි ඒ අපි ගනු ලබන අරමුණ, උපනිස්සය කියන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. ඒ ආරම්මණයම, ආරම්මණ ප්‍රත්‍යය වගේම උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

ආරම්මණ කියන ප්‍රත්‍යයතාවය අපි හඳුන්වන්නට පාවිච්චි කලා එක උපමාවක්. ඒ තමයි යම්කිසි විදියකින් හැරමිටියක එල්බ ගෙන යම්කිසි දුර්වල පුද්ගලයෙක් නැගිටිනව නම් අන්න ඒ සැරයෙටියෙහි එල්බ ගෙන දුර්වල පුද්ගලයාගේ නැගී සිටීම වගේ තමයි ආරම්මණය වටා ඒ සිත සහ චෛතසික ධර්මයන්ගේ ඉපදීම පහළ වීම කියල. ඒ සැරයටිය වටා ඒකේ එල්ලිලා යම්කිසි කෙනෙක් නැගිටිනව නම් **(ආලම්ම්බන කියල අපි කිව්ව එල්බෙනව කියල)** එල්බී ගෙන ඒ වටා නැගී සිටීම වගේ තමයි මේ අරමුණක් වටා තමයි මේ යම්කිසි සිතක් උපදින්නේ.

ඒ නිසා අරමුණ නිසා සිත තියෙනව. සිත නිසා අරමුණ තියෙනව. මේ දෙක නිසාම මෙහි පැවැත්ම අපිට දකින්නට පුළුවන්කම තියෙනව. අරමුණ නිසා සිත සහ චෛතසිකයෙනුත්, ඒ වගේම සිත සහ චෛතසික නිසා අරමුණෙහි පැවැත්ම කියන එකත් මේ එකිනෙකට සම්බන්ධව අපිට ප්‍රත්‍යය වීම තුළ දකින්නට පුළුවන්කම තියෙනව. ඉතින් ඒක ආරම්මණ ප්‍රත්‍යයයි කියල කියන්නේ අර අරමුණ. ඒ ආරම්මණයම බලවත්ව අනිකුත් ධර්මයන් උපදවන්නට හේතුවක් බවට පත්වෙන කොට ඒකට කියනව අපි **ආරම්මණ උපනිස්සය කියල**. ඒ **ආරම්මණයම** බලවත්ව ගියපු හේතුවක් බවට පත්වෙනව.

දැන් මේ සිතේ තියෙන මේ උපනිඃශ්‍රය සම්පන්න බව නිසා තමයි ඒ ඒ සිත් බලවත් කරන්නට පුළුවන්කම තියෙන්නේ. කොටින්ම කියනව නම් සිතක් දියුණු කරන්න පුළුවන්කම තියෙන්නේ එක විෂයකට එක පැතිකඩකට මේ සිතෙහි ක්‍රියාත්මක වන මේ උපනිස්සය සම්පත්තිය නිසා. උපනිස්සය ප්‍රත්‍යය භාවය නිසා තමයි ඒක කරන්නට පුළුවන්කම තියෙන්නේ. ඒ වුණාට කොහොමද යම්කිසි ධර්මයක් ඇසුරු කර ගත්තහම ඒ ධර්මය දියුණු කරන්නට නැතිනම් සිතක් යම්කිසි ධර්මයක් අරමුණු කර ගෙන උපදින කොට කොහොමද ඒ උපනිස්සය ප්‍රත්‍යයෙන් මේක ප්‍රත්‍යය වීම සිද්ධ කරන්නේ?

**දානං දත්‍වා, සීලං සමාදියිත්‍වා**
**උපොසථකම්මං කත්‍වා තං - ගරුංකත්‍වා පච්චවෙක්ඛති**
**පුබ්බෙ සුචිණ්ණානි - ගරුං කත්‍වා පච්චවෙක්ඛති**
**ඣානා වුට්ඨහිත්‍වා ඣානං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති**
**සෙක්ඛා ගොත්‍රභුං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති**
**වොදානං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති**
**සෙක්ඛො මග්ගාවුට්ඨහිත්‍වා මග්ගං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති**

මේ පිළිබඳව බලන කොට **දානං දත්‍වා, සීලං සමාදියිත්‍වා.** දානයක් දීල ශීලයක් සමාදන් වෙලා නැතිනම් **උපොසථකම්මං කත්‍වා තං ගරුංකත්වා පච්චවෙක්ඛති,** නැතිනම්, **උපොසථකම්මං කත්‍වා,** උපොසථ කර්මයක් කරල, **තං ගරුං කත්‍වා පච්චවෙක්ඛති,** ඒ ධර්මය ගරු කර ගෙන ප්‍රත්‍යවේක්ෂා කරනව.

එහෙම නැතිනම් යම්කිසි කෙනෙක් දානයක් දෙන කොට හෝ සීලයක් ආරක්ෂා කරන කොට හෝ එබඳු වූ අවස්ථාවකදි සිද්ධ වන දේ තමයි මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යය වීම කියන එක. ඒ කොහොමද උපනිස්සය ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යය සිද්ධ වන්නේ? ඔබ බොහෝ විට ඔබ කල කී දෑ පිළිබඳව මෙනෙහි

කිරීම සිද්ධ කරනව. ඒ කියන්නේ ඔබ කල කී දෑ පිළිබඳව මෙනෙහි කිරීම සිද්ධ කරනව කියල කියන්නේ, අපේ සිත බොහෝ සෙයින් වර්තමාන අරමුණ අරභයා අතීතය පිළිබඳව අරමුණු ගෙන හැර දැක්වීමක නියලෙනව. ඒක තමයි සිතෙහි සාමාන්‍යය ස්වභාවය. *ඒ කියන්නේ ඇහැට පෙනෙන වර්තමාන රූපය, වර්තමාන රූපයක් විදියට පමණක් අපිට හමුවෙනවා නම් කවදාවත් ඒ රූපය පිළිබඳව අපිට දැන ගන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ ඒක කලින් දුටු සහ කලින් තිබුණ සහ තියෙන දෙයක් හැටියට.*

**එහෙනම් අපි හැම වෙලාවකදීම ඒක බාහිර පවතින දෙයක් ලෙස හා ඒ රූපය දිගෙන් දිගටම ලෝකය තුළ තිබෙන අපි ඇසුරු කල දෙයක් හැටියට අපේ දැන ගැනීමක් ඇති වන්නේ කුමක් නිසා ද? අන්න ඒ අරමුණ පිළිබඳව අපි නැවත සිතෙහි නැඹුරු බවක් ඇති කරගෙන කරනු ලබන මෙනෙහි කිරීමක් නිසා තමයි අපිට ඒ ධර්මයෙහි ඇති බව හමුවන්නේ. අන්න ඒ සිතේ ඇති බලවත්ව ගියපු අරමුණු කිරීමෙහි හැකියාවට අපි හඳුන්වනව ආරම්මණ උපනිස්සය කියල. *(ආරම්මණූපනිස්සය)***

**ඉතින් දානයක් දුන්නට පස්සේ, සීලයක් රැක්කට පස්සේ, එහෙම නැතිනම් යම්කිසි කුසලයක් කලාට පස්සේ ඒක ගරු කරගෙන නැවත නැවත මෙනෙහි කිරීම කරනව නම් අන්න ඒ ගරු කරගෙන මෙනෙහි කිරීම සිදු කිරීම කියන දේ මේ ආරම්මණ උපනිස්සය කියන දේට ඇතුළත් වන දෙයක්.** යම්කිසි පුද්ගලයෙකු ඒ තමන් කල කුසලයන් පිළිබඳව අරමුණු කිරීම නේ පස්සේ කරන්නේ. ඒ කියන්නේ දැන් ඔබ දන් දීල ගෙදරට ඇවිල්ල කල්පනා කරනව ඔබ කල කුසලයෙහි තිබුණ වටිනාකම පිළිබඳව.

ඔබ රුවන්මැලිසෑයට ගිහිල්ල වන්දනා කරල ආපහු ඇවිල්ල ඔබ කල්පනා කරනව ඒ මහා සෑයට ගිහිල්ල වන්දනා කරපු දේ

පිළිබඳව. එතකොට ඒ ගැන මෙනෙහි කරන කොට ඔබේ අරමුණ බවට පත්වන්නේ මොකද්ද? අර කල කුසලය තමයි අරමුණ බවට පත්වන්නේ. එතකොට ඒ කුසලය අරමුණු කරමින් තමයි මේ සිත් පහළ කිරීම සිද්ධ කරන්නේ. එතකොට වර්තමානයෙහි උපදින ලබන මේ සිත හට ගැනීම කියන එකට බලවත්ව උපකාර කරපු දේ මොකද්ද? **අර කරපු කුසලය.** ඒ කුසලය ආරම්මණ ප්‍රත්‍යයෙනුත් ප්‍රත්‍යය වුණා මේ සිත උපදවන්නට. මොකද, ඒ සිත අරමුණු කරමින් තමයි මේ සිත ඉපැද්දුවේ.

***ඒ අරමුණ මේ වෙලාවෙදි අපිට ප්‍රකට වෙන්නේ ඇයි? මේ සිත ඉපදුනු නිසා. මේ සිත නැත්නම් ඒ අරමුණත් නැහැ. ඒ වගේම ඒ අරමුණ නැත්නම් මේ සිතේ පහළ වීමක් නෑ. ඒ නිසා සිත සහ අරමුණ කියන මේ දෙකෙහි තියෙන මේ ආන්තරික ක්‍රියාකාරිත්වය, මේ ඇතුළත තියෙන මේ සම්බන්ධතාවය නිසා තමයි අපිට අතීතය පිළිබඳව මෙනෙහි කරන්නට පුළුවන්කම තියෙන්නේ.*** ඒ කියන්නේ අපිට කොතනක හරි තිබිල ඒ දේ නැවත සිතට කවුරු හරි රිංගුව හරි, එහෙම නැතිනම් ඒක සිතට කොතනින් හරි ගත්ත කියන එක නෙමෙයි ඒ තියෙන්නේ. එතනදි සිද්ධ වන්නේ මේ ප්‍රත්‍යයතාවයන්ගේ ඇති වීම කියන එක. එය මෙනෙහි කිරීම කියන එකේදී අපිට අරමුණු කරනව කියන තැනදි ඒක ආරම්මණ ප්‍රත්‍යය විදියට මේ පසුව උපදින්නා වූ සිත උපදවන්නට ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. අන්න ඒකම උපනිස්සය විදියට බලවත්ව අර සිත උපදවන්නට ප්‍රත්‍යය වෙලා තියෙනව.

**ඒ හින්දා තමයි කුසලයක් එන්න එන්න බලවත් කරන්න පුළුවන්කම තියෙන්නේ.** කුසල ධර්මයක් පිළිබඳව තමන්ගේ සිත වඩන භාවිත කරන කෙනකුට එයම අරමුණු කරමින් නැවත නැවත තමාගේ සිත් උපදවන කොට ඒ සිත බලවත් සිතක් බවට පත් කරන්නට පුළුවන්කමක් තියෙනව එහි තියෙන උපනිඃශ්‍රය

සම්පත්තිය නිසා. ලෞකික කුසලයක් කලහම ඒ කුසලය පිළිබඳව වුණත් නැවත නැවත සිහි කිරීමෙහි වටිනාකම තියෙන්නේ, එහි උපනිඃශ්‍රය භාවය බලවත් වෙනව කියල කියන්නේ ඒ සිත බලවත් වෙනව කියන එක. එතනදි බලවත් වෙන්නේ මොකද්ද? ආරම්මණ උපනිඃශ්‍රය භාවය. ආරම්මණ උපනිඃශ්‍රය භාවය කියන එක මේ සිත නැවත නැවත එබඳු තැනකම පැවැත්වීම කරන්නට බොහෝ සෙයින් උපකාර වෙන ධර්මයක්. අරමුණ වීම කියන එක. ඒක බලවත් කරනව.

ඒ කියන්නේ වැස්ස වහින කොට එක වැහි බිංදුවක් සහ අනිත් වැහි බිංදු අතර සිද්ධ වෙන සම්බන්ධතාවයක් නෑනේ. දැන් පොළොවට එක වැහි බිඳක් පතිත වෙන කියල හිතන්නකෝ. තනිව වැටෙන වැහි බිඳක්. ඊට පස්සේ ඊළඟට නැවත වැහි බිඳක් වැටෙනව. ඊට පස්සේ නැවත වැහි බිඳක් වැටෙනව. දැන් මේ ඔක්කොම එකක් එකක් අතර වෙනම සම්බන්ධයක් නැතුව වෙන වෙනම වැටෙන වැහි පොදවලින් මේ පොළොව තෙමිල. ඊට පස්සේ මේ පොළොව උතුරල යන්න පටන් ගන්නව. නැතිනම් එකින් එකට එකතු වීම මත ගලාගෙන යන්න පටන් ගන්නව. අපිට මහ ජල ප්‍රවාහයක් දකින්න පුළුවන්කම තියෙනව. මේ ජල ප්‍රවාහයක් අපේ ඇස් දෙකට පෙනෙන තැනක මේ එකට ගලාගෙන යෑම සිද්ධ වෙලා තියෙන්නේ, මේ බලවත්ව ගිහිල්ල තියෙන්නේ මොකක් නිසා ද? අර එකින් එකට ඇසුරු වීම නිසානේ මේ බලවත් බව ඇතිවෙල තියෙන්නේ.

**අන්න ඒ වගේ තමයි වෙන් වෙන්ව, වෙන් වෙන්ව, වෙන් වෙන්ව උපදිනා වූ කුසල ධර්ම සමූහයක් අපිට එක සමානව පෙනීම තුළ ඒ කුසලයේ පාටින් අපිට ඒක පේන්න පටන් ගන්නව. වෙන් වෙන්ව වැටුණු වැහි බිංදු ටිකක් වැටිල අපිට සම්පූර්ණම එක ජල ප්‍රවාහයක් පේනව වගේ මොකද වෙන්නේ? අර වෙන් වෙන්ව ඉපදුනු සිත් ටිකක් එකතුවීම ඇතුලේ අපිට මහා ප්‍රවාහයක් දකින්නට පුළුවන්කම තියෙනව.**

ඔබ දැන් රුවන්මැලිසෑයට ගිහිල්ල මල් පූජා කලා කියන එක සිහි කර ගන්න කොට ඔබ සිහි කර ගන්නේ සිත් කෝටි ප්‍රකෝටි ගණනාවක ඇති වුණු ඒ එකතුවක් තමයි ඔබ නැවත සිහිපත් කිරීම් වශයෙන් සිද්ධ කරන්නේ. සිත් ගණනය කල නොහැකි වූ ප්‍රමාණයක, එක් එක් වෙන් වෙන්ව පැවතුණු සිත් ප්‍රමාණයක, වෙන් වෙන්ව පැවතුණු බව පිළිබඳව නොදැන ඔබ දැන් අරමුණු කරන්නේ, එබඳු වූ දෙයක් කල බව තමයි අරමුණු කිරීම සිද්ධ කරන්නේ.

මම මෙතනදි අදහස් කරන්නේ එහි භාවිතය පිළිබඳව තේරුම් ගන්නට අවශ්‍ය නිසා. එතකොට දැන් ඒ අරමුණු කරපු ඒ ක්‍රියාව, ඔබ ගිහිල්ල පූජා කලා කියන ඒ ක්‍රියාව කියන එකේදී, වර්තමානයේදිත් උපදින්නේ වෙන් වෙන් වූ සිත් ටිකක්. හැබැයි මේ වෙන් වෙන් වූ සිත් ටිකට උපදින්නට බලවත්ව ගියපු බවට පත් කරන්නට හේතුවක් බවට පත් වෙලා තියෙන්නේ අර සමස්ත වූ කුසලය.

ඒ නිසා ඔබට මුලින්ම ඉපදුනා ශ්‍රද්ධාවක්. ඊට පස්සේ මේ දේ කරන්නට ඕනේ කියල ඉපදුනා. මෙහෙම සිත් වශයෙන් ගත්තහම මේ අවස්ථාවන් බෙදල බැලුවහම ඔබ ඒ කුසලය සඳහා යනවා කියන තැනකදි ඔබට ඇතිවෙලා තියෙන සිත් ගණනය කරන්න බැරි ප්‍රමාණයක්. අතක් පයක් ඔසවන කියන තැනකදි පවා. එහෙම වෙන් වෙන්ව වෙන් වෙන්ව ඉපදුනු මහා කුසල සිත් සමුදායක අපිට එකතුව පේනව මම දානයක් දුන්නා. දැන් ඔබ අරමුණු කරන්නේ අර හිතපු එක විතරක් නෙමෙයි. අත ඔසවන්න හිතපු කුසල සිත ගැන විතරක් නෙමෙයි. ඔබට ඒ හැම හිතකම නියෝජනය තුළ ලැබුණු දන් දීම කියන දේ ගැන තමයි ඔබ දැන් අරමුණු කරන්නේ. අර ඔක්කොම එක තැනකට අරගෙන එක තැනකට ඔබ අරමුණු කරනව, දන් දුන්නා දානය පූජා කලා කියන තැනින් අරමුණු බවට පත්කර ගන්නව. එතකොට මේ එක හිතෙන් එක හිතකට යන ව්‍යාපාර

ගනදෙනුවක් නැති වුණාට, මේ හිතෙන් අනිත් හිතට යන සංක්‍රමණය වන ව්‍යාපාර ණයක් නැතිවුණාට මෙතනදි ඇතිවෙලා තියෙන තත්ත්වය මොකද්ද?

සිතකින් සිතකට යන වෙනත් වූ දෙයක් නැති වුණත් ඒ එක සිතක් අරමුණු කරමින් ඊළඟ සිත ඉපදීම ඇතුලේ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය නිසා අර පෙර කුසලයට වඩා පසු කුසලය බලවත්ව ගිහිල්ල තියෙනව. ඒක අපිට තව ආසෙවන ආදී ප්‍රත්‍යයන්ගෙදි කතා කරන්න පුළුවන්කම තියෙනව. හැබැයි අර පසු පසු අවස්ථාවන් වලදි ඒක උපනිඃශ්‍රය කරගෙන, ඊළඟට පැවැත්ම ඇතුලේ බලවත්ව ඒ සිතේ පැවැත්මට උපකාර කරල තියෙන බව අපිට මේ සිතෙහි භාවිතය තුළ නැතිනම් සිතෙහි යෙදීම, සිත් පහළ වීම, සිත්වල ඉපදීම කියන එක තුළ හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඉතින් මේකට කියනව ආරම්මණ උපනිස්සය කියල. ආරම්මණ වශයෙන් අපි ඇතිකර ගන්න උපනිංශ්‍රය.

ඊට පස්සේ **පුබ්බෙ සුචිණ්ණානි - ගරුං කත්වා පච්චවෙක්ඛති.** පෙර පුරුදු කරන ලද කර්ම පිළිබඳව ඒව නැවත නැවත ප්‍රත්‍යවේක්ෂා කරනව. ඒ ගැන මෙනෙහි කරනව.

ඊට පස්සේ **ඣානා වුට්ඨහිත්වා - ඣානං ගරුං කත්වා පච්චවෙක්ඛති.** ධ්‍යානයෙන් නැගී හිටල ධ්‍යානය ප්‍රත්‍යවේක්ෂා කරමින් ඒක ගරු කරමින් ප්‍රත්‍යවේක්ෂා කරනව. ධ්‍යානය වශීභාවයට පත් කිරීම ආදී තැන්වලදි සිද්ධ වන්නෙත් අන්න එබඳු වූ දෙයක්. පළමු ධ්‍යාන සිත උපදිනව. ඒකේ අංග දුරුවලයි. ඒ සිත පවත්වන්න අමාරුයි. නැවත නැවත එබඳු මට්ටමේම සිත නැවත නැවත භාවිත වෙන කොට උපනිස්සය බවින් ප්‍රත්‍යය වෙන කොට ඒක බලවත් වෙනව. ඉතින් ඒ ධ්‍යානයෙන් නැගී සිටිමින් නැවත එය ප්‍රත්‍යවේක්ෂා කිරීමේදි, අර ධ්‍යානය කියන දේ අරමුණු කිරීම ඇතුලේ, ආරම්මණ උපනිස්සය බවින් ප්‍රත්‍යය

වීම ඇතුලේ, මේ සිත බලවත් බවට පත්වෙලා තියෙනව. කලින් සිත අපිට අරමුණු කිරීම කියන එක ආරම්මණ ප්‍රත්‍යය බවට පත්වෙන කොට, එය ඇසුරු කරමින් මේ සිතෙහි බලවත් බව තව දුරටත් ඇති කිරීම කියන එක තමයි මෙතනදි ආරම්මණ උපනිස්සය කියන එකෙන් පාවිච්චි වෙන්නේ.

**දැන් උපනිස්සය කියන ප්‍රත්‍යය ආරම්මණ ප්‍රත්‍යයෙන් වෙනස් වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව ඔබ අවධානයක් යොමු කලොත්, ආරම්මණ කියන එකෙන් වෙනස් වෙන්නේ කොහොමද ආරම්මණ ප්‍රත්‍යය සහ උපනිස්සය ප්‍රත්‍යය. උපනිස්සය ප්‍රත්‍යය අර සිත බලවත් කරන්නට තව දුරටත් උපකාර කරල තියෙනව. ආරම්මණ ප්‍රත්‍යය අරමුණු කිරීම් වශයෙන් ඉපැත්මට උපකාර කරල තියෙනව. ඉපදුන දේ අරට වඩා බලවත් කරන්නට උපකාර කරල තියෙනව උපනිස්සය කියන ප්‍රත්‍යයතාවයෙන්. ඒ නිසා ආරම්මණයයි උපනිස්සයයි දෙකම එකතු වෙන තැන ආරම්මණ උපනිඃශ්‍රය භාවයයි කියල අපි හඳුනා ගනු ලබනව.**

ඊට පස්සේ **සෙක්ඛා ගොත්‍රභුං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති.** සේඛ ආයයීන් වහන්සේලා ගෝත්‍රභූ සිත ගරු කරගෙන ප්‍රත්‍යවේක්ෂා කරනව. ඒ වගේම **වොදානං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති.** වෝදාන සිත සේඛ ආයයීන් වහන්සේලා ඒ පෘථග්ජන ගෝත්‍රයෙන් මිදීම් වශයෙන් උපදින ගොත්‍රභූ සිත ප්‍රත්‍යවේක්ෂා කරනව. ඒ වගේම වෝදාන සිත්, ඒ කියන්නේ සකදාගාමී අනාගාමී ආදී ආයයීන් වහන්සේලා ඒ වෝදාන සිත් පිළිබඳව ප්‍රත්‍යවේක්ෂා කරනව.

ඒ වගේම **සෙක්ඛා මග්ගාවුට්ඨහිත්වා මග්ගං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති.** සේඛ ආයයීන් වහන්සේලා මාර්ගය ඉපදුනාට පස්සේ මාර්ගයෙන් නැගී සිටල පසුව මාර්ග අවස්ථාව අරමුණු කිරීම සිද්ධ කරනව. අන්න එබඳු තැන් වලදීත් අපිට

හඳුනාගන්නට පුළුවන්කම තියෙනව මේ ගරු බව කියන එක. නැතිනම් මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි පහළ වීම කියන එක අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

එතකොට දැන් ඒ ඒ සිත්වල අපිට දකින්නට පුළුවන්කම තියෙනව අර පසුව උපදින සිත බලවත් වෙනව කියන එක. එතකොට මෙතනදි අපි ආරම්මණ ප්‍රත්‍යයෙහි ස්වභාවයත් හඳුනාගන්නට ඕන වෙනව. ඒ වගේම මෙතනදි පාවිච්චි වෙනව නේ ආරම්මණ අධිපති කියන එක. අධිපති බවත් ඇතිකරන ධර්මයක් තියෙනව නේ. එතකොට ආරම්මණාධිපති බව සිද්ධ කරන කොට අන්න ඒ අධිපති බවටත් වඩා වෙනස්ව අපිට ඒ සිතෙහි බලවත් බව රඳා පවත්වන්නට උපකාර කරල තියෙනව **බලව කාරණට්ඨෙන ආරම්මණූපනිස්සයො,** බලව කාරණ වශයෙන් මේ සිතෙහි නැවත නැවත එකිනෙකට බලවත් බව ඇති කිරීමේදී ආරම්මණ උපනිස්සය බව බලවත් වෙලා තියෙනව.

ඉතින් අර ඡන්ද - චිත්ත - විරිය - වීමංස කියන මේ ධර්මයන්ගේ බලවත්ව උපදින අවස්ථාවලදී මේ ආරම්මණ උපනිස්සය බොහොම පහසුවෙන් උපදවන්නට පුළුවන්කම තියෙනව. මොකද ඒක ඉතාම සිතේ හොඳට සනිටුහන් වුණ දෙයක් බවට පත්වෙනව. ඒ කියන්නේ ඒක හරියට අපි හොඳට ඇතුළට කා වදින විදියට ගලක කෙටුවොත් එහෙම යමක්, අපිට ඒක ඈතකදි වුණත් දකින්නට පුළුවන්කම තියෙනව. ඒ ගලේම ඇන්දොත් ඒක ටික කාලෙකින් මැකිල යන්න පුළුවන්කම තියෙනව. අර ඡන්ද - චිත්ත - විරිය - වීමංස වලින් අර ගලේ අභ්‍යන්තරයට කොටල ඒක තියෙනව වගේ, කාලාන්තරයක් තිස්සේ ගියත් ඒක මැකිල යන්න ඉඩ අඩුයි වගේ තමයි, අපිට අර ඡන්ද - චිත්ත - විරිය - වීමංසා වගේ අධිපති ධර්මයනුත් එතන යෙදිල තියෙන තැන් වලදි, මේ උපනිස්සය කියන එක බොහොම බලවත්ව ඉපදෙන්නට තියෙන ඉඩකඩ ප්‍රමාණය බොහොම වැඩියි. ඒ

අවස්ථාවලදි අපිට උපනිස්සය ප්‍රත්‍යය - අධිපති ප්‍රත්‍යය - ආරම්මණ ප්‍රත්‍යය කියන මේ ප්‍රත්‍යයන්ගේ තියෙන වෙනස් බව තේරුම් ගැනීම ඉතාම වැදගත් වෙනව.

ඉතින් අධිපති බව කියල කියන්නේ අර ධර්මයන්ගේ අධිපති බව ප්‍රධානත්වය කියන දේ අපිට දකින්නට පුළුවන්. ආරම්මණ ප්‍රත්‍යය කියන එක අරමුණු කිරීම කියන එක දකින්න පුළුවන්. ඒ තමයි එන්න එන්න එන්න ඒ සිතෙහි බලවත් බව, සිතෙන් සිතට ඒ බලවත් බව ඇති කිරීම කියන එක ආරම්මණ උපනිංශ්‍රය භාවය නිසා ඇතිවෙන දෙයක් හැටියට අර **බලව කාරණෙට්ඨෙන** අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. මේක මේ විදියට උපනිස්සය ප්‍රත්‍යයට අදාළව ආරම්මණ උපනිස්සය කියන ධර්මය පිළිබඳව අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව.

## *අනන්තර උපනිස්සය (අනන්තරූපනිස්සයො)*

**පුරිමා පුරිමා කුසල ඛන්ධා - පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඒ වගේම අනන්තර උපනිස්සය කියල කියනව උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන ඊළඟ විග්‍රහය. අනන්තර උපනිස්සය කියල කියන්නේ දැන් අපි දන්නව අනන්තර ප්‍රත්‍යය පිළිබඳව. අතරක් නැහැ කියන එක තමයි අනන්තර කියල කියන්නේ. **න අන්තර කියන එක. එතකොට අතරතුර නැහැ. *ඒ කියන්නේ සිත් දෙකක් අතර පරතරයක් නෑ කියන එක.***

මොන වගේ අවස්ථාවලද, **පුරිමා පුරිමා කුසල ඛන්ධා - පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.** පෙර පෙර වූ කුසල ධර්ම පසු පසු වූ කුසල ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

මෙන්න මේ වගේ තැන් වලදී අපිට දකින්නට පුළුවන්කම තියෙනව මේ අනන්තර උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය සිද්ධ වන අවස්ථාවන් පිළිබඳව.

එතකොට මොකද්ද මේ අනන්තර උපනිස්සයතාවය කියල කියන්නේ? අනන්තර උපනිස්සයතාවය කියල කියන්නේ අර ජවන චිත්තෝත්පාද ආදී හී පවා උපදින ඒ අනන්තර ප්‍රත්‍යයතාවය, ***අපි කුසල වීරියක් ගමුකෝ.*** පළමු කුසල ජවනයක් උපදින දෙවෙනි කුසල ජවන සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දෙවෙනි කුසලය තෙවන කුසල් සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. තෙවන සිත සතරවන සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දැන් මෙහෙම අනන්තර ප්‍රත්‍යයෙහි භාවිතයේ යෙදීම අපිට දකින්නට පුළුවන් නේ.

ඒ පළමු සිත දෙවෙනි සිතටත්, දෙවෙනි සිත තෙවන සිතටත් අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මේකට කියනව අනන්තරතාවය කියල. එතකොට දැන් පළමු සිතෙහි ඉපදුනු දේට වඩා ඒ ඒ හා දත්ත ටිකම ඒ හා සමාන සිතක්මයි උපදින්නේ. ඒ චෛතසික සම්ප්‍රයෝගය ඇතුව තමයි අර දෙවෙනි සිත උපදින්නේ. තෙවන සිත උපදින්නෙත් ඒ විදියටම තමයි. එහෙනම් මොකද්ද මෙතන තියෙන වෙනස? **අර දේවල් වලට වඩා ටිකක් බලවත් වෙනව.**

අපි දන්නව දැන් බිත්තියක තීන්ත ආලේප කරන කොට පළමු පාර අපි ආලේප කරනව. එතකොට ඒ වර්ණය අපිට ටිකක් පාට අඩුවෙන් දකින්න පුළුවන්කම තියෙනව. දෙවෙනි වර ආලේප කරනව. එතකොට ටිකක් අපිට තදින් පාට ආලේප වෙනව දකින්න පුළුවන්. තෙවන වරත් ආලේප කලොත්? ඒක තවත් බලවත්ව ආලේප වෙනව. දැන් එකම පරිමාවට තීන්ත ඇතුළත්ව තියෙන මේ තීන්ත ආලේපනය අපි ආලේපනය කරන කොට

පළමු වතාවට වඩා දෙවෙනි වතාවේ ආලේපනය කිරීමේදී වඩාත් දීප්තිමත්ව සුදු පාටට අපිට ඒක දකින්න පුළුවන්. තෙවන වතාවට ආලේපනය කිරීමේදී තවත් සුදු පාටට දකින්නට පුළුවන්. අන්න ඒ වගේ තේරුම් ගන්න මේ රළු වශයෙන් තේරුම් කලේ. මේ උපමාවක් කිව්වේ. ඔබට තේරුම් ගන්න අවශ්‍ය නිසා. මෙහි සිදුවන මේ බලවත් වීම කියන දේ තේරුම් ගන්න ඔබට පුළුවන්කම තියෙනව.

එතකොට දැන් ඉස්සෙල්ල කතා කලේ අපි යමක් අරමුණු කිරීම කියන තැන නේ. දැන් මෙතනදි කතා කරන්නේ අර ආරම්මණය කියන එක නෙමෙයි. අනන්තර උපනිස්සය කියන එක. මේ එක වීථියක එක ජවන් සිත් සතක් ඇතුළත අපි ගත්තහම ඒ කුසලය නිසා ඊළඟ උපදින කුසල් සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන තැනක ඒ දෙවන කුසල් සිත ඉපැත්මට ඒක බලවත් කිරීමට උපනිස්සය ප්‍රත්‍යයත් ප්‍රත්‍යය වෙනව. උපනිස්සය ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යය වීම එතනදි හඳුනාගන්නට අපිට පුළුවන්කම තියෙනව. මෙන්න මේ ආකාරයට අපිට මේ බලවත් වීම කියන දේ හඳුනාගන්නට පුළුවන්.

**අනුලොමං - ගොත්‍රභුස්ස, අනුලොමං - වොදානස්ස ගොත්‍රභූ - මග්ගස්ස, වොදානං - මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

එතකොට මාර්ගය උපදවන්නට යන කොට අනුලෝම සිත ගෝත්‍රභූ සිතට ප්‍රත්‍යය වෙන විදිය. ගෝත්‍රභූ සිත අපි ගත්තහම ඒක මාර්ග සිත උපදවන්නට ප්‍රත්‍යය වන විදිය. ඒ වගේම අනුලෝම සිත වෝදාන සිතට ප්‍රත්‍යය වන විදිය. මෙන්න මේ ආකාරයන්ට අපිට ගෝත්‍රභූ සිත මාර්ග සිතට, වෝදාන සිත මාර්ග සිතට මේ ප්‍රත්‍යය වන විදිය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම විදියට.

**දැන් අර අනන්තර ප්‍රත්‍යය ප්‍රත්‍යය වන තැනම උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම මොකද්ද? අනතුරුව උපදිනවා කියන එක තමයි අනන්තර ප්‍රත්‍යයට අයිති දේ. අනතුරුවම ඊළඟ සිත උපදිනව කියන එක තමයි අනන්තර ප්‍රත්‍යය කියන එක. එතකොට ඒ උපදින සිත ඊට වඩා බලවත් බවට පත්කරන බව තමයි අපිට එතන දකින්න තියෙන්නේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම කියන එකෙන්.**

දැන් අපි බැලුවොත් එහෙම හිතන්නකෝ විදර්ශනා වඩාගෙන යන කොට ඉතාමත් බලවත්ව ගියපු විදර්ශනා සිත් උපදිනව. එතකොට අනුලෝම සිත් උපදිනව. අර මාර්ගයට අනුලෝම්ව යන සිත්. ඊට පස්සේ එබඳු වූ කුසල සිතක්ම තමයි උපදින්නේ ගෝත්‍රභූ සිත විදියට. ගෝත්‍රභූ සිත එබඳු වූ ආකාරයක්ම අරගෙන තමයි ඒ හිතට වඩා බලවත් වුණ මාර්ග සිත් උපදින්නේ ඊට පස්සේ. ඒ හිත, අර හිත කියන්නේ නෑ. ඒක වෙනත් සිතක්.

ඊට පස්සේ ඒ සිත කියන එක මාර්ග සිතක් වුණාට අර සිතට අනුරූපීවම ඉපදුනු සිතක්. එතකොට ඒ අනතුරුව ඉපදුන සිත මාර්ග සිත, ගෝත්‍රභූ සිතට අනතුරුව මාර්ග සිත උපදෙන අවස්ථාවේදි ඒ උපනිඃශ්‍රය බවින් ඒ ධර්ම ටික ප්‍රත්‍යය වෙනව අර මාර්ග සිත උපදවන්නට. ඒ උපනිඃශ්‍රය භාවයෙහි යෙදීම තියෙන නිසා තමයි මේකේ මේ වැඩීම තියෙන්නේ. දැන් ඔබට තේරුම් ගන්නට පුළුවන් මේ සිත වැඩෙන්නේ ඇයි කියල. මේ සිත පෝෂණය වෙන්නේ ඇයි කියල. එහෙම නැතිනම් හිත දියුණු කරන්න පුළුවන්කම තියෙන්නේ ඇයි කියල. ඒ මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම නිසා.

මේක බොහොම සියුම් කාරණාවක්. බොහොම සියුම්ව තේරුම් ගන්න තියෙන දෙයක්. අපි සියුම්ව තේරුම් ගත්තට වඩා අපි බොහොම රළු මට්ටමෙන්ම මේක තේරුම් ගැනීම ඇතුලේ ඔබට මේක සියුම්තාවයට පසුව තේරුම් ගන්නට පුළුවන්කමක්

තියෙයි. ඒ නිසා තමයි මේ රළු මට්ටමේ උපමා උදාහරණ දක්වන්නට උත්සාහවත් වන්නේ.

දැන් ඔබ කවදාවත් දැකල නැති දෙයක් ඔබ දකිනව. ඊට පස්සේ ඔබට හම්බවෙනව දෙයක් තියෙනව. දැන් ඒක කවුද මොකද්ද කියල ඔබ දන්නේ නෑ. දෙයක් තියෙනව. ඊට පස්සේ දෙවෙනි වතාවෙදිත් ඒක ඔබට හම්බවෙනව. දැන් මොකද්ද ඔබට හම්බ වෙන්නේ? අර කලින් දවසේ තිබුණ එක අදත් තිබුණා. තුන්වෙනි දවස ගත්තහම අර පළමු දවසේ දෙවෙනි දවසේ තිබ්බ එක අදත් තියෙනව. දැන් රූප දකිනවා කියන මට්ටමකදී මෙතන ඉපදුණු හැම හිතක්ම එකම මට්ටමක එකම විදියට ඉපදුණු ධර්ම ටිකක් තමයි තිබුණේ.

**හැබැයි එහෙම දෙයක් තිබුණ තැනක තමන්ගේ හිත අර ධර්මය අරමුණු කරමින් උපදන අවස්ථාවන්වලදි මොකද්ද වුණේ? අරමුණු කරමින් උපදපු අවස්ථාවලදි අර ඊයේ දැක්කා කියන එක අරමුණු කරපු අවස්ථාවලදි ඒ ඒ හා සමානව තමන්ගේ හිතෙන් මනසිකාරය පැවැත්වීම ඇතුලේ තමන්ට අරමුණු වෙනව මේ ඊයේ තිබ්බ එකක් නේද. දැන් ඒක උපදවන්නේ. ඊයේ තිබුණ එකක් කියල දැන ගැනීමක් කරනව. අන්න ඒකට කියනව අපි ආරම්මණ උපනිඃශ්‍රයතාවය කියල. කලින් දැකපු අත්දැකීමක් නැවත සිහි කරනව කියන එක කරනව. ආරම්මණ උපනිඃශ්‍රයතාවය.**

මෙන්න මේ විදියට උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය අපිට හඳුනාගන්නට පුළුවන්. අර තුන්වෙනි දවසේ දකින කොට අර දවස් දෙකක දැක්ක එකනේ දකින්නේ එයා. ඇත්තටම ඇහැට පේන්නේ අළුත් එකක් වුණාට එයා හිතෙන් අරමුණු කරන්නේ අර දවස් දෙකක ගත්ත අරමුණ එකතු කරල. හතරවෙනි දවසේ දවස් තුනක් දැක්ක එක තමයි එයා අරමුණු කරන්නේ.

එහෙනම් දවස් තුනකම සිත් වෙන වෙනම අරමුණු කරනව කියන එක නෙමෙයි. අර තුන්වෙනි අවස්ථාවෙදි ඇති බවට ඉතුරු කලා නම් ඒ හිතේ අත්දැකීම තමයි නැවත මේ සිත උපදවන්නට මේ උපනිස්සය ප්‍රත්‍යය වෙලා තියෙන්නේ. එතකොට මේ විදියට අපිට ආරම්මණ උපනිස්සයතාවය හඳුනාගන්නට පුළුවන්. ඒ කියන්නේ මම එතනදි ඒ උපමාව දැක්වූයේ මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි බලවත් වෙනවා කියන එක පිළිබඳව වැඩිදුර ඔබට තේරුම් ගන්න අවශ්‍ය නිසා. මේක තමයි මේ අනන්තර උපනිස්සය කියන එක ඇතුලෙදි එක මොහොතකදි එක ධර්ම ටිකක ඉපැත්ම ඇතුළෙදිත් ඒ සිතෙහි එකිනෙකට වෙනස්කම් ඇති කරන තැනක් බවට හඳුනාගන්නට දකින්නට තියෙන්නේ.

ඒ කියන්නේ පළවෙනි ජවනයට වඩා දෙවෙනි ජවනය ගත්තොත් කුසල් සිතක ඒක වෙනස් ද කියල බැලුවොත්? නෑ චෛතසික වශයෙන් ගත්තොත් එකම චෛතසික ධර්ම ටික තියෙන්නේ. වෙනස් වෙලා නෑ. එකම චෛතසික ධර්ම ටික. තෙවන කුසල ජවනය ගත්තහම කලින් එකට වඩා වෙනස් වූ සිතක් ද කියල ගත්තහම? නෑ. කලින් සිත් දෙක වගේම ඒ එක හා සමාන චෛතසික ධර්ම ටිකක්මයි තියෙන්නේ.

එහෙනම් මොකද්ද වෙනස? අර උපනිඃශ්‍රය භාවය කියන එකේ යෙදීම මත ඒ වෙනස් වීම හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. සමහර විටක ඒක නිරුද්ධ වන්නට ආසන්න වෙන කොට ඒ උපනිඃශ්‍රය බව ඒ සිතෙහි ප්‍රත්‍යය වීම අඩුවීම මත ඒ සිත දුර්වල වෙන්න පුළුවන්කමක් තියෙනව. ඒ නිසා උපනිඃශ්‍රය වෙනව කියන්නේ හැම වෙලාවකදිම වර්ධනය වෙනව කියන එකම නෙමෙයි. උපනිස්ස ප්‍රත්‍යය ශක්තිය අඩු වුණොත් එහෙම ඒ හිත දුරුවල වෙනව.

ඒක තරුණ කාලේදි ජවය වැඩි වෙන්න පුළුවන් වගේ. දැන් ළමා කාලයේ ඉඳල තරුණ වයසට එන කොට කෙනකුගේ ජවය වැඩි වෙනව. ඒ වගේම තරුණ කාලයේ ඉඳල හායණයට යන කොට අඩු වෙනව. ඉතින් මෙන්න මේ විදියට අපිට මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි අඩු වැඩිවීම බව මත මේකේ බලවත් වීම සහ දුරුවල වීම කියන කාරණාව හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

**එතකොට අනන්තර උපනිස්සය කියල කියන්නේ මොකද්ද? මේ එක වීථියක එබඳු අවස්ථාවක අනතුරුවම උපදින ධර්මයට ඊට පෙර ඉපදුණු ධර්මය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා බලවත් බව ඇති කරල තියෙනව. අන්න ඒක තමයි අනන්තරූපනිස්සය කියල අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. ඉතින් මේ අනන්තර උපනිස්සයතාවය.**

**අනන්තර උපනිස්සයතාවය පිළිබඳව තේරුම් ගැනීමේදී අර ආරම්මණ උපනිස්සයට වඩා වෙනස් වෙන්නේ මොකද්ද? ආරම්මණ උපනිස්සයේදී අතීත වුණ ධර්මයන් අරමුණු කරන බව තමයි කතා කලේ. අනන්තර උපනිස්සයතාවයේදි එකම වීථියක පෙර සිත පසු සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන අවස්ථාවකදි උපනිස්සය ප්‍රත්‍යයෙන් බලවත් කිරීම ඇති කරල තියෙන තැන තමයි එතනදි තියෙන්නේ. ඒක තමයි ඒ සිත් දෙක අතර තියෙන වෙනස්කම හැටියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.**

## ***පකතූපනිස්සය***

ඊට පස්සේ පකතූ උපනිස්සය කියන එක අපිට හඳුනාගන්නට පුළුවන්. පකතූ කියල කියන්නේ ප්‍රකෘතිය කියල කියන එක. ඉතින් මේ පකතූ කියන එක කොහොමද උපනිඃශ්‍රය ප්‍රත්‍යයක් හැටියට ප්‍රත්‍යය වන්නේ. කෘත කියල කියන්නේ කරන ලද කියන

එකනේ. එතකොට ප්‍රකෘති කියල කියන්නේ ප්‍රකර්ෂයෙන් කරන ලද කියන අර්ථය තමයි අපිට එන්නේ ප්‍රකර්ෂයෙන්. වඩා හොඳින් කරන ලද කියන එක තමයි මෙතනදි හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. එතකොට පකතූ උපනිස්සය පිළිබඳව අපිට හඳුනා ගැනීමේදී විශාල කොටස් ටිකක් ආවරණය වෙනව. ඒ කියන්නේ සාමන්‍යයෙන් අපි දහම් කරුණු හැටියට සමාජයේ අපි දකින, අපි තේරුම් ගන්න බොහෝ කරුණු ප්‍රමාණයක් අපිට ඇතුළත් වෙනව මේ පකතූ උපනිස්සය කියන එක ඇතුළෙදි.

**සද්ධා උපනිස්සාය - දානං දෙති, සීලං සමාදියති**
**උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති,**
**විපස්සනං උප්පාදෙති මග්ගං උප්පාදෙති.**
**අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

මොකද දැන් ශ්‍රද්ධා ආදී ධර්මයන් ඒක ඇසුරු වීම ඇතුලේ නැවත නැවත භාවිත වෙනව. දන් දීම කියන එක ඒක නිතර නිතර ඇසුරු වීම ඇතුලේ ඒක බලවත්ව ඒ සිතේ යෙදෙනව. රාගය කියන එක ඒක බලවත්ව ඇසුරු වීම ඇතුලේ ඒක නැවත නැවත යෙදෙනව.

**ඒ නිසා සිතක් නියාමනය වන ආකාරය, සිතක් හදා ගන්න ඕනේ නම් හදා ගන්න විදිය, සිතක් විනාස වෙනව නම් සිතක් විනාස වෙන විදිය කෙනකුට වඩා හොඳින් හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ මේ පකතූ උපනිස්සය ධර්මය වඩාත්ම හඳුනා ගැනීම කියන එකත් එක්ක. ඒ කියන්නේ උපනිඃශ්‍රයටම අදාළ වන කාරණා ටිකත් තමයි. හැබැයි මේ පකතූ උපනිස්සය කියන එක වඩා වැඩි වශයෙන් තේරුම් ගැනීමත් එක්ක ඔබට ඒ කාරණා ටික වඩා තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව.**

එතකොට මේ පකතූ උපනිස්සය නිසාම මම හිතනව ටිකක් අපි වෙලාව අරගෙන තව දුරටත් සාකච්ඡා කලාම අපිට ඒ පිළිබඳව

ටිකක් පැහැදිලි කර දෙන්නට පුළුවන්කම තියෙනව. ඉතින් මේ පකතු උපනිස්සය ඇතුළුව දැන් අපි උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව කතා කිරීමේදී කොටස් තුනකට බෙදල අපි උපනිඃශ්‍රය හඳුනාගන්නට යෙදුනා. ආරම්මණ උපනිස්සය, අනන්තර උපනිස්සය කියන මේ කරුණු දෙක විස්තර කර ගත්ත. අපිට පකතු උපනිස්සය තමයි ඒ අනුව ඉදිරියේදි තව දුරටත් පැහැදිලි කර ගන්නට පුළුවන්කම තියෙන්නේ.

ඉතින් මේ වගේ ප්‍රත්‍යය විභාගයන් පිළිබඳව හඳුනා ගැනීමේදී ඔබට මේ සිත ඉපදීම්, ඒ වගේම ඒ ඇති බවට හම්බවෙන ලෝකෙහි පැවැත්ම සහ ඉපදීම කියන මේ හැම තැනක්ම මේ ප්‍රත්‍යය සමවායෙන් උපදින බව හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ***මේ කතා කරන්නේ බාහිර ඇතිවෙන ප්‍රත්‍යයතාවයන් වලට වඩා මේ කතා කරන්නේ තමන්ගේ පැත්තෙන් මේ ලෝකේ උපදින තැනක ඒ ඒ ධර්මයන්ගේ පැවැත්මට සහ ඉපැත්මට උපකාර වන ප්‍රත්‍යයතාවයන් පිළිබඳව කතාවක් විදියට.*** මහාභූත ආදී දේවල් වලත් ඇතිවන ප්‍රත්‍යයතාවයන් අපි කතා කරනව. ඒ කතා කරන්නේ ඒ ද මේ තමන්ගේ අභ්‍යන්තරව මේ ධර්මයෝ උපදින විදිය පිළිබඳව තේරුම් ගන්නට අවශ්‍ය නිසා තමයි ඒ පිළිබඳව කතා කරන්නේ.

**ඒ හින්දා මේ කතා කරන කථාවන් ඇතුළෙදි ඔබ තේරුම් ගන්නට ඕනේ තමන්ගේ හිත පැත්තට හැරිල හිත දිහා බලාගෙන තමයි මේව ඉගෙන ගන්නට ඕනේ. ඒ විදියට මේ සිත් උපදින්නේ මෙන්න මේ ආකාරයේ උපනිස්සය ප්‍රත්‍යයතාවයක් නිසානේ ද, ඔබට දුකක් ඇතිවෙන කොට පොඩ්ඩක් බලන්නකෝ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය මොකද්ද කියල. එක හා සමානව එය ඇසුරු කරමින් නැවත නැවත සිත් උපදින්නට පටන් ගත්තහම බලවත් වෙලා ඔබව තව දුරටත් ඒ දුක් සහිත බව ඇතුළෙම ගිල්ලල දාන්නේ කොහොමද කියල. තරහ යන කොට රාගයක් ඇති වෙන කොට ඔබ ඒ සිතේ**

**ක්‍රියාත්මක බව දිහා හොඳට බලන්නකෝ කොහොමද ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යයතාවයන් ඇති වන්නේ කියල.**

මේ ප්‍රත්‍යය සින්දොත් මොකද වෙන්නේ? මේක වෙනස් කරන්න ඕන නම් මේ ප්‍රත්‍යය වෙනස් කරන එකනේ කරන්න තියෙන්නේ. මේ ප්‍රත්‍යය නිසා ඉපදෙන දෙයක්. ඒ ප්‍රත්‍යය වෙනස් කර ගත්තොත් අපිට මේක වෙනස් කර ගන්න පුළුවන්. ඒ හින්දා මේ ප්‍රත්‍යයතාවය පිළිබඳව ඔබ තේරුම් ගැනීම ඇතුලේ ඔබේ සිත සකස් කරගෙන ඉතාම ඉක්මනින් මාර්ගය ප්‍රතිපදාව උපදවන්නට ඔබට පුළුවන්කම තියෙනව.

ඒ නිසාම ඒ ධර්මය පිළිබඳව අවබෝධ කර ගැනීමේදී මේ වගේ සිතෙහි තාක්ෂණික පැතිකඩවල් පිළිබඳව තේරුම් ගැනීම ඔබට අත්‍යන්තයෙන්ම වැදගත් වෙනව. ප්‍රයෝජනවත් වෙනව. ඒ හින්දා මේක තේරෙන්නේ නැති වෙන්න පුළුවන්. ටිකක් ගැඹුරුයි කියල හිතෙන්නට පුළුවන්. හැබැයි නැවත නැවත අහන්න. නැවත නැවත ඒ කරුණු ටික විමසා බලන්න. සටහනක් තියා ගන්න. ආපහු තමන්ට කියවල සිහි කර ගන්න පුළුවන්වන විදියට. ඒ ටික ඔබට ගොඩාක් ප්‍රයෝජනවත් වෙයි, භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළ මේ උතුම් මහා ධර්ම සාගරය ඔබේ ජීවිතය තුළ ඔබට අවබෝධ කර ගන්නට යෑමේදී ඔබට තේරුම් ගන්නට යෑමේදී.

ඒ හින්දා ඒක අත හැර ගන්නට එපා. ඔබේ ජීවිතේට අප්‍රමාදීව එකතු කර  ගන්නට කියල බොහොම කල්‍යාණ මිත්‍ර බවෙන් සිහිපත් කරනව. ඒක අතහැර ගන්නේ නැතුව ඔබේ ජීවිතේට එකතුවක් විදියට අරගෙන යෑමේ ඇතුලේ ඔබට ඒ කුසල මනසිකාරය තුළ නිර්වාණ අවබෝධය කරාම ඔබේ මනස ක්‍රමානුකූලව පත්කර ගන්නට පුළුවන් කියන එකත් බොහොම කරුණාවෙන්  යුක්තව සිහිපත් කරනව.

**සාදු සාදු සාදු**

# 03.02.2024 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසි එක්වෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සූදානම් වන මොහොත.

ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඒ උතුම් ශ්‍රද්ධර්ම සාගරයෙන් ස්වල්පයක් නමුත් ඔබ හැම දෙනාම ශ්‍රවණය කරන්නට සූදානම්ව සිටින්නේ.

පින්වතුනි, භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළ වෙලා මේ මුළු ලෝකයටම දුක නැති කරගන්න මාවතක්, දුක නැති කරගන්න ප්‍රතිපදාවක් දේශනා කරන්නේ. ඒ ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේලා මේ ලෝකයාගේ සිත් සතන් දිහා බලල, සිත් සතන් වැඩී තියෙන ආකාරයන් පිළිබඳව, ප්‍රමාණයන් පිළිබඳව, ආසයානුසයේ ඤාණය තුළින් දැකල, ඒ සෑම කෙනකුටම නිර්වාණය අවබෝධ කර ගන්නට පුළුවන් වන ධර්මයන් විවිධ පැතිකඩවල් වලින් දේශනා කරණු ලබනව.

ඉතින් ඒ විවිධ අවස්ථාවන් මුල් කරගෙන විවිධ පුද්ගලයින්ට දේශනා කොට වදාළ ඒ ධර්මය අපිට අද දවසෙදි ත්‍රිපිටකය තුළ දකින්නට පුළුවන්කම තියෙනව භාග්‍යවතුන් වහන්සේගේ පිරිසිදු දේශනාව හැටියට. ඒ බුද්ධ භාෂිතයෙහි ප්‍රධානම එක දේශනාවක්

තමයි අභිධර්ම දේශනාව කියල කියන්නේ. සූත්‍ර මාධ්‍යයට වඩා ටිකක් වෙනස් මාධ්‍යයක් හැටියට අපිට මේ අභිධර්මය හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. සූත්‍ර පෙළ ගැස්වීම සහ සූත්‍ර සකස්වීම කියන එක යම් යම් සිදුවීමක් හෝ යම් යම් පුද්ගලයකුගේ හෝ භික්ෂූන් වහන්සේලා අරමුණු කර ගනිමින් ඒ අවස්ථාවට සිදු කරන ලද කරුණු පැහැදිලි කිරීම් ලෙස බොහෝ විට අපිට එය හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

හැබැයි අභිධර්මයෙහි සැකැස්ම එලෙස තියෙන දෙයක් නෙමෙයි. අභිධර්මය භාග්‍යවතුන් වහන්සේ එක තැනකදි කල දේශනාවක්. දිව්‍ය ලෝකයේදී දෙවියන් අරභයා කරපු දේශනාවකදි ඒක නැවත සැරියුත් තෙරුන් වහන්සේට සංක්ෂිප්ත කොට දේශනා කරන ලද සංග්‍රහයක් හැටියටත්, නැවත සැරියුත් තෙරුන් වහන්සේ විසින් දාරණය කරගෙන තම ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පාරව මගින් පවත්වා ගෙන එන්නට යෙදුනු සංක්ෂිප්ත ධර්ම විග්‍රහයක් ලෙසත් පැවතීම කියන එක තමයි අභිධර්මයෙහි සැකැස්ම ලෙස අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.

ඒ නිසා මේ අභිධර්ම පිටකය කියන එක ඉතාමත් සුවිශේෂ වූ දෙයක්. ඒ තමයි මේ සංගීතයට ප්‍රථමයෙන් පටන්ම ධර්ම සංගායනාවන්ට කලින් ඉඳලම සැකැස්මක් විදියට පිළිවෙලක් විදියට පැවැතුණු ධර්ම කොටසක් විධියට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව. ඉතින් ඒක සූත්‍රයන්ට වඩා වෙනස් ස්වරූපයක් ගැනීම ඒ දේශනාවෙහි තියෙන වෙනස් බවත් එක්කම එයට හේතුව අපිට පැහැදිලි කර ගන්නට පුළුවන්කම තියෙනව.

කෙසේ වෙතත් අභිධර්ම කාරණා කියල කියන්නේ දෙවියන්ට අදාළ වන කාරණා පමණක් නෙමෙයි. නැතිනම් දෙවියන්ට පමණක් අදාළ වන දෙයක්වත් නෙමෙයි. ඒක සමස්ත

ලෝකයාටම අදාළ වන දෙයක්. කෙනකු විසින් තම නුවණ පැවැත්විය යුතු ආකාරය පිළිබඳව තේරුම් ගැනීමේදී මේ අභිධර්මයෙහි තියෙන ඥාණය ඉතාම අවශ්‍ය වෙනවා වගේම වැදගත් වෙනව. ඒක අඩු වුණොත් එහෙම නිවැරදිව සූත්‍රයක දැනුමවත් ගන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ.

සූත්‍රය තුළත් දේශනා කරන්නේ ධර්මය. අභිධර්මය තුළත් පවතින්නෙත් ධර්මය. ඉතින් ඒ නිසා සූත්‍රය පිළිබඳව විමසා බලන කෙනකුට අභිධර්මයෙහි ස්කන්ධ විභාගය පිළිබඳව නුවණ ඇති වෙන්නට ඕනේ. අභිධර්මයෙහි ස්කන්ධ පිළිබඳව විමසා බලන කෙනකුට සූත්‍ර දේශනාවන්හි ස්කන්ධ විභාගය පිළිබඳව පැහැදිලි කරන තැන් පේන්නටත් ඕනේ. ඉතින් මේ කරුණු පරස්පර වෙන්නට පුළුවන් තැන් නෙමෙයි. අභිධර්මය සූත්‍රයට හෝ සූත්‍රය අභිධර්මයට හෝ කිසිදු ලෙසක පරස්පර වන්නේ නැහැ.

අන්න ඒ අභිධර්මය පිළිබඳව අපි විමසා බලන කොට භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනා මාධ්‍යයෙහි ප්‍රධානතම ධර්ම නියායක් වන හේතුඵල දහම නැතිනම් සමස්ත බුද්ධ භාෂිතයම පදනම විදියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන මේ හේතුඵල දර්ශනය පිළිබඳව විමසන කල අභිධර්මයෙහි එන පට්ඨාන දේශනාව එහිදී ඉතාම වැදගත් වන දෙයක්.

ප්‍රත්‍යය නිසා ලෝකයෙහි දේවල් හට ගන්නව කියල කියන කොට මේ ප්‍රත්‍යයන් යනු කුමන ආකාරයේ දෙයක් ද, යම් යම් ධර්මයන් ඉපැත්මට, සංඛත ධර්මයන් හට ගන්න බවට පත් කරන්නට, ඒ ධර්මයන්ගේ උපකාරිත්වය මොන ආකාරයන්ගෙන් සැලසෙනවා ද කියන එක පිළිබඳව අපි විමසා බලන කල අපිට ඉතාම වැදගත් වන දෙයක් තමයි පට්ඨානයෙහි විග්‍රහ වන සූවිසි ප්‍රත්‍යය විභාගය. ප්‍රත්‍යය විසි හතරක් පිළිබඳව එන ධර්ම විභාගය. ඉතින් අපි මේ දේශනා මාලාව තුළදි උත්සාහවත් වන්නේ අන්න

ඒ සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව එකිනෙක හඳුනා ගැනීමක් කරන්නට. පට්ඨානය පිළිබඳව අධ්‍යනයක් කරන්නට මූලික වශයෙන් ඔබට එය පෙළ උගන්වන්නට නෙමෙයි මෙතනදි බලාපොරොත්තු වෙන්නේ. අපි මෙතනදි අදහස් කරණු ලබන්නේ ප්‍රධාන වශයෙන්ම සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව මූලික හැඳින්වීමක් සිද්ධ කරන්නට.

ඉතින් ඒ සඳහා පට්ඨාන දේශනා සාරය වැනි ඒ අභිධර්මය අනුව පට්ඨානප්‍රකරණය පිළිබඳව ලියවුණු ග්‍රන්ථයන්හී එන දහම් කරුණු ආදිය මුල් කරගෙන ඔබට පෙළ දහමට අනුගතව මේ කරුණු කාරණා මේ ප්‍රත්‍යය යනු කුමක්දැයි කියන එක පිළිබඳව පැහැදිලි කරලීමක් තමයි මෙතනදි සිද්ධ කරන්නට මූලික ලෙස බලාපොරොත්තු වෙන්නේ.

ඉතින් පසුගිය දේශනාවන් තුළදි අවසාන වශයෙන්ම අපි නිස්සය ප්‍රත්‍යය සහ උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව හඳුනාගන්නට යෙදුනා. නිස්සය ප්‍රත්‍යය පිළිබඳව හඳුනා ගැනීමේදී නිස්සය සහ නිඃශ්‍රිත දෙදෙනාගේ යෙදීම, නිස්සය කියන්නේ මොකද්ද, නිඃශ්‍රිතය කියන්නේ මොකද්ද කියන එක පිළිබඳව අපි එතනදි වඩාත් ගැඹුරෙන් තේරුම් ගන්නට සහ හඳුනාගන්නට යෙදුනා. ඒ **වගේම අපිට උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව තේරුම් ගන්න කොට අර නිස්සය ප්‍රත්‍යය හා සමාන ලක්ෂණ දකින්න පුළුවන්කම තිබුණත් උපනිස්සය ප්‍රත්‍යය ඊට වඩා වෙනස් විසාල වපසරියක පැතුරුණු ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය සමුප්පන්න භාවය දකින්නට පුළුවන්කම තියෙන විශේෂ යෙදීමක් හැටියට අපිට උපනිස්සය ප්‍රත්‍යයත් හඳුනාගන්නට පුළුවන්කම තිබුණා.**

එහිදී අපි මීට ප්‍රථමයෙන් මේ සූවිසි ප්‍රත්‍යය විභාගය පිළිබඳව තේරුම් ගැනීමේදී අපි තේරුම් ගන්නට යෙදුනා ආරම්මණ උපනිස්සය, ආරම්මණයන් හැටියට යම්කිසි දේක පැවැත්මට උපනිස්සය ප්‍රත්‍යය, ප්‍රත්‍යය වන්නේ කොහොමද කියන එක

පිළිබඳව. ඒ වගේම අනන්තරූපනිස්සය හැටියට යම් ස්කන්ධ පරම්පරාවක් අනිකුත් පසුව පහළ වන පුරෙජාත වුණ ස්කන්ධ පච්ඡාජාත වුණ ස්කන්ධයන්ට පසුව පහළ වන ස්කන්ධයන්ට කොහොමද උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කියන එක පිළිබඳවත් අපි දීර්ඝ ලෙස හඳුනාගන්නට යෙදුනා.

ඒ වගේම අද දවසෙදි අපි උත්සාහවත් වෙනව පකතූපනිස්සය කියන මේ පිළිබඳව උපනිස්සය ප්‍රත්‍යයෙහි එන අනිත් ප්‍රභේදය නැතිනම් අනිත් පැත්ත පිළිබඳව කතා *කරන්නට.*

## ***පකතූපනිස්සය***

ඉතින් උපනිස්සය ප්‍රත්‍යය සහ නිස්සය ප්‍රත්‍යය පිළිබඳව අපි බලන කොට අපිට තේරුම් ගන්නට පුළුවන්කම තිබුණා නිස්සය කිමේදී ඒක අර ඒ ඒ සිතෙහි ඇතිවෙන ඒ ඒ ධර්මයන් අතර තියෙන නිස්සය සහ නිඃශ්‍රිත වූ බව එතනදි හඳුනාගන්නට පුළුවන්කම තිබුණා. හැබැයි උපනිස්සය ප්‍රත්‍යය කියන එක ඒ එක සිතක උපදින නිස්සය නිඃශ්‍රිත වීමක් කියන දේට වඩා එහාට ගිහිල්ල ආරම්මණ උපනිස්සය කියන එකේදී ඒ සමාන ලක්ෂණ දකින්න පුළුවන්කම තියෙනව.

**නමුත් ඊට වඩා අපිට පකතූපනිස්සය කියන එක පිළිබඳව අපි සලකා බලන කල, අනන්තරූපනිස්සයන් පිළිබඳව සලකා බලන කල, අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව ඊට වඩා වෙනස් වූ ආකාරයට වෙනස් වූ යෙදීමක් විදියට මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම සිද්ධ වෙනව කියල. ඒ කියන්නේ උපනිස්සය ප්‍රත්‍යය කියන එක නිස්සය ප්‍රත්‍යය නෙමෙයි, ඊට වඩා මේක යොදන්න අත්‍යවශ්‍යම ප්‍රත්‍යයක් හැටියට වෙනම ප්‍රත්‍යයක් හැටියට දැක්විය යුතු ආකාරයක් තමයි උපනිස්සය කියල කියන්නේ.**

## පකතූපනිස්සය (පළමුවන කොටස)

**සද්ධං උපනිස්සාය - දානං දෙති, සීලං සමාදියති,**
**උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති,**
**විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති,**
**අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

එතකොට කොහොමද මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම සිද්ධ වෙන්නේ කියන එක පිළිබඳව අපි තේරුම් ගැනීමේදී අපි මූලික වශයෙන් හඳුනාගන්නට යෙදුනා, අවසාන වශයෙන් අපි සාමාන්‍යයෙන් දළ අවබෝධයක් ඇතිකර ගත්තා. යම්කිසි කෙනෙක් **සද්ධං උපනිස්සාය**, ශ්‍රද්ධාව උපනිඃශ්‍රය කරගෙන **දානං දෙති, සීලං සමාදියති,** දන් දෙනව, සිල් සමාදන් වෙනව, **උපොසථ කම්මං කරොති,** උපෝසථ කර්ම කරනව. **ඣානං උප්පාදෙති,** ධ්‍යාන උපදවනව. ඒ වගේම **විපස්සනං උප්පාදෙති,** විපස්සනා උපදවනව, **මග්ගං උප්පාදෙති,** මාර්ගයන් උපදවනව. **අභිඤ්ඤං උප්පාදෙති,** අභිඤ්ඤා උපදවනව. ඒ වගේම **සමාපත්තිං උප්පාදෙති,** සමාපත්ති උපදවනව කියන මෙන්න මේ වගේ අවස්ථාවලදි මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

එතකොට මේ පකති උපනිස්සය කියල කියන්නේ **ප්‍ර කෘත** කියන විදියට තමයි නැතිනම් **ප පූර්ව කත** කියන මේ ආකාරයට තමයි මේ පද සන්ධි විසන්ධි අපි දකින්න පුළුවන්කම තියෙන්නේ. ඉතින් **ප** කියන උපසර්ස පදයෙහි යෙදීමත් එක්ක **කත** කියන්නේ කරන ලද දේ කියන එකට. එතකොට **ප** කියන පදය යෙදීමත් එක්ක ප්‍රකර්ෂයෙන් කරන ලද කියන ලද අර්ථය ඒ පදය තුළ ඒ වචනය තුළ ලබා දීම සිද්ධ කරනව. ප්‍රකර්ෂයෙන් සිද්ධ කරන ලද. ඉතින් උපනිස්සය ප්‍රත්‍යය ප්‍රකර්ෂයෙන් ඇති කරණු ලබන උපනිඃශ්‍රය භාවයක් අපිට මේ ප්‍රත්‍යයෙහි දකින්නට පුළුවන්කම තියෙනව.

මේක තේරුම් ගන්න කොට මේකට පකති උපනිස්සය නැතිනම් පකතූපනිස්සය කියල කියන්නේ ඇයි කියන එක පිළිබඳව වඩා හොඳ වටහා ගැනීමක් ඇතිකර ගන්නට පුළුවන්කම තියෙනව මේ ප්‍රත්‍යයෙහි යෙදීම පිළිබඳව ඔබේ අවධානය යොමු කලොත් එහෙම. දැන් අපි කිව්වා මූලික වශයෙන්ම **සද්ධං උපනිස්සාය - දානං දෙති,** ශ්‍රද්ධාව උපනිඃශ්‍රය කරගෙන යම්කිසි කෙනෙක් දානයක් දෙනව. සීලයක් සමාදන් වෙනව. එතකොට මොකද්ද මේ ආකාරයට මෙතනදි සිද්ධ වෙන උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම? ප්‍රත්‍යය සමුප්පන්න භාවය මොකද්ද?

සද්ධා කියල කියන්නේ මොකද්ද? ශ්‍රද්ධාව කියල කියන්නේ කුසල ධර්මයක්. ශ්‍රද්ධාවෙහි ස්වභාවය මොකද්ද? අධිමොක්ෂණ ස්වභාවය. අධිමොක්ෂ අර්ථය තමයි ඒකෙදි සිද්ධ කරන්නේ. නිශ්චලත්වය. ස්ථාවරත්වය. පිහිටි බව ඇති කරලීම තමයි ශ්‍රද්ධාවෙහි සිදු කරන අර්ථය බවට පත් වෙන්නේ. එතකොට මේකේ **සද්ධාන** ලක්ෂණයෙන් යුක්තයි. ඒ කියන්නේ ඇදහීම තමයි මෙහි තියෙන ස්වභාවය. එතකොට ශ්‍රද්ධාව කියන එකේදී කරුණු දැන දෙයක් පිළිගන්නව. කරුණු දැන දෙයක් අදහනව කියන එක තමයි මෙතනදි අදහස් කරන්නේ.

ඇදහීම කියන වචනය සාමාන්‍යයෙන් හිතන්නට එපා යම්කිසි විදියකින් අමූලිකව අදහා ගැනීමක් කියන එක. ඒ කියන්නේ කරුණු නොදැන අදහා ගැනීමක් කියන එක. මේ ශ්‍රද්ධාව කියන්නේ කුසලයක්. ඒක කරුණු දැන ඇදහීමක්. **සමහර වෙලාවට අපි දකිනව ශ්‍රද්ධාව බෙදනව අමූලිකා ශ්‍රද්ධාව සහ ආකරවති ශ්‍රද්ධාව කියල. දැන් එහෙම මේ ශ්‍රද්ධාවේ නිකම් මෝඩ ශ්‍රද්ධාව කියල මෝඩකමත් එක්ක යන ශ්‍රද්ධාව කියන එකක් ඇත්තේ නැහැ.** සමහර වෙලාවට අර්ථ ගන්නන්නට හදනව ඇතැම් කෙනෙක්, බොහෝ වෙලාවට සමාජේ සමහර වෙලාවට සමහර අයව විවේචනය කරන කොට සමහර සිදුවීම සහ දේවල් විවේචනය කිරීමේදී කියනව මෝඩ ශ්‍රද්ධාව. ඔතන

තියෙන්නේ අමූලිකා ශ්‍රද්ධාව. සිද්ධ ස්ථානයකට ගිහිල්ල වන්දනා කරන කෙනෙක් දැක්කත් කියනව මෙතන තියෙන්නේ මේ අමූලිකා ශ්‍රද්ධාව. ඕක නෙමෙයි කරන්නට ඕනේ. අපි ගිහිල්ල ප්‍රතිපත්ති පුරණ එකයි කරන්නට ඕනේ කියල අර දේ හෙලා දකිනව.

**ඇත්තටම අමූලිකා සද්ධා කියල එකක් එහෙම ධර්මයෙහි කොතනකදිවත් එහෙම විග්‍රහ වෙන්නේ නෑ.** එහෙම වෙනමම ශ්‍රද්ධාවෙහි තියෙන විශේෂත්වයක් වෙනම පැහැදිලි කෙරෙන්නේ නෑ. ඒ වගේම මෝහය කියන්නේ අකුසලයක්. මෝඩකම කියන එක මෝහය. අඥාන බව කියන එක අකුසලයක්. ශ්‍රද්ධාව කියන්නේ කුසලයක්. **අකුසල සිතක කුසල ධර්ම යෙදෙන්නේ නෑ. කුසල් සිතක අකුසල ධර්ම යෙදෙන්නෙත් නෑ.** ඒ නිසා ඒකට එහෙම පදනමක් නැති දෙයක් තමයි අපිට එතනදි හඳුනාගන්නට තියෙන්නේ. ශ්‍රද්ධාව කියන ධර්මයෙහි ප්‍රභේද තියෙන්නට පුළුවන්කම තියෙනව.

දැන් යම්කිසි කෙනකුට **ආගමන සද්ධා** කියල කියනව ඒක මේ ශ්‍රද්ධාවේ තියෙන එක ප්‍රභේදයක්. **ආගමන සද්ධා** කියල කියන්නේ මොකද්ද? බෝධිසත්වයන් වහන්සේලා ආදී උතුමන් වහන්සේලා මේ එකම මාර්ගයක සම්මා සම්බුද්ධත්වය සඳහා හෝ පච්චෙක බුද්ධත්වය සඳහා හෝ අරිහත් මාර්ගය සඳහා හෝ එකම මාර්ගයක විවරණ ලබමින් යන කොට ඒ නියත විවරණ ලබා ගත්ත බෝධිසත්වයන් වහන්සේලා තුළ ඒ බෝධිය සඳහා ආගමනය වන ශ්‍රද්ධාවට කියනව **ආගමන සද්ධා** කියල. ඒක ශ්‍රද්ධාවේ තියෙන එක ආකාරයක්. ඒ කියන්නේ සාමාන්‍ය පුද්ගලයින්ට ඇසුරු වෙන ශ්‍රද්ධාවේ මට්ටම නෙමෙයි බෝධිසත්වයන් වහන්සේ නමකට ඇසුරු වෙන්නේ. ධර්මය පිළිබඳ ඇතිවෙන දේ වෙන්නේ. ඒක **ආගමන සද්ධා** කියන ශ්‍රද්ධාව වචනයෙන් තමයි ඒ වගේ දේවල් හඳුන්වා දෙනු ලබන්නේ.

ඒ වගේම **අධිගමන සද්ධා** කියල කියනව අධිගම ඉපදවීමේදී සෝවහන් මාර්ගය සකදාගාමී මාර්ග ආදී අධිගම ඉපදවීමේදී ඒ හා සම්ප්‍රයුක්ත වුණ බලවත්ව ගියපු ඉතාම දැඩි ශ්‍රද්ධාවට කියනව **අධිගම සද්ධාව** කියල. මේ  අධිගමන සද්ධාවේ තියෙන විශේෂත්වය තමයි ඒක අර මාර්ග සිත්වලම උපදිනව. ඒක හෙල වෙන්න පුළුවන්කමක් නෑ කිසිදු ලෙසක.

දැන් ආගමන සද්ධාව ඇතැම් වෙලාවලදී සෙල වෙනව. ඒක නැති වෙනව. එතකොට යම් විදියකට ඒක වෙනස් වෙන්න පුළුවන් අවස්ථා තියෙනව. සමහර වෙලාවට ශ්‍රද්ධාව මුල් නොකරගෙන වැඩ කරන්න පුළුවන් වන අවස්ථා ඕන තරම් තියෙනව. ඒක ආගමන සද්ධාව කියන එක. හැබැයි තැනින් තැන මතු වුණත් ඒක එකම ඉළක්කයකට නොකැඩී යන බවක් තියෙනව ආගමන සද්ධාවේ.

මේ  අධිගමන සද්ධා කියන එකේදී අධිගම ඉපදවීමේදී පහළ වන බලවත් ශ්‍රද්ධාව ඒක මොන විදියකටවත් නැවත සිඳෙන්නේ හෝ වෙනස් වීමකට හෝ ලක් වෙන්නේ නෑ. ඒක තමයි අධිගමන සද්ධාවේ තියෙන විශේෂත්වය.

ඒ වගේම සාමාන්‍යයෙන් ඇතිවෙන බහුල වශයෙන් ඇතිවෙන ශ්‍රද්ධාවට කියනව **පසාද සද්ධා** කියල. ඒක ප්‍රසාදාත්මක ශ්‍රද්ධාව. ප්‍රසාදාත්මක ශ්‍රද්ධාව කියල කියන්නේ අපේ හිතේ ඇතිවෙන පැහැදීම කියන එක. ප්‍රසාදය. අපි කෙනෙක් පිළිබඳව ඇතිකර ගන්න හිතේ පැහැදෙන බව. පැහැදෙන ලක්ෂණය. ඒක තමයි **පසාද සද්ධා** කියල කියන්නේ. ගොඩක් වෙලාවට තුනුරුවන් පිළිබඳව බොහෝ බෞද්ධයින්ට තියෙන්නේ පසාද සද්ධාවක්. පැහැදුනු ශ්‍රද්ධාවක්. එතකොට ඒ පසාද සද්ධා කියන එක ගොඩාක්ම බලවත්ම නැහැ. ඒක සෙල වෙන්න පුළුවන්කම තියෙනව. ඒ නිසා පසාද සද්ධාව කියන මට්ටමෙන් රැඳිල ඉන්න හොඳ නෑ. අපි ඊට වඩා මේ ධර්මය අවබෝධ කර ගැනීම

ඇතුලේ ඒ ශ්‍රද්ධාව නැමති ඉන්ද්‍රිය ධර්මය අධිමෝක්ෂ අර්ථයෙන් අපිට මාර්ගය සඳහා හේතු වෙන විදියට උපනිඃශ්‍රය වන විදියට වඩන්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම **ඔකප්පන සද්ධා** කියල කියනව තෙරුවන් ගුණයන් පිළිබඳව බැස ගත්ත ශ්‍රද්ධාව. දැන් පසාද සද්ධාව කියල කියන්නේ  මොකද්ද? අර බුදුරජාණන් වහන්සේ කියල කියන කොටම කෙනකුට අත්දෙක බැදල වඳින්න හිතෙන ශ්‍රද්ධාවක් තියෙන්නේ, රුවන්මැලිසෑය දැක්කහම කෙනෙක් වඳින්නේ. ඒක ගොඩක් වෙලාවට පසාද සද්ධා කියල කියන්නේ ඒකට තමයි. හැබැයි ඔකප්පන සද්ධා කියන එකේ ස්වභාවය තමයි තුනුරුවන් පිළිබඳව ඇතිකර ගත්ත බැස ගත් ශ්‍රද්ධාව. තුනුරුවන්ගේ ගුණ මෙනෙහි කිරීමෙන්, ඒ පිළිබඳව නිතර නිතර මනසිකාරය පැවැත්වීම ඇතුලේ එයා ගුණය පිළිබඳව ඇතිකර ගත්ත පැහැදීමක් තියෙනව.  ඒක අර පසාද සද්ධාවට වඩා බලවත්.

එතකොට පසාද සද්ධාව තමයි මුලින් ඇති වෙන්නේ. ඊට පස්සේ ඔකප්පන සද්ධාව ඇතිවෙනව. ඊට පස්සේ ඒක එයාට භාවිත කරගෙන යන්න පුළුවන්කම තියෙනව. අධිගමන සද්ධා කියන එක දක්වාම එයාට සද්ධා ඉන්ද්‍රිය භාවිත කරන්න පුළුවන්කම තියෙනව. ඔකප්පන සද්ධාව කියන එකේදී අර තමන්ට මාර්ගය උපදවන්නට පවා ඒ ශ්‍රද්ධාව හේතුවක් බවට පත්වෙනව. දැන් මෙන්න මේ විදියට අපිට ශ්‍රද්ධාව හඳුනාගන්නට පුළුවන්. ශ්‍රද්ධාව කියල කියන්නේ අන්න ඒ විදියේ ධර්මයක්. එහෙනම් මොකද්ද මේ ශ්‍රද්ධාව සමග යෙදෙන උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ.

**සද්ධං නිස්සාය** කියන කොට සද්ධාව නිසා, සද්ධාව ඇසුරු කර ගනිමින්, ඒකේ නිස්සය නිංශ්‍රිත බවට පත්වෙමින් යම් ආකාරයකට සුචරිතයන් සිද්ධ වෙනව නම්, උදාහරණයක්

හැටියට දන් දෙනව කියන දේ. දන් දෙන කොට කෙලින්ම අපි හිතමු ඔබ තුනුරුවන් උදෙසා සංඝයා උදෙසා දානයක් දෙන කොට දානේ දෙන්න කලින්ම ඔබේ හිතේ උපදින දේ තමයි ශ්‍රද්ධාව කියන චේතනාව. මුලින්ම උපදින්නේ ශ්‍රද්ධාව කියන චේතනාව. මුලින්ම උපදින්නේ කුසලයක්. ඒ ශ්‍රද්ධාව කියන කුසලය තමයි උපදින්නේ. ඒ උපදින්නේ දානය දෙන්න ඕන කියන එක නෙමෙයි. එතනදි උපදින්නේ ශ්‍රද්ධාව. ඔබේ පැහැදීමක් තියෙනව. අන්න ඒ පැහැදීම තමයි ඔබට වැඩි වෙන්නේ. ඔබ සතුව තියෙන වටිනා දෙයක් දීමට ඇති කැමැත්තක් උපදිනව. මට මේකෙන් යහපතක් වෙනව. මට මේ වගේ ගුණ ඇති පිරිසකට මෙබඳු මට තියෙන දෙයක් පූජා කර ගැනීම කියන එක මහානිසංස දායක දෙයක්. ඒක වටිනා දෙයක් කියල ඊට පස්සේ අර ශ්‍රද්ධා මූලිකව තව දුරටත් සිත් පැවැත්වීම කියන එක ඇතුලේ එයාට ඇතිවෙනව දන් දීම පිළිබඳව ඇතිවෙන චේතනාවක්.

ඊට පස්සේ පසු දවසකදි හෝ පසු කලකදි හෝ එයා එයාගේ ශ්‍රද්ධාව මුල් කරගෙන දන් දෙන්න සිතපු නිසා එයා දානය සකස් කරල දානය පූජා කරනව. එයා දන් දෙනව. මේක අපි ගත්තහම මේ සමස්ත ක්‍රියාවලියක්නේ. දැන් අභිධර්මයෙහිදි අපි කාරණා බෙදා දැක්වීමේදී අභිධර්ම න්‍යායන්ට අනුරූපීව අපි බෙදා දක්වන්නේ ධර්ම විදියටනේ. චිත්ත චෛතසික ස්කන්ධ විදියටනේ අපි බෙදා දක්වන්නේ.

දැන් මුලින්ම උපදින සිත දිහා බලන්න. එතන උපදින්නේ සිතක්. ශ්‍රද්ධාව කියල එකක් විතරක් උපදින්නේ නැනේ. ඔය ශ්‍රද්ධාව කියන ඉන්ද්‍රිය අධිමත්ත ශ්‍රද්ධාව වැඩි සිත් පරම්පරාවක් තමයි උපදින්නේ. එතකොට පළමුව ඔබේ හිතේ පැහැදීමක් ඇති වෙනව. අපි නිකම් උදාහරණයක් හැටියට සිදුවීම් තුළින් ගත්තොත් එහෙම ධර්ම අසෝක රජ්ජුරුවෝ තමන්ගේ රජ මැදුරේ කවුළුවෙන් එළිය බලාගෙන ඉන්න කොට දකිනව

නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ සංසුන් ගමනින් වඩිනව. ඉස්සෙල්ලම ඒ රූපේ දැක්කහම, ඒ ගමන් විලාසය සහ රූපය දැක්කහම රජ්ජුගේ හිතේ ඉස්සෙල්ලම ඇති වෙන්නේ පසාද ශ්‍රද්ධාවක්. ඒක තමයි ශ්‍රද්ධාවේ තියෙන මූලිකම දේ. දැක්කහම ඇතිවෙන පැහැදීම.

ඊට පස්සේ අර තොරතුරු හොයල බලන්නට හිතෙනව. ආපහු වැඩම කරවනව. දන් දෙන්න හිතෙනව. ඊට පස්සේ ගුණයන් පිළිබඳව ඇතිවෙන දේ, ගුණවතෙක්, මේ වගේ නිවීමක් තියෙන කෙනෙක් කියල හිතෙනව. එතකොට දැන් දැක්කහම හිත සතුටු වෙනව. ඒ වගේම ඉරියව් පැවැත්ම ආදී තුළ යම්කිසි වෙනසක් තේරෙනව. ඒකත් එක්ක ගුණයක් හැටියට දකිනව ඒක. අපි ගත්තහම දැන් අර මුලින් ඇතිවුණු ශ්‍රද්ධාව කියන එක අර තව දුරටත් ගහක් කොළක් දකින එක වගේ මට්ටමකට ගිහිල්ල, ඒකේ ගුණයක් දකින කොට උපදින්නේ නැති ශ්‍රද්ධාවක්. රජ්ජුරුවෝ දැක්කේ නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ වඩිනව විතරක් නෙමෙයි නේ ඒ කවුළුවෙන් බලන් ඉන්න කොට ඕන තරම් තව මිනිස්සු යනව, ආජීවකයෝ යනව, තව ගොඩක් අය යනව දකින්න ඇතිනේ. හැබැයි එහෙම ශ්‍රද්ධාවක් ඇතිවුණේ නැහැ.

හැබැයි මෙතනදි රූපය දැකල ශ්‍රද්ධාවක් ඇතිවුණා. ඊට පස්සේ ඒ පැවැත්මත් එක්ක ඊළඟ සිත් වලට යන කොට තව තව කරුණු එකතු වුණා. ශ්‍රද්ධාව කියන එක විතරක් ඉපදුනේ නෑ. ඒකත් එක්ක සිතක් ඉපදුනා. හැබැයි ඒ සිතේ පැහැදීම ප්‍රසාදවත් බව වැඩියි. පැහැදීම වැඩියි. ප්‍රසාද බව කියන එක.

එතකොට ඒ පසාදවත් බව වැඩි වුණාට පස්සේ එතනදි දෙවෙනි අවස්ථාවට යන කොට එකෙම තවත් වර්ගිත අවස්ථාවක්. තව ටිකක් වැඩිවෙල තියෙනව පසාදවත් බවට වඩා එහාට ගියපු දෙයක් විදියට. එතකොට ඒ වර්ධනය වන බවක් අපිට එතනදි හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඒ කියන්නේ දැන් කලින්

තිබුණ ශ්‍රද්ධාවට වැඩිය ඊළඟ සිත් පරම්පරාව පහළ වෙන කොට ඒ සිතෙහි උපදින ශ්‍රද්ධාව කියන එක ඒ මුලින් ඉපදුනු ශ්‍රද්ධාව කියන ධර්මය ඇතුළත් ඒ කුසල සිත, ඊට පස්සේ උපදින අර ශ්‍රද්ධා සහිත සිත් වලට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දැන් අපි ශ්‍රද්ධාවේ ප්‍රභේද කතා කලානේ. දැන් එතකොට අපි හිතමුකෝ පසාද ශ්‍රද්ධාව, ඒක තව ගුණ දකිමින් ඔකප්පන ශ්‍රද්ධාව වශයෙන් ඒක වර්ධනය වෙලා තියෙනව. ගුණ දකිමින් අපි ඒ පිළිබඳව ඇති කරගන්න පැහැදීම කියන එක. අන්න ඒ මුලින් ඉපදුනු ශ්‍රද්ධාව කියන ධර්මය ඇතුළත් ඒ කුසල සිත, ඊට පස්සේ උපදින අර ශ්‍රද්ධා සහිත සිත් වලට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. ඒක අර සාමාන්‍යයෙන් නිස්සය කියන එක ඇතුළෙදිත් කතා කලාට වඩා වෙනස් කියල කිව්වේ ඒ නිසා තමයි. අර පසාද ශ්‍රද්ධාව උපනිඃශ්‍රය කරගෙන තමයි මේ ඔකප්පන ශ්‍රද්ධාව කියන එක ආවේ.

ඊට පස්සේ අපි දැන් ගත්තොත් දානය පුජා කරනව. දන් දෙන කොට දැන් අර පසාද ශ්‍රද්ධාවත් මුල් වෙලා. ඔකප්පන ශ්‍රද්ධාවත් මුල් වෙලා. කරුණු දැන ගෙන තමයි දානය පුජා කරන්නේ. ඒ වගේම තමන්ගේ හිතේ ඉතාමත් දැඩි ලෙස කරුණු දැන පැහැදීම වගේම දන් දීම පිණිස තමන්ගේ කායිකව වාචිසිකව ඇතිවෙන දේ දක්වාම ඒක දිවෙන්න තරම් ඒ ශ්‍රද්ධාව බලවත් වෙලා තියෙනව. මේ ශ්‍රද්ධාව ඉපදුනේ **සද්ධං උපනිස්සාය** කිව්වේ ඒකයි. ශ්‍රද්ධාව උපනිඃශ්‍රය කරගෙන **දානං දෙති**, දානයක් දෙනව. මුලින් ඉපදුනු පළමු පැහැදීම කියන එක තමයි මුල් වෙලා තියෙන්නේ දැන් දානය දෙනවා කියන එකට.

එතකොට පළමු ඉපදුනු ශ්‍රද්ධාව කියන එකත් දැන් දන් දෙනව කියන එකත් අතර යම්කිසි සම්බන්ධයක් තියෙනව. ඒ සම්බන්ධය කියල කියන්නේ දැන් පසුව අවස්ථාවේ ඉපදුනු සිතට මේ හිතේ ඉඳල මොනවා හරි ටිකක් එක දිගාට ගලා ගෙන ඇවිල්ල වගේ දෙයක් නෙමෙයි. හැබැයි උපනිස්සය ප්‍රත්‍යය

කියල කියන්නේ අන්න ඒ දේට. උපනිස්සය ප්‍රත්‍යය ශක්තිය කියල කියන්නේ අන්න ඒ දේට. ප්‍රත්‍යය කියල කියන්නේ මෙන්න මේ උපනිඃශ්‍රය වන බව. එතකොට මුලින් ඇතිවුණ සිත ඒක ප්‍රත්‍යය වෙලා තියෙනව උපනිස්සය වශයෙන් දෙවනියට ඉපදුනු අර දන් දෙනව කියන සිතට. ඒක දන් දෙනවා කියන ක්‍රියාව සිද්ධ කරන්න හේතුවක් බවට පත්වුණා. අන්න ඒ වෙලාවෙදි දන් දීම කියන දේ සිදු කරන මොහොතෙදි ඉපදුනු සිත් තියෙනව නම් ඒ කුසල් සිත් ටිකට අපි කියනව උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තමයි ඒක ඉපදුනේ, පච්චයසමුප්පන්නය කියල. පච්චය මොකද්ද? අර උපනිස්සය පච්චය. මුලින් ඉපදුනු ශ්‍රද්ධා සහිත සිත පස්සේ ඉපදුනු දන් දෙනවා කියන තැන ඉපදුනු ඒ දේට උපනිඃශ්‍රය වශයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව. පච්චසමුප්පන්නව තමයි අර දානය දෙනව කියන එක ඉපදුනේ.

මෙන්න මේ ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය සමුප්පන්න ආදී මේ යෙදීම නැත්නම් මේ භාවිතය නැත්නම් මේ සිත දියුණු කරනව කියන එක කරන්න පුළුවන්කමක් ඇත්තේ නෑ. මේ සිත වැඩෙනව කියන එක වෙන්නේ නෑ. මේ සිත බලවත් කරන්න පුළුවන් කියන එක වෙන්නේ නෑ. මේ සිත බලවත් කරන්න පුළුවන්කම තියෙන්නේ, වඩන්න පුළුවන්කම තියෙන්නේ, මේ සිත දියුණු කරන්න පුළුවන්කම තියෙන්නේ මොකක් නිසාද? මේ සිත වඩන්න පුළුවන්කම තියෙන්නේ, බලවත් කරන්න පුළුවන්කම තියෙන්නේ, දියුණු කරන්න පුළුවන්කම තියෙන්නේ වෙන දෙයක් නිසා නෙමෙයි. මේ උපනිස්සය ප්‍රත්‍යය කියන එක මේ සිතෙහි බලපෑමට තියෙන නිසා. එහෙනම් බල පවත්වමින් මේ ප්‍රත්‍යය ක්‍රියාත්මක වන නිසා. පච්චය සහ පච්චය සමුප්පන්නතාවය හඳුනාගන්නා කොට උපනිස්සය ප්‍රත්‍යයෙහිදී අපිට මේ සිත් බලවත් වීම හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

එතකොට අන්න ඒ විදියට යම්කිසි අවස්ථාවකදි **සද්ධං උපනිස්සාය - දානං දෙති.** ශ්‍රද්ධාව ඇසුරු කරගෙන යම්කිසි කෙනකු විසින් දානයක් දෙනව නම් අන්න ඒ වෙලාවෙදි ඒ මුලින් ඉපදුනු ශ්‍රද්ධාව පසුව ඉපදුනු ඒ දේට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

ඒ වගේම **සද්ධං උපනිස්සාය - සීලං සමාදියති,** කෙනෙක් සිල් සමාදන් වෙලා සීලය ආරක්ෂා කරනව. දැන් මුලින් ඇති කර ගත්ත ශ්‍රද්ධාව, පැහැදීම, ඒ දේ මුල් කර ගත්ත දේ උපෝසථ කර්මයක් කරන කොට, සීලයක් සමාදන් වෙන කොට, සීලය අවිච්ඡින්නව පවත්වා ගැනීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම කියන එක බලවත් වෙනව. අවශ්‍ය වෙනව. ඒ කියන්නේ උපනිස්සය ප්‍රත්‍යය යෙදුනේ නැත්නම් ඒක බලවත් වුණේ නැති වුණොත් ඒ ප්‍රත්‍යය භාවිත වුණේ නැති වුණොත් එහෙම, හරියට ගහක් හැදෙන්න පොළොවේ තියෙන යම්කිසි ගුණාත්මක බවක්, හොඳට කොළ හැදෙන ගහකට පොළොවේ තියෙන නයිට්‍රජන් ප්‍රතිශතය අඩු වුණොත් එහෙම මේ කොළ හැදෙන්නේ නැනේ හොඳට.

එතකොට අන්න ඒ වගේ තමයි මේ සිත, ඒ කියන්නේ ඒ පසේ තියෙන ගුණාත්මක බවකින් ටිකක් අඩුයි දෙයක්. එතකොට ඒකේ ඒ හැදෙන ගහට බලපානව. අන්න ඒ වගේ මේ සිතෙහි උපනිස්සය ප්‍රත්‍යය, ශ්‍රද්ධාව කියන දේ ඇති වුණොත් එහෙම ඒ සිත බලවත් වෙනව. ඒ උපනිස්සය ප්‍රත්‍යයෙන් මුලින් ඉපදුනු ශ්‍රද්ධා සහිත සිත් පස්සේ උපදින දේවල් වලට ප්‍රත්‍යය වෙන්නේ නැතුව ගියොත් එහෙම? ඒ අතරතුර ශ්‍රද්ධාවට හානි පැමිණ වෙන සිත් පරම්පරාවල් වැඩි වුණොත් එහෙම මොකද වෙන්නේ? අර උපනිස්ස ප්‍රත්‍යය ශක්තිය උපදින්නේ නැහැ ඊට පස්සේ උපදින දේවල් පිළිබඳව. අන්න එහෙම වෙන කොට ඒක බිඳෙනව. ඒක දුරුවල වෙනව. ඒ නිසා තමයි සමහර වෙලාවට කෙනෙක් ශ්‍රද්ධාව මුල් කරගෙන සීල ආදී ධර්මයන්ට උපෝසථ

ධර්මයන්ට ප්‍රවේශ වෙනව. ඒක මම සිල් සමාදන් වෙනව. සිල් රකිනව කියල ඒක පටන් ගන්නව කරන්න. හැබැයි සිල් සමාදන් වුණාට සිල් රකිනව කියල ඒක පටන් ගත්තට ඒක පවත්ව ගෙන යන්න බෑ. **ටික දුරක් යන කොට ඒක නැවත දියාරු වෙලා යනව. ඇයි එහෙම වෙන්නේ? ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන අවම බව.** ඒ කියන්නේ ඒ ප්‍රත්‍යය වැඩෙන්නේ නැති එක.

ඒ නිසා උපනිස්සය ප්‍රත්‍යය තේරුම් ගන්න කොට අපිට තේරෙනව මේ විදියට නැවත නැවත උපනිස්සය ප්‍රත්‍යයතාවය ඒ සිතෙහි යෙදුනොත් තමයි වෙන්නේ. ඒ පොළොවේ ඒ පොහොර අඩු නම් ඒ පොහොර ඇති කරන්න එපැයි අපි. අපිට එතන රෝපණය කරගන්නත් අවශ්‍ය නම් අපිට මේ ගහ රෝපණය කරගන්න තියෙන්නේ එතන නම් අපිට අඩු මොන ගුණාත්මක බව ද, අඩු ගුණාත්මක සංයෝජනය ඒ පොහොර ටික පොළවට එකතු කරන්න  වෙනවා. පිටින් ආදේශකයක් විදියට යොදන්න වෙනව. පොහොර යොදන්න වෙනව.

**අන්න ඒ වගේ තමයි මේ සිතේ යම්කිසි විදියකින් අපිට තේරෙනව නම් අර විදියේ දේවල් අඩුයි කියල, එතකොට අපි මොකද්ද කරන්න ඕනේ? අපි තේරුම් ගන්න ඕනේ උපනිස්සය ප්‍රත්‍යය තමයි අඩු වෙලා තියෙන්නේ.** මුලින් ඉපදුනු ධර්ම ඊට පස්සේ උපනිස්සය ප්‍රත්‍යයෙන් භාවිත වෙනව නම් අපිට මේ හිත පවත්වගෙන යන්න පුළුවන්. ඒකේ ප්‍රතිඵලය එහෙම වෙන්න පුළුවන්. ඒකයි මේ සිත වැඩ කරන විදිය සිතක් යෙදෙන විදිය පිළිබඳව සිතේ ඇති තාක්ෂණය පිළිබඳව දන්න කෙනාට, සිත හසුරුවා ගන්න හරිම පහසුයි. සිත උපදින්නේ කොහොමද, සිත වැඩ කරන යාන්ත්‍රණය පිළිබඳව, සිතේ විද්‍යාව පිළිබඳව එයා දන්නව ඒකේ ඇති ඇතුළාන්තය පිළිබඳව.

එතකොට එයාට සිත හොඳට කර්මණ්‍ය කර ගන්න පුළුවන්කම තියෙනව. තමන්ගේ සිත අපැහැදිලි වෙන්නේ නැහැ. පැහැදිලිව

පවත්වා ගන්නට පුළුවන්කම තියෙනව. තමන්ට අවශ්‍ය පරිදි තම සිත පවත්වා ගැනීමේ හැකියාව ඒ පුද්ගලයා සතු වෙනව. ඒ නිසයි මේ දහම් කරුණු පිළිබඳව විමසීමත් ඔබට වැදගත් වෙන්නේ.

ඔබට යම්කිසි දෙයක් අවශ්‍ය වෙන්නේ නැත්නම් බලවත් කරල හිත ඒ පැත්තට යොදවන්න, ඔබ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නොවන විදියට ඒකට හානි පැමිණෙන විදියට කටයුතු කලා නම් හරි. ඔබට අවශ්‍ය නම් යම් ධර්මයක් පැත්තට ඔබේ සිත බලවත් කරන්න ඔබ උපනිස්සය ප්‍රත්‍යය බලවත් කිරීම තුළ ප්‍රත්‍යය සමුප්පන්න වන ධර්ම බලවත්ව උපදිනව. ඒ නිසා තමයි මේකට පකතූ උපනිස්සය කියල කියන්නේ. ප කෘත කියල කිව්වේ ඒකනේ. කරන ලද දේ. ප්‍රකාශයෙන් කරන දෙයක් බවට පත් කිරීමක් කරන්නේ. ඒක තමයි මෙතනදි සිද්ධ වන දේ බවට පත් වෙන්නේ.

ඉතින් ඒ නිසා සීලයක් සමාදන් වෙන කෙනකු විසිනුත් එයාගේ ඒ සීලයට පවා හේතුවක් බවට පත් වෙනව අර මුලින් ඇතිකර ගත්ත ගුණ ධර්මයන් මුලින් ඇතිකර ගත්ත ශ්‍රද්ධා ආදී ධර්මය. ඉතින් මේකෙදි ශ්‍රද්ධාව විතරක් නෙමෙයි දැන් යම්කිසි කෙනකුගේ සීලයක් තියෙනව නම් - ඒ වගේම සුතය තියෙනව නම් - බහුශ්‍රැත බව තියෙනව නම් - දන් දෙනව කියන චාගය තියෙනව නම් - ඒ වගේම ප්‍රඥා ආදී ධර්ම තියෙනව නම්, මේ හැම එකක්ම සද්ධා - සීල - සුත - චාග - පඤ්ඤා ආදී මේ ධර්ම තියෙනව නම් මේ හැම එකකටම බලපාන ප්‍රධානම දෙයක් තමයි උපනිඃශ්‍රය කියන එක. ඒ ධර්ම මුල් කරගෙන තමයි උපනිඃශ්‍රය කරගෙන තමයි ඒ කුසලයන්ගේ වැඩීම කියන එක තියෙන්නේ.

ඒ නිසා ලෞකික කුසලයන් දියුණු කලත් ඒ තැන්වලත් ක්‍රියාත්මක වෙන්නේ උපනිස්සය. ඒ වගේම ලෝකෝත්තර

පැත්තට උපකාර වෙන්නෙත් උපනිස්සය. රූපාවචර අරූපාවචර කර්මයන් පැත්තට උපකාර වෙන්නේ ද මේ උපනිඃශ්‍රය කියන ප්‍රත්‍යය ධර්මයම බොහෝ සෙයින්ම උපකාරක ධර්මයක් ලෙස. ඉතින් ඒ නිසා මේ අවස්ථා පිළිබඳව අපි තේරුම් ගැනීම අපිට ඉතාම වැදගත් සහ ඉතාම අවශ්‍ය වෙනව. ඉතින් මේ විදියට යම්කිසි ආකාරයකින් යම්කිසි පුද්ගලයෙක් දන් දෙනව නම් සිල් රකිනව නම් පෝය දවසෙදි සිල් සමාදන්ව වෙසෙසින් ආරක්ෂා කරනව නම් ඒ වගේම සමාධියක් උපදවනව නම් ඒ සමාධිය උපදවන ආදී ඒ හැම අවස්ථාවලදීම උපනිස්සය ප්‍රත්‍යය යෙදීම අපිට හඳුනාගන්නට පුළුවන් ඒ ධර්මය නැවත නැවත පැවැත්වීම සිද්ධ වන අවස්ථාවලදි.

ඒ නිසා **සද්ධා, සීලං, සුතං චාගො පඤ්ඤා** - ***සද්ධාය සීලස්ස සුතස්ස චාගස්ස, පඤ්ඤාය*** **උපනිස්සය පච්චයෙන පච්චයො** කියල කියනව. **සද්ධා** ***සද්ධාය*** - ශ්‍රද්ධාව ශ්‍රද්ධාවට, **සීලං** ***සීලස්ස*** - සීලය සීලයට, ඒ වගේම **සුතං** ***සුතස්ස*** - සුතය සුතයට, ඒ වගේම **චාගො** ***චාගස්ස*** - චාගය චාගයට, **පඤ්ඤා** ***පඤ්ඤාය*** - ප්‍රඥාව ප්‍රඥාවට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

එතකොට ශ්‍රද්ධාව තව ශ්‍රද්ධාත්මකව ඒ දේවල් කරන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. සීලය - සිල්වතා එක ශික්ෂාපදයක් පිළිබඳව ගරුකව හිතන කොට එයා තව ශික්ෂාපදයක් දකින කොට ඒ පිළිබඳවත් එයා ගරුකව හිතනව. ඒ නිසා සිල්වතාගේ සීලය තව ශික්ෂාපද සංරක්ෂණය සඳහා එයාට උපනිඃශ්‍රය බවට පත්වෙනව මුලින් ඇතිකර ගන්න අර සංවර අර්ථය. හික්මෙනව කියන දේ.

ඒ වගේම සුතය. කෙනෙක් අහල දැන ගන්නව. ඊට පස්සේ නැවත තව දෙයක් පිළිබඳව අපි අහල දැන ගන්න ඕනේ. හිතන්නකෝ එක බණක් අහනව. ඊට පස්සේ දෙවෙනි දේශනාව අහන කොට ඔබ අහන්නේ පෙර අවබෝධයත් එක්ක තමයි

එතෙන්ට ගිහිල්ල අහන්නේ. එතකොට කොහොමද කලින් අවබෝධය කොහෙද තිබ්බේ කියල ඇහුව්වොත් එහෙම? ඒ අවබෝධය කොතනකවත් තිබ්බ නෙමෙයි. දැන් මේ අළුතෙන් දෙයක් එනකොට අර පෙර තිබුණු අවබෝධය කියන එක සූතය කියන  එක, ඒක උපනිඃශ්‍රය වෙලා තියෙනව වර්තමාන සූතයට.

චාගයත් එහෙමයි. දැන් දීම පිළිබඳව නැමුණු කෙනෙක් නිතර නිතර දන් දීමට පෙළඹෙන්නේ ඒ මුලින් ඇතිකර ගත්ත චාගය දෙවනියට ඇතිකර ගන්න එකට උපනිඃශ්‍රය වෙනව. ඒක තෙවනුවට ඇතිකර ගන්න දීමට උපනිඃශ්‍රය වෙනව. මේ විදියට දන් දෙන කෙනා නිතර නිතර සිතේ සතුටින් දන් දෙන කෙනෙක් බවට පත්වෙනව.

ඒ වගේම ප්‍රඥාවෙහි ස්වභාවයත් එහෙමයි. නුවණ ඇතිවෙන කොට නුවණැත්තාට ටිකෙන් ටික ටිකෙන් ටික නුවණෙහි වැඩීම තියෙනව. මේක හරියට යම්කිසි භාජනයකට ඇවිල්ල වතුර බිංදුවෙන් බිංදුව බිංදුවෙන්  බිංදුව වැටෙනව වගේ. බිංදුවෙන් බිංදුව වැටෙන කොට මොකද වෙන්නේ? ඒ වතුර එකතු වෙනව කියල එකක් පේනව නේ. අන්න ඒ වගේ තමයි මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන ස්වභාවය. අර භාජනය කියන එක, අර වතුර කියන දේ ඒකකයක් විදියට පෙනෙන්න සලස්වන්න හේතුවක් බවට පත්වුණා. උපනිඃශ්‍රය බවට පත්වුණා.

ඒ වගේ අර කලින් හටගත්ත ධර්ම පස්සේ  උපදින දේවල් වලට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මුලින් වැටුණු වතුර බිංදුව පස්සේ වැටුණු වතුර බිංදුවට උපනිඃශ්‍රය වුණා. ඊට පස්සේ මුලින් වැටුණු වතුර බිංදුව පස්සේ වැටුණු වතුර බිංදුවට උපනිඃශ්‍රය වෙනව. තුන්වෙනියට වැටුණු වතුර බිංදුව ආයේ උපනිඃශ්‍රය වෙනව. හතර වෙනියට වැටුණ වතර බිංදුව උපනිඃශ්‍රය වෙනව. මේ විදියට උපනිඃශ්‍රය වෙන නිසා තමයි වතුර භාජනයක් පිරෙනව කියන එක පේන්නේ.

අර උපමාවෙන් සියල්ල සාර්ථක කොට ගන්න එපා. එහෙම වුණොත් අර පිරිල තියෙනව කියන අදහසක් එන්න පුළුවන් නේ. ඒ නිසා ඒ බිංදුව පිරිල නැනේ. එතනින් ඒක අදහස් කරගන්න එපා. ඒ නිසා හාත්පස ගලපන්න බැහැ. හැබැයි මේ උපනිස්සය ප්‍රත්‍යය තේරුම් ගැනීම සඳහායි ඒක කිව්වේ. එතකොට අන්න ඒ විදියට බිංදුවෙන් බිංදුව එකතු වෙනව වගේ මේ උපනිස්සය ප්‍රත්‍යය තමයි මුලින් බිංදුව දෙවෙනි බිංදුවට උපනිඃශ්‍රය වුණා ප්‍රවාහයක් වෙන්න. ඒ වගේ සද්ධාව - සීලය - සුතය - චාගය - පඤ්ඤාව මේ ආදි හැම කුසලයක්ම, ඉන්ද්‍රිය ධර්මයක්ම සද්ධාව - වීර්ය - සතිය - සමාධිය - ප්‍රඥාව මේ ආදී සියළු කුසල ධර්මයන්ගේ ක්‍රියාකාරිත්වය තියෙන්නේ බොජ්ඣංග ආදී ධර්මයන්ගේ වැඩීම කියන එක තියෙන්නේ කුමක් මුල් කරගෙන ද කියල ඇහුවොත් මෙන්න මේ උපනිඃශ්‍රය කියන දේ මුල් කරගෙන තියෙන්නේ. ඒ නිසා උපනිස්සය ප්‍රත්‍යයතාවය ඔබ නිවැරදිව තේරුම් ගත්තොත් ඔබ දන්නව භාවනාවට මොකද්ද කරන්න ඕනේ. අවබෝධයට හිත එකඟ වෙන්න මොකද්ද අඩු වෙලා තියෙන්නේ, ඒ හැම දෙයක්ම සිතේ අඩුව තේරුම් ගන්න පුළුවන් උපනිස්සය ප්‍රත්‍යය තේරුම් ගැනීම ඇතුලේ. ඉතින් මෙන්න මේ විදියට මේ ප්‍රත්‍යයතාවය පිළිබඳව අපිට ප්‍රධාන වශයෙන් හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම අපිට ඊළඟට දකින්න පුළුවන්කම තියෙනව මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදෙන අනිත් යෙදීම පිළිබඳව. අපි කිව්වනේ සමාධිය වඩන කොට ඣාණ උපදවන කොට කියල. ඒ පිළිබඳව දක්වන කොට කියනව,

## *පකතූප නිස්සය (දෙවෙනි කොටස)*

**පඨමස්ස ඣානස්ස පරිකම්මං - පඨමස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

පළවෙනි ධ්‍යානයෙහි තියෙන පරිකර්මය පළවෙනි ධ්‍යානය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. **එතකොට පළවෙනි ධ්‍යානය සඳහා කරන පරිකර්ම කියල කිව්වේ මොකද්ද? මොකද්ද ධ්‍යානය කියල කියන්නේ? ධ්‍යානය කියල කියන්නේ යම්කිසි අරමුණකට තමන්ගේ සිත තබා, ඒ කියන්නේ සිත ඒ අරමුණෙහි පිහිටුවා, වෙන කිසිම අරමුණක තමන්ගේ සිත නොයෙන ලෙස එකම අරමුණක් අරමුණු කරමින් නැවත නැවත නැවත නැවතත් තමන්ගේ සිත් උපදින ලෙස සිතෙහි ඇතිකර ගන්නා වූ ඒකාග්‍රතාවය තමයි අපි ධ්‍යානය හැටියට හඳුනාගන්නේ.**

සමාධිය කියල කියන්නේ - ඒකාග්‍රතාවය කියල කියන්නේ - ධ්‍යානය කියල කතා කරන්නේ අන්න ඒ දේට තමයි අපි ඣානය කියල කියන්නේ. එතකොට මේ ධ්‍යානය කියන එක සඳහා වෑයම් කිරීමේදී උත්සාහවත් වෙන කෙනෙක් නැවත නැවත උත්සාහවත් වෙනව යම්කිසි අරමුණක් අරගෙන ඒ අරමුණ පිළිබඳව නැවත නැවත තමන්ගේ සිත පිහිටුවන්නට. මේක හොඳටම තේරුම් කරවන්නට පහසුම දේ කසිණ භාවනාව කියන එක. ආනාපාන සති ආදී භාවනාවන්ගෙදිත් පුළුවන්. නමුත් මෙතනදි ඉතාම පැහැදිලිව තේරුම් කරන්න පුළුවන් දේ තමයි කසිණ භාවනාව කියන්නේ.

කසිණය කියල කියන්නේ මොකද්ද? නීල කසිණය කියල ගන්නකෝ. එතකොට දැන් නිල් පාට කසිණ මණ්ඩලයක් සකස් කරගෙන ඒ තියෙන වර්ණය කියන දේ පිළිබඳව තමන්ගේ හිතෙන් පුරුදු කරන්න පටන් ගන්නව. එතකොට තමන්ගේ හිතෙන් පුරුදු කරන්න පටන් ගන්න කොට ඒකට ධ්‍යාන **පරිකර්මය** කියල කිව්වේ. ඉස්සෙල්ලම කිසිණු පිළියම් කරන්නට ඕනේ. ඒ කියන්නේ කසිණ පරිකර්මය ඉස්සෙල්ල කරන්න ඕනේ. ඒ කියන්නේ දැන් කසිණ මණ්ඩලයක් සකස් කරගෙන ඒ වර්ණය දිහා බලාගෙන ඒ වර්ණය තමන්ගේ නිමිත්තක් හැටියට, හිත

පවත්වන්නට අවශ්‍ය තැනක් හැටියට ඉතාම හොඳින් තමන්ගේ සිතට ඒ නිමිත්ත ග්‍රහණය කර ගැනීම සිද්ධ කරනව. ඒකට අපි කියනව කසිණ මණ්ඩලය භාවිත කරනව කියල. මේ කසිණ නිමිත්ත නැවත නැවත තමන්ගේ හිතට ගන්න කොට උපුටල ගන්න පුළුවන්කම තියෙනව, කසිණ මණ්ඩලය නැතත් තමන්ගේ සිතෙන් ඉතාම හොඳට අර නිමිත්ත අරමුණු කරමින් අර ඇස් දෙකෙන් බලන් ඉන්න කොට පේනව වගේ තමන්ගේ හිතෙන් ඒ මණ්ඩලය ඒ ලෙසටම බලාගෙන ඉන්න පුළුවන්කම තියෙනව.

ඒකට කියනව අපි කසිණය උපුටා ගන්නව, **උද්භාග නිමිත්ත** පහළ කර ගන්න උත්සාහවත් වෙනව කියල. ඊට පස්සේ තමන්ට ඇස් දෙක පියා ගෙනත් අර නිමිත්ත අර විදියටම මෙනෙහි කරන්න පුළුවන්කම ලැබෙනව. ඒකට කියනව **උද්භාග නිමිත්ත** ගත්ත කියල. දැන් මණ්ඩලයම අවශ්‍ය නෑ. තමන්ට පුළුවන් තමන්ගේ ඇස් දෙක පියා ගෙනත් විවේක තැනකට වෙලා එක තැනකට වෙලා අර මණ්ඩලයෙහි නිමිත්ත ඇස් දෙකෙන් බලන් ඉන්නව වගේම ඇතිකර ගන්න පුළුවන්කම තියෙනව. මෙහෙම තමන් ඒ පිළිබඳව සිහිය පවත්වගෙන හිතෙන් උපුටල අර ගත්ත නිමිත්ත පිළිබඳව තව දුරටත් බලන කොට, එයාට ඊට වඩා ප්‍රභාෂ්වර ලෙස තමන්ට පරිමාව වෙනස් කරන්න පුළුවන් වෙන විදියට අධිෂ්ඨානයෙන් මේක පතුරන්න අකුළන්න මේ විදියට පුළුවන් වෙන විදියට, ඉතාමත් ප්‍රභාෂ්වර ආලෝකයක් විදියට තමන්ගේ හිතට ගෝචර කරගන්න පුළුවන්කම ලැබෙන ආලෝකයක් ඇතිවෙනව.

ඊට පස්සේ එයා වඩන්නේ අන්න ඒ ආලෝකයත් එක්ක. අන්න ඒ ආලෝකය උපදවා ගත්තම අපි කියනව **ධ්‍යාන පරිකර්ම** කරන අවස්ථාවක් කියල. ධ්‍යාන ලක්ෂණ උපදින්නට ප්‍රධාන වශයෙන්ම පටන් ගන්න තැන, ඒ කියන්නේ අනිත් තැන් වලදි නෑ කියන එක නෙමෙයි. අර මුලින් උපදින්නේ කාමාවචර කුසල

සිත්. මේ අවස්ථාවෙදි උපදින්නෙත් ඉතාම බලවත් කාමාවචර කුසල් සිත් තමයි මේ පරිකර්ම කරන වෙලාවෙදිත් උපදින්නේ.

ඊට පස්සේ පසු අවස්ථාව අපි ගත්තට පස්සේ අර අන්තිමේටම එයාට ධ්‍යාන මාර්ගය නැතිනම් ධ්‍යාන කුසලය උපදින්න පටන් ගන්නව. අර විතක්ක විචාර පීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන කුසල සිත විදියට උපදින්න පටන් ගන්නව. ඒක ධ්‍යාන කුසල මාර්ගය හැටියට. ඒක කාමාවචර සිත හැටියට. **මෙන්න මේ විදියට අපි ගත්තහම කාමාවචර කුසලයට අපි කියනව ධ්‍යාන පරිකර්මය කියල. ධ්‍යානය සඳහා කරන පරිකර්මය කියල.**

අන්න ඒ **පරිකර්මය** අර ධ්‍යාන කුසලය උපදවන්නට ඣානය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. අපි කිව්වොත් එහෙම මුලින්ම කසිණ මණ්ඩලය දිහා බලපු එකේ ඉඳල තමයි ක්‍රමානුකූලව එකින් එකට එකින් එකට හැම සිතකටම උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම නිසා තමයි අර බලවත් වෙලා නිමිත්ත උපුටල අරගෙන **පටිභාග නිමිති** පහළ කරගෙන, ඊට පස්සේ පටිභාග නිමිත්ත අරභයා අර ධ්‍යාන උපදවා ගන්න තැනකට පවා යන්නට පුළුවන්කම ලැබුණේ. හැබැයි **මෙතනදි කිව්වේ** ධ්‍යාන **පරිකර්මය** ධ්‍යානයට **උපකාර කරනව කියල නේ.** අන්න **අර නිමිති පහළ කර ගන්න මට්ටමේදී උපදින ඒ ධ්‍යාන පරිකර්මය කියන එක ධ්‍යානයට ප්‍රත්‍යය වෙනව. ඒකෙන් කියන්නේ අර අනිත් ටික ප්‍රත්‍යය වුණේ නෑ කියන එක නෙමෙයි.**

අර කසිණ මණ්ඩලය දිහා බලපු වෙලාවේ ඉඳලම මොකද්ද තිබුණේ? එයාට උපනිස්සය ප්‍රත්‍යය තමයි ඒ භාවිත වීම තිබුණේ. වෙන දේවල් එතනදි භාවිත වෙන්නේ නැතුව එකකට එකක් එකට එකක් මේ නැවත නැවත මේ උපනිස්සය ප්‍රත්‍යය මගින් එකම අරමුණක් මත සිත් ඉපදවීමත් එක්ක තමයි මේ තැනට තමන්ගේ හිත පත් කර ගන්නට පුළුවන්කම ලැබෙන්නේ.

ඉතින් මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන යෙදීම මෙන්න මේ විදියට අපිට ඣානය තුළදි හඳුනාගන්නට පුළුවන්. ඒ පිළිබඳව තමයි ඒ දැක්වුයේ. **පඨමස්ස ඣානස්ස පරිකම්මං - පඨමස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො** කියල ප්‍රථම ධ්‍යානයෙහි තියෙන පරිකර්මය කියන එක පළවෙනි ධ්‍යානය උපදවන්නට ඒක උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. ඉතින් මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන යෙදීම හැටියට අපිට හඳුනාගන්නට පුළුවන් මේ යෙදීම හඳුනා ගැනීම තුළ.

අපිට තේරුම් ගන්නට පුළුවන් සමාධිය ඉපදවීමේදී අපිට අඩු ධ්‍යානයක් උපදවන කොට අපි අතින් සිද්ධ වන අඩු පාඩුව මොකද්ද කියන එක පිළිබඳව අපිට ප්‍රධාන ලෙස හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඉතින් ඒක මේ වගේ දහම් කරුණු විමසා බැලීමේදී අපිට ලැබෙන අතිරේක ලාභයක්.

**දුතියස්ස ඣානස්ස පරිකම්මං - දුතියස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

එතකොට **දුතියස්ස ඣානස්ස පරිකම්මං,** දෙවෙනි ධ්‍යානයේ තියෙන පරිකර්මය දෙවෙනි ධ්‍යානය උපදවන්නට ඒක උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දැන් විතක්ක විචාර කියන දේ විතර්කණය කරනව සහ විචාරණය කරනව. විතර්කය කියල කියන්නේ අරමුණ දැඩිව අල්ල ගන්නව කියන එක. විචාරය කියල කියන්නේ ඒ දැඩිව අල්ලා ගත්ත අරමුණෙහි හැසිරෙනව කියන එක.

ඉතින් අරමුණෙහි අල්ලා ගැනීම සහ අල්ලා ගත් අරමුණෙහි හැසිරීම කියන මේ දෙකම බොහොම ඕළාරිකයි. බොහොම රළු පැවැත්මක් විදියට තමයි මේ දෙකම අපිට හඳුනාගන්නට තියෙන්නේ. අරමුණ අල්ලා ගැනීමත් අල්ලා ගත් අරමුණෙහි

හැසිරීම කියන එකත් සුළු දෙයක් නෙමෙයි. ඒක බොහොම දැඩිවූ දෙයක්. ඉතින් අරමුණ අල්ලා ගැනීමත් අල්ලා ගත් අරමුණෙහි නැවත නැවත හැසිරීමත් කියන එකේ ආදීනවය දැකල, ඒ වගේම අරමුණු විතර්කණය කරන ගතිය කාම සහගත විතර්ක උපදින්නත් එක සමානයි කියන එක තේරුම් අරගෙන, අර නැවත නැවත අර ධ්‍යාන මට්ටමම භාවිත කරන කොට පවත්වන කොට මොකද වෙන්නේ? අර විතක්ක විචාර නැතුවම ඒක ධ්‍යානය වශී කරනව කියල අපි කරනව නේ, යම්කිසි කෙනෙක් ධ්‍යානය උපදවන කොට එයා පංචවිධි ආකාරයකින් ***(ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන සහ පච්චවෙක්ඛන)*** ඒ ධ්‍යානය වශී කරනව.

එතකොට නැවත නැවත ආවර්ජනා කරමින් සමාපජ්ජනය වෙමින් නැවත නැගී සිටිමින් මේ විදියට එයා ඒ ධ්‍යානයෙහි වශී ප්‍රාප්ත භාවය ඇතිකර ගන්නව. ඒ කියන්නේ ඉතාම ඉක්මනට ධ්‍යානයට සමවදින්න පුළුවන්කම තියෙනව. ඉතාම ඉක්මනින් නැගී සිටින්න පුළුවන්කම තියෙනව. ඉතාම හොඳින් මේ ධ්‍යානය නැවත නැවත භාවිත කිරීමත් එක්ක වැඩීමත් එක්ක විතක්ක විචාර දෙකේ අවශ්‍යතාවය කියන එකක් ලැබෙන්නේ නැහැ. ඒ නිසාම අරමුණු විතර්කණය විචාර කිරීම කියන එකත් එයාට අයින් කරන්න පුළුවන්කම තියෙන තැනකට පත්වෙනව.

එයා ප්‍රීති සුඛ ඒකාග්‍රතා කියන අරමුණ සහ අරමුණෙහි ප්‍රීති සුඛ ඒකාග්‍රතා කියන ධර්ම ටිකෙහි පැවැත්මත් එක්ක තියෙනවා මේක දෙවෙනි ධ්‍යානයෙහි එළඹීම. මේ දෙවෙනි ධ්‍යානයෙහි එළඹීම සඳහා අර විතක්ක විචාර දෙකේ සංසිඳීමත් ඇතිකර ගැනීම සඳහා නැවත නැවත වෑයම් කිරීමක් කලා නම් ඉතාමත් පුරුදු කිරීමක් කලා නම් අන්න ඒකට කියනව ද්විතිය ඣාන පරිකර්මය කියල. ද්විතිය ඣාන පරිකර්මය ද්විතිය ධ්‍යානය ලැබීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව.

මේ විදියටම තුන්වෙනි ධ්‍යානය පරිකර්ම කිරීම, තුන්වෙනි ධ්‍යානය සතර වෙනි ධ්‍යානය උපදවන්න පරිකර්ම කිරීම, හතරවෙනි ධ්‍යානය ලබන්න. **ආකාසානඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, විඤ්ඤාණඤ්චායතනය,** ඒ වගේම **නෙවසඤ්ඤානාසඤ්ඤායතනය** කියන විදියට අපිට මේ අරූපාවචර ධ්‍යාන ටිකටත් මේ උපනිස්සය ප්‍රත්‍යය කියන එක බොහෝ සෙයින් උපකාර වෙනව උපනිස්සය ප්‍රත්‍යය උපදවා ගෙන වාසය කරන්න. නැත්නම් උපනිස්සය ප්‍රත්‍යය කියන එකෙන් මේ අනිත් ධර්ම වැඩි දියුණු බවට පත් කරන්නට මේ උපනිස්සය ප්‍රත්‍යය උපකාර වෙලා තියෙනව.

ඉතින් ඒ හිතේ වැඩීම කියන එක තේරුම් ගන්න කොට මම හිතනව ඔබට ඉතාම පැහැදිලි ඇති උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ මොන විදියට යෙදීමක් ද කියන එක ඔබට පැහැදිලි කර ගන්නට  පුළුවන්කම තියෙනව. ඉතින් මේ විදියට ධ්‍යානය ලබා ගන්නා අවස්ථාවලදිත් පළමු පරිකර්ම භාවනාවේ ඉඳල ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම සිද්ධ වෙන එක අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව.

ඉතින් ඒ වගේම තව දුරටත් අපිට මෙහි යෙදීම පිළිබඳව කතා කරන්නට පුළුවන්. ධ්‍යාන ධ්‍යාන අතර උපනිඃශ්‍රය භාවයේ යෙදීම ගැනත් අපිට වෙනමම හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. අපි උපනිස්සය ප්‍රත්‍යයෙහි ඒ අභ්‍යන්තර තව යෙදීම් පිළිබඳව ඒ ටිකත් ඇතුළත් කරගෙන අපි ඉදිරියේදී තව දුරටත් ඒ කරුණු පිළිබඳව සාකච්ඡා කරමු.

මූලික වශයෙන්ම අද අපි කතා කලේ කුසලය කුසලයට කොහොමද අපේ හිත දියුණු වීමට උපනිස්සය ප්‍රත්‍යය කියන එක යෙදිල හිතේ වැඩීම ඇති වෙන්නේ කියන එක. ඒ වගේම උපනිස්සය ප්‍රත්‍යය කියන එක සහ ප්‍රත්‍යය සමුප්පන්න භාවයන් ඇතිවීම ඇතුලේ සමාධිය උපදින්නේ කොහොමද, උපනිස්සය

ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යයතාවය සහ ප්‍රත්‍යය සමුප්පන්නය ඇතිවීම ඇතුලේ ධ්‍යාන ආදිය ලැබෙන්නේ කොහොමද කියන එක තමයි ප්‍රධාන වශයෙන් හඳුනාගන්නට යෙදුනේ.

**පරිකර්මය උපකාරයි ධ්‍යානයට, උපනිස්සය ප්‍රත්‍යයෙන් තමයි ධ්‍යානයට ඒක ප්‍රත්‍යය වන්නේ. උපනිස්සය ප්‍රත්‍යය නොලැබෙන්නේ නම් පරිකර්ම අවස්ථාවෙහි උපනිඃශ්‍රය ලැබෙන්නේ නැත්නම් ධ්‍යානය ලැබෙන්නේ නැහැ. එතකොට කාටවත් ධ්‍යානයක් නැත්නම් ඒකට හේතුව මොකද්ද? පරිකර්ම අවස්ථාව නොලැබීම කියන එක. පරිකර්ම අවස්ථාව නොලැබුණොත් ඒක වෙන්නේ නෑ. එහෙනම් පරිකර්ම අවස්ථාව උපදව ගන්න ඕනේ. පරිකර්ම අවස්ථාවට එන්න අර විදියේ සමාධි භාවිතය තියෙන්නට අවශ්‍යයි.**

ඉතින් මේ විදියට තමන් අඩු තැන පිළිබඳව සලකා බලන්නට පුළුවන්කම තියෙනව. කොයි තැන ද හානියට පත්වෙලා තියෙන්නේ කියන එක පිළිබඳව තමන්ට හොඳින් විශ්ලේෂණය කර ගන්නට පුළුවන්කම තියෙනව මේ දහම් කරුණු පිළිබඳව මනාව අවබෝධ කරගැනීම ඇතුලේ. අපි තව දුරටත් ඉදිරියේදි ඒ පිළිබඳව විවිධ පැතිකඩවල් ඔස්සේ සාකච්ඡා කරමු.

ඉතින් මේ කාරණාවන් පිළිබඳව මෙහි ප්‍රධාන කරුණු විස්තර වීම ඔබේ ධාරණයෙහි තියාගෙන ප්‍රධාන කරුණු ඔබ ලියාගෙන හරි ඒ පිළිබඳව යම් සටහනක් තියා ගන්න පුළුවන් නම් ඒක ඔබට ඒක නිරවුල් අවබෝධයකට හේතුවක් බවට පත්වෙයි. එතකොට ඒ අවබෝධයත් එක්ක ආපහු ඒ ප්‍රත්‍යය පිළිබඳව බොහොම සංක්ෂිප්ත විග්‍රහයක් ඔබ ළඟ ඉතුරු වෙනව. ඒ අවබෝධය පහසුයි. ඊට පස්සේ අනිකුත් දහම් කරුණු පිළිබඳව කරන සාකච්ඡාවන්ගේදී ඔබට ඒ සඳහා ඒ දැනුම භාවිත කිරීමට පහසුවක් බවට පත්වෙයි.

ඒ නිසා ඉතාම සිහියෙන් නුවණින් කල්පනාවෙන් මේ කියන කරුණු පිළිබඳව ඔබේ අවධානය යොමු කරල මේ දේවල් ශ්‍රවණය කරන්නට කියන එක හැම දෙනාටම බොහොම කල්‍යාණ මිත්‍ර බවෙන් සිහිපත් කරනව.

**සාදු සාදු සාදු**

# 10.02.2024 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසි දෙවෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සූදානම් වන මොහොත.

පට්ඨානප්‍රකරණයෙහි දැක්වෙන සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳවයි අප මේ දේශනා මාලාව තුළින් හඳුනාගන්නට යෙදෙන්නේ. ඒ අනුව අවසාන වශයෙන් අපි උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව තමයි සාකච්ඡා කරන්නට සහ හඳුනාගන්නට යෙදුනේ. උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව හඳුනා ගැනීමේදී අපි උපනිස්සය ප්‍රත්‍යයෙහි කොටස් තුනක් පිළිබඳව තේරුම් ගත්තා. ඒ තමයි **ආරම්මණූපනිස්සය, අනන්තරූපනිස්සය සහ පකතූපනිස්සය** කියල මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි කොටස් තුනක් පිළිබඳව අපි හඳුනාගන්නට යෙදුනා.

ආරම්මණූපනිස්සය ධර්මයන් හැටියට සියලුම ආරම්මණ ප්‍රත්‍යය භාවිත වන ආරම්මණ ප්‍රත්‍යය යෙදෙන හැම තැනකම ආරම්මණූපනිස්සය යෙදෙන බව අපි තේරුම් ගත්තා. ඒ ඒ සිත්වල සහ චෛතසික ධර්මයන්ගේ පැවැත්මට අර ආරම්මණය කියන එක උපකාර වෙනව. ආරම්මණ භාවයෙන් ඒ හැම දෙයක්ම අපිට අරමුණු කරන්නට පුළුවන්කම තියෙන නිසාම ඒ ආරම්මණය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව අපි තේරුම් ගන්නට යෙදුනා. **ඒ වගේම රූපය සහ නිර්වාණය ආදී**

**ධර්මයනුත් ඒ ප්‍රත්‍යය හැටියට සලකනව. ඒකට හේතුව තමයි ඒක ආරම්මණය කිරීම තුළ ආරම්මණ උපනිස්සය කියන එක යටතේ ඒ පිළිබඳව සාකච්ඡා කරන නිසා.**

එතකොට මේ ආරම්මණ උපනිස්සය වගේම අනන්තරූපනිස්සය කියල කියනව යම් ධර්මයක් අනතුරුව පහළ වෙනව නම් ඒ කියන්නේ පෙර පහළ වූ ධර්මයන් ඒ අනතුරුව පහළ වන දේට උපනිඃශ්‍රය වශයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව කියල අනන්තරූපනිස්සය තුළදි අපි හඳුනාගන්නට යෙදුනා. ශ්‍රද්ධා ආදී ධර්මයන් කොහොමද අනන්තරූපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වන්නේ කියල.

ඒ වගේම පකතූපනිස්සය කියන එකෙන්, **ප කෘත** කියන එකෙන් අපි තේරුම් ගත්තා ප්‍රකාෂයෙන් කරන ලද වශයෙන් අපිට පරම්පරා වශයෙන් පැවැත්ම තුළ පෝෂණය වෙමින් ඇතිකර ගන්න තත්ත්වයක්. ඒක තව විදියටම අපි කතා කලොත් සාමාන්‍යයෙන් ඉපදුනු ස්වභාවයට වඩා වෙනස් ස්වරූපයකට පත්කරමින් ඇතිවෙන සංවර්ධිත බවක් එහෙම නැතිනම් ප්‍රකෘතිය තුළින් ඇතිකර ගන්න විකෘතියක් කියන ආදී ලක්ෂණයන් මුල් කරගෙන අපි පකතූපනිස්සය පිළිබඳව හඳුනාගන්නට යෙදුනා.

ඉතින් මේ පකතූපනිස්සය තමයි අවසාන වශයෙන් අපි සාකච්ඡාවට බඳුන් කරමින් හිටියේ, මේ පකතිය තුළ කොහොමද උපනිස්සය ප්‍රත්‍යය භාවිත වන්නේ පකතූපනිස්සය කියන එක. මේ පකතූපනිස්සයෙහි යෙදීම තියෙන්නේ පෙර ඉපදුනු ධර්මයන් ඊට පසුව උපදින ධර්මයන්ට නැතිනම් සිත් සහ චෛතසික ධර්මයන්ට උපනිඃශ්‍රය වීම කියන එක මුල් කරගෙන.

**උපනිඃශ්‍රය කියන එකෙහි අදහස, නිඃශ්‍රය කියන්නේ අපිට යම්කිසි විදියකින් උපකාර කරණු බව නම් උපනිඃශ්‍රය කියන්නේ**

**සමීපයෙහි සිට උපකාර කිරීම කියන දේ. ඒ කියන්නේ සමීපව සිට නිඃශ්‍රය භාවය සකස් කිරීම තමයි උපනිඃශ්‍රය කියන දේ තුළින් අපි හඳුනාගන්නට යෙදෙන්නේ.** ඉතින් මේ උපනිස්සය ප්‍රත්‍යය තුළදී අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව මේ චිත්ත චෛතසික ධර්මයන්ගේ ආන්තරික සම්බන්ධතාවයන් පිළිබඳව.

ආරම්මණූපනිස්සය කියන එක තුළදි ඒ යම් සිතක් උපදිනව නම් ඒ සිතටම ඒ අරමුණ හේතුවක් බවට පත්වෙල තියෙනව. ඒ නිසා ඒ සිත තුළම ඒ සිත හැර ඒ අරමුණ ගැන කතා කරන්නට බැහැ. ඒක එකටම ඉපදුනු දෙයක් හැටියට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව.

හැබැයි අනන්තරූපනිස්සය සහ පකතූපනිස්සය කියන මේ උපනිස්සය ප්‍රත්‍යය භාවිතයෙහිදී අපිට තේරුම් ගන්නට තියෙන විශේෂත්වය තමයි මේ තැන් දෙකේදිම එක සිතක යෙදෙන සම්ප්‍රයුක්ත භාවයක් දකින්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. අපිට කලින් ඉපදුනු ධර්මයන් පසුව ඉපදුනු ධර්මයන්ගේ ඉපැත්මට උපනිඃශ්‍රය භාවය ලබාදීම තමයි ඒ තැන් දෙකේදිම හඳුනාගන්නට තියෙන්නේ. ඒ උපනිස්සය ප්‍රත්‍යය ශක්තිය.

ගොඩක් වෙලාවට බොහෝ දෙනා ඇතිකර ගන්න ප්‍රශ්නයක් තමයි යම්කිසි ආකාරයකින් කොහොමද මේ පස්සේ ඉපදෙන ධර්මයන් සංකීර්ණ වන්නේ, එහෙම නැත්නම් කොහොමද ඒව සංවර්ධනය වෙන්නේ? එහෙම නැතිනම් කොහොමද අපේ මතකය තියෙන්නේ? මේ වගේ ප්‍රශ්න ගොඩක් වෙලාවට බොහෝ දෙනාට හිතෙන සහ සමාජය තුළ නිතර ඇහෙන දේවල් බවට පත්වෙල තියෙනව. ඉතින් ඒකට සාර්ථක විසඳුමක් ලබා ගන්නට පුළුවන්කම තියෙන දේ තමයි මේ සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව අවබෝධය ඇතිකර ගැනීම කියන එක. මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය තුළ අපිට අර අනන්තරූපනිස්සය තුළදි අර අනතුරුව උපදින ධර්මය ඊට වඩා

වෙනස්ව ඊට වඩා සුවිශේෂව උපදින ආකාරය අපිට දකින්න පුළුවන්කම තියෙනව.

පකතූපනිස්සය තුළත් එබඳු වූ ස්වභාවයක්ම තමයි හඳුනාගන්නට තියෙන්නේ. අර ප්‍රකෘතියට වඩා ඒ කියන්නේ ප්‍රකෘති භාවයෙන් උපනිඃශ්‍රය සලසනව යම් ධර්මයක්. ඒ වගේම ඒ උපදින පච්චයුප්පන්න ධර්මය ඊට වඩා වෙනස් ස්වරූපයක් ගන්නව. පළමු දේ ඇසුරු කරගෙන තමයි දෙවෙනි දේ උපදින්නේ. හැබැයි දෙවනියට උපදින දේ අර පළමු ඉපදුනු දේට වඩා වෙනස් ස්වරූපයක් ගන්නව. කිසිසේත්ම ඒක පළමු ඉපදුනු දේ නෙමෙයි. අන්න එබඳු ආකාරයක් අපිට මේ උපනිස්සය ප්‍රත්‍යය විභාගය තුළදි දකින්නට පුළුවන්කම තියෙනව.

ඉතින් පකතූපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව කෙරෙණු සාකච්ඡාවෙදි අපි මූලික ලෙසම පසුගිය දේශනාවෙදි හඳුනාගන්නට යෙදුනා කොහොමද එහි භාවිතය සිද්ධ වන්නේ කියන එක පිළිබඳව. අපි ලෞකික කුසලයන් සිද්ධ කරන කොට පකතූපනිස්සයෙහි යෙදීම නිසා ඒ දන් දෙන කොට, සිල් රකින කොට, ඒ ශ්‍රද්ධා ආදී ධර්මයන් නිසා කොහොමද ඒක සංවර්ධනය වෙමින් ඒ කුසලය බලවත් වෙන්නේ. මුලින් ඉපදුනු ශ්‍රද්ධාව කියන ධර්මය, ඊට පස්සේ සීලය - සුතය - චාගය - පඤ්ඤා ආදී දේවල් මූලික ධර්ම ඒ කියන්නේ ප්‍රකෘති ධර්ම හැටියට ඒ ධර්මයන් මුල් කරගෙන කොහොමද දන් දීම කියන දේ ක්‍රියාත්මක වුණේ? නැතිනම් වෙනස් ස්වරූපයකට පත්වෙමින් ඒක වැඩ කලේ කොහොමද? ඒ වගේම සීලය කියන මූලික දේ මුල් කරගෙන කොහොමද එයා ඒක සංවර්ධනය වෙලා ගියේ? මෙන්න මේ ආදී ස්වරූපයන් පිළිබඳව අපි අර මූලික ධර්මය, මූලිකම ස්වභාවය පසුව ඉපදුන ධර්මයන්ට එලෙස උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණ බව අපි තේරුම් ගත්තා. හඳුනාගන්නට යෙදුනා පකතූපනිස්සය පිළිබඳව කතා කිරීමේදී.

අවසාන වශයෙන් එතනදි සාකච්ඡා කරපු කාරණාව බවට පත්වුණේ අපි **පරිකර්ම (පරිකර්ම/පරිකම්ම - ධ්‍යානය සඳහා සිත එක අරමුණකට ගැනීමේදී ධ්‍යාන සිතට පෙර පහළවන පළමුවන ජවන් සිත.)** කරන අවස්ථා වල, පරිකර්ම කියල කියන්නේ ඔබ භාවනා කරනව යම්කිසි චිත්ත ඒකාග්‍රතාවයක් ලබා ගැනීම සඳහා. ඉතින් සමාධියක් උපදවා ගැනීම සඳහා භාවනාවක් සිද්ධ කරන කොට ඒ භාවනාව සඳහා කරන පරිකර්ම කිරීම කියන එක, ඒ කියන්නේ දැන් උදාහරණයක් හැටියට අපි කිව්ව කසිණ භාවනාවක් කරන කෙනෙක් කසිණ මණ්ඩලයක් දිහා බලාගෙන එයා  භාවනා කරන්නට පටන් ගන්නව. ඒ කසිණ මණ්ඩලයක් දිහා බලාගෙන භාවනා කිරීම ආරම්භ කලාට පස්සේ එයා කසිණ මණ්ඩලය පිළිබඳව සිත පුරුදු කිරීම සිද්ධ කරනව. කසිණ මණ්ඩලය අරහයා කසිණ මණ්ඩලයෙහි හිත තබා සිත පුරුදු කිරීම ආරම්භ කරනව. එයා උද්භාග නිමිත්ත ***(උද්ග්‍රහ නිමිත්ත - කසිණාරම්මණය දෙස බලාගෙන භාවනා ප්‍රගුණ කරන කල්හී ඇස පියාගත් විට මනසින් ප්‍රකටව පෙනෙන නිමිත්ත)*** පටිභාග නිමිත්ත ***(භාවනාවට අරමුණු වශයෙන් ගත කසිණයට සමානව භාවනා කරන්නාගේ සිතට වැටහෙන නිමිත්ත)*** ආදී නිමිති පහළ කර ගැනීම් සිද්ධ කර ගන්නව. මෙන්න මේ වගේ අවස්ථාවන්ට අපි කියනව පරිකර්ම කරනව කියල.

මේ භාවනා පරිකර්මය සිත භාවනාවට පුරුදු කිරීම, නැතිනම් පුහුණු කිරීම කියන අවස්ථාවෙදි සිත ධ්‍යානය සඳහා කර්මණ්‍ය බවට පත් කරන කොට එයාට උපදින සිත් ඒවා රූපාවචර කුසල සිත් නෙමෙයි. එයාට කාමාවචර මහා කුසල සිත් තමයි උපදින්නේ. ඒ සිත එතන පුරුදු කරන කොට ඒ මහා කුසල චිත්තෝත්පාදයන්හී පැවැත්ම නිසාම එයාට ධ්‍යාන කුසල සිත උපදවන්නට පුළුවන්කම තියෙනව. ඊට පස්සේ ඣාන සිත විපාක සිතක් හැටියට එයාට උපදවන්නට පුළුවන්කමත් තියෙනව. මෙන්න මේ අවස්ථාවල සිදුවෙන මේ පරිකර්ම අවස්ථාවන් දිහා බැලුවහම ඒ අර **පරිකර්මය කියන එක නිසා**

**නම් ධ්‍යානය උපදින්නේ ඒ පරිකර්මය කියන ඒ කුසල සිත ධ්‍යානයට ප්‍රත්‍යය වීම සිද්ධ කරල තියෙනව.** ඒ නිසා තමයි ඒ ගැන පැහැදිලි කරන කොට අර පරිකර්මය ධ්‍යානයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවාය කියල සඳහන් කරන්නට යෙදුනේ.

## <u>*පකතූප නිස්සය (තුන්වෙනි කොටස)*</u>

**පඨමං ඣානං - දුතියස්ස ඣානස්ස උපනිස්සය පච්චියෙන පච්චියො.**

ඉතින් අද දවසෙදි මේ පකතූපනිස්සය පිළිබඳව හඳුනා ගැනීමේදී **පඨමං ඣානං - දුතියස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** පළමු ධ්‍යානය දෙවෙනි ධ්‍යානයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන මේ විග්‍රහය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. **පළමු ධ්‍යානය කියල කියන්නේ විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත වූ සිතක්.** විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා කියන මේ පඤ්චංගික ඣාන ලක්ෂණ තමයි ඒ සිතේහි ප්‍රධාන වන්නේ. විතක්ක කියල කියන්නේ අරමුණ විතර්කණය කරන බව. අපි රළු වශයෙන් ගත්තොත් අපි ඒ අරමුණ පිළිබඳව දැඩිව සිතන බව. අරමුණෙහි ග්‍රහණය කර ගැනීම.

ඊට පස්සේ විචාරණය කියල කියනව ඒ අරමුණෙහි හැසිරෙන බව කියන එක. **මෙන්න මේ අරමුණ ගැනීම සහ අරමුණෙහි හැසිරීම කියන මේ ලක්ෂණ දෙකම ධ්‍යානයක් උපදවන අවස්ථාවක් වෙන කොට ප්‍රථම ධ්‍යානයේදී ඉතාම බලවත්ව තියෙන ධර්ම දෙකක්.** අන්න ඒ නිසාම මේ විතර්කණය කරන බව ඇති නිසා සිත විසිරීමට ඇති සම්භාවිතාවයටත් ඉතාම ආසන්න බවක් තියෙනව. ඒ සිතන බව තියෙනව නිමිත්ත පිළිබඳව. අරමුණ පිළිබඳව සිතන බව තියෙනව. ඒ සිතන බව කියන කොට මෙතනදි චේතනාව සහ අපි ස්වභාව වශයෙන්

ගත්තොත් එහෙම චේතනාවෙහි සහ මේ කතා කරන විතර්කණයෙහි තියෙන දුරස්ථ බව අපි තේරුම් ගන්නට ඕනේ. ඒ කියන්නේ වෙනස් දෙකක් තමයි චේතනාව සහ විතර්කණය කියල කියන්නේ. අරමුණ කරා සිතෙහි පැමිණවීම හැම වෙලාවකදිම විතර්කය විසින් සිද්ධ කරනව. ඒක විතර්කණය කිරීම තමයි එතනදි වෙන්නේ අරමුණ පිළිබඳව. ඒ අරමුණෙහි හැසිරීම තමයි විචාරය බවට පත් වන්නේ. මෙන්න මේ ලක්ෂණ දෙක මුල් කරගත්තහම කාම ආදී සඤ්ඤාවන් පිළිබඳවත් තමන්ගේ සිතට ආසන්න වශයෙන් ඒ බැස ගැනීම යන්න ඉඩකඩ තියෙනව. ඒ ඉඩකඩ තිබ්බ කියන්නේ ධ්‍යානය පිරිහෙනව කියන එක.

අන්න ඒ නිසා ඒ විතක්ක විචාරයන්හී ආදීනවය තේරුම් ගත්ත කෙනෙක් තමන්ගේ සිත නැවත නැවත අර සමාධියෙහි භාවිත කරනව මේ විතක්ක විචාර සංසිඳවීම සඳහා. මොකද විතක්ක විචාර කිරීම කියන එක රළුයි. ඒක වැඩි භාවිතයක් නැතිකම නිසා තමයි ඒක සිද්ධ වන්නේ. ඒ නිසා මේ ප්‍රථම ධ්‍යානය තව දුරටත් වසීකෘත කරමින් ද්විතිය ධ්‍යානය සඳහා එයා සිත නමනව.

ධ්‍යානයක් වසීකෘත කරනව කියන කොට අපිට හම්බවෙනව ධ්‍යානයක් වසීකෘත කරගන්නා ආකාර පහක් පිළිබඳව. ඒකට පඤ්ච විධි වසීතාවය කියල කියනව. මේ ධ්‍යාන වශී කිරීම කියන මේ කොටස් පහට. (1. ආවජ්ජන - ***නැවත නැවත මෙනෙහි කිරීම*** **2.** සමාපජ්ජනය - ***නැවත නැවත සමවැදීම*** 3. අධිට්ඨාන - ***ඉතාම සුළු වෙලාවක් සමාපත්තියෙහි සිටීමට හැකිසේ සමවැදීම*** 4. වුට්ඨාන - ***එසේම සුළු කාලයකින් ධ්‍යානයෙන් නැගීමට හැකි බව*** **5.** පච්චවෙක්ඛණ - ***නැවත මෙනෙහි කර බැලීම*** )

එහිදී අපි යම්කිසි විදියකින් නිමිත්ත ආවජ්ජන ***(නැවත නැවත මෙනෙහි කිරීම)*** කියල කියනව. ආවර්ජනා කරන කම. අපි ඒ

ධ්‍යානය උපදවා ගන්නට අවැසි නිමිත්ත පිළිබඳව නැවත නැවත සිතෙන් කරනු ලබන ආවර්ජනාවක් තියෙනව. මේකට අපි කියනව **ආවජ්ජන වසීතාවය** කියල. ඒ ආවර්ජනාව තුළ තමයි නැවත නැවත ඒ සිත උපදවන්නට නැතිනම් එබඳු වූ සිත් පරම්පරාවක පහළ කිරීමක් කරන්නට පුළුවන්කම තියෙන්නේ ඒ නිමිත්තෙහි නැවත නැවත පවත්වන ආවර්ජනාව තුළ. ඉතින් ඒ ආරම්මණය නැවත නැවත ආවර්ජනා කිරීම කියන ඒ නිසා අත්‍යන්තයෙන්ම අවශ්‍ය වන දෙයක්.

ඒ වගේම ආවර්ජනා කරමින් ඊළඟට ඇතිවෙන දේ තමයි **සමාපජ්ජනය *(නැවත නැවත සමවැදීම)*** කියන එක. සමාපජ්ජනය කියල කියන්නේ සමවදිනව. ඒ තුලට සමවැදීම සිද්ධ කරනව. අපි ඒ තුළට ප්‍රවේශ වෙනව. ඒ තුළට ඇතුළත්ව වාසය කරනව. ඊට පස්සේ අර ධ්‍යානය ඒ සමාපජ්ජන වශයෙන් අපි සමවැදීම සිදු කරනව. ආපහු නැගී සිටීම සිද්ධ කරනව. ඉතින් මෙන්න මේ විදියට සමාපජ්ජන වශයෙන් ඒ තුළ වාසය කරන්නට පුළුවන්. එබඳු මනසිකාරය තුළ නැතිනම් එබඳු සිතක් තුළ වාසය කරන්නට පුළුවන්. එක සමාන සිත් පරම්පරාවක පහළ කිරීමක් කරන්නට පුළුවන් කියන එක තමයි ඒ සමාපජ්ජන අවස්ථාවෙහිදී සිද්ධ වන්නේ.

ඊට පස්සේ **අධිට්ඨාන *(ඉතාම සුළු වෙලාවක් සමාපත්තියෙහි සිටීමට හැකිසේ සමවැදීම)*** කියල කියනවා යම් කෙටි කාල සීමාවක් සඳහා සිතෙන් අපි වෙලාවක් අධිෂ්ඨාන කරමින් අර සමවැදී සිටීම. මෙපමණ කාලයක් දක්වා මම මේ සමාධිය ආසේවනය කරනව, ඇසුරු කරනව කියල, කාලය අධිෂ්ඨාන කරල, ඒ කාලය පුරාවට අර සිත පවත්වනවා. ඒ කියන්නේ ඒක බිඳෙන්නට නොදී අර සිත් පරම්පරාව පවත්වනවා. ඒ කියන්නේ සිත වසීකෘතයි මේ අවස්ථාවෙදි. ඊට පස්සේ එයා සමහර විට විනාඩි පහක්, දහයක්, පහළොවක්, මේ වගේ යම් යම් කාල සීමාවන් අධිෂ්ඨාන කරමින් නැවත නැවත ඒ අදාළ කාල

සීමාවෙන් පසු නැගී සිටින විදියට අර ධ්‍යානයට සමවැදීම සිද්ධ කරනවා. ඉතින් මේකට කියනව අධිට්ඨාන වසීතාවය කියලා.

ඒ වගේම වුට්ඨාන වසීතාවය ***(එසේම සුළු කාලයකින් ධ්‍යානයෙන් නැගීමට හැකි බව)*** කියල කියනව මෙන්න මේ කාල සීමව තුළ නැගී සිටිනව කියල එයාට අවැසි අවස්ථාවන් වල ඒ සමාධියෙන් නැගී සිටින්නටත් අධිෂ්ඨාන කරනව. ඒකට කියනව වුට්ඨාන වසීතාවය කියල. ඒ වගේම එයා වුට්ඨානය වුණාට පස්සේ එයාට පුළුවන්කම තියෙනව ආවර්ජනා කරන්නට ඒ ධ්‍යානය පිළිබඳව නැවත නැවත ආවර්ජනා කිරීම් වශයෙන් එයා මෙනෙහි කර බැලීම් විදියට වසී කිරීම සිද්ධ කරනව. නැවත නැවත අර ධ්‍යාන සිත පිළිබඳවම ආවර්ජනා කිරීම සිදු කිරීම් ලෙස. සෑම ධ්‍යානයකට සමවදින පුද්ගලයෙකුම නැවත ආවර්ජනා කිරීම සිද්ධ කරනව අර ධ්‍යානය පිළිබඳව නැවත සිතෙන් ආවර්ජනා කොට බැලීම් විදියට.

ඒ වගේම **පච්චවෙක්ඛණතාවය** ***(නැවත මෙනෙහි කර බැලීම)*** ඊළඟට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. පච්චවෙක්ඛණ වසීතාවය කියල කියන්නේ ප්‍රත්‍යවේක්ෂා කිරීම. ඒ කියන්නේ අර සමවැදුනු ධ්‍යානයෙන් නැගී සිටල ඊට පස්සේ අර ධ්‍යාන අවස්ථාව පිළිබඳව නැවත සිතෙන් ප්‍රත්‍යවේක්ෂා කරල බලනව. නැවත නැවත මෙනෙහි කොට බැලීම කියන එක සිදු කරනු ලබනව. සෑම ධ්‍යානයකටම සමවැදුනු පුද්ගලයෙකුම නැවත ඒ මෙනෙහි කොට බැලීම කියන දේ නැතිනම් ප්‍රත්‍යවේක්ෂා කිරීම කියන දේ ප්‍රති ආවේක්ෂණයන් නැවත සිද්ධ කරනව. නැවත මෙනෙහි කර බැලීම කියන එක සිදු කරනව ධ්‍යාන අවස්ථාවේ. ඉතින් මෙන්න මේ ආකාරයන්ගෙන් ප්‍රථම ධ්‍යානය වසීකෘත කිරීම සිද්ධ කරනව.

මේ විදියට නැවත නැවත ප්‍රථම ධ්‍යානය භාවිත කිරීම කියන එක සිදු කිරීම තුළ තමයි ද්විතිය ධ්‍යානය උපදවන්න පුළුවන්කම

තියෙන්නේ. කිසිම විදියකින් ප්‍රථම ධ්‍යානය ඔය විදියට භාවිත කිරීමක් නොකට ද්විතිය ධ්‍යානය ලබනව කියන එක සිද්ධ කරන්නට පුළුවන්කමක් ඇත්තේ නෑ. **ඒ නිසාම ප්‍රථම ධ්‍යානය ඉතාම බලවත් ලෙස පුරුදු කරපු කෙනකුට තමයි ද්විතිය ධ්‍යානය උපදවන්න පුළුවන්කම තියෙන්නේ.**

අන්න ඒ හේතුව නිසා පළමුව උපදව ගත්ත ධ්‍යානය දෙවනුවට හටගත්ත ධ්‍යානයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඒ පළමු ධ්‍යානය නැවත නැවත අසේවනය කිරීම තුළ නැවත නැවත භාවිත කිරීම තුළ තමයි දෙවෙනි ධ්‍යානය උපදින්නේ. **දෙවෙනි ධ්‍යානය උපදින කොට පඤ්චකම නයෙන් ගත්තොත් අවිතක්ක විචාරමත්ත, චතුත්ථ නයෙන් ගත්තොත් අවිතක්ක අවිචාර.**

ඒ කියන්නේ ධ්‍යාන පහක් කියල බෙදෙනව එක න්‍යායකට අනුව බැලුවහම. ඒ කියන්නේ ඒක අවස්ථා දෙකකට විතක්ක විචාර සංසිඳීම සිද්ධ වෙන නිසා තමයි එහෙම කොටස් පහකට බෙදා දක්වන්නේ. පළමුව විතක්කය කියන එක දුරු වෙනව. විචාරය කියන එක මාත්‍රයක් තියෙනව විතර්කණය නැතුව. දෙවනුවට අවිතක්ක බව සහ අවිචාර බව කියන එක ඇති වෙනව. ඒ කියන්නේ විතක්ක විචාර දෙකම නැතිවෙල යනව. මේ අවස්ථා දෙකම අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

චතුත්ථ නයෙන් මුල් කරගෙන කතා කලොත් ප්‍රධාන වශයෙන්ම අවිතක්ක අවිචාර සමාධියක් ලෙස එය අපිට දකින්නට පුළුවන් විතක්ක විචාර නැති. විතර්කණය සහ විචාරණය කිරීම කියන එක යටපත් කර ගත්ත ඒක දුරු කරපු අවස්ථාවක් හැටියට අපිට දකින්නට පුළුවන්. ඇයි? තම මනස භාවිත කිරීම ඇතුලේ දැන් අරමුණ අපි තදින් ගැනීමක් අවශ්‍ය වෙන්නේ හෝ අරමුණෙහි හැසිරීම අවශ්‍ය වන්නේ නැහැ. අපි ඒ සිත නැවත නැවත භාවිත කරල තියෙනව. ඒ නිසා ස්වභාවිකවම හිත එතනට පත්වීම

තියෙනව. ඒ නිසා චේතනා ආදී දේවල් පමණක් ප්‍රමාණවත්. විතක්ක විචාරයට කල හැකි අමුතු දෙයක් එතන ඇත්තේ නෑ. අන්න ඒ වසීකෘත කරපු ප්‍රථම ධ්‍යානය ඉතාමත් හොඳින්ම භාවිතා කරපු කෙනකුට පුළුවන්කම තියෙනව ඒ විදියට ද්විතිය ධ්‍යානය උපදවන්නට. ඉතින් මෙන්න මේ ධ්‍යානයන් අතර සිදුවන, ඒ කියන්නේ පළමු ධ්‍යානය ද්විතිය ධ්‍යානය උපද වීමට උපකාර කෙරෙනව.

ඒ වගේම දෙවෙනි ධ්‍යානයත් ඒ ලෙසටම භාවිත කිරීම ඇතුළත තෙවන ධ්‍යානය උපදවන්නට උපකාර වෙනව. තුන්වෙනි ධ්‍යානය හතරවෙනි ධ්‍යානය උපදවන්නට භාවිත වෙනව. ඉතින් පඤ්චක නයෙන් ගත්තොත් හතරවෙනි ධ්‍යානය පස්වන ධ්‍යානය උපදවන්න භාවිත වෙනව. නැතිනම් උපකාර වෙනව. මෙන්න මේ පළමු ධ්‍යානය දෙවෙනි ධ්‍යානයෙහි ඉපදීමට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණා. දෙවෙනි ධ්‍යානය තෙවෙනි ධ්‍යානය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණා. තුන හතර, හතර පහ උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කලා. මෙන්න මේ විදියට උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම පිළිබඳව ඔබට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව. මේ ධ්‍යානයන් අතර සිදු වෙන උපනිස්සයතාවය පිළිබඳව.

ඊට පස්සේ අරූපාවචර ධ්‍යානය ඉපදවීමේ දී **ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතනය නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය** කියන මෙබඳු තැන් වලදිත් සිද්ධ වන්නේ අර කලින් කතා කරපු ආකාරයටම උපනිඃශ්‍රය වෙමින් මුලින්ම ආකාසය අනන්තයි කියන තැන අර  සඤ්ඤාවන්ගෙන් මිදී එයා ආකාසයෙහි තියෙන අනන්තවත් ස්වභාවය පිළිබඳව සිත භාවිත කිරීම ඇතුලේ පරිකර්ම කිරීම ඇතුලේ එයාට ඒ සඤ්ඤාව උපදවන්නට පුළුවන්කම තියෙනව අනිත් සඤ්ඤාවන් යටපත්

කරල. ඒ කියන්නේ අනිකුත් පරිකර්ම අවස්ථාවන් ඒ අවස්ථාවට **ආකාසානඤ්චායතනය** කියන එකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. ඒ නිසා තමයි ඒ ධර්මයෙහි **ආකාසානඤ්චායතනය** කියන එකේ හට ගැනීමත් පේන්නේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන නිසා.

ඒ වගේම ආකාසය අනන්තයි කියපු සඤ්ඤාවෙහි තියෙන ඕළාරික බව තේරුම් අරගෙන තමයි **විඤ්ඤාණඤ්චායතනය** කෙනෙක් උපදවන්නේ. විඤ්ඤාණය අනන්තයි කියන එක පිළිබඳව හිත තැබීම සිද්ධ කරන්නේ. එහෙනම් ඒ විඤ්ඤාණය අනන්තයි කියන ධර්මය පච්චුප්පන්න ධර්මය බවට පත්වෙනව, අර කලින් ඉපදුනු ආකාසය අනන්තයි කියල ගත්ත සඤ්ඤාව පච්චය බවට පත් කරමින්. එතකොට ඒක පච්චය කරගෙන පච්චුප්පනය බවට පත්වෙල තියෙනව විඤ්ඤාණය අනන්තයි කියන එක. මෙන්න මේ විදියට පච්චය සහ පච්චුප්පන්නය, ප්‍රථම ධ්‍යානය පච්චය. ද්විතිය ධ්‍යානය පච්චුප්පන්නය. ද්විතිය ධ්‍යානය පච්චය. තෘතිය ධ්‍යානය පච්චුප්පන්නය. මෙන්න මේ විදියට දකින්නට පුළුවන්.

මේක පච්චය කියල හැඳින්වූවාට අපි තේරුම් ගන්නට ඕන දේ තමයි මේ පච්චය කියන වචනය භාවිත වුණාට මේක පච්චය වෙලා තියෙන්නේ, මොන පච්චයෙන් ද පච්චය වෙලා තියෙන්නේ. ප්‍රථම ධ්‍යානය මොන පච්චය බවටද පත්වුණේ. උපනිස්සය ප්‍රත්‍යය බවට පත්වෙමින් තමයි ද්විතිය ධ්‍යානයේ පච්චය බවට පත්වුණේ. එතකොට අර සහජාත ආදී වශයෙන් එහෙම පච්චය වුණේ නෑ. උපනිස්සය පච්චය, එතන උපනිඃශ්‍රිත භාවය තමයි මේක උපදවන්නට මුල් වුණේ. ඒ නිසා ප්‍රථම ධ්‍යානයේ උපනිස්සය භාවය තමයි එහි යෙදුනු ප්‍රත්‍යය, නමුත් අපි කියනව පච්චය හැටියට ප්‍රථම ධ්‍යානය කියල. ද්විතිය ධ්‍යානය පච්චුප්පන්න ධර්මය හැටියට කතා කරනව. මේකේ ඇතුලේ තියෙන ප්‍රත්‍යය ශක්තිය කියන එක නැතිනම් ප්‍රත්‍යය

ශක්තිය බවට පත් වන්නේ මොකද්ද? මේ පච්චයේ ශක්තිය බවට පත් වන්නේ උපනිස්සය පච්චය කියන එක. මෙන්න මේ ආකාරයට මේ ධ්‍යානයන් අතර ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. උපනිස්සය ප්‍රත්‍යය අනිත් ධ්‍යානයට ප්‍රත්‍යය වීම් වශයෙන්. මේ විදියට නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය දක්වාම මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය සිදු වෙන අවස්ථාවන් හැටියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

## *<u>පකතූප නිස්සය (සතරවෙනි කොටස)</u>*

**දිබ්බස්ස චක්ඛුස්ස පරිකම්මං - දිබ්බස්ස චක්ඛුස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඒ වගේම අපිට ඊළඟ කොටස හැටියට දකින්නට පුළුවන්කම තියෙනව **දිබ්බස්ස චක්ඛුස්ස පරිකම්මං - දිබ්බස්ස චක්ඛුස්ස උපනිස්සය පච්චයෙන පච්චයො. දිබ්බස්ස චක්ඛුස්ස පරිකම්මං,** දිබ්බ චක්ඛුව සඳහා ඇතිකර ගන්න පරිකර්මයක් තියෙනව නම් මේ පරිකර්මය පිළිබඳව, දිබ්බ චක්ඛු ඤාණය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම සිද්ධ වෙනව.

ඒ වගේම **දිබ්බාය සොතධාතුයා පරිකම්මං - දිබ්බාය සොතධාතුයා උපනිස්සය පච්චයෙන පච්චයො.** දිව්‍ය කන උපදවන්නට නැතිනම් දිබ්බ සෝතය උපදවන්නට පරිකර්ම කිරීම දිබ්බසෝතය උපදීමට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව.

**ඉද්ධිවිධ ඤාණස්ස පරිකම්මං - ඉද්ධවිධ ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** ඉද්ධවිධ ඤාණය උපදවන්නට පරිකර්ම කිරීම කියන එක **ඉද්ධවිධ ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො,** ඉද්ධිවිධ ඤාණයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව.

**චෙතොපරිය ඤාණස්ස පරිකම්මං - චෙතොපරිය ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො,** චෙතොපරිය ඤාණයාගේ පරිකර්ම කිරීම චෙතොපරිය ඤාණයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

**පුබ්බෙනිවාසානුස්සතිඤාණස්ස පරිකම්මං - පුබ්බෙනිවාසානුස්සතිඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො,**

**යථාකම්මූපග ඤාණස්ස පරිකම්මං - යථාකම්මූපග ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො,**

**අනාගතංසඤාණස්ස පරිකම්මං - අනාගතංසඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො,**

ඒ වගේම **පුබ්බෙනිවාසානුස්සති ඤාණය, යථා කම්මූපග ඤාණය අනාගතංස ඤාණය** කියන මේ ඤාණයන් උපදවන්නට ඒ ඒ ඤාණයන්ගේ පරිකර්මයන් උපකාර වෙනව. එතකොට පරිකර්ම ඇති කල්හී තමයි ඒව උපදවන්න පුළුවන්කම තියෙන්නේ.

එතකොට මේවට කියන්නේ අපි අභිඥා ඤාණයන් කියල. ඒ කියන්නේ සුවිශේෂ ප්‍රඥාවක් ඒ ධර්මයන් පිළිබඳව පවත්වන. ඉතින් මේ අභිඥා ඤාණයන් ලබන්නට මේ ප්‍රත්‍යයතාවයේ ක්‍රියත්මක වීම තියෙන්නට ඕනේ. මේ අවස්ථාව වලදි චාතුර්ත ධ්‍යානය උපදව ගත්ත යම්කිසි කෙනෙක් එයා ධ්‍යානයට සමවැදිල ධ්‍යානය පාදක කරගෙන මේ අභිඥා ඤාණයන් උපදවන්නේ එයා ඒ ධ්‍යාන සමාපත්තිය තුළට සමවැදී ඒ ධ්‍යානයෙන් නැගී සිට ඒ පිළිබඳව සිත මෙහෙය වීමෙන් තමයි උපදවන්නේ.

දැන් අපි ගත්තහම බොහෝ අවස්ථාවලදි මේ සඳහා උපකාර වෙනව මේ ධ්‍යාන සඤ්ඤාවන්. නැතිනම් ධ්‍යාන ඕභාසයන් (*ධ්‍යාන ඕභාසය -අවභාසය.* **විදර්ශනාව හොඳින් වඩමින් සිටින යෝගාවචරයාට පමණක් පෙනෙන සෙස්සන්ට නොපෙනෙන ආලෝක විශේෂය)** කියන එක උපකාර කෙරෙනව මේ දිබ්බ චක්ඛු ආදී ඤාණයන් උපදවන්නට. යම්කිසි කෙනෙක් තමන් පරිකර්ම කිරීම ඇතුලේ භාවනාව පුරුදු කරල ඒ ධ්‍යානය උපදව ගත්තට පස්සේ ඒ ධ්‍යාන ඕභාසය තුළ තමයි ඒ දිබ්බ චක්ඛු ආදී ඒ ඤාණයන් උපදවන්නේ. එතකොට යම්කිසි විදියකින් ඒ ඕභාස නිමිති එයා පැතිර වීම් කරන්න පුළුවන් නම් යම්කිසි ප්‍රමාණයකට, තම මනසින් පතුරවන්නට හැකි ප්‍රමාණය ඔහුගේ විෂය ක්ෂේත්‍රය බවට පත් වෙනව. යම්කිසි කෙනකුට තම ඕභාසය පතුරවන්නට පුළුවන්කම තියෙන්නේ තමා වටා තියෙන සුළු ප්‍රමාණයකට නම් එතකොට තමා වටා තියෙන ඒ ප්‍රමාණයට තමයි සිදුවන දේ දැකීමට පුළුවන්කම ඔහුට ලැබෙන්නේ.

ඒ වගේම තමන්ට පුළුවන් නම් ගාමක්ෂේත්‍රයකට පතුරුවන්නට තමන්ගේ සිත එපමණ ප්‍රමාණයකට භාවිත කරපු කෙනකුට ඒ ක්ෂේත්‍ර තුළ සාමාන්‍යය මානුෂීය චක්ෂුසය ඉක්ම වූ දිව්‍යමය වූ චක්ෂුසය භාවිත කරන්නට පුළුවන්කම තියෙනව. ඒ වගේම ඒ ආලෝක සඤ්ඤාව එයාට පහළ කරන්නට පුළුවන් නම් තව විශාල පරිමාවක, සමහර විට යොදුනක් දෙකක් තුනක් මේ විදියට එයාට තමන්ට යම්තාක් දුරකට පතුරවන්න පුළුවන් නම් ඒ පැතිරිවිය හැකි වූ දුර ප්‍රමාණයකට තමයි ඒ පුද්ගලයාට ඒ දිබ්බචක්ඛු ආදී ඤාණයන් ලබන්නට පුළුවන්කම තියෙන්නේ. එතකොට පැතිරවීම අඩු කෙනාට අඩුයි.

ඒ නිසා දිවැස දිබ්බචක්ඛු ඤාණය ලබා ගන්න හැම කෙනකුටම එක ලෙස හැම දේම සිද්ධ කරන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ කියන්නේ හැමෝගෙම දේවල් දකින්නට, ඒ කියන්නේ සාමාන්‍යයෙන් හැම තැනම සිදු වෙන දේවල් දකින්නට

දිබ්බචක්ඛු ඤාණය තිබුණාය කියල ඒ ආයයීන් වහන්සේ නමකට හෝ අභිඥාවක් උපද්දව ගත්ත කෙනකුට හෝ පුළුවන්කමක් ඇත්තේ නෑ. එයාට තියෙනව විෂය ක්ෂේත්‍රය, ඒ විෂය ක්ෂේත්‍රය තුළ දේවල් එයාට කියන්නට පුළුවන්කම තියෙනව. ඒක තමන් සිත දියුණු කිරීමේ පරිමාව අනුව සිද්ධ වන දෙයක්.

එතකොට දැන් දිබ්බචක්ඛු ඤාණය උපදවා ගැනීම සඳහා හිත දියුණු කරන කෙනකුට ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් තියෙනව. මූලික ලෙසම ඔහු විසින් ඇතිකර ගතයුතු තත්ත්වය තමයි අර මුලින් කතා කරපු ආකාරයට එයා ධ්‍යාන උපදවීම සිද්ධ කරන්නට ඕනේ. මොකද සිත විසිරී තියෙන කොට තමන්ට අවැසි විදියට සිත පවත්වන්නට බැරි වෙන කොට සිත එක තැනකට විතරක් කේන්ද්‍ර ගත කිරීමෙහි හැකියාව නැති පුද්ගලයෙකුට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ තමන්ට අවශ්‍ය පරිදි දේවල් සිද්ධ කරන්නට. ඒ නිසා සිත කර්මණ්‍යයි කියල කියන්නේ තමන්ට අවශ්‍ය පරිදි හසුරුවන්නට පුළුවන් දෙයක් බවට පත් කර ගන්නව කියන එක. ධ්‍යානයන් තුළින් ඇතිකර ගන්නේ අන්න ඒ කර්මණ්‍ය අවස්ථාව.

තමන්ට රුචි පරිදි තමන්ගේ සිත පැවැත්විය හැකි තැනකට පත්කර ගැනීම කියන දේ තමයි ඒ ධ්‍යානයන් තුළ සිද්ධ වෙන්නේ. ඉතින් චාතුර්ත ධ්‍යානය උපද්දව ගත්ත කෙනෙක් අන්න අර විදියට එයින් නැගී සිටිමින් ආලෝකය පතුරවමින් තමන්ගේ ඒ ස්වර්ණ වූ ද දුර්වර්ණ වූද මානුෂීය ඇසකට හසු නොවන ආකාරයේ රූප දැකීම සඳහා තම සිත මෙහෙවා බලන කල, ඒ පුද්ගලයට පුළුවන්කම තියෙනව ඒ ඉතාමත් සූක්ෂම වූ ද, තම ප්‍රකෘති ඇසට නොපෙනෙන්නා වූ ද රූප දකින්නට පුළුවන්කම තියෙනව. ඒක සිත දියුණු කිරීම තුළ ලැබෙන දෙයක්.

එතකොට දැන් යම්කිසි කෙනකුට **තිරොපාකාරං**, ඒ කියන්නේ ප්‍රාකාරයේ විනිවිධ දකින්නට අවශ්‍ය නම් දැන් බිත්තියෙන් එහා පැත්තේ වෙන්නේ මොකද්ද වෙන්නේ කියල අපිට පේන්නේ නෑ ප්‍රකුති ඇසකට. හැබැයි දිබ්බචක්ඛු ඤාණ උපදව ගත්ත කෙනකුට එබඳු දෙයක් දකින තැනකට තම සිත පත්කර ගන්නව කියන එක කරන්නට පුළුවන්කම තියෙන දෙයක්. ඒක සිද්ධ කරන්නේ ප්‍රකුති ඇහෙන් ලැබෙන දෙයක් හැටියට නෙමෙයි. ප්‍රකුති ඇහේ අත්දැකීම් උපකාර වීම එතන නැතුවා නොවෙයි. හැබැයි ඒක දකින්නේ එයා තමන්ගේ චිත්ත ශක්තිය උපකාර ගෙන. සිත මුල් කරගෙන.

අර ධ්‍යාන ආලෝකය පැතිරවීම තුළ ඒ ආලෝකය, දැන් අපි ගත්තහම අන්ධකාර රාත්‍රියක අපිට මොනවත් පෙන්නේ නෑ ඇස් දෙකට. අන්ධකාරයම පමණයි පේන්නේ. වස්තූන් පේන්නේ නැහැ. ඒ වගේ තමයි ඔබට ඔබේ ඇස් දෙක ඉදිරිපිට නිතරම ඔබට අන්ධකාරයක් පවතිනව. ඒ අන්ධකාරය තමයි හැම වෙලාවකදිම ඔබේ ප්‍රකෘති ඇහැට ඒ බාහිර තියෙන වස්තූන්ගේ ඒ ප්‍රමාණයන්ගෙන් සීමාවකට පත්වෙලා තියෙනව. ඒ සීමාව කියන එක අපි අන්ධකාරය විදියට සැලකුවොත් ඒ සීමාවේ ඇතුලේ විතරයි ඔබට දකින්නට පුළුවන්කම තියෙන්නේ. එතනින් එහාට දෙයක් දකින්න පුළුවන්කමක් ඇත්තේ නෑ.

කාමරයක් ඇතුලේ ඉන්න ඔබට ඒ කාමරයේ ප්‍රදේශයෙහි ලැබෙන දේවල් ටික විතරයි ඇස් දෙකට දකින්නට පුළුවන්කම තියෙන්නේ. ඒක හරියට අන්ධකාරයක් වගේ. ආලෝකයක් පහළ කර ගත්තහම ඒ කියන්නේ ඔබට එක තැනකට පමණක් වදින ආලෝකයක් තියෙන විදුලි පන්දමක් ලැබෙනව. ඔබ විදුලි පන්දම ගහන කොට ඒ ආලෝකය වදින වදින පැත්ත ඒ ප්‍රදේශය ඔබට ඉතාම හොඳින් දර්ශනය වෙනව. අන්න ඒ වගේ සිත දියුණු කර ගැනීම කියන එක අර විදුලි පන්දමක් ගත්ත වගේ දෙයක්. ඒක පතිත කරන ප්‍රදේශය තමන්ට හොඳින්

දර්ශනය වෙනව වගේ අර සිත දියුණු කිරීම කියන එකේ දි අර මානුෂීය ඇස ඉක්මවා ගිහිල්ල එයා ඒක පතිත කරන තැන එයාට ප්‍රකටව පේනව. එතකොට ඒ පෙනීම සඳහා උපකාර වෙන්නේ මොකද්ද කියල බැලුවොත් අර ධ්‍යානය තුළ උපදව ගත්ත ආලෝකය තමයි එයාට ඒ සඳහා උපකාර වෙන්නේ තමන්ගේ සිත තුළ උපදව ගත්ත ශක්තියක් හැටියටයි ඒ ලෙසට සිද්ධ වෙන්නේ. ඉතින් මේක තමයි දිබ්බචක්ඛු ඥාණය කියල කියන්නේ.

**ඉතින් මේ දිබ්බචක්ඛු ඥාණයෙහි ප්‍රභේදයන් අපිට තව දකින්න පුළුවන්කම තියෙනව. නමුත් ප්‍රධාන වශයෙන්ම මෙන්න මේ දිබ්බචක්ඛුව අපිට මෙතනදි වැදගත් වෙන්නේ මේ කියන දිබ්බචක්ඛු ඥාණය උපදවන්නට තමන්ගේ සිත පුරුදු කරන්නට ඕනේ. ඒ සඳහා පරිකර්ම කරන්නට අවශ්‍යයි. ඒ සඳහා නැවත නැවත සිත භාවිත කිරීම කරන්නට අවශ්‍යයි. ධ්‍යාන ලබා ගත්ත කෙනකුට වුණත් නිකම්ම දිබ්බචක්ඛු පහළ වෙන්නේ නැහැ ධ්‍යාන තිබුණ කියල. ධ්‍යාන තිබුණ කියල එයාට ඍද්ධි ප්‍රාතිහාර දක්වන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. හුදෙක්ම ඒක ඔහුගේ පුද්ගලික ගුණයක් විතරයි. ඔහුට ධ්‍යානය ලබා ගන්නට පුළුවන්. ඒකට සමවදින්න පුළුවන්. ඒක තව කෙනකුට එක බාහිරෙන් බලල කියන්න පුළුවන්කමක් ඇත්තේ නෑ. බාහිර පෙනුමෙන් ඒක වෙනස් කරල දක්වන්න පුළුවන්කමක් ඇත්තේ නෑ ධ්‍යානය කියන එක.**

හැබැයි මේ ඍද්ධි විෂය කියන එකේදී එයාට තව කෙනකුට දක්වන්න පුළුවන්කම තියෙන දෙයක් ඒක. තව කෙනකුට ඒක දක්වන්න පුළුවන්කම තියෙන දෙයක්. ඒක ධ්‍යානලාභී හැමෝටමත් කරන්න බෑ. එයින් මම අදහස් කලේ ඒ සඳහාම විශේෂයෙන්ම තමන්ගේ හිත පුරුදු කිරීම කරන්න ඕනේ. ඒ සඳහා විශේෂයෙන්ම තමන්ගේ සිත පුහුණු කරන්නට ඕනේ. අර ප්‍රථම ධ්‍යානය ලබා ගත්ත කෙනෙක් ද්විතිය ධ්‍යානය සඳහා සිත

පුරුදු කරනව. මෙන්න මේ විදියට ඒ පුරුදු කලා ලෙසම එයා චතුර්ත ධ්‍යානය ලබා ගත්ත කෙනෙක් අන්න ඒ සිත ඉතාම පිරිසිඳු බවට පත්වෙලා කෙලෙස් සංගන රහිත වුණ තැනට පත්වුණාට පස්සේ එයා මේ මිනිස් ඇස ඉක්ම වූ දිවැස ලැබීම සඳහා එයාගේ සිත මෙහෙය වීම කරනව.

එයා ඉතාමත් ස්වණ දුර්වර්ණ තමන්ගේ ප්‍රකෘති ඇසට නොපෙනෙන එබඳු රූප දැකීම සඳහා උත්සාහවත් වෙනව. ඉස්සෙල්ලාම එයාගේ භාවිත කිරීම සිද්ධ කරන කොට ඉතාම රළු මට්ටමෙන් එයාට පුළුවන් පරිකර්ම කරන්නට. ඒ කියන්නේ රළු මට්ටමේ දේවල් දකින්නට එයාට පුළුවන්කම තියෙනව. ඒ කියන්නේ තමන්ගේ පරිසරයෙහි වටේට තමන්ගේ සීමාවෙන් ඔබ්බේ තියෙන දේවල් ඒ කියන්නේ තමන් ඉන්නේ කාමරයක නම් ඒ කාමරයෙන් එළියේ තියෙන දේවල්, අන්න ඒ වගේ දේවල් දකින්නට උත්සාහවත් වෙනව. මෙන්න මේ ආකාරයට එයා දර්ශනයක් ඇතිකර ගන්නව ඒක නුවණ මුල් කරගෙන නැතිනම් සමාධිය මුල් කරගෙන ඇතිකර ගන්න දර්ශනයක් විදියට.

එතකොට මේ සඳහා තමන්ගේ මනස භාවිත කරනව කියල කියන්නේ, මේ සඳහා තමන්ගේ මනස පුහුණු කරනව කියල කියන්නේ, අන්න ඒ භාවිත කිරීම පුහුණු කිරීම කියන එකට අපි පාවිච්චි කරනව පරිකර්ම කරනව කියල. ඒ පරිකර්ම කරන එකට දිබ්බචක්ඛු ඤාණය කියන එක අන්න ඒ පුරුදු කරන අවස්ථාවෙදි අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව මේ පරිකර්ම අවස්ථාව අර දිබ්බචක්ඛු ඤාණය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණ බව. එහෙනම් මේ උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙලා තියෙන්නේ අර පරිකර්මය කියන එක. පරිකර්මය ප්‍රත්‍යය. දිබ්බචක්ඛු ඤාණය කියන එක පච්චුප්පන්නය. ප්‍රත්‍යය ශක්තිය බවට පත් වුණේ මේක ඒ තරමට ප්‍රත්‍යය බවට පත් කිරීම කියන

එක සිද්ධ කලේ උපනිස්සය කියන දෙයින්. ඒ නිසා ඒක උපනිස්සය ප්‍රත්‍යයතාවය කියල හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම දිබ්බසොත ඤාණ ආදී ඤාණ ඉපදවීම පිළිබඳව අපි බලන කොටත් එබඳු ආකාරයටම යම්කිසි කෙනෙක් තමන්ගේ සිත පඤ්චම ධ්‍යානයට පත් කර ගෙන ඊට පස්සේ පඤ්චම ධ්‍යානය උපදවා ගෙන ඊට සමවැද ඒක වසීකෘත කරල එයින් නැගී ඉඳල වෙනමම දිබ්බසොතය උපදවන්නට ඔහුට උත්සාහවත් වෙන්නට වෙනව. එතකොට අපිට සාමාන්‍යයෙන් පුළුවන් ලඟ ඇහෙන ශබ්ද අහන්න නේ, ඒ කියන්නේ දුර පවතින්නා වූ බොහොම රළු නොවූ ශබ්ද අපිට ඇහෙන්නේ නෑනේ දුර තියෙන.

ඉතින් මෙන්න මේ විදියට අපිට පුළුවන්කම තියෙනව දිබ්බසොතය උපදව ගත්ත කෙනකුට සාමාන්‍යය කන ඉක්මවා එයාට මේ ශබ්ද ඇහීම සඳහා හිත පුරුදු කරන්නට. ඉතින් ඒ සඳහා අර ධ්‍යානයට සමවැදිල නැගී ඉඳල එයා ඉතාමත් දුර පවතින ශබ්ද අහන්න තමන්ගේ හිත යොමු කරනව. එතකොට පඤ්චම ධ්‍යානය උපචාර වශයෙන් පහළ වෙලා ඒ සඳහා කරන පරිකර්ම අවස්ථාවක් විදියට ඒ පඤ්චිම ධ්‍යානය උපචාර වශයෙන් පහළ වීමෙන් පස්සේ එයාට යම්කිසි ශබ්දාරම්මණ ගනිමින් සිත පහළ වීම සිද්ධ වෙනව. මනෝද්වාරිකව ඒ සිත් ඉපද නිරුද්ධ වෙන කොට ශබ්දාරම්මණ ගනිමින් ඒ සිත පහළ වීම සිද්ධ වෙනව. එතකොට ශබ්දාරම්මණ කියන්නේ ඉතාමත් දුර පවතින ශබ්දයන් තමන්ගේ සිතෙන් අරමුණු කිරීම කියන එක තමයි එතනදි සිද්ධ වෙන්නේ.

ප්‍රකෘති කණෙන් ද අහන්නේ කියල ඇහුව්වොත් එකලෙස කියන්නට පුළුවන්කමක් නෑ එයා ශබ්දේ අහන්නේ ප්‍රකෘති කණෙන් කියල. ඒ නිසා එතන වැඩිපුරම තියෙන්නේ මානසික

ක්‍රියාකාරිත්වය කියන දේ. එතකොට එයා මේ කණේ අත්දැකීමක් නැතුව දිබ්බසොතය උපදවන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ ප්‍රකෘති කනෙහි උපකාරී බවක් නෑ කියල කියන්නේ නෑ. හැබැයි වැඩිපුර මුල් වෙන්නේ ද්වාරයක් විදියට මනෝද්වාරය තමයි ඒ දිබ්බසොතය ඉපදවීම සඳහා මුල් වෙන්නේ.

එතකොට එකෙදි මේ කනට ඒ ශබ්ද තරංගයෙහි පැමිණීමක් අවශ්‍ය වන්නේ නැහැ. ඒ නිසා මේ බොහෝ දුර පළාතක කෙනෙක් වුණත් කතා කරන දෙයක් මේ කනට ඇහෙන්න හා සමානව අහන්න පුළුවන්කම තියෙනව. මොකද ඇහෙන්නේ කනට නෙමෙයි. ගොඩාක් වෙලාවට අපි කතා කරනව ඇහෙන්නේ කනට තමයි කියල. හැබැයි අපි අහන්නේ හැම වෙලාවකදිම ඇසීම කියන දේ සම්පූර්ණ වීමේදී එතන තියෙන්නේ සම්පූර්ණවම මානසික බලපෑමක්. ඇසීම කියන එක සම්පූර්ණ වෙන්නේ කනත් ශබ්දයත් සොතවිඤ්ඤාණයත් එක්කනේ. එතකොට ඒ විඤ්ඤාණය විජානන කෘත්‍යත් එක්ක තමයි ඇසීම කියන එක සම්පූර්ණ වෙලා තියෙන්නේ. ඒ කියන්නේ මානසිකව ස්පර්ශය කියන දේ මුල් කරගෙන තමයි අපිට ඇහීම කියන දේ සිද්ධ වෙලා තියෙන්නේ. මේ තුන් දෙනකුගේ ස්පර්ශය කියන දේ මුල් කරගෙන. එතකොට මේකෙදි දිබ්බසොත කියන එක භාවිත වෙන්නේ.

එතකොට ඒ දිබ්බසොතය කියන එකට මුල් වෙලා තියෙන්නේ එයාගේ මනින්ද්‍රියම තමයි එතනදි මූලිකත්වය ලැබිල තියෙන්නේ. අර පඤ්චම ධ්‍යානය පාදක කර ගත්ත බව. ඊට පස්සේ ශබ්දයත් මනෝ විඤ්ඤාණයත් කියන මේ ටික යෙදුනට පස්සේ එයාට ඒ ශබ්දය පිළිබඳව දැන ගන්නට පුළුවන්කම ලැබිල තියෙනව. ඉතාමත් දුර පවතින ශබ්ද වුවද ඔහුට එතනදි විජානනය කරන්නට දැන ගන්නට පුළුවන්කම ලැබිල තියෙනව. ඒකට කියන්නේ දිබ්බසොතය කියල. හැබැයි එකෙදිත් අර පැතිරවීම කියන එක ඔහුගේ විෂය පරාසයට අයිති වෙනව. අර මුලින්

දිබ්බචක්ඛු වලදි කතා කලා වගේම ඒ විෂය පරාසයට අදාළව තමයි කෙතෙක් දුරට ඔහුගේ සමාධිය බල පවත්වන්නට පුළුවන්ද කියන එක මත පදනම්ව තමයි තීරණය වෙලා තියෙන්නේ ඔහුගේ සමාධිය කොපමණ දුරකට ඔහු පවත්වනවා ද කියන එක තීරණය වෙලා තියෙන්නේ. ඒ නිසා ඒක දිබ්බසොතය ඉපදවීම ගැනත් එලෙසට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඒ පරිකර්ම කිරීම කියන එක දිබ්බසොතය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

ඒ වගේම ඉද්ධිවිධ ඤාණය කියල කියනව නොයෙක් ආකාරයට ඍද්ධි ප්‍රතිහාරය දැක්වීම කියන එක. ඒ කියන්නේ තමන්ගේ රූප මවල පෙන්වනව. ඔය ආකාරයට තමන්ගේ සිත භාවිත කිරීම කියන එක සිද්ධ කල කෙනකුට දක්වන්නට පුළුවන් විවිධ ආකාරයේ දේවල් තියෙනව. මේ කය අපි උඩින් අරගෙන යනව. ඒ වගේම පොළවේ ඇතුලේ ගිලෙනව සේ දක්වනව. මේ වගේ විවිධ ස්වරූපයන්ට පත් කිරීම, විවිධ දේවල් වෙනස් කිරීම් ආදිය දේවල් ඉද්ධිවිධ ඤාණයට ඇතුළත් වෙනව.

ඉතින් ඉද්ධිවිධ ඤාණය කියන එක ලබා ගන්න ඤාණයක්. අභිඥාවක්. ඒක ලබා ගැනීම සඳහා අර ධ්‍යාන ඉපදවීම කියන එක සිද්ධ කරන්නට ඕනේ. මොකද කර්මණ්‍ය නොවූ මනසින් කල හැකි කිසිම දෙයක් ඇත්තේ නැහැ. ඉතින් සිත ඒ සඳහා කර්මණ්‍ය කරන්නට ඕනේ. ඒ කර්මණ්‍ය කරල ඉද්ධිවිධ ඤාණය ඉපදවීම සඳහා එයා සිත පරිකර්ම කරන්නට ඕනේ. ඒකට හිත පුරුදු කරන්නට ඕනේ. ඒ නිසා ඒ පරිකර්ම කරන අවස්ථාවකදී එයා මේ කයට සිත බහාලනව. සිතට කය බහාලනව.

දැන් ස්වභාවයෙන්ම අපේ තියෙන්නේ මේ කයට සිත බැහැලී තියෙන්නේ. ඒ නිසා අපේ හිතේ සීමාව මේ කයේ සීමාවට සීමා වෙලා තියෙනව. ඒ නිසා තමයි මේ කොහෙ හරි යනව නම් මේ කය උස්සගෙනම යන්න ඕනේ. කොහෙට හරි යනව නම් මේ

කය උස්ස ගෙනම යන්න ඕනේ. ඇයි? මේ හිත මේ කයේ හැකියාවට අද සීමා වෙලනේ තියෙන්නේ. ඒ නිසා මේ කය ඔසව ගෙන යන්න ඕනේ.  හැබැයි ඉද්ධිවිධ ඤාණය තියෙන කෙනාට එයා මේ කයට සිත බැහැලීම විතරක් නෙමෙයි, සිතට කය බැහැලීමත් කරනව.

එතකොට දැන් ඔබට රුවන්මැලිසෑය අරමුණු කරන්න අවශ්‍ය නම් දැන්  රුවන්මැලිසෑය අරමුණු කරන්න මේ කය අරගෙන එතෙන්ට යන්න ඕන නැහැනේ. සිතෙන් අරමුණු කරන්න පුළුවන්කම තියෙනව. අන්න ඒ සිතේ වේගයෙන්. එතකොට දැන් ඒකට කොච්චර වේගයක්ද ඔබට යන්නේ රුවන්මැලිසෑය අරමුණු කරන්න. එක ක්ෂණයක් යයි. එක මොහොතක්. එපමණ වේගයකින් ඔබට ඒ හිතට කය බහාලා තියෙනව නම් මේ කය රුවන්මැලිසෑය ලඟ පහළ කරනවා කියන එක අපහසුවක් නැතුව කරන්න පුළුවන්කම තියෙන දෙයක්. ඒක මේ ඉද්ධිවිධ ඤාණය ඇතුලේ තියෙන තාක්ෂණය.

එතකොට මේ සඳහා තම සිත පුරුදු කරන්නට ඕනේ. එහෙනම් සිත කර්මණ්‍ය කරන්නට ඕනේ. සිත කායික සීමාව ඇතුලෙත් කායික සීමාව කියන එක සීමාවක් නොකට හිත ඒකෙන් එලියට අරගෙන, ඒ කියන්නේ තමන්ගේ කය සිත ඇතුලට බහලා. එතකොට සිතේ හැකියාව අනුව මේ කය පරිහරණය කරනව කියන එක කරන්න පුළුවන්කම තියෙන දෙයක්. මේ කය තමන් කැමති සේ කරන්න පුළුවන්. මේක උඩට අරගෙන යන්න ඕනේ නම් මේක පොළවේ ගිලෙන ආකාර දක්වන්න පුළුවන් නම් මේක විවිධ ස්වරූපයන්ගෙන් දක්වන්න පුළුවන් නම් අවකාස ධාතුව ඇසුරු කරගෙන තව මෙබඳු ආකාරයේ රූප මැවීම් කරන්නට පුළුවන් නම් ඒ හැම දෙයක්ම තමන්ගේ සිතේ තියෙන දියුණුවත් එක්ක කරන්නට පුළුවන්කම තියෙනව. ඒක ඉද්ධිවිධ ඤාණයක්.

මේකෙන් කියන්නේ ධ්‍යාන ලබා ගත්ත හැමෝටම ඉද්ධිවිධ ඤාණය තියෙනව කියන එක නෙමෙයි. වෙනම ඒ සඳහා තම සිත පරිකර්ම කරන්නට ඕනේ. ඒ කියන්නේ වෙනමම සිත එතනට පුරුදු කරන්නට ඕනේ. පුරුදු කිරීමක් නැතුව ඒ සිතේ එහෙම පැනවීමක් පෙන්නේ නැහැ. ඒ නිසා සිත අනිවාරයෙන්ම ඒ සඳහා භාවිත කිරීම සහ පුරුදු කිරීම කියන එක සිදුවිය යුතු සිදු කල යුතු දෙයක්. අන්න ඒ පුරුදු කිරීම කියන එක ඉද්ධිවිධ ඤාණයට ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව.

ඒ වගේම චෙතොපරිය ඤාණය කියල කියන්නේ අනුන්ගේ සිත් දැන ගැනීම කියන එක. ඒකත් අර වගේම ධ්‍යානයට සමවැදිල නැගී ඉඳල ඊට පස්සේ නැවත අපි යම්කිසි කෙනකුගේ සිත අරමුණු කරනව නම් ඔහුගේ සිත අරමුණු කරමින් නැවත අර පරිකර්ම කිරීම කියන එක සිදු කරමින් තමයි මේ සමාධිය උපදවන්නේ. ඉතින් මෙබඳු අවස්ථා වලදී අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව ඒ සෑම අවස්ථාවකදීම චෙතොපරිය භාවය. අනුන්ගේ සිත පිරිසිඳ දැකීම කියන එක. තමන්ගේ සිතෙන් **චෙතොපරිඤ්ච පරිජානාති** කියල කියනව. තමන්ගේ සිතෙන් අනුන්ගේ සිත පිරිසිඳ දැකීම සිද්ධ කරනව.

එතකොට තමන්ගේ සිතෙන් අනුන්ගේ සිත පිරිසිඳ දකිනවා කියන අවස්ථාව සිද්ධ කරන කොට ඒ සෑම තැනකදීම සිදුවෙන කාරණාව තමයි ඒ තමන්ගේ සිතේ දියුණුව තුළ අනුන්ගේ චේතනාවෙහි පැවැත්වීම කියන දේ අරමුණු කරන්නට පුළුවන්කම තියෙනව. ඒක වෙනම විශේෂයක්. ඒකටත් අර පරිකර්මය ප්‍රත්‍යය වීම සිදු කරනු ලබනව.

ඒ වගේම **පුබ්බෙනිවාසානුස්සති ඤාණය** කියන එක. ඒ කියන්නේ පෙර විසූ කඳ පිළිවෙල පිළිබඳව ස්කන්ධ පරම්පරාව පිළිබඳව සිහි කරනවා කියන එකත් විදියටම තමයි. ඒ සඳහා

තමන්ගේ  සිත වෙනම පුරුදු කිරීම කියන එක සිද්ධ කරන්නට අවශ්‍යයි.

ඒ වගේම **යථාකම්මූපග ඤාණය** කියල කියනව අර තමන් පෙර කලා වූ කර්මයන් පිළිබඳව සිහි කරන්නට පුළුවන්කම. මෙබඳු වූ කර්ම කරල මෙබඳු වූ විපාක ලැබුණා. මෙබඳු වූ කර්මයන් කරල මෙබඳු වූ විපාක ලැබුවාය කියල පෙර කල කර්මයන් පිළිබඳව සිහි කරන්නට පුළුවන්කම සහ සිහි කරනකම තමයි **යථාකම්මූපග ඤාණය** කියල කියන්නේ. ඉතින් මේ යථාකම්මූපග ඤාණයත්  ඒ වගේම චෙතොපරිය ඤාණය කියන එකත් අපිට ගොඩක් වෙලාවට දකින්නට පුළුවන්කම තියෙනව මේ දිබ්බචක්ඛු ඤාණයෙහිම සංග්‍රහ වන සහ දිබ්බචක්ඛු ඤාණයෙහිම ඇතුළත් වන කොටස් විදියටත් අපිට දකින්නට පුළුවන්කම තියෙනව. ඒ කියන්නේ දිවැස කියන එකේදී අපිට අතීත ස්කන්ධයන් පිළිබඳව දකින බවත් දිවැසටම ඇතුළත් කරල දිබ්බචක්ඛු ඤාණෙහිම සංග්‍රහ වන බව අපිට දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඉතින් මෙන්න මේ ආකාරයන්ගෙන් අපිට මේ සිත දියුණු කරන අවස්ථාවලදි සිත වඩන අවස්ථාවලදි ඒ පරිකර්ම අවස්ථාවන් අභිඥා ඤාණයන්ට ප්‍රත්‍යය වෙනව උපනිස්සය ප්‍රත්‍යය විදියට. පරිකර්ම අවස්ථාවන් අභිඥා ඤාණයන්ට ප්‍රත්‍යය වෙනව අභිඥා ඤාණයන් ඉපදවීම කියන දේ සිද්ධ කරනව උපනිස්සය ප්‍රත්‍යය ප්‍රත්‍යයක් හැටියට යෙදීම මුල් කරගෙන. උපනිස්සය ප්‍රත්‍යය කියන එකේ විශේෂත්වය පිළිබඳව තේරුම් ගන්න කොට මෙන්න මේ විදියට සමීපව තව ධර්මයන් ඉපදවීම කියන අවස්ථාව තමයි ඔබ හඳුනාගන්නට ඕනේ මූලික ලෙසම හඳුනා ගැනීමේදී.

ඉතින් මෙන්න මේ ආකාරයට ඒ තැන් උපදවන්නට ප්‍රත්‍යය වෙනව වගේම මේකේ තියෙන ඊළඟ ලක්ෂණය තමයි

**දිබ්බචක්ඛු දිබ්බාය සොතධාතුයා උපනිස්සය පච්චයෙන පච්චයො.** දිබ්බචක්ඛු ඤාණය දිබ්බසොත ධාතුව උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

**දිබ්බසොත ධාතු ඉද්ධිවිධ ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** ඒ කියන්නේ දැන් දිබ්බචක්ඛු ඤාණය කියන එක දිබ්බසොත ඤාණය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. ඒ වගේම දිබ්බසොතය ඉද්ධිවිධ ඤාණය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මෙන්න මේ විදියට ඒ ඒ ඤාණයන් ඒ ඒ දේට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. ඒ කියන්නේ දැන් දිබ්බචක්ඛු ඤාණය ඇයි දිබ්බසොත ඤණයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ? දිබ්බචක්ඛු ඤාණය කියන්නේ, ඉස්සෙල්ලම කෙනෙක් උපදවන්නේ බොහෝ සෙයින් දිබ්බචක්ඛු ඤාණය. එතකොට එයා බොහෝ දුර තියෙන්නා වූ දේවල් පවා දකින්නට පුළුවන් විදියට පරිකර්ම කරල දිබ්බචක්ඛු ඤාණය උපදවනව.

ඊට පස්සේ දිබ්බචක්ඛු ඤාණයෙන් එයා දුර ඉන්න කෙනෙක්ව දකිනව. ඉතාමත් දුර ඉන්න කෙනෙක්ව එයා දිබ්බචක්ඛු ඤාණයෙන් දිවසින් දකිනව. දැන් දිවසින් දැක්කට ඒ දකින තැන කතා කරන දේ ඇහෙන්නේ නැහැ. ඒ නිසා ඊට පසුව ඔහු ඒ කතා කරන ඒ ශබ්දය ඇසීම සඳහා වෙනම සිත පුරුදු කරනව. එතකොට මොකද වෙන්නේ? එබඳු අවස්ථාවල අර දිබ්බචක්ඛු ඤාණය දිබ්බසොත ඤාණය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණා. උපනිඃශ්‍රය කියන එක්දි අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව එකම ධර්මයක් එකම සිතක් ඒ අනිත් සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම කියන එක, එක දෙයක් හැටියට නෙමෙයි. විවිධ ධර්මයන් ඒ යම්කිසි ඵලයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් විවිධ ආකාරයට උපකාර කරන්නට පුළුවන්. ඒ කියන්නේ උපනිස්සය ප්‍රත්‍යය කියන්නේ ඒක ප්‍රත්‍යයක්. හැබැයි එකක් විතරක් නෙමෙයි

උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ. විවිධ ධර්ම උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙමින් අර ධර්මයෝ උපදවන්නට පුළුවන්කම තියෙනව. ඡන්ද ආදී අනිත් ධර්මත් උපනිස්සය වශයෙන් මේ ධර්මයන් උපදවන්නට ප්‍රත්‍යය වෙනව.

ඉතින් මෙන්න මේ ආකාරයන්ට ගත්තහම උපනිස්සය ප්‍රත්‍යය මුල් කරගැනීම කියන එක ඇතුලේ අපිට ඔය දිබ්බචක්ඛු දිබ්බසොතයට උපකාර වෙනව. ඒ වගේ දිබ්බචක්ඛු දිබ්බසොත දෙක උපකාර වෙනව ඒ නයෙන් ගත්තහම ඉද්ධිවිධ ආදී ඤාණයන්ට. ඒ වගේම ඒ ඤාණයන් අනිකුත් ඤාණයන්ට ප්‍රත්‍යය වන අවස්ථාවන් තියෙනව. ඉතින් මේක මාරුවෙන්න පුළුවන්කමක් තියෙනව. ඉතින් මෙලසට එකිනෙකට ප්‍රත්‍යය වීම කියන එක උපනිස්සය ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යතාවයෙන් අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

මේ තමයි උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන යෙදීම බවට පත්වෙන්නේ. උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන මූලික වශයෙන්ම ප්‍රත්‍යය හඳුනා ගැනිමේදී ඔබට තේරුම් ගන්නට තියෙන්නේ සමීපයෙහි සිට උපකාර කිරීම කියන අර්ථය මේ තුළින් ඔබට වඩාත් හොඳින් තේරුම් ගන්නට දකින්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම අපිට මේ ප්‍රත්‍යයෙහි තියෙන මාර්ගය සහ ඵලය අතර නැතිනම් මාර්ගයට කොහොමද උපකාර කෙරෙන්නේ මොනවද, ඒ වගේම ඵලයට උපකාර කෙරෙන්නේ කොයි ආකාරයට ද කියන එක පිළිබඳව අපිට තව දුරටත් උපනිඃශ්‍රයතාවය තුළ කතා කරන්නට පුළුවන්කම තියෙනව. උපනිස්සය ප්‍රත්‍යයෙහි ඒ යෙදීම් පිළිබඳව අපි ඉදිරියට තව දුරටත් සාකච්ඡා කරමු කරුණු කාරණාවන්.

**සාදු සාදු සාදු**

# 02.03.2024 දින පූජනීය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණ අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසි තුන්වෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සූදානම් වන මොහොත.

ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඒ උතුම් ශ්‍රද්ධර්ම සාගරයෙන් ස්වල්පයක් නමුත් ශ්‍රවණය කරගන්නටයි හැම දෙනාම සූදානම් වන්නේ.

අභිධර්ම පිටකයට අයත් පට්ඨානප්‍රකරණයෙහි දැක්වෙන සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳවයි ඔබ හැම දෙනාම පැහැදිලි කරගන්නට යෙදෙන්නේ මේ දේශනා මාලාව තුළ. සමස්ත පට්ඨානප්‍රකරණය පිළිබඳව අධ්‍යනයක් නොවූවත් සූවිසි ප්‍රත්‍යයන්ගේ මේ ප්‍රත්‍යය යනු කුමක්ද යන්න පිළිබඳව තේරුම් ගත්ත කෙනකුට මේ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ මේ ධර්මය තේරුම් ගැනීම අතිශය පහසුවක් ඇති කරලනව.

ඉතින් එහේදි සුවිශේෂියෙන්ම අපිට සමාජය තුළ විවිධ කෝණයන්ගෙන් විමසා බලන කල ඒ ඇතිවෙන බොහෝ ගැටළු වලට පිළිතුරු ලබා ගන්නට පුළුවන්කම තියෙන්නේ නිවැරදිව ධර්මය ගවේෂණය කිරීම දේ ඇතුළත. ඉතින් අපිට ලැබි තියෙන මූළාශ්‍ර පද්ධතිය තමයි භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාව විදියට මේ ත්‍රිපිටක ධර්මය. එය කාටවත් සොලවාලිය නොහැකි සබුද්ධිකව ප්‍රතික්ෂේප කොට නොහැකි දෙයක් තමයි ත්‍රිපිටක ධර්මය කියල කියන්නේ.

කෙන කෙනාගේ හුදු පුද්ගලික මතවාදයන් අනුව පුද්ගලික අදහස් අනුව මේක බුද්ධ දේශනාව නොවේ. මේ බුද්ධ දේශනාවයැයි මම සංඛ්‍යාවට ගන්නේ නැතය, විවිධ අදහස් ප්‍රකාශ කරන්නට පුළුවන්කම තියෙනව. ඒ ඔහුන්ගේ ඇති බුද්ධියෙහිම ගැටළුවක් විනා දේශනාවෙහි ඇති ගැටළුකාරී තත්ත්වයක් නෙමෙයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ධර්මය නොවෙනස්ව පවත්වාගෙන ඒම සඳහා මහරහතන් වහන්සේලා ඇතුළු ඒ මහා සංඝරත්නය අනන්ත අප්‍රමාණ වෙහෙසක් දැරුවා ගිහි පිරිසත් ඇතුලුව. ඉතින් අද අපිට ලැබිල තියෙන්නේ සංවිදිත ක්‍රමවේදයන් ඔස්සේ නොවූවත් අසංවිදිතව ඉතාමත් පිළිවෙලට ආපු දෙයක්. සංවිදිත භාවය ඇතුලේ යම්කිසි ආකාරයකට ධර්මය වෙනස් වීමට තියෙන ඉඩකඩ බොහොම වැඩියි. එහෙම කිව්වේ කරුණු වශයෙන් සංවිදිත කියන එක නෙමෙයි. පැමිණි පරම්පරාව පැමිණි හුය, වංශය නිසා සංවිදිත වීම කියන දේ මුල් කරගත්තොත් එතන ඇතිවෙන ගැටළුකාරී තත්ත්වයන්.

අපි දන්නව යම්කිසි ග්‍රන්ථයක් මුද්‍රණයට ගැනීම තුළ එයින් පිටපත් ලක්ෂයක් මුද්‍රණය කරල ලෝකේ පුරා බෙදා හැරීම් ඇතුළත, ඒ මුල් පිටපතේ එක අකුරක් එක වචනයක් වැරදුනොත්, ඒ පිටපත් ලක්ෂයේම ඒ අකුර ඒ වචනය වැරදිනව. ඒක තමයි එහි ස්වභාවය. ඒකයි කිව්වේ සංවිදිත වෙන කොට ඒකේ ඇතිවෙන ගැටලුකාරී තත්ත්වයන් අපිට ඇතිවන අයහපත් දේ බොහෝ තියෙනව. අසංවිදිත වෙන කොට මූල දේ මුල් කරගෙන, මහ රහතන් වහන්සේලා පන්සිය නමකගේ මූළයෙන් පටන් ගත්ත මේ ධර්මය, ඊට පස්සේ පරම්පරාවෙන් පරම්පරාවට එන කොට ඒක අසංවිදිතයි. එතකොට ඒක, එක එක භික්ෂූන් වහන්සේලා වෙන වෙනම සංග්‍රහ කරගෙන ආවේ. වෙන වෙනම පොත්පත් වල ලිය වුණේ. වෙන වෙනම පැතිවල ඒක සංග්‍රහ වුණා. වෙන වෙනම පැතිවල ලිය වුණා.

ලංකාව පුරාවටම ව්‍යාප්ත වෙලා ලංකාව පුරා තිබුණ බොහෝ විහාරස්ථාන වල ඒ ධර්මය වෙන වෙනම ඒ පොත්පත් ලිය වෙන්නට පටන් ගත්තා. පිටපත් විදියට සකස් වුණා. අපි සරල උදාහරණයක් හැටියට කිව්වොත් දීඝනිකාය කියල ගත්තහම, දීඝනිකාය ඒ පොත අනුරාධපුරයෙහි තියෙන පිටපත ගත්තහම අනුරාධපුරේ බොහෝ විහාරස්ථාන වල භික්ෂූන් වහන්සේලා අර මුල් පොතෙන් බලාගෙන එක පිටපත් කර ගත්තා. ඒ වගේම මාතරෙන් වැඩම කල ස්වාමීන් වහන්සේලා ඒ පිටපත් එහාට අරගෙන ගියා. ඊට පස්සේ ඒ පොත දිහා බලාගෙන එහි නැවත නැවත පොත් පරම්පරාවක් බිහිවුණා.

දැන් ඔහොම ඔය පරම්පරාව පරම්පරාව පැතිරී යන කොට අර පසු කාලීනව මුල ග්‍රන්ථයන් සහ අර පරම්පරාව අතර සම්බන්ධතාවය ගොඩ නගන කොට, මේ ඔක්කොම එක ළඟට අරගෙන හොයා බලන කොට, මේ එකින් එකට වෙනස් වෙලා නම් එකම වචනයක් එකම විදියට අර කිසිඳු සම්බන්ධතාවයක් නැති අය විසින් වරද්දනව කියන එක ඒක සාමාන්‍යයෙන් අසම්භවයක්.

ඒක නොවීමට තියෙන ඉඩකඩ තමයි වැඩි. අන්න ඒ විදියට තමයි මේ ධර්මය පැවත ගෙන ආවේ. ඒකෙන් අත හැරෙන්නට ඉඩක් තිබුණේ නෑ. බණවර වචන පවා මේකේ ගණන් කරල, අකුරු පවා ගණන් කරල, ඒ විදියට තමයි මේක මුඛ පරම්පරාගතව පවා පවත්වා ගෙන ආවේ. ඒ නිසා පිරිසුදු බුද්ධ වචනය කියල අපි යම් තැනක් ගවේෂණය කරනව නම් යම් තැනක් හොයනව නම් ඒ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව බවට පත්වුණේ මේ පැහැදිලි ත්‍රිපිටක ධර්මයම තමයි. එයට අනුගතව තමයි සියලු කරුණු අපි ගලපා තේරුම් ගත යුතු වන්නේ. ඒකත් ප්‍රතික්ෂේප කරනව නම් ඒක පිටක දෙකක් කරනව නම් කවුරු හරි ඒකෙන් තව තව කොටස් අයින් කරල ඒ දෙකෙනුත් කෑලි කෑලි අයින් කරනව නම් කවදාවත් ඒ ධර්මය

පිළිබඳව අවබෝධයක් තියෙන හෝ සබුද්ධික පුද්ගලයෝ නෙමෙයි.

ඒ නිසා එබඳු තැන් වලින් ඔබ ඉතාමත් ප්‍රවේසම් වන්නට ඕනේ. එබඳු තැන් වලට ධර්මය ඇසීම සඳහා යොමු වෙනව නම් ඔබත් ධර්මය වරදවා ගෙන තවත් බොහෝ දෙනකුට දහම් මග වරදවන්නට එය හේතුවක් බවට පත්වන්නට පුළුවන්කම තියෙනව. ඒ හින්දා කවුරු හරි මේ ත්‍රිපිටකය ඉවත් කොට දෙපිටකයක් කරන්න උත්සාහවත් වෙනව නම් ඒක බුද්ධි ගෝචර දෙයක් නෙමෙයි. බුද්ධිමත් ක්‍රියාවක් බවට පත්වන්නේ නෑ.

ඉතින් කෙසේ වෙතත් දැන් අපි අභිධර්ම පිටකය පිළිබඳව කතා කලේ. එහි තියෙන වැදගත් කම තමයි බොහෝ දහම් ගැටළු අතර පවතින ඒ පිළිතුර නිවැරදිව සපයා ගන්නට අපිට පුළුවන්කම තියෙනව මේ අභිධර්මය හාත්පස අවබෝධ කර ගැනීම තුළ. ඒකට හේතුව තමයි භාග්‍යවතුන් වහන්සේ දේශනා කල ධර්මය, සූත්‍ර පිටකය තුළ සංග්‍රහ වෙන සූත්‍ර තුළත්, අභිධර්ම පිටකය තුළ තියෙන න්‍යායාත්මකව සඳහන් කාරණා ඇතුළෙත් මේ එකම ධර්මය තමයි අන්තර්ගතව තියෙන්නේ. දැන් සූත්‍රයෙහි විහිත කාරණාවන් අපිට තව දුරටත් විස්තරාත්මකව බෙදා දක්වා ගත යුතු න්‍යාය දැක්වෙන්නේ අභිධර්මය ඇතුළේ.

දැන් චතුරායයී සත්‍යය ධර්මය පිළිබඳව පැහැදිලි අවබෝධයකට අපිට යන්නට අවශ්‍ය නම් ඒ යායුතු පැහැදිලි අවබෝධය අපිට ගන්නට සිද්ධ වෙන්නේ අභිධර්ම ඥාණයත් එක්ක. ඒක නැතුව ගියොත් අපි ධර්මය වරදවා ගන්නව. ඒ හේතුව නිසා මේ ත්‍රිපිටකයේ කොටසක් අපිට ඉවත් කරන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ.

ඉතින් අභිධර්මය පිළිබඳව විමසා බැලීමේදී එහි විශේෂ කොටසක් නියෝජනය කරන මේ ධර්මයක් තියෙනව. ඒ තමයි

පට්ඨාන ධර්මය කියල කියන්නේ. මේ පට්ඨාන ධර්මය තුළ විග්‍රහ වන්නේ මූලික ලෙසම මේ සූවිසි ප්‍රත්‍යය විභාගය ඇතුලේ භාග්‍යවතුන් වහන්සේගේ විස්තාරිත හේතුඵල ධර්ම විග්‍රහය විදියටයි අපිට මේ ධර්ම විග්‍රහය දකින්නට පුළුවන්කම තියෙන්නේ.

එය තේරුම් ගැනීමට ඔබට පහසු වන ලෙස තමයි මේ සූවිසි ප්‍රත්‍යයන් අපි හඳුනාගන්නේ. හඳුන්වන්නට යෙදෙන්නේ. පසුගිය දේශනාවන් තුළත් අපි පැහැදිලි කරන්නට යෙදුනා උපනිස්සය ප්‍රත්‍යය සහ එහි භාවිතය පිළිබඳව. උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව සහ එහි භාවිතය පිළිබඳව කතා කිරීමේදී අපි අවසාන වශයෙන් දිබ්බචක්ඛු ඤාණය කොහොමද එහි පරිකර්මය උපනිඃශ්‍රය කරගෙන උපදින්නේ. ඒ සඳහා තමන්ගේ මනසින් කරන පරිකර්මය මුල් කරගෙන කොහොමද දිබ්බචක්ඛු ඤාණය උපදින්නේ. ඒ වගේම දිබ්බසොත ඤාණය නැතිනම් දිබ්බසොතය කොහොමද උපදින්නේ පරිකර්මය මුල් කරගෙන කියල මේ විදියට අපි ඤාණයන් පිළිබඳව කතා කරන්නට යෙදුනා. ඒ වලට කොහොමද උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම සිද්ධ වන්නේ කියල.

## *<u>පකතූප නිස්සය (පස්වෙනි කොටස)</u>*

**දිබ්බචක්ඛු - දිබ්බාය සොතධාතුයා උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඒ වගේම අද දවසෙදි දැන් අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව ඒ **දිබ්බචක්ඛු - දිබ්බාය සොතධාතුයා උපනිස්සය පච්චයෙන පච්චයො.** මේ පකතූපනිස්සය තමයි ඔබට මතක ඇති නම් අපි මේ කතා කරන්නේ. ආරම්මණ උපනිස්සය, අනන්තර උපනිස්සය සහ පකති උපනිස්සය කියන උපනිස්සය ප්‍රත්‍යයෙහි විභාග තුන් ආකාරයකට අපි දැක්කා. එහි

පකතූපනිස්සය තමයි මේ හඳුනාගන්නට යෙදෙන්නේ. එහි දි දැන් දිබ්බචක්ඛු ඥාණය සඳහා මනසින් ඇති කර ගන්න ලබන පරිකර්මය උපනිඃශ්‍රය වෙනව කියල කිව්ව. දැන් මෙතනදි උපනිස්සය ප්‍රත්‍යය දැන් එතන පරිකර්ම අවස්ථාවට වඩා ටිකක් විශේෂව අපිට දකින්නට පුළුවන්කම තියෙනව. දැන් දිබ්බචක්ඛු - **දිබ්බාය සොතධාතුයා උපනිස්සය පච්චයෙන පච්චයො.** දිබ්බචක්ඛුව දිබ්බ සොත ධාතුව සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

**දැන් බලන්න අර එකම ආකාරයකට තමන්ගේ සිතෙහි ඇතිකර ගනු ලබන වැඩීම කියන එක ඇතුලේ දිබ්බචක්ඛු ඉපදවීම සඳහා තමන්ගේ සිත භාවිත කරපු කෙනාට ඒ නිසා දිබ්බචක්ඛු උපදිනව කියන එක හරි. මේ කාරණාවෙන් පැහැදිලි කරන දේ ඔබ තේරුම් ගන්න. මෙතනදි මේ උපනිස්සය ප්‍රත්‍යය තවත් ගැඹුරෙන් ඔබට තේරුම් ගන්න අවස්ථාවක් තමයි මෙතන තියෙන්නේ. දිබ්බචක්ඛුව ඉපදවීම සඳහා තමන්ගේ මනස යොමු කරල ඒ සඳහා උත්සාහවත් වන මනස පුරුදු කරන කෙනාට, ඒ පුරුදු කිරීම නිසා, එය ඇසුරු කරගෙන දිබ්බචක්ඛු ඥාණය ලැබෙනව. ඒක හරි.**

දැන් මෙතනදි කියන්නේ එය ඇසුරු කරගෙන ඒ සඳහා මනස පුරුදු කිරීම කියන දේ නෙමෙයි, ඒ පුරුදු කරනව කියන කොටස අත හැරල **මෙතනදි කියනව දිබ්බචක්ඛු ඥාණය දිබ්බසොතය උපදවන්න උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය** වෙනව කියල. දැන් අපි පසුගිය දේශනාව ඇතුළෙදි හඳුනාගත්තා දිබ්බසොතය සඳහා මනස පුරුදු කිරීම දිබ්බසොතයට උපනිස්සය වෙනව කියල. දැන් මෙතනදි කියනව දිබ්බසොතය සඳහා මනස පුරුදු කිරීම නෙමෙයි දිබ්බචක්ඛුව දිබ්බසොතයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල.

අන්න එතකොට අපිට උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව කතා කිරීමේදී අර ඒ සඳහා ආසන්නවම තියෙන දේ පමණක් නෙමෙයි ඊට පෙරාතුව තිබුණ ධර්ම පවා මෙයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව. දිබ්බචක්ඛුව ඉපදුවට පස්සේ අනන්තරව දිබ්බසොතය ඉපදුනේ නෑ. ඒ සඳහා මනස යොමු කරල මනස භාවිත කරන්නත් වුණා.

හැබැයි දැන් ඒ භාවිත කරපු ටික අත හැරල මෙතනදි කියනව දිබ්බචක්ඛුව දිබ්බසොතයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල. ඒ හින්දා ඊට අනතුරුවම ඊළඟ ධර්මය උපදිනවා කියන එක නොකියා මෙතනදි උපනිස්සය ප්‍රත්‍යය තේරුම් ගැනීමේදී ඔබට තේරුම් ගන්නට සිද්ධ වෙනවා, ඒ ආසන්නවම උපදින සිත පමණක් නෙමෙයි, ඊට පෙරාතුව ඉපදුන ධර්ම පවා මීට පසුව උපදින මේ ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරණු ලබනව. ඒක තමයි උපනිස්සය ප්‍රත්‍යය ශක්තිය කියල කියන්නේ. **දිබ්බචක්ඛුව උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා දිබ්බසොතය ඉපදවීම සඳහා.** දිබ්බචක්ෂුසය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය  වෙනවා දිබ්බසොතය උපදවන්නට. දිව කන උපදවන්නට. **එතකොට ස්වර්ණ - දුර්වර්ණ - ලඟ වූ ද - දුර වූද රූප දැකීම සඳහා තම මනස මෙහෙයවන කෙනකුට ඒ මෙහෙවීම තුළම දිබ්බසොතය උපදවීම සඳහාත් තමන්ගේ මනස පුරුදු කරන්න පුළුවන්කම තියෙනව.**

ඒ වගේම **දිබ්බසොත ධාතු - ඉද්ධිවිධ ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** දිබ්බසොත ධාතුව ඉද්ධිවිධ ඤාණය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. අර කියපු න්‍යායම තමයි එතනටත් අදාළ  වෙන්නේ එතකොට.

ඊට පස්සේ **ඉද්ධිවිධ ඤාණං - චෙතොපරිය ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** ඉද්ධිවිධ ඤාණය චෙතොපරිය ඤාණය සඳහා, ඉද්ධිවිධ ඤාණයෙන් අනුන්ගේ සිත් දැන ගැනීම

සඳහා තම මනස මෙහෙය වීම. චෙතොපරිය ඤාණයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

**චෙතොපරිය ඤාණං - පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** චෙතොපරිය ඤාණය පුබ්බෙනිවාසානුස්සති ඤාණය සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

**පුබ්බෙනිවාසානුස්සති ඤාණං - යථාකම්මූපග ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** පුබ්බෙනිවාසානුස්සති ඤාණය යථාකම්මූපග ඤාණය සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

**යථාකම්මූපග ඤාණං - අනාගතංස ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** යථාකම්මූපග ඤාණය අනාගතංස ඤාණය සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවයි කියල මේ ආකාරයට මේ ධර්මයන්ගේ ප්‍රත්‍යය වීම උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ***(දිබ්බචක්ඛු ආදී අභිඤ්ඤා ඤාණයන් නොඋපදවා දිව කන ආදී නුවණ ඉපද විය නොහැකිය.)***

එතකොට දැන් මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය මේ විදියට කිව්වේ ඇයි? උපනිස්සය ප්‍රත්‍යයෙහි මේ භාවිතය පිළිබඳව ඔබට මෙලෙස හැඳින්වූයේ මේ දිබ්බචක්ඛුව දිබ්බසොතයට, එතකොට අර අතරතුර ධර්ම අත හැරල වුණත්, ඒ කියන්නේ දැන් පළමු සිත උපදිනව. දෙවන සිත උපදිනව. තෙවන සිත උපදිනව. හතර පහ උපදිනව කියල කියන්නකෝ, මේ උපමාවක් කතා කරන්නේ. ඒක සිතක් ඉපද නැතිවුණා. දෙවෙනි සිත හට ගත්තා ඒ සිත නැතිවුණා. තුන්වෙනි සිත හට ගත්තා ඒ සිත නැතිවුණා. හතරවෙනි සිත හට ගත්තා ඒ සිත නැතිවුණා. පස්වෙනි සිත හටගත්තා ඒ සිත නැතිවෙනව. එතකොට දැන් මේ විදියට මේ

පළමු සිත සහ පස්වෙනි සිත කියන එක දිහා බැලුවහම අපිට පේනවා හතරවෙනි සිත පස්වෙනි සිත උපදවන්නට ප්‍රත්‍යයක් වෙනව. හතරට පස්සේ පහ එනව. එතකොට මේ හතර වන සිතට අනන්තර ප්‍රත්‍යයෙන් මේ සිත නිරුද්ධ වෙන කොටම ඒ අතරතුර වෙන අතුරක් නොතබා අනන්තර ප්‍රත්‍යයෙන් පස්වෙනි සිත උපදවනව.

අනන්තර ප්‍රත්‍යය වෙමින් තමයි පස්වෙනි සිත උපදවන්නේ. එතකොට අනන්තර ප්‍රත්‍යයෙන් පස්වෙනි සිත උපදවන කොට ඒක ගැටළුවක් නෑ. අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. ඒ වගේම ඒක නිස්සය හෝ උපනිස්සය ප්‍රත්‍යයෙනුත් ප්‍රත්‍යය වීම ඒ අවස්ථාවෙදි සිද්ධ වෙනව. දැන් ඒක පැහැදිලියි නේ.

දැන් මෙතනදි කියන්නේ හරියට අර හතර - තුන - දෙක අයින් කරල දාල, මෙතනදි කියනව පළමු එක පස්වෙනි සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල. එක, පහට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. ඒ වගේ දෙයක් තමයි මේ කිව්වේ. දිබ්බචක්ඛුව දිබ්බසොතයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියන එක. එතකොට උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව හඳුනාගන්න. අනතුරුව ඊළඟ මොහොතේ ඒක උපදවනව. ඒකට, උපදිනව කියන එක නෙමෙයි. උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම දිහා බැලුවහම උපනිස්සය ප්‍රත්‍යයෙහි එක ආකාරයක් තමයි ඊළඟ මොහොතෙදි ඊළඟ ධර්මය ඉපදවීම කියන දේ විතරක් නෙමෙයි, ඒක එසේ නොවුණත් පසුව උපදින වෙනත් ධර්මයකට පවා මේ කලින් ඉපදුන එක උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරණු ලබනව. අන්න ඒක තමයි මෙතනදි තේරුම් ගැනීම වැදගත් වෙන්නේ.

## *පකතූපනිස්සය (සයවෙනි කොටස)*

**පඨමස්ස මගස්ස පරිකම්මං - පඨමස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඊට පස්සේ අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව **පඨමස්ස මගස්ස පරිකම්මං - පඨමස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** පළමු මාර්ගය සඳහා කරන පරිකර්මය පළමු මාර්ගය ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. **පළමු මාර්ගය සඳහා** ඒ කියන්නේ මාර්ගය උපදවා ගැනීම සඳහා කරන ඒ පරිකර්මය, සිත පුරුදු කිරීම කියන එක, විපස්සනා වශයෙන් සිත භාවිත කිරීම කියන එක පළමු මාර්ග ඥාණය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. **පරිකර්මය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම.**

එතකොට මේ මග්ග කියල කියන්නේ මොකද්ද? මග්ග කියන කොට මේ **ඒක අයන මග්ග (ඒකායන මාර්ගය)** කියල කියන කොට මේ වචන ගමනාර්ථයෙන් තමයි මේ වචනය සකස් වෙන්නේ. එතකොට යම්කිසි ආකාරයෙන් සුගතියකට හෝ දුගතියකට හෝ නිර්වාණයට හෝ අභිමුඛව පාපනය කරන නිසා, පමුණුවන නිසා **මග්ගෙති පාපෙතීති මග්ගො** කියල දක්වනව. මේ පමුණුවන නිසා තමයි මේකට මාර්ගය කියල කියන්නේ. එතකොට යම්කිසි තැනකට පැමිණීවීම අර්ථය තියෙන නිසා ගමන අර්ථය තියෙන නිසා මේකට මග්ග කියන වචනය පාවිච්චි වෙනව.

ඒ වගේම කෙලෙස් මරමින් යන නිසා සහ ආයයීන්ගේ දැකීම තියෙන නිසා මේකට මග්ග කියන වචනය භාවිත වෙනව. ඒ කියන්නේ කෙලසුන්ගේ මැරීම නිසා "**මො**" කියන වචනය පාවිච්චි වෙනව. ඒ වගේම ගමනාර්ථය දක්වමින් නිවනට පැමිණීවීම කියන දේ නිසා "**ගො**" කියන ශබ්දය මෙතනදි

පාවිච්චි වෙනව. එතකොට "**මොච ගොච**". එතකොට කෙලෙස් මරන අර්ථය නිසා **මාරෙතීති මග්ගො** කියල කියනව කෙලෙස් මරණ  නිසා එතනදි මාර්ගය කියල කතා කරනව.

ඒ වගේම ගමනාර්ථය, නිවන කරා පැමිණීම කියන ගමනාර්ථය නිසා **ගො** කියල "**ච**" ශබ්දය කියල පාවිච්චි වෙනව. එතකොට **මොච ගොච. මො ගො** කියන මේ ම ග කියන ශබ්ද දෙක එකතු වෙලා තමයි මග්ග කියන වචනය සකස් වෙන්නේ කියල ව්‍යාකාරණ අනුරූපීව එක තැනකදි දක්වනව.

මේ අර වහරක පද බෙදීම එහෙම නෙමෙයි. මේ අපේ ව්‍යාකරණ සම්ප්‍රදායන් ඇතුළෙදි ඒ ධාතු වල ක්‍රියාත්මක වන අර්ථය. යම්කිසි පදයක් නිෂ්පාදනය වෙලා තියෙන්නේ යම්කිසි ධාතු ප්‍රකෘතියකින් තමයි. ඒ ධාතුවෙන් ඒ ඒ ප්‍රකාශ කෙරෙන අර්ථයන් තියෙනව. ඒ අර්ථයන්ගෙන් තමයි ඒ වචනය පාවිච්චි වෙන්නේ. ඊට වඩා වෙනස් අර්ථ කියන්න පුළුවන්කමක් නෑ.

එතකොට මග්ග කියන වචනය ඇතුලේ තියෙන්නේ ගමනාර්ථයක්. ඒ නිසා තමයි සුගති මග්ග - දුගති මග්ග මේ විදියට කතා කරන්න පුළුවන්කම තියෙන්නේ. සුගති මග්ග කියන්නේ කුසල්. සුගති මාර්ගය. දුගති මග්ග කියල කියන්නේ අකුසල්. දුර්ගති මාර්ගය. මාර්ගය කියල කියන්නේ **මග්ගෙති පාපෙතීති මග්ගො. මග්ගෙති** කියල කියන්නේ පැමිණිවීම කරනව. ගමන් කරවනව. පමුණුවනව. එතකොට ඒ **මග්ගෙති** කියන පදෙන් තමයි ඒ වචනය සකස් වෙන්නේ. මග්ග කියන වචනය සකස් වෙන්නේ. එතකොට පැමිණි වීම කරනව. එතකොට සුගතියට හෝ දුගතියට හෝ නිර්වාණය කරා හෝ පැමිණි වීම සිද්ධ කරන නිසා මාර්ගය කියල කියනව.

දැන් මෙතනදි මේ මාර්ගය කියන වචනය පාවිච්චි වෙන්නේ මොකක් සඳහා ද කියල බැලුවොත්, මෙතනදි මාර්ගය කියන

එක පාවිච්චි වෙන්නේ සෝවහන් - සකදාගාමී - අනාගාමී - අරිහත් කියන මේ මාර්ග අවස්ථාවන් හැඳින්වීම සඳහා තමයි මෙතනදි මේ මග්ග කියන වචනය පාවිච්චි වෙන්නේ. එතකොට මෙතනදි අපරියාපන්න භූමිය සඳහා එහෙම නැතිනම් නිර්වාණය සඳහා තිබෙන මාර්ගය තමයි මග්ග කියන වචනයෙන් පාවිච්චි වෙන්නේ.

එතකොට ඒ සඳහා තමයි මනසේ පරිකර්මය කියන එක අපිට දකින්න පුළුවන්කම තියෙන්නේ. **පඨමස්ස මග්ගස්ස පරිකම්මං.** පඨම මාර්ගයාගේ පරිකර්ම අවස්ථාව. මාර්ගය ඉපදවීම සඳහා තමන්ගේ මනස භාවිත කිරීම කියන එක. **පඨමස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** ප්‍රථම මාර්ගය ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව.

**එතකොට මොකද්ද මේ පරිකර්මය කියල කියන්නේ මාර්ගය ඉපදවීම සඳහා කරණු ලබන පරිකර්මය?**

**මාර්ගය ඉපදවීම සඳහා කරණු ලබන පරිකර්මයැයි කියල කියන්නේ තමන්ගේ සිත ලෝකෝත්තර මාර්ගය ඉපදවීම සඳහා සමථ මූළිකව හෝ ශුද්ධ විපස්සනායානිකයෙක් විදියට හරි තමන්ගේ මනස ටිකෙන් ටික විපස්සනාව කරා නැගීම තමයි මෙතනදි පරිකර්ම කිරීම කියල කියන්නේ. ඒ කියන්නේ දැන් අපි විපස්සනාවට තමන්ගේ සිත වඩනව. ඒකට කියනව සම්මස්සන ඤාණය කියල. (*සම්මස්සන ඤාණය නම් නාම රූපයන් ලක්ෂණාදී වශයෙන් අරමුණු කිරීමයි.)* සම්මස්සන ඤාණය ගත්තහම කෙනෙක් මේ සම්මස්සන ඤාණය ඔස්සේ එයා මේ ධර්මයන් පිළිබඳව සම්මර්ශනය කිරීම කියන දේ සිද්ධ කරනව.**

අපි ගොඩක් වෙලාවට මේ භාවනාව පිළිබඳව එහෙම කතා කිරීමේදී මේ ගැන දක්වනව මෙනෙහි කිරීම මුල් කර ගන්නව කියල. මෙනෙහි කරනව. ***සිතට එන අරමුණු පිළිබඳව යෝනිසෝ***

*මනසිකාරය පවත්වනව. ඒ පිළිබඳව මෙනෙහි කරනව. එතන පවතින ස්කන්ධ ස්වභාවයන්, ධාතු ස්වභාවයන්, ආයතන ස්වභාවයන්, එහි පවත්නා යථා ස්වරූපය ඉස්මතු වෙන විදියට එහි මනසිකාරය පැවැත්වීම සිදු කරණු ලබනව. එතකොට අන්න ඒ මෙනෙහි කිරීම තමයි මෙතනදි සම්මස්සන ඤාණය කියල කියන්නේ. අනිත්‍යය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් ඒ ධර්මයන් පිළිබඳව හිතනව. මේ තමයි පළමු අවස්ථාව. අපි ඒ සඳහා පරිකර්ම කරන මූලිකම අදියර තමයි සම්මර්ශනය කිරීම කියන එක.*

*මෙනෙහි නොකිරීමක් තියෙන කෙනකුට කවදාවත් එතනින් එහාට තමන්ගේ සිතේ වැඩීමක් තියෙන්නේ නෑ. ඉතින් පළමු අදියර භාවනා කිරීමෙහි තියෙන නිවන් දැකීම සඳහා උත්සුක වීමෙහි තියෙන නිවන් දැකීම සඳහා කටයුතු ආරම්භ කිරීමෙහි තියෙන පළමු පියවර තමයි මේ යෝනිසෝ මනසිකාරය කියන එක. මෙනෙහි කිරීම.*

අරමුණ පිළිබඳ යථාභූත ස්වභාවය ඉස්මතුව පෙනෙන විදියට හිතනව අපි ඒ පිළිබඳව. හිතෙන් අපි ඒ අරමුණක් ඇති බවට හම්බවෙන කොට ඒ අරමුණේ ඇත්ත ස්වරූපය පිළිබඳව, එතන ස්කන්ධයන්ගේ ස්වභාවය පැහැදිලි වෙන විදියට, ධාතු ආයතනයන්ගේ ස්වභාවය පැහැදිලි වෙන විදියට, අනිත්‍යයතාවය ප්‍රකට වන විදියට, දුක්ඛතාවය අනාත්මතාවය ඉස්මතු වන විදියට ඒ ගැන හිතනව. මෙනෙහි කරනව. අන්න ඒ සිතීම සහ මෙනෙහි කිරීම කියන එක මෙතන විශේෂයි.

**ඒ සිතීම සහ මෙනෙහි කිරීම ඇති කල්හී එතන ක්‍රියාකාරිත්වයක් ඇතිවෙනව සම්පූර්ණම ඒ ධර්මයන්ගේ යථා ස්වරූපය පිළිබඳව දකින්න ඤාණයක් ප්‍රඥාවෙන් අත්දකින්න පුළුවන් මට්ටමකට තම මනස පත් කිරීමක් විදියට. මේ සිතීම පළමු අදියර ඒ තමයි සම්මස්සන ඤාණය.**

සම්මස්සන ඤාණය පවත්වන කෙනාට හම්බවෙනව **උදයව්‍යය ඤාණයක්**. උදය වැය පිළිබඳව දකින්න පුළුවන්කම තියෙනව. ස්කන්ධයන්ගේ හට ගැනීම සහ වැය වීම පිළිබඳව හිතන කෙනාට ඒ පිළිබඳව මෙනෙහි කරන කොට එයාට පේනව මේ එහෙනම් මොහොතෙන් මොහොත ස්කන්ධ ධර්ම ටිකක් හටගෙන නිරුද්ධ වෙනව කියන එක.

**දැන් ඒක නොදකින කෙනාට මොකද්ද වෙන්නේ? අර සම්මර්ශනය නැතිවෙන කොට ලෝකයෙහි පැවැත්ම, සත්ත්ව පුද්ගල ආත්මභාවයන්ගේ පැවැත්ම හම්බවෙනව. මේ කෙනෙක් ඉන්නව. මේ පුද්ගලයෙක් ඉන්නව. මේ සත්ත්වයෙක් ඉන්නව. මේ විදියට මේ ලෝකයෙහි සහ සත්ත්ව පුද්ගලභාවයන්ගේ පැවැත්ම කියන දේ තීරණය කරල තියෙනව. සත්ත්ව පුද්ගලභාවයන්ගේ පැවැත්ම හසු වෙනව. මේ සත්ත්ව පුද්ගලයන්ගේ පැවැත්ම හසු වෙන්නේ කුමක් නිසා ද? අර යථාභූත ස්වරූපය පිළිබඳව දැකීමට සම්මර්ශනයක් නෑ. සම්මර්ශනය පවත්වන්න ගන්න කෙනාට පේනව ස්කන්ධ ටිකක් විදියට. ඒ ස්කන්ධ ධර්මයෝ මොහොතෙන් මොහොත හට ගන්නව සහ වැය වෙනව කියන උදයව්‍යය ඤාණය එයාට ලැබෙනව.**

ඒ වගේම තව දුරටත් මනස පරිකර්ම කරන කොට, තව දුරටත් මනස භාවිත කරන කොට එයාට **භංග** ආදී ඤාණයෝ පහළ වෙනව. ඒ කියන්නේ භංගය, ස්කන්ධයන්ගේ බිඳීයෑම කියන එක. ඒක මොහොතෙන් මොහොත ඇතිවෙන ස්කන්ධයන්ගේ බිඳීම කියන දේ එයාට දකින්නට පුළුවන්කම තියෙනව. ඊට පසුව **ආදීනවය මුඤ්චිතුකම්‍යතා** ආදී ඤාණයන් ලබන්නට පුළුවන්කම තියෙනව.

***(<u>භංග ආදී ඤාණයන්</u>*** **- සියලු සංස්කාර ධර්මයන්ගේ බිඳීමම දක්නා නුවණ.** ***<u>භයතුපට්ඨාන ඤාණය</u>*** **- සියලු සංස්කාර ධර්මයන් බිය විය යුතු දෙයක් ලෙස දක්නා වූ නුවණ.** ***භයතුපට්ඨාන ඤාණය පහළ වීමෙන් පසුව <u>ආදීනව ඤාණය</u>*** **- දශවිධ විදර්ශනා ඤාණයන්ගෙන් භයතුට්ඨාන ඤාණයට අනතුරුව උපදනා විදර්ශනා ඤාණය,** ***<u>නිබ්බිදා ඤාණය</u>*** **- සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීම,** ***<u>මුඤ්චිතුකම්‍යතා ඤාණය</u>*** **- සියලු සංස්කාරයන්ගෙන් මිදෙන්නට කැමතිවීමේ දී පහළ වන නුවණ,** ***<u>පටිසංඛා ඤාණයන්</u>*** **- සියලු සංස්කාරයන්ගෙන් මිදෙනු පිණිස විදර්ශනාවෙන් උපදවා ගන්නා නුවණ,** ***<u>සංඛාරුපෙක්ඛා ඤාණයන්</u>*** **-සංස්කාරයන් කෙරෙහි ඇල්මක් හෝ භීතියක් නොකොට මධ්‍යස්ථ වීම් වශයෙන් උපදනා නුවණ යන ඤාණයන් ලබන්නට පුළුවන්කම තියෙනව.*****)***

ඒ කියන්නේ එහි ආදීනවය පැහැදිලි කරගෙන, මොහොතෙන් මොහොත බිඳී යන ස්කන්ධයන්හී ගැලෙන්නට තැනක් නැතිබව, එහි පිහිටා සිටින්නට තැනක් නැතිබව තේරුම් ගැනීම තුළ සහ එය තුළ පිහිටා සිටින ලෝකයට අනිවාරයෙන්ම දුකේ පැමිණීම සිද්ධ වෙනව කියල මහා භය සහිත බව තේරුම් ගැනීම සිද්ධ කරන්නට පුළුවන්කම තියෙනව.

ඊට පස්සේ ඒකෙන් මිදෙනු කැමතිව වෑයම් කරන කෙනාට ඒ ධර්මයන්ගේ යථාභූත ස්වභාවය තේරුම් අරගෙන එහි නොඇල්ලම පිණිස භාවිත කරන කෙනාට පුළුවන්කම තියෙනව සංස්කාරයන්ගේ උපේක්ෂාව කියන දේ උපදවන්නට. ඒ සංස්කාර ධර්මයන්ගේ උපේක්ෂාව ඇතිකර ගන්න කෙනාට ඒ සංස්කාරයන්ගේ නොඇලී වාසය කිරීමත් එක්ක එයාට **ගොත්‍රභූ සහ මාර්ග ඤාණය** උපදවන්නට පුළුවන්කම තියෙනව. ඊට පස්සේ **ඵල ඤාණය** ලබන්නට පුළුවන්කම තියෙනව. ***(මෙම පරිකර්ම සිත් නොඋපදවා සෝවහන් මාර්ග ඤාණය නොලැබෙන බව දත යුතුයි.)***

ඉතින් මෙන්න මේ විදියට <u>අනුපූර්ව වශයෙන්</u> තමන්ගේ මනස තුළ ඇතිකර ගනු ලබන පරිකර්ම අවස්ථාවන් තියෙනව. මේ අවස්ථාවන්හී අර ගොත්‍රභූ අවස්ථාව වෙනකම්, මාර්ග සිත උපදින තැන දක්වාම සිත් වශයෙන් ගත්තොත් එහෙම ඤාණ සම්ප්‍රයුක්ත සිත් තමයි උපදින්නේ. ප්‍රඥාව සහිත සිත් තමයි ඒ හැම අවස්ථාවකදිම භාවිත වීම සිද්ධ වෙන්නේ. එතකොට ප්‍රඥාවෙන් යුක්තව ඒ ඒ ධර්මයන්ගේ නුවණ මෙහෙවා බැලීම කියන දේ තමයි මේ මානසිකව අපිට සිද්ධ වෙන්නේ.

දැන් අපිට ඕකෙදි සිතක් පේන්නේ නෑ. ඔබට සිතක් කියල මෙන්න මේකයි කියල අපිට පේන්නේ නැහැ. හැබැයි ඔබට මේ සිත් සමූහයක පරම්පරාව  නිසා පේනව මේ ප්‍රඥා සහිත බවක තියෙනව කියන එක. මේ ධර්මයන් දකින්න පුළුවන්කම තියෙනව. නුවණින් අත් දකින්න පුළුවන්කම තියෙන බව ඔබට මේ විදියේ හිතේ භාවිතයත් එක්ක තේරුම් ගන්න පුළුවන්කම තියෙනව ඒ ඒ අවස්ථාවන් පිළිබඳව. ඒ හිතේ ඔබට ඒ ප්‍රඥාව අවදි කරවන ඤාණනය කරවන අවස්ථාවන් තමයි අර ***සමස්සන ඤාණය - උදයව්‍යය ඤාණය - භඞ්ග ඤාණය - භයතුපට්ඨාන ඤාණය - ආදීනව ඤාණය*** මේ විදියට ඤාණයන් හැටියට පැහැදිලි කරන්නට යෙදෙන්නේ.

මෙන්න මේ ආකාරයෙන් අපිට විදර්ශනා භූමිය සඳහා අපේ මනස භාවිත කිරීම කියන එක සිදු කරන කොට ඒ හැම අවස්ථාවකදිම ඒ සිත මාර්ග ඤාණය ඉපදවීම සඳහා පරිකර්ම කරන අවස්ථා හැටියට තමයි දක්වන්නට පුළුවන්කම තියෙන්නේ. මේ අවස්ථාවල උපදින්නේ ඤාණ සම්ප්‍රයුක්ත වුණ කුසල් සිත. ඒ කියන්නේ සම්මස්සන ඤාණයෙදිත් උපදින්නේ ඤාණ සම්ප්‍රයුක්ත කුසලය. උදයව්‍යය ඤාණය තුළත් උපදින්නේ ඤාණ සම්ප්‍රයුක්ත කුසලය. මේ හැම අවස්ථාවකදිම ඤාණ සම්ප්‍රයුක්ත කුසල අවස්ථා තමයි අපිට දකින්නට හඳුනාගන්නට

පුළුවන්කම තියෙන්නේ. ඥාණ සම්ප්‍රයුක්ත කුසල අවස්ථා මේ හැම තැනකදිම උපදින කොට දැන් අපිට දකින්න පුළුවන්කම තියෙනව මේ මාර්ග ඥාණයට නැතිනම් මාර්ග අවස්ථාවට මේ පරිකර්මය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල.

එහෙනම් මේ සිත් අතර තියෙන වෙනස්කම ඔබට පැහැදිලි කර ගැනීම මෙතනදි මේක තේරුම් ගැනීමේදී වැදගත්. ඒ කියන්නේ දැන් සම්මස්සනය කිරීමයි උදයව්‍යය ඥාණයයි අතර සිත් වශයෙන් තියෙන වෙනස්කම මොකද්ද? සම්මස්සන ඥාණය කියන එක ඔබට ඇතිවන්නේ මූලික වශයෙන්ම සාමාන්‍යය ආධුනික මට්ටමකදි හිතට එන කරුණු පිළිබඳව වඩාත්ම ඔබ මනසින් නුවණ මෙහෙවා හිතනව. මෙනෙහි කරනවා කියන තැන තමයි සම්මස්සන ඥාණය එන්නේ.

උදයව්‍යය ඥාණය කියන එක ඊට වඩා ටිකක් බලසම්පන්න බවක තියෙන්නේ. උදයව්‍යය ඥාණය කියන එක ඇතුළෙදි ඔබට තව දුරටත් ඒ කරුණු ප්‍රඥාවෙන් නුවණින් අත්දකින මට්ටමකට සමීප කර ගන්නට පුළුවන්කම තියෙනව.

භඞ්ග ආදී ඥාණයන්ගෙදි ඒකේ හට ගැනීම සහ වැය වීම පිළිබඳව කරන අවධානයත් ඉවත් වෙලා මොහොතෙන් මොහොත බිඳෙන ස්වභාවය පිළිබඳව අවධානය ප්‍රඥාව වැඩිවෙල තියෙනව. පොදුවේ ගත්තහම මේ එකම ඥාණ සම්ප්‍රයුක්ත සිත වුණාට මේ ඥාණ සම්ප්‍රයුක්ත සිතෙහි යෙදෙන ප්‍රඥාව නැමති ඉන්ද්‍රිය ධර්මයෙහි භාවිතයෙහි වෙනස්කමක් තියෙනව. ඒ කියන්නේ එකින් එකට එකින් එකට පොඩි වෙනසක් තියෙනව මේ ප්‍රඥාවේ.

පළවෙනි තැනදි ප්‍රඥාවෙන් දකින මට්ටම බොහොම අවමයි. දෙවෙනි අවස්ථාවට යන කොට ප්‍රඥාවෙන් දකින මට්ටම

බොහොම ඊට වඩා ටිකක් වැඩියි. තුන්වෙනි අවස්ථාවට යනකොට ඊටත් වඩා ටිකක් වැඩියි.

දැන් අපි සාමාන්‍යයෙන් ලා ගොයමක් දිහා බැලුවහම මේක අපිට ඈතට හොඳට ලා කොල පාටට දකින්නට පුළුවන්කම තියෙනව. ඔක්කොම ගොයම් ගස් කොල පාටයි. ගොයම ටිකක් ලොකු වෙන කොට අපිට තද කොල පාටට දකින්න පුළුවන්කම තියෙනව. ඊට පස්සේ මේ ගොයම පැහීගෙන එන කොට ටිකෙන් ටික අතර මැද කොළ (පත්‍ර) කහ වෙනව. කොළ ඉදෙනව. මේ වගේ දේවල් සිද්ධ වෙනව නේ. දැන් අතරින් පතර එක එක ගස් ඒ විදියට වුණා කියල ඈතට පෙන්නේ නෑ මේ ගොයම පැහිල කහ පාටට කරල් බර වුණ දෙයක් හැටියට. තාම කරලුත් කොලයි. ඔක්කොම කොල පාටට නේ තියෙන්නේ. එතකොට අතරින් පතර එකක් දෙකක් වුණා කියල පේන්නේ නෑ.

එතකොට ටිකක් වැඩිපුර වුණොත් එහෙම එතකොට ටිකක් වැඩිපුර අපිට පේන්න ගන්නව. ඒ අතර ටිකක් ලා කොල පාටකුත් පේනව. ඒ මිශ්‍ර පාටත් පේනව ඈත ඉඳල බලන කෙනකුට. ඔක්කොම ටික වේලෙන පාටට එන කොට ඔක්කොම එකම පාටට හොඳට පැහැණු ගොයමක් ලෙස දකින්නට පුළුවන්කම තියෙනව. මේ වගේ තමයි ප්‍රඥාවෙහි තියෙන වෙනස්කම.

දැන් සම්මස්සන ඥාණය කියන එකේදී අර අතරින් අතර අතරින් අතර එකක් එකක් පැහිල වගේ අර මෙනෙහි කරන වෙලාවට විතරක් ඉස්මතුව පෙනෙන්නට පටන් ගන්නව ඥාණය - අත්දැකීම - අවබෝධය - ප්‍රඥාව ඒ මට්ටමට තියෙනව. හැබැයි දුර තියා බලන්නෙකුට තාම මේ ගොයම පෙන්නේ කොල පාට ගොයමක් විදියට වගේ, අර සම්මස්සන ඥාණය තිබුණහම සම්මර්ශනය කරන වෙලාවට ඒක පෙනුණට, ඊට පසුව

අවස්ථාවලදි ඒක එලෙස දකින්නට පුළුවන්කමක් ඇත්තේ නෑ. ඒක අත්හැරල ගිහිල්ල සාමාන්‍යය මට්ටමක ලෙස පෙනෙනව.

හැබැයි අර **සම්මස්සන ඤාණය** වැඩි දියුණු කර ගත්ත කෙනකුට ඊට පස්සේ **උදයව්‍යය** ආදී වශයෙන් ඒ ඤාණය වඩාත්ම තියුණුවට පෙනෙන්නට පටන් ගන්නව අර දැන් හැම තැනම ටික ටික කොල ඉදෙන්න පටන් ගත්තහම ලා මිශ්‍ර පාට පෙනෙන්නට පටන් ගන්නව වගේ.

**භඞ්ග ඤාණය** කියල කියන කොට අර ගොයමට උපමා කලොත් තවත් ටිකක් වැඩිපුර හොඳට පැහැණු පාටකට ඇවිල්ල තියෙනව. ඉතින් ඔය විදියට ගිහිල්ල ගොත්‍රභූ අවස්ථාව කියන තැනකට යන කොට ගොත්‍රභූ ඤාණයට පෙරතුව **සංඛාරුපෙක්ඛා** ආදී ඤාණයන්ගේ පැවැත්ම පැත්ත අපි බැලුවොත් එහෙම සම්පූර්ණම හොඳටම පැහැණු මට්ටමකට පත්වෙලා තියෙනව. ***ඒ කියන්නේ මේ සිත් ඉපදවීම කියන දේ අර විදර්ශනා භූමියට නිවන අරමුණු කරමින් ඒ පැත්තට බරවම උපදවන්නට පුළුවන් තැනට දැන් ඒක මුහුකුරා ගිහිල්ල තියෙනව.***

එතකොට අන්න ඒ වගේ තමයි එකම ප්‍රඥා ඉන්ද්‍රියෙහි භාවිතය මත උපනිඃශ්‍රය වීම මත අනිත් අනිත් සිත්වලට අන්න ඒ නිසා පරිකර්ම සිත් අතරත් මේ උපනිස්සය - නිස්සය - ආසෙවන ආදී ප්‍රත්‍යය භාවයන් අපිට දකින්නට පුළුවන්කම තියෙනව. හැබැයි මෙතනදි මේ පරිකර්ම අවස්ථාව කියන එක තමයි මේ හැම තැනකම නියෝජනය වෙන්නේ. අර පළමුවෙන්ම සම්මස්සනයෙදි පටන් ගත්ත තැනම උදයව්‍යය භඞ්ග ආදී ඤාණයන්ටත් ඒ වගේම ගොත්‍රභූ ඤාණයටත් එක ලෙස උපකාර කරල තියෙනව.

ඊට පස්සේ තමයි ඒ ගොත්‍රභූ ඤාණයට අනතුරුව මාර්ග ඤාණය උපදිනව  නම් ඒ මාර්ග ඤාණය උපදින කොට ඒ මාර්ග ඤාණයට ගොත්‍රභූ ඤාණය උපනිස්සය ආදී අනන්තර ආදී ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරන්නට පුළුවන්කම තියෙනව. හැබැයි අර සම්මස්සන ඤාණය කියපු තැන ඉඳල පටන් ගත්ත දේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව අර මාර්ගය උපදවන්න.

ඒ නිසා උපනිස්සය ප්‍රත්‍යය ගැන කතා කරන කොට අර සමස්තයම ගන්න සිද්ධ වෙනව. සිතේ පැවැත්ම පිළිබඳව ගත්තහම උපනිස්සය ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යය පිළිබඳව තේරුම් ගැනීමේදී ඔය ආකාරයට ඔබට උපනිස්සය ප්‍රත්‍යය ටිකක් සංකීර්ණව තේරුම් ගන්න වෙනව. ඒ කියන්නේ ඒක එක සිතකින් තව සිතක් උපදිනවා කියන ඒ නිඃශ්‍රය නිඃශ්‍රිත භාවය පමණක්ම නෙමෙයි. මේ පරිකර්ම කියන සෑම අවස්ථාවක්ම අර මාර්ගය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව. පරිකර්මය උපනිඃශ්‍රය කරගෙන තමයි ඒ නිඃශ්‍රිතය උපදින්නේ. මාර්ගය නැමති නිඃශ්‍රිතය උපදින්නේ කියල අපිට ඒක දකින්නට පුළුවන්කම තියෙනව.

ඒ නිසා මාර්ග සිත උපදින්නට මේ කියපු පරිකර්ම අවස්ථාව උපකාර වෙනව. මාර්ග අවස්ථාව හැටියට කතා කරන්නේ අන්ධකාර වෙලාවක විදුලි ආලෝකයක් වගේ කියල. උපමා කරන්නේ අපේ අට්ඨකතාවන් තුළදි. ඒ කියන්නේ හරියට කළුවරක ඉන්න කෙනකුට එක පාර විදුලි ආලෝකයක් ආවොත්, විදුලියක් කෙටුවහම තම වටේට තියෙන රූප ආදී නිමිති දකින්නට පුළුවන්කම තියෙනව. හැබැයි ඒ ක්ෂණයෙදි සමස්තය ආලෝකයට ගියා.

**ඒ වගේ සියලු ධර්මයන් විදිත  වුණා. දැන ගත්තා. දිට්ඨ ධම්මයි. ඒ ධර්මයෝ දැක්කා. එහි යථා ස්වරූපය දැක්කා. ආපහු ඒ**

**මාර්ගය ඒ සිත ඒක නැතිවෙල ගියත් ඒ අවබෝධ ඤාණය ඒක නැතිවෙල යන්නේ නෑ. ඒක කවදාවත් ආවර්ණය වෙන්නෙත් නෑ. එයා ආලෝකය නොදැක්ක කෙනෙක් බවට කවදාවත් පත් වෙන්නේ නෑ. එක මොහොතකට හරි ආලෝකය හරහා එයා වටේ තියෙන දේවල් දැක්ක නම් ඒක දැක්කම තමයි. ඒක එයාගේ ප්‍රත්‍යක්ෂය බවට පත්වෙලා තියෙනව. ඒක ආයේ කිසි කෙනකු කීවත් ඒක ප්‍රතික්ෂේප කරන්නට හෝ නැහැයි කියල පිළිගැනීමකට යන්නට හෝ එබඳු බවකට පත්වීමක් ඔහුගේ ඇත්තේ නෑ. ඒක තමයි ධර්මය අවබෝධ කර ගත්ත මාර්ග ඤාණය උපදව ගත්ත කෙනකුගේ තියෙන ස්වභාවය.**

හැබැයි මෙතනදි අපිට වඩාත්ම ඉස්මතු  කරන්නට අවශ්‍ය වන කාරණව තමයි අර සඳහන් කරපු දේ. ඒ තමයි යම්කිසි ආකාරයකින් තමන්ගේ සිත මනස භාවිත කරන කොට ඒ පරිකර්ම අවස්ථාව මාර්ග ඤාණ උපදවන්නට ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව කියල.

**දුතියස්ස මග්ගස්ස පරිකම්මං - දුතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඒ වගේම තමයි **දුතියස්ස මග්ගස්ස පරිකම්මං - දුතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** දුතිය මාර්ගයෙහි පරිකර්මය දුතිය මාර්ගය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. **දැන් සෝවහන් ඵලයට පත්වුණ කෙනකුට, සෝවහන් ඵලයට පත්වෙලා  සකදාගාමී ඵලය ලබා ගැනීම සඳහා කුමක්ද කල යුතු වෙන්නේ? සකදාගාමී ඵලය ලබා ගැනීම සඳහා ඔහුට කල යුතු වෙන්නේ නැවත තමන්ගේ මනස පරිකර්ම කල යුතු වෙනව. නැවත තමන්ගේ මනස පුරුදු පුහුණු කල යුතු වෙනව. ඒ නිසා තමන්ගේ මනස නැවත පුරුදු කිරීම පුහුණු කිරීම සිදු කල යුතුයි සකදාගාමී මාර්ගය උපදවන්නට අවශ්‍ය අය. අන්න ඒ පරිකර්මය තමයි එයාට සකදාගාමී මාර්ගය**

**ලබන්නට හේතුවක් බවට පත්වන්නේ. පරිකර්ම නොකරන්නේ නම් ඔහුට ඒ මාර්ගය ලබන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නෑ.**

**ඒ නිසා මෙතනදි පරිකර්මය කියන එක ඉතාම වැදගත් දෙයක් හැටියට අපි දකින්නට අවශ්‍යයි. ඒ නිසා තමයි සෝතාපන්න ඵලයට පත්වුණ කෙනෙකු වුණත් නැවත නැවත යෝනිසෝ මනසිකාරය වඩන්නේ නැතිනම් සේඛ බල ධර්මයන්ගේ තව දුරටත් දියුණුවක් ඇතිකර ගන්නේ නැතිනම් ඒ පුද්ගලයට ඉදිරි මාර්ග ඵල අධිගමයන් ලබන්නට පුළුවන්කමක් නැත්තේ.**

ඉතින් ඒක හැමදාමට ලැබෙන්නේ නෑ කියනව නෙමෙයි. එයාගේ මනස කොහොමත් ක්‍රමානුකූලව යෝනිසෝ මනසිකාර වීථිය තුළ වැඩෙනව. හැබැයි ඒ වෙනුවෙන් එයා භාවිත කරන ඒ දක්වා දරන උත්සාහය තමයි හේතුවක් බවට පත්වෙන්නේ එයාට ඉදිරි අනිකුත් මාර්ග ඵල අධිගම සාක්ෂාත් කිරීම සඳහා හේතුවක් බවට පත්වන්නේ. ඉතින් ඒ නිසා දැන් එහෙම පරිකර්ම කිරීමක් නැත්නම් එයාට සකදාගාමී ආදී මාර්ග ලබන්නට උපදවන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ ඒ පරිකර්මය නැති කල්හී. ඉතින් ඒ පරිකර්මය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා සකදාගාමී මාර්ගය ලබන්නට.

ඒත් අර ආකාරයටම විපස්සනා ඥාණයන්ගේ තමන්ගේ හිත භාවිත කරන කොට. දැන් එයා භාවිත කරන්නේ මේ දෙය අර සෝවහන් ඵලය තුළ දිට්ඨ ධර්මයම විදිත ධර්මයම එයම අරමුණු කරමින්, ඒ ලබා ගත්ත ඥාණය ප්‍රඥා සහිත බව මුල් කරගෙන තමයි ඊට වඩා සියුම් වූ කෙලෙස් ධර්මයන් ගෙවීම සඳහා උත්සාහවත් වීම සිදු කරණු ලබන්නේ. ඉතින් අන්න ඒ විදියට සකදාගාමී මාර්ගය ලැබීම සඳහා ඉපදවීම සඳහා කරන පරිකර්ම අවස්ථාවන් සකදාගාමී මාර්ගය සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. එය උපනිස්සය කරගෙන තමයි සකදාගාමී මාර්ගය ලැබෙන්නේ.

**එතකොට ඒ උපනිඃශ්‍රය යෙදෙන්නේ නැත්නම් මාර්ගය නෑ. සෝවහන් මාර්ගය කෙනකුට ඉපදෙන්නේ නැත්නම් හේතුව මොකද්ද? උපනිඃශ්‍රය නැති නිසා. උපනිඃශ්‍රය ටික හදා ගත්තොත් සෝවහන් මාර්ගය උපදිනව. හරියට පිරිසිදු තෙල් ටිකක්, තිරෙත්, ඒ වගේම ඒ පහනත්, ජ්වලන උෂ්ණත්වයත් කියන ටික සුදුසු පරිදි සකස් වුණාට පස්සේ එහි ඵලය, පහනක දැල්වීම කියන දේ අපිට පෙනෙනවා.**

එතකොට ඒ ප්‍රත්‍යය ටික සකස් වීම තුළ තමයි ඒ ඵලය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. ඒ වගේම තමයි මේ මාර්ගය උපදිනව නම් මේ මාර්ගය ඉපදවීම සඳහා මේ ධර්මයන්ගේ ප්‍රත්‍යයතාවය අපි  හඳුනාගන්නට ඕනේ. **උපනිඃශ්‍රය වන ධර්ම අයින් වුණොත් එහෙම ඒක උපදින්නේ නෑ. ඒ නිසා කෙනකුට මාර්ගය උපදින්නේ නෑ කියල හිතනව නම් ඔහු බැලිය යුත්තේ මාර්ගය ඉපදීම හෝ නැති බව නෙමෙයි. ඒ සඳහා උපනිඃශ්‍රය ධර්ම තමන් සතුව තියෙනව ද කියල. උපනිඃශ්‍රය ධර්ම අඩු නම් උපනිඃශ්‍රය ධර්ම සම්පාදනය කරගත යුතු වෙනව. එතකොට තමයි අර මාර්ගය උපදවන්නට පුළුවන්කම තියෙන්නේ.** ඉතින් මෙන්න මේ විදියට දුතිය මාර්ගය ඉපදවීම සඳහා, ඒ සඳහා තියෙන පරිකර්මය - සිත භාවිත කිරීම - පුරුදු කිරීම උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරණු ලබනව.

**තතියස්ස මග්ගස්ස පරිකම්මං  - තතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** ඊට පස්සේ තෙවන මාර්ගය ඉපදවීම සඳහා,  තෙවන මාර්ගය ලැබීම සඳහා, තෙවන මාර්ගය ඉපද වෙන්නට සිත භාවිත  කිරීම පරිකර්මය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

**චතුත්ථස්ස මග්ගස්ස පරිකම්මං - චතුත්ථස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** එතකොට සතරවෙනි මාර්ගය ලැබීම

සඳහා කරන පරිකර්මය සතරවෙනි මාර්ගය ලැබීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව.

එතකොට මෙන්න මේ විදියට ඒ මාර්ගයට, පරිකර්ම අවස්ථාවන් ප්‍රත්‍යය වීම කියන එක අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඉතින් මෙන්න මේ විදියට තමන්ට සිතෙහි ලෝකෝත්තර මාර්ගය දක්වාම වැඩෙන ආකාරය, ලෞකික කුසලයන් තුළ ඉඳල ලෝකෝත්තර මාර්ගය උපදවා ගැනීම දක්වාම තම සිත වැඩෙන ආකාරය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව මේ ප්‍රත්‍යය විභාගය තුළ.

## ***පකතූප නිස්සය (සත්වෙනි කොටස)***

ඉන් අනතුරුව අපිට දකින්නට පුළුවන් **පඨමො මග්ගො - දුතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** පළමු මාර්ගය දෙවෙනි මාර්ගය ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දැන් මුලින් කිව්වේ මොකද්ද? පරිකර්මය ප්‍රත්‍යය වෙනවා මාර්ගය උපදවන්නට. **(උදාඃ පඨමස්ස මගස්ස පරිකම්මං - පඨමස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.)**
පරිකර්මය තමයි ආසන්නම මාර්ගයට. පරිකර්මය නිසා තමයි පරිකර්ම ගොත්‍රභූ වශයෙන් තමයි ඒ සිත උපදින්නේ.

එතකොට දැන් මේ අවස්ථාවලදී මෙතනදි දැන් ආපහු කියන්නේ මොකද්ද? අර පරිකර්මය කියන එක නොකියා මෙතනදි කියනව අර පළමු මාර්ගය දෙවෙනි මාර්ගය ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල. එතකොට පළමු මාර්ගයට අනුලොම්ව තමයි දෙවෙනි මාර්ගය උපදින්නේ. ඒ නිසා අර ගොත්‍රභූ කියන අවස්ථාව එන කොට මෙතනදි අනුලොම් කියල අපි කතා කරනව. අනුලෝම සහ වොදාන කියල පිරිසිදු බව ඇති කරනව අර කෙලසුන්ගෙන් ඇති කරන. එතකොට මෙන්න මේ අවස්ථාවන්ගේදි ඇති වන්නේ මොනවද?

මේ අවස්ථාවෙදි සිද්ධ වන දේ තමයි අර පළමු මාර්ග ඥාණය දෙවෙනි මාර්ගය ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

*එතකොට ඒ මැද පරිකර්ම නැද්ද? පරිකර්ම තියෙන්න එපෑය. ඒකනේ අර කලින් සඳහන් කලේ. පරිකර්ම තියෙනව. සිතේ ඒ සඳහා නැවත නැවත අනිත්‍යය දුක්ඛ ආදී ඒ ත්‍රිලක්ෂණයෙහිම නැවත නැවත නැගීම සිද්ධ කරනව. සිත ඒ වෙත යොමු කිරීම සිද්ධ කරනව. ඒක තමයි සීල ආදී සූත්‍රයන්හී තියෙන්නේ පෘථග්ජන කෙනා සෝවහන් වෙන්න පඤ්ච උපාදානස්කන්ධයේ උදය - වැය බලනව. සෝවහන් කෙනා සකදාගාමී වෙන්න, සකදාගාමී කෙනා අනාගාමී වෙන්න, අනාගාමී කෙනා රහත් වෙන්න, රහතන් වහන්සේ දිට්ඨ ධම්ම සුඛ විහරණය සඳහා කරන්නේ මොනවද කියල අහන කොට ඒත් කියන්නේ මේ උපාදානස්කන්ධයේ උදය - වැය බලනව කියල.*

එතකොට මේ හැම තැනකදිම එහෙනම් පරිකර්ම අවස්ථාවක් විදියට මේ උදය - වැය ආදී දැකීම පරිකර්මය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව නේ මේ මාර්ග ඵල උපදවන්නට. එහෙනම් පළමු මාර්ගය උපදව ගත්ත කෙනෙකුට දෙවෙනි මාර්ගය උපදවන්නට අර පළමු මාර්ගයෙන් ලබා ගත්ත අවබෝධය ප්‍රඥාව හේතුවක් බවට පත් වෙනව. ඒක තමයි මේ පළමු මාර්ගය දෙවෙනි මාර්ගය ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය  වෙනව කියල මේ දැක්කුවේ.

ඒ පළමු මාර්ගයෙන් කෙලෙස් ප්‍රහාණය කලා නම් ඒ ප්‍රහාණය කල මට්ටමේ ඉඳල තමයි දෙවෙනි මාර්ගය වඩන්නේ. දෙවෙනි මාර්ගය ලබන්නට උත්සාහවත් වෙන්නේ. ඒ නිසා තමයි අර පළමු මාර්ගය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල කිව්වේ. දැන් අර මුලින්ම පැහැදිලි කරපු එක ඔබට මෙතනදි වඩාත්ම තව දුරටත් තේරුම් ගන්න පුළුවන්කම තියෙනව. දැන්

අපි දන්නව පළමු මාර්ගයට අනතුරුව උපදින්නේ පළමු ඵල සිත නේ. සෝවහන් මාර්ගයට අනතුරුව උපදින්නේ සෝතාපත්ති ඵලය. සෝවහන් මාර්ගයට අනතුරුව උපදින්නේ නෑ සකදාගාමී මාර්ගය. සෝවහන් මාර්ගයට අනතුරුව සෝවහන් ඵලයයි හට ගන්නේ. එතකොට ඒ සෝවහන් මාර්ගයට අනතුරුව සෝතාපත්ති ඵල සිත හටගෙන ඊට පසු අවස්ථාවල නැවත පරිකර්ම ඉපදිල ආපහු සකදාගාමී මාර්ගය ඉපදෙන්නේ ඊට පස්සේ.

**හැබැයි දැන් මෙතනදි ඒ සෝවහන් ඵල සිත ගන්නෙත් නැතුව අනිකුත් පරිකර්ම කිරීම ආදියෙහි තියෙන ඒ ඤාණ සම්ප්‍රයුක්ත සිත් ටික ගන්නෙත් නැතුව මෙතනදි කියනව සෝවහන් මාර්ගය සකදාගාමී මාර්ගයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල. *ඒ අතරතුර වෙන ඒව නෑ කියල නෙමෙයි කියන්නේ.* අර සකදාගාමී මාර්ගය උපදින්නේ සෝවහන් මාර්ගය තුළ ලබා ගත්ත අවබෝධය ඒ කෙලෙස් ගෙවීම කියන මත පිහිටල තමයි සකදාගාමී මාර්ගය කියන එකේ වැඩීම සිද්ධ වෙන්නේ. ආයේ මුල ඉඳල වඩන්න දේවල් ඉතුරු වෙලා එහෙම නෑ. ආපහු මුල ඉඳල වැහිල ගිහිල්ල ඔක්කොම අමතක වෙලා ගිහිල්ල එහෙම නෑ. ඒ මාර්ගය මේ මාර්ගයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරණු ලබනව. ඒක තමයි මෙතනදි තේරුම් ගන්නට තියෙන්නේ.**

එතකොට උපනිස්සය ප්‍රත්‍යය තමයි මෙතනදි වඩාත්ම වැදගත් වෙන්නේ. මේ කියන කාරණාව තේරුම් ගන්නවටත් වැඩිය, මම මෙතනදි බලාපොරොත්තු වෙන දේ තමයි මේ උපනිස්සය ප්‍රත්‍යය කියන්නේ මොකද්ද? මෙහි භාවිතය සිද්ධ වෙන්නේ මොන ආකාරයන්ගෙන්ද කියල ඔබ තේරුම් ගැනීම. එහෙනම් ඊට අනතුරුව තව දෙයක් ඉපදවීම පමණක් නෙමෙයි උපනිඃශ්‍රය කියල කියන්නේ. මොකද්ද උපනිඃශ්‍රය කියල කියන්නේ? අර ඊට පෙරාතුව මාර්ගය, ඊළඟ මාර්ගයට, ඒ අතරතුර තව කොතෙක්

දේවල් පහළ වෙලා තිබුණත් අර ප්‍රඥාව මතම තමයි ඊළඟ ප්‍රඥාව උපදින්නේ. එහෙනම් ඒ දෙක අතර සම්බන්ධයක් තියෙනව. සම්බන්ධයක් යනුවෙන් අදහස් කලේ මෙය තියෙනව. මෙහි තිබිල ඊළඟ මාර්ගය උපදවනව එහෙම නෙමෙයි. මෙතනින් උපදව ගත්ත ප්‍රඥාව මත තමයි ඊළඟ දේ හටගෙන තියෙන්නේ. ඒකට අපි කියන්නේ උපනිස්සය ප්‍රත්‍යය ශක්තිය කියල. ඉතින් මේ ප්‍රත්‍යය ශක්තිය තේරුම් ගත්තහම අපිට එතන බොහෝ ගැටලු නිරවුල් කර ගන්නට පුළුවන්කම තියෙනව.

එතකොට මේ විදියටම **දුතියො මග්ගො - තතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** සකදාගාමී මාර්ගය අනාගාමී මාර්ගය ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

ඒ වගේම **තතියො මග්ගො - චතුත්‍ථස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චියො.** ඒ වගේම අනාගාමී මාර්ගය අරිහත් මාර්ගය ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරණු ලබනව.

මේ විදියට ඒ ඒ මාර්ගයන් අතර සිද්ධ වන උපනිස්සය ප්‍රත්‍යය භාවය පිළිබඳව අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

එතකොට ලෝකෝත්තර කුසලය ලෝකෝත්තර කුසලයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව තමයි තවත් පැත්තකින් මේ පැහැදිලි කලේ. ලෝකෝත්තර කුසලය ලෝකෝත්තර කුසලයන් ජනනය කිරීමට ලෝකෝත්තර කුසලයන් ඉපදවීම සඳහා මේ උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වීම කියන දේ තමයි මෙතන හඳුනා ගැනීම වැදගත් වෙන්නේ.

## *පකතූපනිස්සය (අටවෙනි කොටස)*

**සෙක්ඛා මග්ගං උපනිස්සාය - අනුප්පන්නං සමාපත්තිං උප්පාදෙන්ති. උප්පන්නං සමාපජ්ජන්ති. සංඛාරෙ අනිච්චතො, දුක්ඛතො, අනන්තතො විපස්සන්ති.**

ඒ වගේම අපිට දකින්නට පුළුවන් **සෙක්ඛා මග්ගං උපනිස්සාය -අනුප්පන්නං සමාපත්තිං උප්පාදෙන්ති.** සේඛ ආයයීන් වහන්සේලා **මග්ගං උපනිස්සාය,** මාර්ගය ඇසුරු කරගෙන, මාර්ගය උපනිඃශ්‍රය කරගෙන **අනුප්පන්නං සමාපත්තිං උප්පාදෙන්ති, අනුප්පන්න,** නූපන්නා වූ සමාපත්ති උපදවනව. **උප්පන්නං සමාපජ්ජන්ති,** ඉපදුනු සමාපත්තීන්ට සමවදිනව. **සංඛාරෙ අනිච්චතො, දුක්ඛතො, අනන්තතො විපස්සන්ති,** සංස්කාරයෝ අනිත්‍යය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් මෙනෙහි කිරීම සිද්ධ කරනව.

එතකොට සෝවහන් සකදාගාමී අනාගාමී කියන සේඛ ආයයීන් වහන්සේලා **සෙක්ඛා මග්ගං උපනිස්සාය** මාර්ගය උපනිඃශ්‍රය කරගෙන **අනුප්පන්නං සමාපත්තිං උප්පාදෙන්ති,** නූපන් මාර්ග උපදවීම සිද්ධ කරනව. සමාපත්ති ඉපදවීම සිද්ධ කරනව. මොනවද සමාපත්ති? ප්‍රථම ධ්‍යාන, ද්විතිය ධ්‍යාන. ධ්‍යාන සමාපත්ති උපදවන්න ඒ මාර්ග සඳහා තම සිත භාවිත කරන්නට වඩන්නට සේඛ ආයයීන් වහන්සේලාට පුළුවන්කම තියෙනව. ඉතින් මේ සේඛ ආයයීන් වහන්සේලා මොකද කරන්නේ? රහතන් වහන්සේලා නෙමෙයි. සේඛ ආයයීන් වහන්සේලා තමන්ගේ සිත ප්‍රථම ධ්‍යාන - ද්විතිය ධ්‍යාන - තෘතිය ධ්‍යාන පිණිස වඩනව.

එතකොට ඒ අය සිත වඩන කොට **මග්ගං උපනිස්සාය** මාර්ගය ඇසුරු කරගෙන තමයි ඒක වඩන්නේ. ඇයි මාර්ගය ඇසුරු කරගෙන කියල කියන්නේ? මාර්ගයෙන් ප්‍රහීණ කලා නම්

යම්කිසි කෙලෙස් කොට්ඨාසයක්, මාර්ගයෙන් සින්ද නම් කෙලෙස් ටිකක්, අන්න ඒ මත පිහිටල තමයි අනිකුත් අර ධ්‍යාන සමාපත්ති ඉපදවීම සඳහා හිත තබන්නේ. මාර්ගයෙන් සින්ද නම් යම් කෙලෙස් ටිකක් ඒ මාර්ගයෙන් සිඳපු කෙලෙස් ටික ආයේ ඉපැත්මක් නැනේ. ඒ නිසා ඒ මාර්ගය මුල් කරගෙන, ඒ මාර්ගය මත පිහිටා තමයි මේ ධර්මයන්ගේ වැඩීම සිද්ධ කරන්නේ. **මග්ගං උපනිස්සාය** කියල සඳහන් කලේ ඒ නිසා තමයි. **මග්ගං උපනිස්සාය,** මාර්ගය ඇසුරු කරගෙන.

අන්න ඒ වගේ විපස්සනාව සිද්ධ කරනව අනිත්‍යය දුක්ඛ අනාත්ම වශයෙන් ත්‍රිලක්ෂණයට නගා මෙනෙහි කිරීම සිද්ධ කරනව. අන්න එබඳු අවස්ථාවල ඇති වන්නේ මොකද්ද? අර ඊළඟ ඵලයන් ඉපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම තමයි සිදු කරන්නේ.

**තෙන තෙන මග්ගෙන සිථිලීකත පහීණ පාරිපන්ථ කත්‍තා තං තං සමාපත්තිං උප්පාදෙන්තීති.**

එතකොට ඒ විදියට ඒ ඒ ලිහිල් කල නසා දැමූ කෙලෙස් නිසා, ඒකයි **සිථිලීකත** කියල කිව්වේ, සිසිල් බවට පත් කරපු **පහීණ පාරිපන්ථ කත්‍තා,** පිරිසිදු බවට පත්කර ගත්ත **තං තං සමාපත්තිං උප්පාදෙන්තී,** ඒ ඒ සමාපත්තීන්ගේ පහළ කිරීම සිද්ධ කරනව. එතකොට මෙන්න මේ අවස්ථාවලදිත් භාවිත වන දේත් තමයි මේ උපනිස්සය ප්‍රත්‍යය කියන එක. උපනිස්සය කියන ප්‍රත්‍යය මුල් කරගෙන තමයි උපනිස්සය කියන ප්‍රත්‍යය අනුගතව ගිහිල්ල තමයි මේ දේ උපදවන්නේ. එතකොට මේ විදියට ඒ අවස්ථාවලදිත් උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය සිද්ධ කරනව.

## *පකතූ පනිස්සය (නමවෙනි කොටස)*

**මග්ගො සෙක්ඛානං අත්‍ථපටිසම්භිදාය, ධම්ම පටිසම්භිදාය, නිරුත්ති පටිසම්භිදාය, පටිභාණ පටිසම්භිදාය ඨානාඨාන කොසල්ලස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

එතකොට මේ සේඛ පුද්ගලයන්ට මාර්ග ඤාණය **අත්‍ථපටිසම්භිදාව පිණිස (චතුපටිසම්භිදා ප්‍රභේදයෙන් එකක නාමය, අර්ථයෙහි ප්‍රභේදගත වූ ඤාණය) ධම්ම පටිසම්භිදාව පිණිස (ප්‍රත්‍යය ධර්මයෙහි ප්‍රභේද ගත නුවණ හෙවත් හේතුව තේරුම් ගැනීමේ ඤාණය, චතුපටිසම්භිදා හෙවත් සිව්පිළිසිඹියාපත් අතුරින් එකක නාමය) ඒ වගේම නිරුත්ති පටිසම්භිදාව පිණිස (අත්‍ථපටිසම්භිදා ඤාණයන්ගෙන් දතයුතු වන ඵල ධර්මයන්ද ධම්මපටිසම්භිදා ඤාණයෙන් දතයුතු වන හේතු ධර්මයන්ද පිළිබඳ නියත සම්බන්ධය ඇත්තා වූ ස්වභාව නිරුත්ති පිළිබඳ දැනුම), පටිභාණ පටිසම්භිදා පිණිස (අර්ථ, ධර්ම, නිරුත්ති යන තෙවැදෑරුම් ඤාණයෙහි පැමිණි අවබෝධය),** ඒ ඒ ස්ථානයන්ගේ **ඨානාඨාන කොසල්ලස්ස** කියල කියනව. ස්ථාන පිළිබඳව දැන ගැනීමෙහි කුසල බව පිළිබඳව උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය තියෙනව.

එතකොට ඒක අපිට තව දුරටත් ඉදිරියේදී පැහැදිලි කරගන්නට පුළුවන්කම තියෙනව. මොකද්ද මේ **අත්‍ථපටිසම්භිදා** කියල කියන්නේ, මොකද්ද **ධම්ම පටිසම්භිදා** කියල කියන්නේ, මොකද්ද **නිරුත්ති පටිසම්භිදා** කියල කියන්නේ මොකද්ද, **පටිභාණ පටිසම්භිදා** කියල කියන්නේ මොකද්ද කියන එක අපි තේරුම් ගැනීමත් එක්ක තමයි මෙතන උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙන්නේ. මෙතනදි හැබැයි වඩාත්ම අවශ්‍ය වන දේ බවට මම අවධානයක් යොමු කරන්නේ උපනිස්සය ප්‍රත්‍යය සහ උපනිස්සය ප්‍රත්‍යය ශක්තිය මොකද්ද, පච්චයසමුප්පන්න වන්නා වූ ධර්මයෝ,

සමුප්පන්න බවට පත් කරන්නේ  කොහොමද කියන එක පිළිබඳව ඔබ ඇතිකර ගන්නා යථා අවබෝධය තමයි මෙතනදි බලාපොරොත්තු වෙන්නේ.

ඒ නිසා මේ කියන කාරණාවන් ඔබට ඇතැම් දේවල් මග හැරුනා කියල ගැටලුවක් නැහැ. උපනිස්සය ප්‍රත්‍යය කියන එක හරියට තේරුම් ගියා නම් එය හොඳට ප්‍රමාණවත්. ඉතින් ඒ නිසා ගොඩාක් අමාරුයි කියල ඒකෙන් පසු බසින්නට එපා. ටිකෙන් ටික උත්සාහවත් වන්නට ඕනේ. ඔබට එක වරක් අහල තේරුණේ නැති වුණොත් නැවත වරක් අහන්න. ආපහු නැවත උත්සාහවත් වෙන්න. ඒ තුළ ඔබට පුළුවන්කම තියෙනව මේ අභ්‍යන්තරයෙහි යෙදෙන බොහෝ කරුණු කාරණාවන් ඔබට තවත් සුවිශදව තේරුම් ගන්නට සහ ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඇතිකර ගන්නට. ඒ අවබෝධය ඔබට ඉතාම වැදගත් බොහෝ දහම් කරුණු අපිට නිරවුල් කර ගන්නට. පටිච්චසමුප්පාද ආදී දහම් කරුණු පිළිබඳව අපි විමසා  බලන කොට ඒක නිරවුල් කරගන්න යන කොට ඒ කාරණාවන් පිළිබඳව තියෙන අවබෝධය ඔබට ඉතාම වැදගත් වෙනව.

ඒ හින්දා ඒක අතහැර ගන්නට එපා. ඒ සඳහා ඔබ අප්‍රමාදීව උත්සාහවත් වන්න. අප්‍රමාදීව කටයුතු කරන්නට කියල ඔබ හැම දෙනාටම කල්‍යාණ මිත්‍ර භාවයෙන් සිහිපත් කරනව.

**සාදු සාදු සාදු**

# 09 03 2024 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසි හතරවෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සූදානම් වන මොහොත.

ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඒ උතුම් ශ්‍රද්ධර්ම සාගරයෙන් ස්වල්පයක් නමුත් ශ්‍රවණය කර ගන්නටයි ඔබ හැම දෙනාම මේ මොහොතෙදි සූදානම්ව සිටින්නේ.

පින්වතුනි, භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයෙහි පහළවීම ඉතාමත් දුර්ලභයි. ඒ භාග්‍යවතුන් වහන්සේ නමක් අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත කේවල පරිපූර්ණ වුණ ධර්මයකුයි මේ ලෝකයට දේශනා කරනු ලබන්නේ. අර්ථ ව්‍යඤ්ජන වශයෙන් පරිපූර්ණ වූ සියලු ආකාරයකින් අඩුවක් නොවූ දහමක් භාග්‍යවතුන් වහන්සේලා පෙන්වා දෙනු ලබන කල්හි ඒ ධර්මය එලෙසම ව්‍යඤ්ජන සහිතව අප තේරුම් ගතයුතු වෙනව.

එයින් අදහස් කරනු ලැබුවේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනා ව්‍යවහාරය දේශනා න්‍යාය ඉක්මවා අපට ධර්මය හොයා ගන්නට මාර්ගය උපදවා ගන්නට පැහැදිලි කරගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එහෙනම් එය අපිට ගවේෂණය කරන්නට

වෙන්නේ සොයා බලන්නට වන්නේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව ලෙස අපට පිරිසිදුව දකින්නට ලැබෙන හමුවෙන ත්‍රිපිටක ධර්මය තුළින්මයි.

ත්‍රිපිටක ධර්මය තුළින් අපි ධර්මය ගවේෂණය කරන කොට සූත්‍ර පිටකය තුළ විහිත වූ කරුණු කාරණාවන් තව දුරටත් ගැඹුරින් තේරුම් ගැනීම පිළිබඳව අභිධර්මය තුළ කරුණු කාරණා පැහැදිලි වෙනවා. මේ ආකාරයට සූත්‍ර අභිධර්ම යන මේ පොදු වූ ධර්මයන් අපට එක ළඟින් විශ්ලේෂණය කරගත යුතු වෙනව ඒ ධර්ම සංකල්පයන් පිළිබඳව.

ඉතින් මේ ධර්මය තේරුම් ගැනීමේදී අපට ඉතාම වැදගත් වන දහම් පරියායක් තමයි භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ මේ හේතු ඵල ධර්ම න්‍යාය. භාග්‍යවතුන් වහන්සේගේ විස්තාරිත හේතු ඵල ධර්ම න්‍යාය හැටියට අපි නිතර සිහිපත් කරනව, මේ සූවිසි ප්‍රත්‍යය විභාගයයි අපට හඳුනාගන්නට තිබෙන්නේ පට්ඨාන ප්‍රකරණයෙහි විහිත මේ සූවිසි ප්‍රත්‍යය ධර්ම විභාගය.

මේ සූවිසි ප්‍රත්‍යය ධර්මයන් අපි විභාගයට ලක් කරන කල්හි එක් එක් ප්‍රත්‍යය ධර්මයන්ට අනන්‍ය වූ කරුණු අපට කතා කරන්නට පුළුවන්කම තියෙනව. මේ දේශනා මාලාවේ දී අප උදක්ම බලාපොරොත්තු වන්නේ එම ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව මූලික හඳුනා ගැනීමක් සිදු කිරීමට. එහි දී  උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳවයි අපි දැනට සති කිහිපයක පටන්ම දේශනා තුළින් හඳුනාගන්නට යෙදෙන්නේ.

ඉතින් අද දවසේදී ත් ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳවයි කරුණු  කාරණා විමසන්නට යෙදෙන්නේ. පසුගිය දේශනාව තුළින් මාර්ගය ඵලයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන ආකාරය, ඒ වගේම පළමු මාර්ගය දෙවන  මාර්ගයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ආකාරය, මේ ආදී ලෙස අපි ඒ

මාර්ග සහ ඵල අධිගමයන් අතර පවත්නා උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව සාකච්ඡා කරන්නට යෙදුනා.

ඒ වගේම සේඛ ආයයීන් වහන්සේලා යම් එබඳු ආකාරයකට සමාපත්තීන් උපදවන කොට ආයයී මාර්ගයෙහි හික්මුණ නැතිනම් සෝවාන් සකෘදාගාමී අනාගාමී ආදී මේ සේඛ ආයයීන් වහන්සේලා යම් එබඳු ආකාරයකට සමාපත්ති ආදිය උපදවන කල්හි, ඒ වගේම ඉපදුණ සමාපත්තීන්ට සමවදින කල්හි සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය දුක්ඛ අනාත්මයන් විපස්සනා කරන කල්හි, මේ අවස්ථාවන් වලදී මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය සිදුවන බව අපි හඳුනාගන්නට යෙදුනා.

*එතකොට ඒ මාර්ගය උපනිඃශ්‍රය කරගෙන තමයි උන්වහන්සේලා සමාපත්තියට සමවැදීම සිද්ධ කරන්නේ. එතකොට සාමාන්‍යයෙන් ප්‍රථම ධ්‍යානය සමවැදීමට වඩා සෝතාපන්න මාර්ග - සකදාගාමී මාර්ග - අනාගාමී මාර්ග ආදිය උපනිඃශ්‍රය කරගෙන ඒ මාර්ගයට සමවැදීම කරන බව ධ්‍යාන ඉපදවීම සිදු කරන බව අපට එහි දී හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.*

ඉතින් මේ ධර්ම කාරණා පිළිබඳව සාකච්ඡා කරනු ලබන අවස්ථාවල බොහෝ දෙනා විසින් මතු කරන අදහසක් බවට පත්වන්නේ මේ කියන කාරණාවන් පොත්පත් වල තිබෙන දේවල්. මේක ප්‍රායෝගික ජීවිතයට ඇතුළත් නොවන දේ ද කියලා.

ඇත්තටම ධර්මය අපේ ප්‍රායෝගික ජීවිතය තුළ භාවිත වන දේ. ඒ ප්‍රායෝගික ජීවිත වල ඇතිවන භාවිතය තමයි, ඒ අනුගමනය කළ යුතු, භාවිත කිරීම ලෙස හැඳින්වීමේ දී අනුගමනය කළයුතු පියවරවල් තමයි අපට පොත්පත් වල දකින්නට පුළුවන්කම තියෙන්නේ. එතකොට ත්‍රිපිටකය තුළ ඒ පිළිබඳ තිබෙන අර්ථ විවරණයන් තුළ අපට හඳුනාගන්නට තියෙන්නේ ඒ ස්වභාවයන් පිළිබඳව.

**ඒ නිසා මේ භාවනාව තුළ අපි ලබන අත්දැකීම්, ලබන ප්‍රතිඵලයන්, ඒවා අර මූල ධර්ම ග්‍රන්ථයන්හි දැක්වෙන දේවල් ඒ සීමාවන් ඉක්මවා ගිහිල්ල ඒවට වඩා වෙනස් දේවල් බවට පත්වන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒක එයට අනුගත විය යුතුයි. එහෙම නැතිවුණොත් අපි ගිහිල්ල තියෙන්නේ ඒ පාරේ නෙවෙයි වෙනත් මාර්ගයක.**

අපි කෙනෙකුට අනුරාධපුරයෙහි සිට කොළඹ බලා පිටත් වන්නට අවශ්‍ය මාර්ග සලකුණු කියනව. එතකොට ඒ කෙනාට තමන් ගමන් කරන කොට කොළඹට යන මං සලකුණු ඔහුට දකින්නට පුළුවන් නම් ගැටලුවක් ඇත්තේ නැහැ. ඔහුට ලියල දුන්නොත් ඒ ලියලා තිබුණ දේට අනුව මං සලකුණු පෙනෙනව නම් ඔහුට ගැටලුවක් ඇත්තේ නැහැ ඔහු නිවැරදි මාර්ගයෙහි යනව.

ඒ වගේම යම්කිසි විදිහකින් ඔහු ගමන් කරනු ලබන්නේ මාර්ගයක කියල හිතාගෙන, ඒකත් මාර්ගයක් තමයි කියල යාපනයට යන පාරේ යනව. එකේදී මාර්ග සලකුණු දකින්න පුළුවන්කම ලැබෙනව. ඔහු සංසන්දනය කරන කොට අර ඔහු ළඟ තියෙන දේත් එක්ක ගැලපෙන්නේ නැත්නම්, යම් කිසි කෙනෙක් කියනව නම් මේත් මං සලකුණු තමයි මේකත් එහෙනම් කොළඹට යන්නට පුළුවන් කියලා තර්කයක් ගොඩ නගනව නම් අපි දන්නව ඒක ඉතාමත් මෝඩ කතාවක් කියල.

ඒ වගේම තමයි යම්කිසි කෙනෙක් මේ ධර්මය කියන එක අර ත්‍රිපිටකයට පරිබාහිරව, තමන්ගේ දැනුමට පරිබාහිරව කියල අපි කතා කරන කොට ඒ තමන්ගේ අවබෝධය දැනුම ත්‍රිපිටකයට පරිබාහිරව යෙදෙනව. මේක තමයි ප්‍රායෝගික දේ කියල අර වෙනස් කර ගන්නට උත්සාහවත් වෙනව නම් ඒක වෙනස් කොට හඟිනව නම් කල්පනා කරනව නම් ඒ කොළඹ යනව කියලා හිතාගෙන යාපනය පාරෙ යන්නේ. එසේ නොවිය යුතු යි.

ඉතින් මේ කාරණාව සිහිපත් කරන්නට යෙදුනේ මේ මාර්ග ඵල අධිගම පිළිබඳව අපි මේ විදිහට කතා කරන කොට මේවා මේ ප්‍රායෝගික නොවෙන දේවල් නෙවෙයි. ප්‍රායෝගිකව යෙදෙන දේ න්‍යායාත්මකව මෙතන කතා කරනව. ප්‍රායෝගිකව ඇති දේ න්‍යායාත්මකව කතා කරනව. එතකොට ප්‍රායෝගික භාවිතය ඇතුළේ ඒ න්‍යායාත්මක සංසිද්ධිය ඒ විදිහට යෙදිල තියෙනව සහ ඔබ මාර්ගය වඩන කොට, ඔබ මාර්ගය උපදවන කොට, ඔබ මාර්ගය උපදවා නැවත සමාපත්තීන් උපදවන කොට, මෙබඳු ආකාරයේ ප්‍රත්‍යය ධර්මයන්ගෙන් තමයි ඒ දේවල් උපද්දවල තියෙන්නේ. මෙබඳු ආකාරයේ ප්‍රත්‍යය සමවායෙන් තමයි ඒ පැවැත්ම පේන්නේ. අන්න ඒ පැවැත්ම පෙනෙන ප්‍රත්‍යය ධර්මයන්ගේ ස්වභාවය තමයි අප මෙතනදි හඳුනාගන්නට යෙදෙන්නේ.

ඒ වගේම අද දවසෙදි අපි සාකච්ඡා කරන්නට තිබෙන මාතෘකාව පිළිබඳව අප අවධානය යොමු කළොත් අපට පෙනෙනව,

**මග්ගො සෙක්ඛානං - අත්‍ථපටිසම්භිදාය, ධම්ම පටිසම්භිදාය, නිරුත්ති පටිසම්භිදාය, පටිභාණ පටිසම්භිදාය, ඨානාඨාන කොසල්ලස්ස උපනිස්සය පච්චෙන පච්චයො කියලා.**

එතකොට **මග්ගො සෙක්ඛානං** සේඛ ආයයීන් වහන්සේලාට මේ මාර්ගය **අත්‍ථපටිසම්භිදාය,** අර්ථ පටිසම්භිදාව පිණිස, **ධම්ම පටිසම්භිදාය,** ධම්ම පටිසම්භිදාව පිණිස, **නිරුත්ති පටිසම්භිදාය,** නිරුක්ති පටිසම්භිදාව පිණිස, ඒ වගේම **පටිභාණ පටිසම්භිදාය,** පටිභාන පටිසම්භිදාව පිණිස, ඒ වගේම **ඨානාඨාන,** ස්ථාන ස්ථාන වශයෙන්, **කොසල්ල** වශයෙන් **උපනිස්සය පච්චෙන පච්චයො,** උපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වීම සිදු කරනු ලබනව. ඒ කියන්නේ සේඛ ආයයීන් වහන්සේලාට උපදනා මාර්ග ඥාණය මේ අත්‍ථ පටිසම්භිදා - ධම්ම පටිසම්භිදා - නිරුත්ති පටිසම්භිදා - පටිභාන පටිසම්භිදා කියන මේ පටිසම්භිදා ඥාණ උපදවන්නට හේතුවක් බවට පත්වෙනව.

පටිසම්භිදා නැතිනම් මේ සිව්පිළිසිඹියාපත් කියන වචනය අපිට අහන්නට ලැබෙන නිතර අපි ඇසුරු කරන දෙයක්. සිව්පිළිසිඹියා එහෙම නැතිනම් **චතුපටිසම්භිදා** පාලි වචනය තමයි **චතුපටිසම්භිදා** කියල කියන්නේ. එතකොට සතරක් වූ ප්‍රතිසම්භිදාවන් කියලා අපි සිංහලෙන් මේ ගැන කතා කරනව. නැතිනම් පටිසම්භිදා හතර කියලත් අපි කියනව.

**එතකොට සිව්පිළිසිඹියාපත් කියන්නේ චතුපටිසම්භිදා ප්‍රාප්ත කියන එක. චතුපටිසම්භිදා ප්‍රාප්ත. සතර ප්‍රතිසංවිධාවට පැමිණි. එතකොට මේ සතර පටිසම්භිදාවට පැමිණි කියල කියන්නේ මේ පටිසම්භිදා හතරක් උපදවා ගත්ත කියන එක. රහතන් වහන්සේලාගේ සිව්පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා සහ සිව්පිළිසිඹියාපත් නොලැබූ මහරහතන් වහන්සේලාය කියලා රහතන් වහන්සේලා කොටස් අපිට දකින්න පුළුවන්.**

**එතකොට සිව්පිළිසිඹියාපත් ලබන්නේ කවුද? අර බහුශ්‍රැත - ශ්‍රැතවත් - ශ්‍රැත සන්නිචය - පරිචිත මහරහතන් වහන්සේලා. උන්වහන්සේලා වෙනම ම විවිධ පර්යායන් ඔස්සේ තම සිත භාවිත කිරීම තුළ වැඩීම තුළ තමයි සිව්පිළිසිඹියාපත් උපදවන්නේ. ඒක නිකම්ම ලැබෙන දෙයක් නෙමෙයි. ඒක නිසා සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේලාය කියන කොට උන්වහන්සේලාගේ විශේෂත්වයක් තියෙනව.**

ධර්ම සංගායනාව සඳහා මුලින්ම තෝරා ගත්තේ සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේලා. ඒ වගේම සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේලා තමන්ගේ සිත මනාව භාවිත කළ මහෝත්තම පිරිසක්. අනිකුත් රහතන් වහන්සේලා අතර අරිහත් ඵලය කියන දෙයින් වෙනසක් නොවුණත් උන්වහන්සේලාගේ මනස භාවිත කිරීම පැත්තෙන් සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේලා වඩා වැඩි භාවිත කිරීමක තියෙනව.

ඉතින් මේ භාවිතය කරන්නේ කොයි කාලෙකද කියලා බැලුවහම අර මාර්ග ඥාණයන් උපදවා ගත්තට පස්සේ සේඛ භූමිය තුළදි මේ චතුපටිසම්භිදාවන්ගේ භාවිත කිරීම සිද්ධ කරනවා මනස. ඉතින් මොනවද මේ චතුපටිසම්භිදා කියල කියන්නේ. අපි දන්නවා මේ වර්තමාන කාලෙදි මේ චතුපටිසම්භිදාවන් කියන එක බොහොම අයථා භාවිතයට ගන්න වචනයක්. ඒ කියන්නේ ඒක සුදුසු වන පරිදි නෙවෙයි නුසුදුසු පරිදි මේ වචනය අද කාලේ ගොඩක් වෙලාවට පාවිච්චි කරනව සිව්පිළිසිඹියාපත් කියන මේ වචනය.

එතකොට ඒ ඇත්තෝ හිතාගෙන ඉන්නව මේ සිව්පිළිසිඹියාපත් කිව්වහම මේ වචන හැදුණ හැටි පිළිබඳව එක එක අර්ථ දෙන්නට පුළුවන්කම තමයි මේ සිව්පිළිසිඹියාපත් කියන එකෙන් අදහස් කරන්නේ. එතකොට මේ එක එක වචන හැදුණ විධි තියෙනව. එක එක වචන හැදුණ හැටි තියෙනව. අන්න ඒ හැදුණ හැටි කියන්නට පුළුවන්කම තිබීම තමයි සිව්පිළිසිඹියාපත් කියන්නේ කියන එක කියල සමහර කෙනෙක් අදහස් කරගෙන පවතිනව.

මේක වචන ඡායාව ගැනීම නැතිනම් මේ සිව්පිළිසිඹියාපත්වල නිරුක්ති පටිසම්භිදාවෙහි වචන ඡායාව ගැනීම පමණක් නිසා ඇති කරගත්ත භයානක තේරුම් ගැනීමක්. සිව්පිළිසිඹියාපත් කියලා කියන්නේ යම් කිසි කෙනෙකුට හිතෙන පරිදි ගම්වල ගැමි දරුවන් විසින් ඔය එක එක වචන වලට අර්ථ සපයන ක්‍රමයට අරුත් සැපයීම නෙවෙයි.

ඒ කියන්නේ අව්‍යක්ත ක්‍රමයට තමන්ට හැඟෙන හැඟෙන පරිදි හිතූ හිතූ මනාපයට වචන හැදුණ හැටි එක එක අර්ථ යොදා ප්‍රකාශ කිරීම නෙවෙයි. අපි දකිනව අද සම්ප්‍රදාය ඇතුළේ මේ අපිට පිළිවෙලට ගොඩ නැඟුණ තැන්වල ඒ විදිහේ විකාර රූපී දේවල් නැතිවුණත්, ඉතාම වයසට ගිහිල්ල වෘද්ධ පබ්බජිත පුද්ගලයෝ ඉන්නව මේ සිව්පිළිසිඹියාපත් රහතුන්ය කියලා

හිතාගෙන, තමන්ට හිතූ හිතූ දේවල් හිතූ හිතූ වචන ඒ තැන් වලට කියනවා.

එතකොට දැන් ***කාලෙන*** කිව්වහම, මේ **කාලෙන** කියන එක දෙකට බෙදනවා, ***කාල*** කියන්නේ කෙලෙස් කියන එක ***න*** කියන්නේ නසනව  කියන එක, කාලෙන කියල කියන්නේ කෙලෙස් නැසීම කියන එක. එතකොට දැන් **කාලෙන ධම්ම සාකච්ඡා** කියල කියන්නේ කෙලෙස් නසන්නා  වූ ධර්මයක් සාකච්ඡා කරන්න කියන එක කියලා ඕකට අර්ථ කථනයක් සපයනව කියල හිතන්න.

ඔන්න ඔය විදිහේ කාලෙන කියන කොට කාල කියන වචනය මේ කෙලෙස් හඳුන්වන්නට යෙදෙනව කියල මේ කතාවක් ගොඩ නගනව. ඒක තමන්ට  හිතෙන විදියනේ, **කාල** කෙලෙස් බොහොම ළඟයි. ***න*** කියන්නෙ නසනවා. මේ පදය දෙකට කඩලා කියනව. ඔය විදිහට හිතූ මනාපෙට එක එක්කෙනා අර්ථ කථන සැපයීම නෙමෙයි මේ පටිසම්භිදා ඤාණ කියල එහෙම කියන්නේ.

අර ඩෙංගා නැටුවහම ඩෙංගු හැදෙනව. ඊට පස්සේ ණයට අරගෙන මුවාවෙලා ගියාම මුවෝ වෙනව. තිතට දෙන්නම් කියල මුවා වුණහම **(හැංගුණාම)** තිත් මුවෝ වෙනව. රැල්ලට හැක හැක ගෑවහම හැකරැල්ලෝ වෙනව. අර නම හැදුණ එකයි මොකක් හරි අකුසලයකුයි සම්බන්ධ කරල ඒ කිට්ටුවෙන් යන එහෙම තමයි සතා ඉපදිලා තියෙන්නේ කියලා ඒක ගැන විවිධ අර්ථ කථන සපයන්නට උත්සාහවත් වෙන අර රස්තියාදුකාර ක්‍රමයකට  එක  එක වචන වලට තේරුම් කියන එහෙම මේ මහා පටු ඉතාම අව්‍යක්ත  ක්‍රමයක් නෙමෙයි මේ චතුපටිසම්භිදා ලාභී බව කියල කියන්නේ.

චතුපටිසම්භිදා ලාභී බව කියල කියන්නේ ඉතාමත් විශාරද ඤාණයක් ඒක. ඒ නිසා මම හිතනව මේ මාර්ගය

චතුපටිසම්භිදාවට උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල කියන කොට, මාර්ගය කොහොමද ප්‍රත්‍යය වන්නේ කියන්නට කලින්, ඔබ චතුපටිසම්භිදා කියන්නේ මොනවද කියන එක නිවැරදිව හඳුනා ගත යුතුයි කියල.

**ඉතින් චතුපටිසම්භිදා කියල කියන්නේ අත්‍ථපටිසම්භිදාව ධම්ම පටිසම්භිදාව නිරුත්ති පටිසම්භිදාව සහ පටිභාන පටිසම්භිදාව.** ***(බු. ජ. ත්‍රි. පටි (1) පටිසම්භිදාඤාණං පිටු 168)***

ඉතින් **අත්‍ථපටිසම්භිදාව** කියලා කියන කොට ඒක **අර්ථය.** ඒ වගේම **ධම්ම පටිසම්භිදාව** කියන කොට ඒක **ධර්මය.** අර්ථ සහ ධර්ම කියලා කියන්නේ කොටස් දෙකක්. එතකොට මේ ලෝකයෙහි යම් කිසි ආකාරයකට යම් ධර්මයෝ තියෙනව. මොන විදිහේ ධර්මයෝ ද? ඒ පිළිබඳව පැහැදිලි කරන කොට **සද්ධින්‍ද්‍රියං ධම්මො,** සද්ධා ඉන්ද්‍රිය කියල කියන්නේ ශ්‍රද්ධාව නමැති ධර්මය. **විරියින්‍ද්‍රියං ධම්මො** කියල කියන්නේ වීර්යය නමැති ධර්මය.

මේවට අපි කියන්නේ ධම්ම කියල තමයි මේවා හඳුන්වන්නේ. එතකොට ශ්‍රද්ධාව ධර්මයක්. වීර්යය කියන එක ධර්මයක්. දැන් ශ්‍රද්ධාව කියන එක එකම ධර්මය. වීර්යය කියන එක එකම ධර්මය නෙමෙයි. යම් යම් ආකාරයකට දැන් චක්ඛු කියන කොට මේක එක ධර්මයක්.

එතකොට මේ විදිහට මේ ධර්ම කියන කොට ඒක අපිට එහි ස්වරූපයන් තියෙනව. **චක්ඛුං උදපාදි ඤාණං උදපාදි.** එතකොට **චක්ඛුං උදපාදි** කියන කොට චක්ෂුසයෙහි පහළවීම කියන කොට, මේ **චක්ඛුං** කියල කියන්නේ ධර්මය. **ඤාණං** කියල කියන්නේ මෙතනදි ධර්මය. එතකොට විද්‍යාව ආලෝකය කියල කියන්නේ මොනවද මේවා ධර්ම. මේවා හඳුන්වන්නේ ධර්ම හැටියට. ඒ වුණාට මේවා වලට මෙන්න මේ විදිහට යම්කිසි ආකාරයකින් යෙදෙන ඒ ධර්මය පිළිබඳව හඳුනාගන්නා බව.

ධර්මය කියන කොට අපි දන්නව, **ධම්මා** කියන වචනය ඇතුළෙ කුසල - අකුසල - අව්‍යාකෘත, ඒ වගේම රූප ආදී මේ මේවා ධර්මයෝ. නිර්වාණ ආදී මේවට කියනව ධර්ම කියල.

එතකොට මේ ධර්මය පිළිබඳව දන්නව. කුසලාධම්මා - අකුසලා ධම්මා - අබ්‍යාකතා ධම්මා. ඔන්න අපි සමස්ත සියලු ධර්මයෝ වෙන් කරනව කොටස් තුනකට. කුසල ධර්ම - අකුසල ධර්ම - අබ්‍යාකත ධර්ම. මෙන්න මේව තමයි ධර්ම කියලා කියන්නේ. ඒ කියන්නේ ඒවා වෙන් කරන්නට බැරි එබඳු ස්වභාවය.

එතකොට ශ්‍රද්ධාව කියලා කියන්නේ මොකක් ද? ධර්මයක්. අම්මා කියන්නේ ධර්මයක්ද කියල බැලුවොත්? නෑ. ඒක ධර්මයක් නෙවෙයි. **ධර්මයක් කියල කියන්නේ ඒ නිස්සත්ත නිප්පුග්ගල යම්කිසි ස්වභාව මාත්‍රික හටගන්නා වූ ධර්මයක්.** එතකොට අන්න ඒ ධර්මය. සංඛත ධර්ම තියෙනව ඒවා හේතු නිසා හටගන්න දේවල්. හේතු නිසා සකස් නොකරන දේවල් අසංඛත ධර්ම.

මෙන්න මේ පොදුවේ ගත්තහම මේ ස්වභාව ලක්ෂණයන්. මේව හඳුන්වනව ධර්ම විදිහට. එතකොට මේ පවතින ධර්මයන් ඉතාමත් විච්ඡේදගත නුවණින් හඳුනාගන්නව. එතකොට ධර්ම හඳුනා ගැනීම කියන එක නිකම් ලැබෙන දෙයක් නෙවෙයි. තමන්ගේ මනස ඉතාම හොඳින් භාවිත කරල මනසෙහි පවත්නා චිත්ත චෛතසික ආදී ධර්මයන් හොඳින් බෙදන්නට හොඳින් තේරුම් ගන්නට පුළුවන්කම ලැබෙන උතුමන් වහන්සේලාට තමයි මේ කියන ධම්මපටිසම්භිදාව ලබන්නට පුළුවන්කම තියෙන්නේ.

**ඒ දේවල් එලෙස බෙදාගන්නට තරම් නුවණක් නැතිවුණොත් ඒ පිළිබඳව වෙනමම නුවණෙහි භාවිතයක් ප්‍රඥාවක් නැතිවුණොත් ඒ ධම්මපටිසම්භිදාව ලැබෙන්නේ නැහැ. ඒකෙන් කියන්නේ අර්හත්වයට ඒක බාධාවක් කියලා නෙවෙයි. ඒ විදිහේ**

**ධම්මපටිසම්භිදාව නැතුව අරිහත් ඵලයට පත්වෙන්න බැරිකමක් ඇත්තේ නැහැ. ධම්මපටිසම්භිදාව තියාගෙන අරිහත් ඵලයට පත්වෙන තැනකට යන්න පුළුවන් ධම්මපටිසම්භිදාව නැතුවත් යන්න පුළුවන්.**

**ඒ නිසා මේ අරිහත් ඵලයට සම්බන්ධ වෙන තැන පිළිබඳව කතාවක් නෙවෙයි. හැබැයි ප්‍රඥාවෙහි තවත් පැතිකඩකට තමන්ගේ ප්‍රඥාව විහිදුවාලීමක්. ප්‍රඥාව දියුණු කිරීමක්. එතකොට ඒ අර මූලික දේ විතරක් නෙවෙයි ඊට අමතරව ප්‍රතිලාභ ටිකකුත් ලබාගෙන තියෙනව.**

අන්න ඒ විදිහට මේ ධම්ම පටිසම්භිදාවෙදි කරන්නේ මොකක්ද අර ධර්මයන් පිළිබඳව හඳුනාගන්නා බව, ධර්මයන් පිළිබඳව විශ්ලේෂණය කරන බව, තමන්ගේ මනසෙහි උපදින චිත්ත චෛතසික රූපාදී මේ ධර්මයන්ගේ බෙදීම් පිළිබඳව ස්වභාවයන් පිළිබඳව හඳුනාගන්නව.

දැන් සාමාන්‍ය පුද්ගලයින්ට ඒක කරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ පිළිබඳව වෙසෙසින් හිත නැඹුරු නොකළ පුද්ගලයෙකුටත් ඒක කරන්න පුළුවන්කමක් නැහැ. තමන්ගේ හිතේ සිත් පරම්පරාවක් ඉපදිලා ගියාට පස්සේ ඒ සිත් පරම්පරාව පිළිබඳවම මෝහය තියෙන පුද්ගලයින්ට කොහොමද ධර්ම පිළිබඳව විශ්ලේෂණය කරගැනීමක් කරන්නේ? බොහොම ආයාසයෙන් මෙන්න මේවා තමයි කුසල් මේවා තමයි අකුසල් කියල පොදුවේ ලක්ෂණයන් පිළිබඳව මෙනෙහි කරලා මිසක ඒ ධර්ම දකින්නට පුළුවන්කමක් නැහැ.

හැබැයි තමන්ගේ මනස ඉතාම කර්මණ්‍ය කරපු භාවිත කරපු දියුණු කරපු කෙනෙකුට, ඒ හටගෙන නිරුද්ධ වෙන සිතක ඒ ඒ ධර්මයන් වෙන වෙනම විශ්ලේෂණය කරන්නට වෙන වෙනම ඒ පිළිබඳව දකින්නට පුළුවන්කම තියෙනව. අන්න ඒක තමයි මෙතනදි කතා කරන ධම්ම පටිසම්භිදා කියලා කියන්නේ. ඒ

විදිහට පවතින සියලු ධර්මයන් පිළිබඳව තිබෙන පටිසම්භිදා ඥානයක් ධම්ම පටිසම්භිදා. එතකොට ඒක මොනවද? ඒ ඒ ධර්මයන්ට අදාළව මේක වෙන වෙනම කතා කරන්නට පුළුවන්.

අපි දැන් එක ක්‍රමයක් මෙතනදී අර ගත්තොත් එක ක්‍රමයකට **සද්ධින්‍ද්‍රියං ධම්මො.** මේ සද්ධා ඉන්ද්‍රියය කියල කියන්නේ මොකක්ද? **සද්ධින්‍ද්‍රියං ධම්මො,** සද්ධා ඉන්ද්‍රියය ධර්මයක්. **විරියින්‍ද්‍රියං ධම්මො,** විරියය ඉන්ද්‍රිය කියල කියන්නේ ධර්මයක්. **සතින්‍ද්‍රියං ධම්මො,** සති ඉන්ද්‍රිය කියල කියන්නේ ධර්මයක්. ඒ වගේම **සමාධින්‍ද්‍රියං ධම්මො,** සමාධි ඉන්ද්‍රිය කියල කියන්නේ ධර්මයක්. **පඤ්ඤින්‍ද්‍රියං ධම්මො,** ප්‍රඥා ඉන්ද්‍රිය කියල කියන්නේ ධර්මයක්. එතකොට මෙන්න මේ වලට කියනව ධර්ම කියලා.

එතකොට මේ ධර්මයන්ගේ ස්වභාව ලක්ෂණ හඳුනාගන්නව කියල කියන්නේ **අඤ්ඤො සද්ධින්‍ද්‍රියො.** මේ සද්ධා ඉන්ද්‍රිය කියල කියන්නේ එකක්. **අඤ්ඤො සද්ධින්‍ද්‍රියං ධම්මො,** සද්ධා ඉන්ද්‍රිය නමැති මේ ධර්මය එකක්. සති ඉන්ද්‍රිය කියන එක තවත් එකක්. මේව වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තියෙනව. ශ්‍රද්ධාව නමැති ඉන්ද්‍රිය ධර්මය ඒක එකක්. සති ඉන්ද්‍රිය කියන්නේ තව එකක්. වීර්යය කියන්නේ තවත් එකක්. සමාධිය කියන්නේ තව එකක්. ප්‍රඥාව කියන්නේ තවත් එකක්.

මේ ධර්මයන් වෙන් වෙන් කරගන්නට ඉතාමත් හොඳ පරිච්ඡේදගතව පවත්වන්නට පුළුවන් නුවණක් ඇතිකර ගැනීම. එතකොට ඔන්න ශ්‍රද්ධා ඉන්ද්‍රිය එක ධර්මයක්. ඒක අනික් ඉන්ද්‍රියත් එක්ක අපි මිශ්‍ර කර ගන්නේ නැහැ. සතිය එකක්. ඒක අනික් ඉන්ද්‍රියත් එක්ක මිශ්‍ර කර ගන්නේ නැහැ. මෙන්න මේ විදිහට අපි මේ පඤ්ච ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳව අරගෙන බලනව නම් මේ ඉන්ද්‍රිය පහ පිළිබඳව තිබෙන්නා වූ ඒ ධර්මය වෙන් වෙන් කොට අනිකුත් ඒවා සමග සම්මිශ්‍රණය නොකොට හඳුනාගන්නා වූ ස්වභාවයට කියනව අපි **ධම්මපටිසම්භිදාව** කියල. ඒක ධම්ම පටිසම්භිදාව.

ඊට පස්සේ අපිට හම්බවෙනව ඊළඟට මේ ධර්මයන් පිළිබඳව අර්ථ පරිග්‍රහණය කිරීම. ඒ කොහොමද? **අධිමොක්ඛට්ඨො අත්‍ථො,** එතකොට මේ අධිමොක්ෂාර්ථය කියල කියන්නේ අර්ථයක්. **අධිමොක්ඛට්ඨො අත්‍ථො,** මොකේද මේ අර්ථය තියෙන්නේ? අර සද්ධාව නමැති ඉන්ද්‍රිය ධර්මයෙහි අර්ථය තමයි අධිමොක්ෂණ අර්ථය ඉපදවීම. නිශ්චලත්වය. පාවෙමින් තැනින් තැනට ගහගෙන යන්නේ නැතුව පිහිටා සිටින බව. ස්ථාවරත්වය ගොඩනැගීම. ඒක තමයි අර්ථය.

එතකොට ශ්‍රද්ධාව කියලා ධර්මයක් හඳුනාගන්නව. එහි භාවිත අර්ථය හඳුනාගන්නව. ඒ කියන්නේ මොන විදිහේ අර්ථයක් ද, මොන විදිහේ තැන්වල ද ඒක භාවිත වෙන්නේ, මොන විදිහට ද එය පවතින්නේ, අන්න එබඳු ආකාරයකට ඒ පිළිබඳව ඇතිකරගන්නා වූ නුවණ, ඒ පිළිබඳව ඇතිකරගන්නා වූ දැකීම තමයි මෙතනදි මේ කතා කරන අර්ථය බවට පත්වෙල තියෙන්නේ. එතකොට අර ධර්මයට අනුරූපව තමයි අර්ථය තියෙන්නේ. එතකොට ධර්ම පහයි නම් අර්ථ පහක නුවණක් එතන තියෙනව. ඒ ධර්මය භාවිත වෙන්නේ මොන මොන විදිහෙ අර්ථයන් ද කියන එක. එතකොට අධිමොක්ෂණාර්ථයෙහි තමයි සද්ධා ඉන්ද්‍රිය භාවිත වෙන්නේ.

ඊට පස්සේ අපිට **විරියින්‍ද්‍රිය** භාවිත වෙන කොට **පග්ගහට්ඨො අත්‍ථො,** පග්‍රහ අර්ථය, ඔසවා තබනවා. පග්‍රහ කරමින් ඔසවා තැබීම සිදු කරනව. මෙන්න මේ අර්ථයෙහි තමයි **විරියින්‍ද්‍රිය** කියන එක යෙදෙන්නේ. විරිය කියන්නේ ධර්මයක්. ඒ **විරියින්‍ද්‍රිය** නමැති ධර්මය පග්‍රහණ අර්ථයෙහි ඔසවා තැබීම සැලකීම කියන දෙයෙහි තමයි යෙදෙන්නේ.

ඒ වගේම **සතින්‍ද්‍රියං ධම්මො,** සති ඉන්ද්‍රිය ධර්මයක්. එතකොට සති ඉන්ද්‍රියෙහි යෙදෙන අර්ථය මොකද්ද? **උපට්ඨානට්ඨො,** එළඹ සිටීම, එය යම්කිසි තැනකට එළඹ සිටිනවා. සතිපට්ඨානය කියල කියන්නේ සිහිය පිහිටවීම. පිහිට වන්නේ කොතන ද

එතන තමයි ප්‍රකට වෙන්නේ. ඒක එළඹ සිටීමක්. මරණය පිළිබඳව සිහි කරන කෙනාට, එයාගේ සිහිය, එයාගේ හිත, මරණය පිළිබඳව එළඹ සිටීමක් සිද්ධ වෙනව. අන්න ඒ විදිහට උපස්ථාන අර්ථය, සමීපයෙහි සිටින බව එතන පිහිටා සිටිනව. ඒක තමයි අර්ථය. එතකොට සතිය කියන්නේ ඒකේ ධර්මය. සතිය කියන මේ ධර්මය උපස්ථානර්ථය තමයි ඒකේ ගෙනල්ල දෙන්නේ. එතකොට ධර්මය තියෙනව. අර්ථය තියෙනව. ධර්මය සහ අර්ථය තියෙනව.

එතකොට මෙන්න මේ විදිහට **සතින්ද්‍රිය** කියන එක උපස්ථානර්ථය ගෙනල්ල දෙන කොට **සමාධින්ද්‍රියං,** සමාධි ඉන්ද්‍රිය කියන එක, සමාධියෙන් මොනවද අපිට ගෙනල්ල දෙන්නේ? සමාධි ඉන්ද්‍රිය භාවිත කිරීම ඇතුළේ **අවික්ඛෙපට්ඨො අත්‍ථො,** අවික්ෂෙප අර්ථය ඇතිවෙනව. අවික්ෂෙප අර්ථය. ඒ කියන්නේ හිතේ නොවිසුරුණු බව. ඒක තමයි අර්ථය. නොවිසිරීම ගෙනත් දෙන්නට ඕනෑ. ඒක නොවිසිරීම තමයි එහි අර්ථය බවට පත්වෙල තියෙන්නේ.

එතකොට **පඤ්ඤින්ද්‍රිය,** ප්‍රඥාව නමැති ඉන්ද්‍රිය ධර්මය මොකක්ද ගෙනල්ල දෙන්නේ. **දස්සනට්ඨො අත්‍ථො,** දර්ශනාර්ථය **(දර්ශනකෘත්‍යය),** පෙන්වල දෙනව. අවබෝධ කරවීම, ඒ දර්ශනාර්ථය දකිනව. මේ ඇස් දෙකෙන් දකින කොට අපිට පෙනීමක් වෙනව. ප්‍රඥාවෙන් මොකද කරන්නේ දෙයක් පෙන්වා දෙනව. එතකොට මේ දකිනව වගේම ඒ දේ ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ වෙනව. ඒ නිසා ප්‍රඥා ඉන්ද්‍රියේ ස්වභාවය තමයි අන්න ඒ දර්ශනවත් බව තමයි එහි තියෙන ස්වභාවය පෙන්වා දීම කරනව. එහි යථාර්ථය එහි ඇත්ත ස්වභාවය පිළිබඳව එතකොට වටහා ගන්නට පුළුවන්කම තියෙනව. ඒ දර්ශනාර්ථය.

**(අධිමොක්ඛට්ඨො අත්‍ථො, පග්ගහට්ඨො අත්‍ථො, උපට්ඨානට්ඨො අත්‍ථො, අවික්ඛෙපට්ඨො අත්‍ථො, දස්සනට්ඨො අත්‍ථො, බු. ජ. ත්‍රි. විප (1) පටිසම්භිදාඤාණං පිටු 168)**

එතකොට මෙන්න මේ විදිහට අපිට දැන් ධම්මපටිසම්භිදාව පිළිබඳව යම් යම් ධර්මයන් පිළිබඳව හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. දැන් මේක වෙනස් වෙන්න පුළුවන් තැනින් තැනට. **චක්ඛුං උදපාදි ඤාණං උදපාදි** කියන කොට දැන් චක්ඛුව තමයි ධර්මය. ඤාණං උදපාදි කියන කොට **ඤාණය තමයි ධර්මය. ඒකට අර්ථයක් තියෙනව. ඒක අත්ථපටිසම්භිදාය ඤාණං.**

උඩ කිව්වේ **ධම්මපටිසම්භිදෙ ඤාණං.** මේ දෙවෙනියට කියන්නේ **අත්ථපටිසම්භිදෙ ඤාණං.** අර්ථ පටිසම්භිදාව පිළිබඳ තියෙන නුවණ. එතකොට ධර්මය පිළිබඳව හඳුනනව ප්‍රභේදගතව, ඒව වෙන වෙනම හඳුනා ගැනීම තියෙනව. ඒ හඳුනා ගත්ත ධර්මය මොන විදිහේ අර්ථයක් ද සිද්ධ කරන්නේ? මොන විදිහේ භාවිතයක් ද වන්නේ කියන එක පිළිබඳව දැනුමක් තියෙනව. එතකොට මේ තමයි අත්ථපටිසම්භිදාව. එතකොට ධම්මපටිසම්භිදාව සහ අත්ථපටිසම්භිදාව.

ඊට පස්සේ අපිට හම්බවෙනවා මේ **නිරුත්තිපටිසම්භිදාව.** මෙන්න මේක තමයි ගොඩක් දෙනෙක් තමන්ට අවශ්‍ය විදිහට සකස්කර ගන්නේ තමන්ට අවශ්‍ය විදිහට පරිවර්තනය කරන්නට. ඒ කියන්නේ තමන්ට ඕන ඕන විදිහේ වචන කියන්නට. **නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස** කියන කොට, ***න මො*** කියන කොට ***න*** කියන්නේ නැතිකළ ***මො*** කියන්නේ මෝහය. මෝහය නැතිකරන එක තමයි නමො කියන්නේ.

දැන් මේ විදිහට අර දැන් ධර්මය හඳුනගන්නෙත් නැහැ. අර්ථය හඳුනගන්නෙත් නැහැ දැන්. ***නමො*** කියන්නේ ධර්මයක් නෙමෙයි නේ. ***නමො*** කියන්නේ ධර්මයක් නෙමෙයි. එතකොට **අත්ථපටිසම්භිදාවට** අයිති නැහැ, ***නමො*** කියන එක මෙතනට අදාළ කරගෙන දෙයක් ගැනීම **අත්ථපටිසම්භිදාවට** අදාළ දේ නෙමෙයි. ඒ නිසා **අත්ථපටිසම්භිදාව තියෙන්නේ ධම්මපටිසම්භිදාවත් එක්ක.** එතකොට ඒ ධර්මයෙහි යෙදෙන

අර්ථයෙන් තමයි අපි හඳුනාගන්නේ. ධර්මය හඳුනා ගැනීම ඒ ධර්මයෙහි භාවිත අර්ථය හඳුනා ගැනීම. ඒ කියන්නේ මේ භාෂාවේ යෙදෙන හැම වචනයකටම අපි ඒක හදනව. ඒකට අර්ථයක් දෙනව. එහෙම නෙමෙයි. ඒ ධර්මයන් තියෙනව වෙනම. ඒව හඳුන්වනව. ඒ ධර්මයන් ඒ විදිහට හඳුනාගන්නේ මෙබඳු අර්ථයකින් කියල අර්ථය පිළිබඳව හඳුනා ගැනීමක් තියෙනව, ඒ අර්ථයෙහි තමයි ඒක භාවිත වන්නේ කියන එක පිළිබඳව.

ඒක කෙන කෙනාට ඕන විදිහට ඒ නිසා තබන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා ධර්ම සහ අර්ථ කියන ඒ දේවල් අපි ඒ විදිහට වෙනස්ව හඳුනාගන්නට අවශ්‍යයි.

ඊට පස්සේ අපිට මොකක්ද මේ **නිරුත්තිපටිසම්භිදාව** කියල කියන්නේ. මේක ඉතාම වැදගත් නිරුක්ති **නිරුත්තිපටිසම්භිදා ඤාණය** කියන එක. නිරුක්ති දෙනව. නිරුක්ති දෙනව කියල කියන්නේ මේ දේවල් හැඳුණ හැටි කියන එක නෙවෙයි. දැන් විනිරුක්තියයි කියල කියන කොට අපිට මේ පටිසම්භිදාමය වශයෙන් තියෙන නිරුත්ති ඤාණයක් තියෙනව. ව්‍යාකරණානුකූල වුණ නිරුක්තියක් තියෙනව. ව්‍යාකරණානුකූල නිරුක්තිය කියල කියන්නේ යම්කිසි දෙයක සැකැස්ම පිළිබඳව හඳුන්වනු ලබන විග්‍රහ වාක්‍යය.

**නීලඤ්ච තං උප්පලංචාති නීලුප්පලං** කියල කියනව. එතකොට **නීලඤ්ච තං උප්පලං** ඒක නිල්පාටයි. ඒ වගේම ඒක උපුල් මලක්. ඒක මානෙල් මලක්. ඒ නිසා ඒක නීලුප්පලයි. නිල් මානෙල් කියල අපි කියනව. ඒක නිල්. ඒකමයි උපුල්. ඒ නිල් වූයේත් ඒකමයි. උපුල් වූයේත් ඒකමයි. ඒ නිසා අපි ඒක නිල් මානෙල් කියල කියනව.

එතකොට දැන් මේ නිල් මානෙල් කියන පදය නැතිනම් **නීලුප්පල** කියන මේ පාලි වචනය විග්‍රහ කරන්නට ගියාම ඒකේ

තියෙන විග්‍රහ වාක්‍යය තමයි **නීලංච තං උප්පලං.** ඒකම නිල්. ඒකමයි උපුල්. එතකොට මේ දෙකම එකතු කරලා අපි පදයක් හදා ගන්නව. **නීලුප්පලයි** කියලා අපි ඒක සමාස කරල පදයක් හදා ගන්නව.

දැන් මෙන්න මේ විදිහට පාලියෙහි නිරුක්තිය කියන දේ ව්‍යාකරණානුකූල නිරුක්තියක් තියෙනවා. ඒක ව්‍යාකරණානුකූල නිරුක්තිය. දැන් මෙතනදි කතා කරන මේ නිරුත්තිපටිසම්භිදා ඤාණයට අදාළවන නිරුක්ති බවට පත්වන්නේ අර භාෂාවෙහි තියෙන පද කඩමින් ඒ දේවල් සකස් වුණේ කොහොමද කියලා කියන එබඳු ගතියක් නෙමෙයි. වාචාල කමින් එහෙම කියන එකක්වත් ව්‍යාකරණානුරූපීව ව්‍යාකරණ ඤාණයකින් එහෙම කියන එකකුත් නෙවෙයි **නිරුත්තිපටිසම්භිදා** ඤාණයෙහි තියෙන ස්වභාවය බවට පත්වෙන්නේ.

එහෙනම් මොකක්ද **නිරුත්තිපටිසම්භිදාව** කියල කියන්නේ. **පඤ්ච ධම්මෙ සඤ්ඤස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්චයො සඤ්ඤස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා.** එතකොට දැන් මෙතනදි කියනව **පඤ්ච ධම්මෙ සඤ්ඤස්සෙතුං,** අර පඤ්ච ධර්මයන් පිළිබඳව අර කියපු ශ්‍රද්ධාව - වීර්යය - සති - සමාධි - ප්‍රඥා කියල අපි පහක් එතනදි කතා කලා. එකක් කතා කළා නම් ඒකට අදාළව. අන්න ඒ පිළිබඳව, **සඤ්ඤස්සේතුං,** ඒක ගෙනහැර දැක්වීම සඳහා **බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා,** ව්‍යඤ්ජන නිරුක්ති කියනව. ඒ සඳහා අපි වචනයන්ගෙන් ඒක හඳුන්වනව. මේ සද්ධා කියල අපි වචනයකින් ඒක හඳුන්වනව. එතකොට අන්න ඒ ව්‍යඤ්ජනය අපි ඒක දන්නව. ඒ ව්‍යඤ්ජනය, ඒකට අපි කියන්නේ නිරුක්තිය කියල. ඒකට නිරුක්තියක් දෙනව. අන්න ඒ නිරුක්තිය පිළිබඳව ශ්‍රද්ධාව කියල අපි ඒ ධර්මය ඒ ගති විශේෂය ඒක හඳුන්වන්නේ සද්ධා කියල තමයි.

**ඒ කියන්නේ ඒකට විද්‍යාත්මක නාමයක් දෙනවනේ, අපි යම් කිසි දෙයක් හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මක නාමයක් දෙනව. එතකොට භෞතිකව තිබෙන දේවල් සඳහා විද්‍යාත්මක නාම ලියලා තියෙනව වගේම, බුදුරජාණන් වහන්සේ මේ මනසෙහි තිබෙන යම් යම් ගති ස්වභාව හැම එකකටම භාග්‍යවතුන් වහන්සේ ඒ සඳහා ඒ තිබෙන්නා වූ නාමකරණයන් ලබා දීලා තියෙනව.**

**ඒක සමාජයේ භාවිත වන්නාවූම නාමකරණයන්ගෙන් වෙන වෙනම ඒක හඳුන්වා තිබෙනව. එතකොට ඒ පද වචන ව්‍යඤ්ජනයන්ගේ අකුරු වලින් ඒ යම්කිසි ආකාරයකට ඒ ධර්මය පිළිබඳව හැඳින්වීමක් කරනව නම්, අන්න ඒ වචන වලින් හැඳින්වීම කියන එක නිරුත්තිපටිසම්භිදා ඥාණය නෙමෙයි. වචන වලින් යම්කිසි ධර්මයක් හඳුන්වනව නම් හඳුන්වනු ලබන ධර්මය සහ එහි වචන වල භාවිතය පිළිබඳව දන්නා නුවණ.**

වචන වලින් කියනව කියන එක නෙමෙයි. ඒ ධර්මය වෙන් වශයෙන් දැන ගන්නා බවත්, ඒ වගේම ඒ ව්‍යඤ්ජන අකුරු වලින් ඒ වචනය හැඳින්වෙන බවත් දන්නා වූ කම. මේ දෙකම දන්නව. ඒ ධර්මය සහ ඒ වචනය. එතනදී දෙකම දන්නව. ඒ වචන වලින් හඳුන්වන්නේ මෙන්න මේ ධර්මයයි කියන එක දන්නව.

එහෙම නැතුව මේ එක එක තමන්ට කැමති කැමති හැටියට මේ රැල්ලට හැක හැක ගෑවම හැකරැල්ල කියල හැදෙනව කියල එහෙම එකක් නෑ. හැකරැල්ල කියල එහෙම ධර්මයක් නෑ. හැක හැක ගානව කියල එහෙම ධර්මයක් නෑ. ඒවා නිරුක්ති නෙවෙයි ඒ නිසා. ඒවා නිරුක්ති ඥාණයට අයිති දේවල් නෙවෙයි. නිරුක්ති ඥාණය කියල කියන්නේ මොකක් ද? ඒ ධර්මය හඳුනාගන්නව. ශ්‍රද්ධාව චෛතසික ධර්මයක්. ඒක කුසල ධර්මයක්. කුසලයෙහි වැටෙන කුසලා ධම්මා කියල අපි කියනව නේ. ඒක කුසල ධර්මයක්. කුසල චෛතසිකයක්.

එතකොට ඒ චෛතසික ධර්මයක් වන සද්ධා කියන මේ ගතියෙන් අපි ඒ ගති ස්වභාවයක් හඳුන්වනව. අන්න ඒ ව්‍යඤ්ජනයෙන් හඳුන්වන්නේ මොකක්ද? අන්න එය පිළිබඳව දන්නා වූ නුවණ. එතකොට නිරුක්තිය සහ ඒ කියන්නේ ව්‍යඤ්ජන අභිලාපය පිළිබඳව. ඒ අකුරු වලින් කතා කරන අභිලාපනය පිළිබඳවත් එහි ධර්මයෙහි ස්වභාවය පිළිබඳවත් හඳුනාගන්නව. ඒක නිරුක්ති ඤාණයට අයිතියි.

එහෙනම් වචනේ තේරුම විතරක් නෙමෙයි, අර ධර්මයට අදාළ දේත් හඳුනාගන්නට ඕනේ. ධර්මයෙහි ස්වභාවය, ශ්‍රද්ධාව කිච්චහම දැන් ශ්‍රද්ධාව කියන එක අපිට ඒක විග්‍රහයක් තියෙනව නේ. අපිට හාත්පස වචන සමූහයක් අපිට තියෙනව නේ. ඒක හැඟීම අපිට කියන්න බෑනේ නැත්නම්. එතකොට අන්න ඒ හැඟීම කියන දේත්, ඒ හැඟීම හැඳින්වීම සඳහා පාවිච්චි කරන නැතිනම් ඒ චෛතසිකයත්, චෛතසිකය හැඳින්වීම සඳහා පාවිච්චි කරන ඒ නාමකරණයත් ව්‍යඤ්ජනයත් පිළිබඳව දන්නා වූ නුවණ කියන එක තමයි නිරුක්ති ඤාණය කියලා කියන්නේ. එතකොට ඒ ධර්මය වෙන් වශයෙන් ගැනීමේ නුවණත් නිරුක්ති ඤාණයට අයිතියි. ඒ පිළිබඳව තියෙන ව්‍යඤ්ජනයෙහි සංයෝජනතාවය පිළිබඳව දන්නා වූ නුවණත් අයිති නිරුක්ති ඤාණයට.

ඒක මේ දැකපු දැකපු පදවලට කාටවත් කියන්න අයිතියක් තියෙන දෙයක් නෙමෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ඒ අවබෝධ ඤාණය යම් විදිහකට පෙන්නල දුන්න නම් එබඳු ආකාරයෙහි පවත්නා ධර්මය, චිත්ත චෛතසික රූපාදී වශයෙන් පවතින ධර්මයන් පිළිබඳව තමයි මේක පිහිටන්නේ. එහෙම නැතුව වෙනත් දේවල් ගැන නෙමෙයි. නිමල් ඉපදුනේ කොහොම ද? කමල් හැදුනේ කොහොම ද? වයලට් සීතා හැදුනේ කොහොම ද? ඒවා නෙමෙයි නිරුත්තිපටිසම්භිදා ඤාණය උපදවන්නට තියෙන ක්‍රමය බවට පත්වෙන්නේ.

ඊට පස්සේ අපිට ඊළඟ කාරණාව තමයි දැන් මෙතන එකක් කිව්වේ ධර්මය සහ ධර්මය පිළිබඳව තියෙන ව්‍යඤ්ජන නිරුක්ති අභිලාපනය කිරීම. ඊට පස්සේ අපිට හම්බෙනවා අර **පඤ්චන්නෝ සන්දස්සෙතුං,** අර ධර්ම පහට අර්ථ පහක් කිව්වා. ධර්ම පහට අර්ථ පහක්. **සද්ධාව අධිමොක්ෂනාර්ථය** කියලා කිව්වා. එතකොට වීර්යය කියන එක පග්ගහර්ථය කියලා කිව්වා. දැන් ඔය විදිහට අර්ථ පහකුත් කිව්ව නේ මෙතනදි.

අන්න ඒ ධර්මය පිළිබඳව හඳුනා ගැනීම වගේම, ඒක යෙදෙන අර්ථය පිළිබඳව හඳුනා ගැනීමත්, ඒ අර්ථය සඳහා යෙදෙන ව්‍යඤ්ජනයන්ගේ හඳුනා ගැනීමත්, එතනදී නිරුක්ති කියන දේට අයිති වෙන දෙයක්. එතකොට එයා සති කියන චෛතසික ධර්මය දිහා අරගෙන බැලුවහම එයා දන්නවා **යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා, (බු. ජ. ත්‍රි, විප්‍ර (1) බොජ්ඣඞ්ගවිභඞ්ගො අභිධම්මභාජනීය පිටු 6)** මේ මොන විදිහට කතා කළත් එයා මෙතන කතා කරන්නේ සති නම් වූ චෛතසික ධර්මය පිළිබඳව. එයා දන්නව.

එතකොට අපිලාපනතා කියලා යම් තැනක වචනයේ තියෙනව. අපිලාපනතා කිව්වහම, ***අපි*** කියන්නේ අප්‍රිය කියන එක, ***ලා*** කියන්නේ නැති කරනව කියන එක, එහෙම අර්ථ දෙන්න බෑ. අපිලාපනතා කියල කියන්නේ ඒ ධර්මයක් හඳුන්වල තියෙන්නේ. එතකොට එයා දන්නව ඒ ව්‍යඤ්ජනයෙන් හැඳුන්වූයේ අර ධර්මය. ඒ ධර්මයෙහි ස්වභාවය තමයි අධිමොක්ෂණ අර්ථය. ඒකෙන් කියවෙන්නට ඕනේ අධිමොක්ෂණ බව. මෙන්න මේ ආකාරයට ඒ ධර්මයත් අර්ථයත්, ඒ ධර්මය කීම සඳහා තිබෙන ව්‍යඤ්ජනයත්, අර්ථය කීම සඳහා පාවිච්චි කරන ව්‍යඤ්ජනයත්, ඒ කියන්නේ අක්ෂර පද ආදී දේවලුත් එයා දන්නව. ඒ අවබෝධයට තමයි කියන්නේ නිරුක්ති ඤාණය කියල.

එතකොට අර ධර්ම පහ පිළිබඳව අර්ථ වශයෙන් ඤාණ පහයි, ධර්ම වශයෙන් ඤාණ පහයි, එතකොට නිරුක්ති වශයෙන්

දන්නා වූ පහ පහ ගානේ ඤාණ දහයක් තියෙනවා. අර දහයයි මෙතන දහයයි. එතකොට මේ කියන ඤාණ විස්සක් අපිට දකින්න පුළුවන්කම තියෙනව.

ඇයි? ධර්ම පහ සහ අර්ථ පහ පිළිබඳව දන්නා වූ කම ඒක කොටස් දෙකක්. එතකොට එතන දහයක් තියෙනවා. මේකට තියෙන නිරුක්ති අභිලාපනය පිළිබඳව දන්නාකම. ඒක තව කොටස් දෙකක්. එතකොට එතන නිරුක්ති අභිලාපනය කියන එක අර්ථ පහටත් ධර්ම පහටත් දහයක් තියෙනව. එතන නිරුක්ති ඤාණයට. ඒ කොටස් දෙකම විස්සක් බවට පත්වෙනව. එතකොට අත්‍ථපටිසම්භිදෙ ඤාණය දැන් ඔබ දන්නව. ධම්මපටිසම්භිදෙ ඤාණය දන්නව. නිරුත්තිපටිසම්භිදෙ ඥාණය කියන එකත් දන්නව.

ඊට පස්සෙ මොකක් ද මේ කතා කරන **පටිභානපටිසම්භිදාව?** අවසාන පටිසම්භිදාව තමයි පටිභාන පටිසම්භිදාව. එතකොට **පඤ්චසු ධම්මෙසු ඤාණානි.** මේ සමස්ත ධර්මයන්ගෙන් වැටහෙන ස්වභාවය පටිභානය කියලා කියන්නේ.

එතකොට **පඤ්චසු ධම්මෙසු ඤාණානි,** ධර්ම පහක් වූ එතන උපදින ඤාණයෙනුත්, **පඤ්චසු අත්‍ථෙසු ඤාණානි,** අර්ථ පහක් වූ එතන එතැන්හී උපදනා ඤාණයෙනුත්, **දසසු නිරුත්තිසු ඤාණානි,** අර නිරුක්ති දහය පිළිබඳව දන්නා වූ නුවණත් **අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්‍ථෙසූ ඤාණානි,** ධර්මයන්ගේ නුවණ තවත් එකක්, අර්ථයන්ගේ නුවණ තවත් එකක්, **අඤ්ඤානි නිරුත්තිසු ඤාණානි,** නිරුක්තීන්ගේ ස්වභාවය තවත් එකක් කියල වෙනස්ය කියල, යම්කිසි ආකාරයකින් මේ ඔක්කොගෙම වෙනස් වෙනස් ස්වභාවය හඳුනගෙන තියෙනවා නම් ඒ කියන්නේ දැන් කිව්වනේ ධර්මයන්ගේ යෙදෙන එක, එකක්, අර්ථයන්ගේ යෙදෙන එක, තව එකක්, නිරුක්ති ඤාණය තව එකක්. දැන් ඕකේ වෙනස් බව වැටහෙන්නේ කාටද වෙනස් බව වැටහෙන්නේ කොතනටද?

අන්න ඒ එකිනෙකට අර්ථයන්ගේ වෙනස් බව. මේක තමයි ධර්මයන්ගේ වෙනස් බව. ඔය කතා කරන්නේ අර්ථය. මෙන්න මේක තමයි ධර්මය. ඔය කියන්න හදන්නේ නිරුක්තිය ඕක අර්ථය නෙමෙයි. ඕක ධර්මයත් නෙමෙයි. ඕක නිරුක්තියක්. මෙන්න මේ ආකාරයට අර්ථය, ධර්මය සහ නිරුක්තීන් පිළිබඳව හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ ඒ පිළිබඳව ඇති කරගත්තා වූ පටිභානයට. ඒ පිළිබඳව පවතින ඒ පිළිබඳව ඉපදුනා වූ පටිභානයට තමයි ඒ වටහා ගන්නට පුළුවන්කම තියෙන්නේ. අන්න ඒ ඒ ධර්මයන් පිළිබඳව දන්නා වූ කමට තමයි **පටිභානපටිසම්භිදාව** කියලා කියන්නේ.

එතකොට මෙන්න මේ විදිහට **පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.** එතකොට මෙන්න මේ විදිහට පටිභාන නානත්වය පිළිබඳව දන්නා වූ නුවණට කියනව පටිභාන පටිසම්භිදා ඤාණය කියල.

එතකොට දැන් ඔබට ඉතාම පැහැදිලියි චතුපටිසම්භිදා කියලා කතා කරන කොට මේ සිව්පිළිසිඹියාපත් කියන දේවල්. මේ කියන්නේ තම තමන්ට ඕන ඕන විදිහට දේවල් අර්ථකථනය කිරීමේ නිදහස ඇතුව දීල තියෙන දෙයක්වත්, තමන්ට හැඟුන පරිදි පද කඩා අරුත් ගැන්වීමට දුන්න අයිතියක්වත්, එහෙම දීමෙහි හැකියාවක් වත් හඳුන්වන දෙයක් නෙමෙයි.

සිව්පිළිසිඹියාපත් ඤාණයන්ගේ මේ ඤාණමය ස්වභාවය තමයි මෙලෙස අවබෝධ කරගන්නට අපිට තියෙන්නේ. ඒක මේ කාටහරි නිකන් මේ පද කඩ කඩ ඉන්න, පද කඩ කඩ තමන්ට හිතෙන හිතෙන ස්වරූප කියන්නට තියෙන දෙයක් නෙමෙයි. පාලි සූත්‍රයක් අරගෙන මේ සූත්‍රය අර්ථ විවරණය කරන්න අර්ථ විග්‍රහ කරන්නට කියලා යම්කිසි කෙනෙකුට ඔය පද කඩන පුද්ගලයෙකුට දුන්නොත් ඔහුට ඒක කියාගන්න පුළුවන්කමක් නෑ.

ඇයි අර එක වචනයක් කඩලා ඒකට ගොඩාක් එක එක අර්ථ කියනව. ඒකේ වචනෙන් වචනයට අකුරෙන් අකුරට වෙන් කර කර එයා කතන්දරයක් කියනව. ඒව නෙවෙයි නිරුත්තිපටිසම්භිදාව කියල කියන්නේ. එක එක විදිහට පද වලට කෙන කෙනාගේ මුඛරීකම අනුව වාචාලකම අනුව කියන්න පුළුවන්කම තියෙනවනේ. ඒ කියන්නේ මොකක් හරි දේකට මේ තමන්ට හිතෙන විදිහේ වචන ටිකක් හදලා කියන්න පුළුවන්කම තියෙනව. යමක් හැදුනහම මේ මොකක් හරි දෙයක් නිසා හැදුනේ කියලා.

දැන් මදුරුවා කිව්වහම කාටහරි කියන්න පුළුවන්කම තියෙනව මවාගෙන තමන්ගේ රූපය ගැන දුකෙන් ඉන්න කොට මදුරුව වෙලා උපදිනවා එහෙමයි. දැන් අර ඒක දැන් මේ හිතට ආපු දෙයක්. එතකොට දැන් එහෙම කාට හරි හිතුන පලියට අර්ථයක් කිව්වා කියන එකෙන් ඒක කියන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. මේක මේ නිරුත්තිපටිසම්භිදාමය ඤාණයක් කියලා.

එහෙම ඕනම කෙනෙකුට මුඛරි පුද්ගලයෙක් නම් ඔහුට අපිට වගේ නෙවෙයි හිතුන හිතුන විදිහට කියන්න පුළුවන්කම තියෙනව. අපි බොහොම අමාරුවෙන් කල්පනා කරලා ගන්න ඕන දේවල් කියන්න පුළුවන්. ඒකට හිත යොමු කරපු කෙනෙකුට වුණත්, ටිකක් මං මේක පුරුදු කරලා බැලුවා. එතකොට නිකම්ම ඔහේ එනව කටට, මේ පදයක් කියපු ගමන්ම වචනයක් කියපු ගමන්ම ඒක කඩලා එක එක දේවල් ගලපලා කියන්න පුළුවන්කම එනවා. ඒක මහා විශාල මේ ඤාණයක් එහෙම නෙමෙයි. ඒක මුඛරීකමක්. ඒක එක පැත්තකින් තියෙන මුඛරීකම. ඒක මේ ඤාණයක් නෙමෙයි. ඒකට මේ සිව්පිළිසිඹියාපත් ඤාණය කියන එක ඇතුළත් කරලා මේ මහා ඤාණයෙහි තියෙන මහා ගැඹුරු බව ඒක ඉවත් නොකළ යුතුයි.

ඒ නිසා මේ ඤාණය කියලා කියන්නේ සුවිශේෂ වූ දෙයක්. ඒක හැම රහතන් වහන්සේ නමකටත් නොපිහිටන, විශේෂයෙන්ම ඒ

පිළිබඳව සිත වඩපු ඒ සිත් වශයෙන් චිත්ත චෛතසික ධර්මයන් වෙන් කොට ගන්නට තරම් ඉතාම සූක්ෂම ඥාණයකින් හෙබි, ඒ කියන්නේ ධ්‍යාන උපදවගෙන ධ්‍යාන සහිත ඒකාග්‍රගත වුණ මනසින් තමන්ගේ ඉද්ධිවිධ ආදී ඥාණයන් තුළ තමන්ගේ සිත හොඳින් භාවිත කරල, තමන්ගේ චිත්ත චෛතසික ධර්මයන් හොඳින් බෙදාගන්නට පුළුවන්කම තියෙන, අනුන්ගේ සිත් පිළිබඳව දකින්නට පුළුවන්කම තියෙන, එබඳු උතුමන් වහන්සේලාට ඒ ඒ ධර්මයන් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීම් වශයෙන් උපදනා වූ ඥාණයක් මිසක, මේ කියන චතුපටිසම්භිදා ඥාණය, එක එක පුද්ගලයන්ට නිකන්ම ඉපදෙන පද කඩමින් අර්ථ කීමේ වචන පිළිබඳව කීමෙහි දෙයක් නෙමෙයි. ඒ නිසා මේ ඥාණය අපි ලඝු කොට තැකිය යුත්තක් එහෙම නෙමෙයි.

ඉතින් මූලික වශයෙන්ම මේ ඥාණය පිළිබඳව මෙලෙසට හඳුන්වන්නට යෙදුනේ වෙනත් දෙයක් නිසා නෙමෙයි. මේ ඥාණය මෙලෙසට හඳුන්වන්නට යෙදුනේ මේ ඥාණයෙහි තියෙන යෙදීම භාවිතය පිළිබඳව අවබෝධය තිබුණහම තමයි ඔබට නිවැරදි දැනුමක් ගොඩ නැගෙන්නේ. දැන් මේක සූවිසි ප්‍රත්‍යය ගැන කතා කරන කොට මේ හතර ගැන අපිට දීර්ඝ විග්‍රහයක් අවශ්‍ය වෙන්නේ නැහැ තමයි. මේකට මාර්ගය උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙනව කියලා සරල ලෙසම කියල ඉවර කරන්න පුළුවන්කම තියෙනව.

හැබැයි අපිට ඒ කාරණාවන් පිළිබඳව අවබෝධය තිබුණහම තමයි ඔබට නිවැරදි දැනුමක් ගොඩ නැගෙන්නේ. ඒ පිළිබඳව නොයෙක් මිත්‍යා මතවාද වලට හසු නොවන්නට පුළුවන්කම තියෙන්නේ සහ මේ කියන ප්‍රත්‍යය වීම පිළිබඳවත් මනාව තේරුම් ගන්නට පුළුවන්කම තියෙන්නේ.

ඉතින් ඔන්න ඔය කියපු **අත්‍ථපටිසම්භිදාව - ධම්මපටිසම්භිදාව - නිරුත්තිපටිසම්භිදාව - පටිභාන පටිසම්භිදාව** කියන ඔය හතර

ආකාර වූ ප්‍රතිසම්භිදාවන්ට යම්කිසි කෙනෙකුගේ මනස පිහිට වන කොට ඒකට මාර්ගය උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙනවා. මාර්ගය කියලා කියන්නේ, මේ පටිසම්භිදා සඳහා තමන්ගේ සිත භාවිත කරන්නේ සේඛ ආයයීන් වහන්සේලා නම් ඒ සේඛ ආයයීන් වහන්සේලා තමන්ගේ සිත ඒ සඳහා භාවිත කරන කොට, අර ඒ ධර්මයන් හඳුනාගන්නට පුළුවන් තරමේ සමාධිමත් බවක් ඔහු සතුව තියෙන්නට ඕනේ. ඒ සමාධිමත් වූ බවින් යුක්තව තමයි ඒ ඒ ධර්මයන් වෙන වෙනම පරිග්‍රහ කරන්නට පුළුවන්කම තියෙන්නේ.

අපි දන්නවා ප්‍රථම ධ්‍යානය ඉපදවීමේදී විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා කියන මේ පඤ්චංගික ඣාන ලක්ෂණ වෙන වෙනම පරිග්‍රහණයට ලක් කරනව. වෙන වෙනම ඣාන ලක්ෂණ හඳුනාගන්නව. අන්න ඒ විදිහට වෙන වෙනම පඤ්චංගික ඣාන ලක්ෂණ හඳුනාගන්නව වගේම, ඒ පුද්ගලයාට ඒ සිතෙහි උපදිනා ඒ ධර්මයන් පිළිබඳව වෙන වෙනම හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. අන්න ඒක තමයි ධම්මපටිසම්භිදා ඤාණය දියුණු කරගන්නව කියල කියන්නේ. එතකොට ඒකේ ගොඩාක් නැහැනේ. චිත්ත චෛතසික රූප නිබ්බාණ යම් සීමාසහිත ප්‍රමාණයක් තමයි ධර්මයන්ගේ ස්වභාව තියෙන්නේ.

එතකොට ඒ ධර්මයන්ගේ ස්වභාව පිළිබඳව අවබෝධ කරගැනීම තමයි ධම්මපටිසම්භිදාව කියලා කියන්නේ, ඒ ස්වභාවයන් පිළිබඳව තියෙන්නා වූ නුවණට. ඊට පස්සේ එහි අර්ථයන් පිළිබඳව එහි ක්‍රියාකාරීත්වය එහි ශක්තිය මොකක්ද කියන එක හඳුනා ගැනීම තමයි අත්‍ථපටිසම්භිදාව කියල කියන්නේ. **එතකොට අර ධර්ම පටිසම්භිදාව තියෙන කෙනෙකුට තමයි අත්‍ථපටිසම්භිදා ඤාණය උපදවන්නට පුළුවන්කම තියෙන්නේ. ඒ දෙකම තියෙන කෙනෙකුට තමයි නිරුත්තිපටිසම්භිදා ඤාණය තියෙන්නේ. නිරුත්තිපටිසම්භිදා ඤාණය තියෙන කෙනෙකුට, ඒ**

තුනම තියෙන කෙනෙකුට තමයි පටිභානපටිසම්භිදා ඤාණය උපදින්නේ.

ඒ නිසා මේක සරල දෙයක් නෙමෙයි. එහෙනම් මෙතනට මනස භාවිත කරන්නේ කොහොම ද? සේඛ ආයයීන් වහන්සේලා තමන්ගේ මනස යම්කිසි ආකාරයකට භාවිත කරනවා නම් ඒ භාවිත කරන සෑම අවස්ථාවකදීම ඔහුට අර සෝවාන් මාර්ග ඤාණය තුළ ප්‍රහීණ කරගත්ත ආශ්‍රව ධර්මයන් නැවත ඉපදීමක් නැති නිසාම ඒ මාර්ග දර්ශනය හැම අවස්ථාවකදිම භාවිත වෙනව සේඛ ආයයීන් වහන්සේලාට. ඒ නිසා සෝවාන් ආයයීන් වහන්සේලාට කාම භූමියෙහි ප්‍රතිසන්ධිය ලබන්නට තියෙන හේතු ටික තවම තියෙනව. ඒ වගේම අනාගාමී ආයයීන් වහන්සේලාට කාමාවචර භූමියේ ප්‍රතිසන්ධිය ලබන්නට හේතු නැහැ.

මේ පුද්ගලයෝ දෙන්නම ගත්තහම මේ පුද්ගලයෝ දෙන්න වඩන සමාධිය ගත්තහම, සමාධිය උපදවනව නම් සමාධිය ඉපදවීමෙහි වෙනසක් තියෙනවා. එතකොට කාමාවචර භූමියෙහි කෙලෙස් තියෙන පුද්ගලයා ඒ මට්ටමේ සංයෝජන සහ නිමිති නානත්වය යටපත් කරල තමයි අතනට යන්නට ඕනේ.

අනාගාමි ආයයීන් වහන්සේට මේ මට්ටමට එන්නට නිමිති නැහැ. උන්වහන්සේ නිමිති වලින් මිදිලා ඒක යටපත් කරලා තියෙන නිසා උන්වහන්සේට වෙනස් තැනකින් තමයි ඒ සඳහා උත්සාහවත් වන්නට තියෙන්නේ.

එහෙනම් ඒ ඒ පුද්ගලයෝ උපදවා ගත්ත මාර්ගයට අදාළව තමයි ඒ මත පිහිටා තමයි ඒ උපනිඃශ්‍රය කරගෙන තමයි මේ පටිසම්භිදා ඤාණ උපදවන්නේ. අර දිබ්බචක්ඛු දිබ්බසොත ආදිය උපදවනව ගැන කිව්ව වගේම මේ චතුපටිසම්භිදා ඤාණ උපදවන්නට පුළුවන්කම තියෙන්නෙත් ඒ ඒ සේඛ වහන්සේලා තම තමන් ප්‍රහීණ කරගත්ත ආශ්‍රව මට්ටමේ ඉඳල තමයි ඒක උපදවන්නට

පුළුවන්කම තියෙන්නේ. ඒ කියන්නේ ඒ ඒ ඥාණ දර්ශනය තුළ පිහිටල තමයි ඒ ඒ මාර්ගය උපනිඃශ්‍රය කරගෙනම තමයි ඒ ඒ පටිසම්භිදාවන්ගේ ලැබීම සිදු කරනු ලබන්නේ. අන්න ඒ නිසා තමයි මේ පටිසම්භිදා ඥාණය පිළිබඳව කතා කරන කොට මාර්ගය මේ පටිසම්භිදාවන් සඳහා උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියල වෙනමම පැහැදිලි කරන්නට යෙදුනේ.

ඉතින් මෙන්න මේ විදිහට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව මේ තැන්වලත් උපනිඃශ්‍රය ප්‍රත්‍යය ක්‍රියාත්මක වෙනව. ඒ උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව මම හිතනව මේ විවිධ ක්‍රමයන් ඔස්සේ කරන සාකච්ඡාව ඇතුලේ උපනිස්සය ප්‍රත්‍යය හඳුනාගන්නට පුළුවන් කියලා. උපනිස්සය ප්‍රත්‍යය කියන එක මේ පැවැත්ම ලෝකයෙහි සකස්වීම කියන එකට විශේෂයෙන්ම බලපාන ප්‍රත්‍යයක්. ඒ නිසා තමයි මේ විවිධ පැතිකඩවල් වලින් උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව මේ විභාගයට ලක් කරන්නේ.

සූවිසි ප්‍රත්‍යයන්ගේම දීර්ඝතම විග්‍රහය දීර්ඝතම විභජනය අපට දකින්න පුළුවන්කම තියෙන්නේ මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි. ඒක එතරම්ම සංකීර්ණව සහ එතරම්ම සියුම්ව අනෙකුත් ධර්මයන් උපදවන්නට හේතු වෙනව සහ අනෙකුත් ධර්මයන් උපදවන්නට ප්‍රත්‍යය වෙනව. ඒ නිසා එය පිළිබඳව අපිට එලෙස සියුම්ව හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

**සාදු සාදු සාදු**

# 16.0320.24 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසි පස්වෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව ඒ සිදු කරනු ලබන ඒ ධර්ම දේශනා මාලාවෙහි ධර්ම දේශනාවක් සඳහා සුදානම්ව සිටින්නේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ පරම ගම්භීර වූ අභිධර්ම පිටකයෙහි පට්ඨානප්‍රකරණයෙහි දැක්වෙන ප්‍රත්‍යය ධර්ම විසි හතර අතුරින් එක් එක් ප්‍රත්‍යය ධර්ම පිළිබඳව හඳුනා ගැනීමේදී අපි ඒ උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳවයි අවසාන වශයෙන් සාකච්ඡා කරමින් සිටියේ.

ඉතින් මේ සූවිසි ප්‍රත්‍යයෙහි ඉතාම දීර්ඝ ලෙස පැහැදිලි කෙරෙන ප්‍රත්‍යයක් තමයි උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ. අපි උපනිස්සය ප්‍රත්‍යයෙහි  භාවිතය පිළිබඳව සාකච්ඡා කලා තුන් ආකාරයකට. **ආරම්මණූපනිස්සය** - **අනනන්තරූපනිස්සය** - **පකතූපනිස්සය** වශයෙන් ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම් පිළිබඳව. උපනිස්සය ප්‍රත්‍යය සෑම තැනකදිම භාවිත වන ලබන ප්‍රත්‍යය ධර්මයක්, ප්‍රත්‍යය විශේෂයක් හැටියට හඳුනාගන්නට පුළුවන් ඒ ඒ ධර්මයන් සමුප්පාදය කිරීමෙහි දී ඒ සංඛත ධර්ම ඉපදවීමෙහි දී.

**ඉතින් යම් යම් ධර්මයන්ගේ උපනිස්සය බව ලැබ ගෙනම තමයි සෑම සංඛත ධර්මයක්ම මේ ලෝකයෙහි හට ගැනීම සිද්ධ වෙන්නේ.** යම් ධර්මයක් ඇසුරු කරගෙන නිංශ්‍රිත කරගෙන උපදිනු ලබන්නේ නම් මේ සෑම තැනකම උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය සිද්ධ වෙනව. **යම් සිතක් උපදින්නේ යම් ධර්මයක් අරමුණු කොට ගෙන නම් ඒ ආරම්මණ ප්‍රත්‍යය උපදිනු ලබන සෑම අවස්ථාවකදීම ආරම්මණය උපනිඃශ්‍රය වීම කියන එකෙනුත් අපිට හම්බවෙනව ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය.**

ඒ වගේම ඒ අධිපති භාවයට පත් වෙන කොට ආරම්මණය අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා වගේම උපනිඃශ්‍රය බවෙන් කටයුතු කරන  තැන්හි දී උපනිඃශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වීමත් අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. **ආරම්මණ ප්‍රත්‍යය යෙදෙන සෑම තැනකම මේ  උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීමත් ඒ නිසාම දකින්නට පුළුවන්.**

ඉතින් උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම පිළිබඳව කෙරෙන ලබන විග්‍රහයේදී  අපි කතා කලා යම් එබඳු ආකාරයකට සේඛ ආයයීන් වහන්සේලා විසින් මාර්ගය ඉපදවීම මුල් කරගෙන ඒ සිව්පිළිසිඹියාපත් උපදවන්නේ කොහොමද කියන එක පිළිබඳව හඳුනාගන්නට යෙදුනා.

ඒ අනුව අවසාන වශයෙන් අපි සිව්පිළිසිඹියාපත් කියන්නේ මොනවද කියල දීර්ඝ ලෙස පැහැදිලි කරගත්තා. මොකද සිව්පිළිසිඹියාපත් කියන එක පිළිබඳව ඔබ තේරුම් අරගෙන සිටිය යුත්තේම දැනගෙන සිටිය යුත්තේම බොහෝ ධර්ම විකෘති වලට මග පාදල තියෙන්නේ ධර්ම විකෘති අද දවසෙදි සිද්ධ කරන්නේ මෙන්න මේ කියන සිව්පිළිසිඹියාපත් අවභාවිත කරමින්. සිව්පිළිසිඹියාපත් කියන යෙදීම අවභාවිත කරමින්, ඒක සාමාන්‍ය පුද්ගලයින්ට ආරෝපණය කරගෙන ඒ ගති ලක්ෂණ පිළිබඳව කරනු ලබන පැහැදිලි කිරීමක් විදියට. නමුත්

සිව්පිළිසිඹියාපත් බව කියන එක ඒක විශේෂ ඤාණයක් හැටියට, ඒ වගේම අභිඥාලාභී උතුමන් වහන්සේලා විසින් උපදවා ගනු ලබන සුවිශේෂ ප්‍රඥාවක් හැටියටත් දක්වමින් අපි එය සඳහන් කරන්නට යෙදුනා සිව්පිළිසිඹියාපත් කියන එක පිළිබඳව. ඒ සඳහා මනස වෙනම භාවිත කිරීමක් තියෙන්නට ඕනේ. තීක්ෂණ නුවණෙහි භාවිතයක් තියෙන්නට ඕනේ සිව්පිළිසිඹියාපත් බව තියෙන්නට නම්.

ඉතින් ඒ පිළිබඳව අපි තේරුම් අරගෙන, ඊට පස්සේ අද දවසෙදි අපිට සාකච්ඡා කරන්නට පුළුවන්කම තියෙනව කුසලයක බලවත් උපකාරය මුල් කරගෙන කොහොමද අකුසල ධර්මයන් උපදින්නේ කියන එක. නැතිනම් එයට උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව.

**කුසලො ධම්මො - අකුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

කුසල ධර්මයක් අකුසල ධර්මයක් උපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරනු ලබනව. කුසල ධර්ම අකුසල ධර්ම උපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම. එතකොට කොහොමද කුසලයක් අකුසලයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරනු ලබන්නේ. එහිදී අපිට දකින්නට පුළුවන් **ආරම්මණූපනිස්සය - පකතූපනිස්සය** කියල උපනිස්සය දෙකට බෙදන බව. ඒ බව අපි මීට පෙර හඳුනා ගෙන තියෙනව. එතකොට ඒ අනුව උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව යෙදෙන කොට දැන් අපි කිච්චනේ කුසල - අකුසල - අව්‍යාකෘත ධර්ම මුල් කරගෙන තමයි මේ ආදී දේවල් අපි විග්‍රහ කරගන්නේ යම්කිසි ප්‍රත්‍යයක් විභාග කර ගැනීමේ දී කියල.

දැන් අපි මීට ප්‍රථමයෙන් කතා කලා කුසල ධර්මයක් මුල් කරගෙන කුසල ධර්මයක් උපදිනව උපනිස්සය ප්‍රත්‍යයෙන්

කියන එක පිළිබඳව මීට පෙරාතුව සාකච්ඡා කරන්නට යෙදුනා. ඒ අනුව **ආරම්මණූපනිස්සය - අනනන්තරූපනිස්සය - පකතූපනිස්සය** කියන මේ උපනිස්සය ධර්මයන්ගේ භාවිතය පිළිබඳවත් ඒ අතරතුරම කරුණු පැහැදිලි කරගන්නට යෙදුනා. දැන් අද දවසෙදි අපි **කුසලො ධම්මො - අකුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො** කියන එක කුසල ධර්මයක් අකුසල ධර්මයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම කියන එක පිළිබඳවයි අපි මේ හඳුනාගන්නට යෙදෙන්නේ.

දානං දත්‍වා **සීලංසමාදියිත්‍වා**

**උපොසථ කම්මං කත්‍වා - තං ගරුං කත්‍වා අස්සාදෙති අභිනන්‍දති, තං ගරුං කත්‍වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

**පුබ්බෙ සුචිණ්ණානි - ගරුං කත්‍වා අස්සාදෙති අභිනන්‍දති, තං ගරුං කත්‍වා රාගො උප්පජ්ජති. දිට්ඨි උප්පජ්ජති.**

**ඣානා වුට්ඨහිත්‍වා ඣානං - ගරුං කත්‍වා අස්සාදෙති අභිනන්‍දති, තං ගරුං කත්‍වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

ඒ අනුව යම්කිසි ආකාරයකට **දානං දත්‍වා සීලංසමාදියිත්‍වා,** දානයක් දීල සීලයක් සමාදන් කරගෙන **උපොසථ කම්මං කත්‍වා,** උපොසථ කර්මයක් කරල, **තං ගරුං කත්‍වා අස්සාදෙති අභිනන්‍දති,** ඒක ගරු කරගෙන ආස්වාදනය කරනව. අභිනන්‍දනය කරනව. මෙන්න මේ සිදු කරනු ලබන ආස්වාදනය කිරීම අභිනන්‍දනය කිරීම කියන එක මත කුසල ධර්මයන් මුල් කරගෙන උපනිඃශ්‍රය කරගෙන අකුසල ධර්මයන්ගේ පහළ වීම සිද්ධ වෙනව. **තං ගරුං කත්‍වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.** ඒක ගරු කරගෙන රාගය උපදිනව. දිට්ඨිය උපදිනව.

**පුබ්බෙ සුචිණ්ණානි - ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති,** පෙර පුරුදු කරන ලද ධර්මයන් මුල් කරගෙන ඊට පස්සේ ආස්වාදය උපදිනව. අභිනන්දනය උපදිනව. **තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති,** ඒක ගරු කරගෙන රාගය සහ දිට්ඨිය ඉපදීම සිදු වනු ලබනව.

**ඣානා වුට්ඨහිත්වා ඣානං - ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති,** ධ්‍යානය ගරු කරගෙන ධ්‍යානයෙන් නැගි සිටල ඒ ගැන මෙනෙහි කරන කොට ආස්වාදන වශයෙන් අභිනන්දන වශයෙන් සිතේ බැස ගැනීම සිද්ධ වෙනව. **තං ගරුං කත්වා රාගො උප්පජ්ජති,** ඒක ගරු කරගෙන රාගය උපදිනව. **දිට්ඨි උප්පජ්ජති,** දිට්ඨිය උපදිනව.

ඉතින් මෙන්න මේ ආකාරයට අපිට මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය තේරුම් ගන්නට පුළුවන් කුසලයක් මුල් කරගෙන අකුසලයක් උපදින කොට ඒ මුලින් උපදිනු ලබන කුසලය පසුව උපදිනු ලබන අකුසලයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. ඒ අනුව කුසලයක් අකුසලයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව අපට වටහා ගන්නට පුළුවන්කම තියෙනව. එතකොට අභිනන්දනය කියල කියන්නේ මෙතනදි අභිනන්දති  කියල වචනයක් අපි දැක්කා, අභිනන්දනය කියල කියන්නේ ඒ පිළිබඳව සිතෙහි ඇතිවෙන සතුටු වීම කියන එක තමයි අපි එහිදී අදහස් කරන්නේ.

එතකොට මේ කුසල් සිතක් මුල් කරගත්තහම අකුසල් ඉපදීම කියන දේ දී අපි දන්නව කුසල චෛතසික සහ අකුසල චෛතසික කියන දේ එකට යෙදෙන්නේ නැහැ. හැබැයි කුසලක් අරමුණු කරමින් අකුසල් උපදින්නට පුළුවන්කම තියෙනව. ඒ තමයි කුසලයක් අරමුණු කරමින් ඒ කුසලය රාග ආදී වශයෙන් මෙනෙහි කරන්නට පුළුවන්කම තියෙනව. කුසලය මුල් කරගෙන ඒ පිළිබඳව අකුසල සිතක් උපදවන්නට පුළුවන්කම තියෙනව.

ඒක තමයි කුසලයක් අරමුණු කරමින් අකුසල් ඉපදවීම කියන දේ ගැන කතා කරන්නේ. එතකොට ඒ අවස්ථාවෙදි ආරම්මණ වශයෙන් උපනිස්සය ප්‍රත්‍යය යෙදීම සිද්ධ වෙනව. **ආරම්මණූපනිස්සය** කියල ඒ උපනිඃශ්‍රය අපි හඳුනා ගනු ලබනව.

එහිදී අර උපනිඃශ්‍රය වන කුසල සිත, අපි දානයක් දුන්න කියල හිතන්නකෝ, ඒ දීපු දානය අපි අරමුණු කරනව. ඒ දෙන ලද දානය අපි අරමුණු කරනව. අරමුණු කරමින් ඒක අපි අභිනන්‍දනය කරනව. **අභිනන්‍දනය කරනව කියන්නේ ඒක තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් එතන අපි සතුට ඇතිකර ගන්නව කියන එක. ඒ තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් එතන ඇතිකර ගන්න සතුටෙහි තියෙන වටිනාකම පිළිබඳව හිතමින්, දිව්‍ය ලෝක සම්පත් ආදී ලැබෙන දේවල් පිළිබඳව සිතමින් ඒක අරමුණු කරගන්නව ලෝභ ආදී වශයෙන්.**

අන්න ඒ ලෝභ ආදී වශයෙන් අර කුසලය අරමුණු කරන කොට ඒ අවස්ථාවෙදි ඒ කුසලය අරමුණු වීමේදී ඒ කුසලය ආරම්මණ ප්‍රත්‍යයෙන් තමයි පසුව ඉපදුන අර ලෝභ සිතට ප්‍රත්‍යය වෙලා තියෙන්නේ. **එතකොට අර පෙර ඉපදුනු සිත එතනදි ආරම්මණ භාවයෙන් මේ සිතෙහි පැවැත්මට උපකාර වෙලා තියෙනව.**

එතකොට ආරම්මණ බව පිළිබඳව කතා කරන කොට අපි දන්නවා මේ ආරම්මණය එතන තියෙන්නට අවශ්‍ය නෑ ඒ උපකාරී බව සිද්ධ කරන්නට කියල. **ඒ කියන්නේ එතන යෙදිල ඒක ඉපදිල තිබීමෙහි අවශ්‍යතාවයක් නෑ.** හැබැයි **ඒක අරමුණු කරමින් උපදින කොට උපදින්නේ අකුසල් සිත.** හැබැයි ඒ සිත ඉපදවීමෙහි දී ඒකට න්‍යෂ්ටිය සපයල දීල තියෙන්නේ, ඒක එල්බී ගන්න ඒ අකුසල් සිතට අවකාශය සලස දීල තියෙන්නේ මොකද්ද? අර කුසලය කියන ධර්මය. **ඒක තමයි ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියල කියන්නේ.**

එතකොට ඒක උපනිඃශ්‍රය කරගෙන පවතින නිසා ඒක උපනිස්සය ප්‍රත්‍යය භාවයෙනුත් ප්‍රත්‍යය වෙනවා කියල කියනව. **අරමුණු වීමත් එය උපනිඃශ්‍රය කොටගෙන පැවතීමත් කියන මේ ආකාර දෙකෙන්ම මේ ප්‍රත්‍යය වීම අපිට මෙතනදි හඳුනාගන්නට පුළුවන්. ඒ නිසා ආරම්මණ ප්‍රත්‍යය වගේම උපනිස්සය ප්‍රත්‍යය කියන එකත් මෙතනදි අපිට තේරුම් ගැනීමෙහි හැකියාව තියෙනව.**

එතකොට මේ ආකාරයට කුසලයක් මුල් කරගෙන අකුසල් ඉපදවීම කියන දේ දිහා බැලුවහම අපිට විග්‍රහ කරගන්න පුළුවන්කම තියෙනව යම්කිසි විදියකින් ශ්‍රද්ධාව මුල් කරගෙන ඒ ශ්‍රද්ධාව ඇසුරු කරගෙන මිනිස්සු අකුසල් කර ගන්නව. සීලය ඇසුරු කරගෙන ශ්‍රැතය ඇසුරු කරගෙන චාගය ඇසුරු කරගෙන ප්‍රඥාව ඇසුරු කරගෙන මිනිසුන් අකුසල් සිද්ධ කරගන්නව. එතකොට මෙන්න මේ ධර්මයන් ඇසුරු කරගෙන රාග ද්වේශ මෝහ වශයෙන් මිනිස්සු අකුසල් රැස් කරගන්නව. මෙන්න මේ විදියට අපිට මේ කුසල ධර්මයන් මුල් කරගෙන අකුසල්වල ඉපදීම පිළිබඳව හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

**ඇයි කුසලයන් මුල් කරගෙන මේ අකුසල්වල ඉපදීම පිළිබඳව මේ විදියට කතා කරන්නේ?** දැන් හිතන්නකෝ ශ්‍රද්ධාවන්ත පුද්ගලයෙක්, ඔහු ශ්‍රද්ධාව මුල් කරගෙන ඔහුට පුළුවන්කම තියෙනව ඒ නිසා මානය ඇතිකර ගන්න. මම ශ්‍රද්ධාවන්තයෙක්. ඒ වගේම මම හොඳ පුද්ගලයෙක්ය කියල තමන් ශ්‍රද්ධාව ඇතිකර ගන්නට පුළුවන්කම තියෙනව **අත්තුක්කංසනයක්** ඇතිකර ගන්නට. තමා උසස් කොට දැකීම. ඒකට කියන්නේ මානය කියල. එතකොට මම ශ්‍රද්ධාවන්තයෙක්. අනිත් අය අශ්‍රද්ධාවන්තයෝ කියල තමන් හුවා දක්වාගෙන පරවම්භනය කරනව, අනුන් හෙලා දැක්වීම සිද්ධ කරනව, අනුන් ශ්‍රද්ධාවක් නැති අය. මම වගේ නෙමෙයි ශ්‍රද්ධාවක් ඇත්තේ නෑ. එතකොට අන්න ඒ විදියට තමන් හුවා දක්වමින් අනුන් හෙලා දැකීම සිද්ධ

කිරීම ආදී ඒ වගේ තැන්වලදි උපදින්නේ මානය කියන මේ අකුසල ධර්මය.

ඒ නිසා ඔබට යම් එබඳු අවස්ථාවල සිතේ ඇතිවෙනව නම් සිතුවිල්ලක් යම් විදියකට මේ අනිත් අයට වඩා මම ශ්‍රද්ධාවන්තයෙක් අන්න ඒ විදියට ඇතිවෙන තැනකදි ඔබ ඒ සිත හඳුනාගන්නට ඕනේ. මේ මොකද්ද වෙන්නේ? ශ්‍රද්ධාව නැමති කුසලය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙමින් අකුසලයක් උපදවල තියෙනව. මානය නැමති අකුසලය උපදවන්නට ඒක ප්‍රත්‍යය භාවය සකස් කරල තියෙනව කියල අපිට එතනදි ඒ පිළිබඳව දැනුවත් බව ඇතිකර ගැනීම තමයි වැදගත් වෙන්නේ.

ඊට පස්සේ සීලය නිසා කෙනෙකුට හිතෙන්නට පුළුවන් මම හරි සිල්වත්. ඒ වගේම අනිත් අය දුශ්ශීලයන්ය කියල මේ විදියට හිතෙන්නට පුළුවන්. මේක මේ පැවිදි සමාජය ඇතුළෙත් ගිහි සමාජය ඇතුළෙත් බොහෝ සෙයින්ම දකින්නට තියෙන දෙයක් තමයි තමන්ගේ සිල්වත් බව කියන දේ තුළ නොරැඳී තමන් අනිත් අයගේ සීලය පිළිබඳව සොයා බැලීමකුත් කරනව. එතකොට මම හරි සිල්වත්. අනිත් අයට එහෙම සීලයක් ඇත්තේ නෑ. අපෝ ඒ පුද්ගලයෝ දුශ්ශීල පුද්ගලයින්ය කියල තමන්ව ඔසවා ගැනීම සහ අනුන්ව හෙලා දැකීම සිද්ධ කරනව. තමන් ඒ ඇතිකර ගන්න තැනකදි එහෙම දේවල් හිතන තැනකදි මානය කියන ධර්මය තමයි ක්‍රියාත්මක වෙන්නේ. තමන්ව හුවා දක්වා ගන්න තැනදි තමනුත් ඒ කෙලෙස්සයකට හසුවීම තමයි එතනදි දකින්නට පුළුවන්කම තියෙන්නේ. ඒ නිසා මානය කියන දේ හොඳ දෙයක් නෙමෙයි. මානය උපදින අවස්ථාවකදි අපි තේරුම් ගන්නට ඕනේ ඒක ඉපදිල තියෙන්නේ කුසලයක් ඇසුරු කරගෙන උපනිඃශ්‍රය කරගෙන අකුසලයක් උපදින අවස්ථාවක. ඒ කියන්නේ තමාගේ සීලය, සීලය රැකීම කියන එක කුසලයක්. ඒ කුසලය මුල් කරගෙන මානය නැමති අකුසලයක් උපදිනව.

ඒ වගේම ශ්‍රද්ධාව සීලය මේ ආදී තැන්වල දිට්ඨිය උපදින්නටත් පුළුවන්කම තියෙනව. කොහොමද දිට්ඨිය උපදින්නේ? සත්ත්ව පුද්ගලභාවයෙන් දකින කොට. ශ්‍රද්ධාව නැමති මේ ධර්ම විෂය පිළිබඳව අවබෝධයක් නැති වෙන කොට අපිට හම්බවෙනව ඒ තැන්වලදි ශ්‍රද්ධා සම්පන්න පුද්ගලයෙක්. මම තමයි ශ්‍රද්ධාවන්තයා. අනිත් අය තමයි අශ්‍රද්ධාවන්ත. එතකොට මේ හැම තැනකදිම අපිට හසුවෙන දේ තමයි අකුසල ධර්මයන්ගේ පැවැත්ම කියන එක. ඒ කියන්නේ දිට්ඨි සහගත කෙලෙස්සයක්. පුද්ගලභාවයන්ගේ පැවැත්ම කියන එකත්. ඒ පුද්ගලය කවුද කියල බැලුවහම ඒ ශ්‍රද්ධාවන්ත පුද්ගලය මේ මම. ඒක රූපය තුළින් හෝ හම්බවෙනව. එහෙම නැත්නම් ඒ ශ්‍රද්ධාවන්ත පුද්ගලයා වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණයන් තුළින් හෝ හම්බවෙනව. මේ නාම රූප කියන මේ ධර්ම දෙක තුළම ඒ ශ්‍රද්ධාවන්ත පුද්ගලය ඇසුරු වෙන තැනදි ඒකට කියනව සක්කාය දිට්ඨිය ඇසුරු වෙනව කියල. ඒක දිට්ඨි සහගත බව. එහෙනම් අර කුසලය මුල් කරගෙන මේ දිට්ඨි සහගත බවත් උපදිනව.

ඒ නිසා තමයි අපිට ඒ කුසලයන් මුල් කරගෙන අකුසලයන් උපදවන්නට පුළුවන්කම තියෙන නිසාම ඒව හඳුන්වන්නේ **අසඞ්කිලිට්ඨසඞ්කිලෙසික ධර්ම (බු. ජ. ත්‍රි. ධප්‍ර මාතිකා ඡේද 1002 පිටු 384 සහ ඡේද 1396 පිටු 502)** කියල. කුසලය කරන වෙලාවෙදි කුසල් සිත උපදින අවස්ථාව වෙන කොට ඒක කිලුටු නැහැ. හැබැයි පසුව උපදින කිලුටු සහිත සිතකින් අර මුලින් ඉපදුන සිත අරමුණු කරන්න පුළුවන්කම තියෙනව. එතකොට අර සිතේ කිලුටු නැහැ, හැබැයි කිලුටු සහිත සිතකින් අරමුණු කරන්න පුළුවන්කම තියෙන නිසා ඒ ධර්මය හඳුන්වන්නේ **අසංකිට්ඨයි සංකිලෙසිකයි. කුසල ධර්ම අසංකිලිට්ඨ සංකිලෙසික ධර්ම. ඒව කෙලසෙන්න පුළුවන්කම තියෙනව.**

ඒ ධර්මයන් ඇසුරු කරගෙන මෙන්න මේ විදියට ඒව උපනිඃශ්‍රය කරගෙන  අකුසල් ඉපදවීමේ හැකියාව තියෙන නිසා මානය උපදින්නට පුළුවන්. දිට්ඨිය උපදින්නට පුළුවන්කම තියෙනව. ඒ නිසා තමයි මිනිස්සුන්ට ශ්‍රද්ධාවන්ත බව, සිල්වත් බව මේව මුල් කරගෙන දිට්ඨි සහගත මට්ටමෙන් පරාමර්ශනය කරගත්තහම ඇතැම් වෙලාවට ශ්‍රද්ධාවන්ත බව නිසා වේදනාවට දුකට ජරා මරණයන්ට පත්වන්නට සිද්ධ වෙන්නේ. සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයන්ට මුල් වෙන්නේ. ඒ වගේම සීලය මුල් කරගෙන ඒ තැන්වලට පත්වන්නට සිද්ධ වෙන්නේ. ඒක දිට්ඨි සහගත මට්ටමකින් ඇසුරු වෙන නිසා.

ඒ වගේම තමන් ඒ ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීම තුළ තමන් සීලයෙන් යුක්තව වාසය කිරීම තුළ ඒව සුගති විපාක ගෙනවිත් දෙන්න තරම් සමර්ථ දේවල් බවට පත්වන්නෙත් ඒ හේතුව නිසාම තමයි. ඒ හේතුව නිසා කියල කිව්වේ එබඳු වූ විපාක සම්පත්තියක් ගෙනල්ල දෙන්නට පුළුවන්කම තියෙන්නේ වෙනත් දෙයක් නිසා නෙමෙයි. එබඳු වූ විපාක සම්පත්තියක් පවා ගෙනත් දෙන්නට පුළුවන්කම තියෙන්නේ ඒ කුසලය මුල් කරගෙන කෙලෙස් උපදවන්නට පුළුවන්කම තියෙන නිසා.

දැන් අපි දන්නව කෙනෙක් උපදින්නේ හේතුව හැටියට ගත්තහම **අවිද්‍යාව - කර්ම - තණ්හා** කියන මේ ලක්ෂණ ටික නිසා තමයි අපි සසරේ භව උප්පත්තියකට පත්වෙන්නේ. **අවිද්‍යා - කර්ම - තණ්හා** කියන ටික නිසා. නැතිනම් **තණ්හා - උපාදාන - භව** කියලත් අපි මේ කෙලේසය පැත්ත ගැන කතා කරනව. එතකොට මේ **තණ්හා - උපාදාන - භව**  කියන මේ ධර්ම දිහා බැලුවහම අපිට කුසල හේතු යෙදෙනව කුසල කර්මයක් පිළිබඳව උපදින කොට. **හැබැයි ඒ කර්මයකට මේ කෙලෙස් ටික යෙදෙන්නේ නැති වුණොත් ඒ කර්මයට උපදින්න පුළුවන්කමක් නෑ.** ඒ හින්දා තමයි පොදුවේ අපි කියන්නේ අවිද්‍යාව නිසයි උපදින්නේ කියල. කර්මය නිසයි උපදින්නේ කියල කියන්නේ.

කර්මයෙහි යෙදීමක් නැතුව අර කෙලේසයට පවතින්න තැනක් නැහැ. කෙලෙස් වල යෙදීමක් නැතුව උපදින්නෙත් නෑ. ඒ නිසා අවිද්‍යාව කර්මය සහ තණ්හාව කියන මේ ධර්මයන් අත්‍යන්තයෙන්ම මේ භව ගමන සකස් කරන්නට නැතිනම් මේ හේතු ඵල, හේතු ඵල වශයෙන් මේ හේතු ඵල දහමෙහි පැවැත්ම, නොනවැත්ම ඇති කරන්නට ඒක හේතුවක් බවට පත් වෙලා තියෙනව මේ කර්ම සහ කෙලෙස් කියන ටික.

**එතකොට කර්මය කියන එක කුසල කර්මයක් වන්නට පුළුවන්. හැබැයි කෙලෙස් කියන එක අකුසල ධර්මයක්.** කුසලය මුල් කරගෙන වුණත් ඒ කෙලේසය නැමති අකුසල පාක්ෂික ධර්ම, සමුදය පාක්ෂික ධර්ම උපදින නිසා තමයි ඒ කර්මයට අනුරූපීව විපාකයක් ලබන්නට පුළුවන්කමක් තියෙන්නේ.

ඉතින් කුසලයක් උපනිඃශ්‍රය කරගෙන අකුසලයක් ඉපදීම නිසා නැතිනම් මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි ම භාවිතය නිසා, ඒ අකුසලය ප්‍රත්‍යයෝත්පන්න වන නිසා, කුසලයෙහි ප්‍රත්‍යයෝත්පන්නය අකුසලය වන නිසා තමයි ඒ සසරේ පැවැත්ම කියන එක වර්තනය කියන එක අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. ඒ කියන්නේ ඒක කුසලයකින් මුල් කරගෙන උපදින්නේ කුසලයක් පමණක්ම නෙමෙයි, කුසලයෙහි උපනිඃශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වීම තුළ අකුසලයක් උපදින්නට පුළුවන්කම තියෙනව.

**සද්ධං උපනිස්සාය - මානං ජප්පෙති, දිට්ඨිං ගණ්හාති.**
**සීලං, සුතං, චාගං, පඤ්ඤං, උපනිස්සාය - මානං ජප්පෙති දිට්ඨි ගණ්හාති.**

**සද්ධා සීලං සුතං චාගො, පඤ්ඤා - රාගස්ස, දොසස්ස මොහස්ස මානස්ස දිට්ඨියා පත්ථනාය උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඉතින් ශ්‍රද්ධාව තියෙන තැනක, සීලය තියෙන තැනක මානය උපදින්නට පුළුවන්කම තියෙනව වගේම, ඒ තැනක දිට්ඨිය උපදින්න පුළුවන්කමත් තියෙනව. දිට්ඨිය ඉපදුනාට පස්සේ ශ්‍රද්ධාවන්ත මම අපිට දකින්න පුළුවන්. මම හරි ශ්‍රද්ධාවන්තයි. මම හරි සිල්වත්. මේ විදියට සිල්වත් බවත් අපිට උපදව ගන්නට පුළුවන්කම තියෙනව.

සිල්වත් කෙනෙක් අපිට හම්බවෙනව. අන්න ඒ මොකද්ද වෙලා තියෙන්නේ? කුසලයක ප්‍රත්‍යය වීම මුල් කරගෙන කෙලේසයක ඉපදීමක්. අකුසලයක ඉපදීම තමයි ඒ අවස්ථාවලදි සිද්ධ වෙලා තියෙන්නේ. ඒ නිසා අපි ඒ තැන් උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය කියන එක තුළ අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන දේවල්.

එතකොට ඒ විදියටම ශ්‍රද්ධාව සීලය ආදී ධර්මයන් තුළ ඒ සක්කාය දිට්ඨි ආදී දිට්ඨි ඒ වගේම මානය මේ වගේ දේවල් උපදවන්නට පුළුවන්කම තියෙනවා කියන එක අපි හඳුනාගන්නට යෙදුනා.

ඒ වගේම සුතය තුළ මම මම බොහොම ඇසූ පිරූ තැන් ඇති කෙනෙක්. මම බොහොම ධර්මය අහල තියෙනව. මම ගොඩක් දන්නව. ඒ වගේ ශ්‍රැතවත් බව පිළිබඳවත් කෙන කෙනාට මානයක් ඇතිකර ගන්නට පුළුවන්කම තියෙනව. දිට්ඨියක් ඇතිකර ගන්නට පුළුවන්කම තියෙනව.

චාගය මුල් කරගෙනත් කෙනකුට මානයක් ඇතිකර ගන්නට පුළුවන්කම තියෙනව. චාගය මුල් කරගෙනත් කෙනකුට දිට්ඨිය උපදවා ගන්නට පුළුවන්කම තියෙනව.
ප්‍රඥාව මුල් කරගෙනත්, මම හරි ප්‍රඥාවන්තයි. මේ මේ දහම් කරුණු මට හරි හොඳින් වැටහෙනව. අනිත් අයට මේව වැටහෙන්නේ නෑ. මේ සියුම් නුවණින් මට මේව දැන ගන්නට පුළුවන්කම තියෙනව. මේ විදියට තමන්ට ඒ පිළිබඳව මානය

ඇතිකර ගන්නටත් පුළුවන්කම තියෙනව. ඒ වගේම ඒ පිළිබඳව ප්‍රඥාවන්ත පුද්ගලභවක් සකස් කර ගැනීම ඇතුලේ දිට්ඨිය සකස් කරගන්නට පුළුවන්කමත් තියෙනව.

ඉතින් මේ මාන සහ දිට්ඨී කියන මේ ධර්ම වැඩිවෙන කොට මොකද  වෙන්නේ? හරියට රිදෙනව. කොච්චර දේවල් හදා ගත්තත් එතකොට තමන්ට ලෝකෙන් යම්කිසි විදියකින් තමන්ට කැමති පරිදි දේවල් නොවෙන කොට මෙච්චර ශ්‍රද්ධාවෙන් වැඩ කරන මට නේද අප්පා මේ බැණුම් අහන්න වුනේ. මෙච්චර ශ්‍රද්ධාවෙන් වැඩ කරපු මට නේද මේ විදියේ දෙයක් වුනේ. ලෝකේ එහෙම හිතෙන්නේ නැද්ද? එහෙම හිතෙන අවස්ථා නැද්ද? ලෝකේ බොහෝ දෙනා ඇසුරු වෙන කොට ඔබට දැනිල ඇති. ඒ වගේම මෙච්චර සිල් රැකගෙන හිටපු මටනේ මෙහෙම දේවල් වෙන්නේ. හොඳට ඉන්න අපිට නේ හැමදාම මෙහෙම කරදර එන්නේ. මිනිස්සුන්ට හිතෙන්නේ නැද්ද? එහෙම හිතෙන වෙලාවල් තියෙනව. **ඒ රිදෙන්නේ ඇයි? ඒ රිදෙන්නේ කුසලය නිසා නෙමෙයි. ඒ කුසලය උපනිඃශ්‍රය කරගත්ත අකුසලය නිසයි රිදෙන්නේ.** කුසලය නිසා ඔබට රිදෙන්නේ නෑ. අකුසලය නිසාම තමයි ඔබට රිදෙන්නේ.

සූත්‍රය තුළ බැලුවොත් එහෙම මෙච්චර බහුශ්‍රැත බවක් තියෙන, මෙච්චර ධර්මය පිළිබඳව දන්න මට මොකක්වත්ම නොදන්න කෙනෙක් ගානේට දාල කතා කලා. අපි එහෙම මෝඩ අය නෙමෙයි. අපි මහ නුවණක් තියෙන අය. එහෙනම් සමාජය ඇතුලේ මේවා ඔබට පේන්නේ නැද්ද? ඔබට ඇහෙන්නේ නැද්ද? ඔබේ හිතට මෙහෙම දේවල් ඇති වන්නේ නැද්ද?

හිතල බැලුවහම ඔබට තේරුම් ගන්නට පුළුවන් කොච්චර දුරට අපේ සිත් කෙලෙසයන්ගෙන් ආවරණය කරගෙන තියෙනව ද කියල. ඒ කෙලෙස් නිසා තමයි ගොඩක් වෙලාවට රිදෙන්නේ හිතට. මට තමයි මෙහෙම කිව්වේ. මෙච්චර සිල්වත් මට මෙහෙම

කිව්වා. මෙච්චර ප්‍රඥාවන්ත මෙච්චර බණ දහම් අහල තියෙන මට මෙහෙම කිව්වා. එහෙම නැත්නම් මම බණ දහම් අහල නෑනේ කියල කෙනකුට රිදෙන්නත් පුළුවන්. ශ්‍රැතවත් බව මුල් කරගෙනම. ඒක කෙසේ වෙතත් ශ්‍රැතය මුල් කරගෙන කෙනකුට අර අකුසලය උපදින්නට පුළුවන් උපනිඃශ්‍රය කරගෙන.

ඒ වගේම චාගය. දන් දෙනව. කෙනෙක් බොහොම දන් දෙනව කියල හිතන්නකෝ. ඒ චාග සම්පත්තිය කියන තැනදි. දානය මුල් කරගෙන කටයුතු කරන යම් කෙනෙක් ඉන්නව. ඒ පුද්ගලය දානය මුල් කරගෙන දන් දි දී කටයුතු කරන කොට යම් කෙනෙක් බණිනව. දෝෂාරෝපනය කරනව. දන් දුන්න කියන එක මත මුල් කරගෙන ඔය මනුස්සය මහ ලෝභයෙක්. මේ විදියටයි දානය දුන්නේ. එහෙම නැතිනම් ලෝභයෙක් හැටියට කවුරු හරි දෝෂාරෝපණය කරල තියෙනව කියල. දැන් රිදෙන්නේ කොයි විදියට ද? මෙච්චර දන් දුන්න, මෙච්චර මේ දේවල් අත හැරපු මට නේද මේ මිනිස්සු මෙහෙම වචන කියන්නේ. අපිට රිදෙන්නේ නැද්ද? අපි අකමැති දේවල් ලෝකේ සිද්ධ වෙන කොට. ඒ දානය මුල් කරගෙන රිදෙනව ද අපිට? නෑ. කුසලය මුල් කරගෙන කවදාවත් රිදවීමක් ඇති වෙන්නේ නෑ.

**පින කියල කිව්වේ බුදුරජාණන් වහන්සේ සැපයට තව නමක්. එහෙනම් ඒක දුකක් වෙන්නේ නෑ කවදාවත්. කුසලය මුල් කරගෙන නෙමෙයි අපිට දුකක් උපදින්නේ. අකුසලයක් මුල් කරගෙන.** එතනදි උපදින අකුසලය මොකද්ද? අර කුසලය මුල් කරගත්ත උපනිඃශ්‍රය කරගත්ත මානය නිසා, කුසලය උපනිඃශ්‍රය කරගෙන උපදින දිට්ඨිය නිසා, එතකොට ඒ ශ්‍රද්ධාව ප්‍රත්‍යය වෙනව උපනිස්සය ප්‍රත්‍යයෙන් අර කියන දුක උපද්දන්නට. නැතිනම් අර කෙලේසය උපද්දන්නට. ඒ කෙලේසය තමයි දුක උපද්දන්න මුල වෙලා තියෙන්නේ. ඒ විදියටම සීලය කියන එක උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව කෙනකුට අර

අකුසලය උපදවන්නට. අකුසලය තමයි මානය සහ දිට්ඨිය තමයි හේතු වෙලා තියෙන්නේ ඔහුට දුක උපද්දන්නට.

මේ විදියට ගත්තහම දුක ඉපදිල තියෙන්නේ මොකක් මතද කියල බැලුවහම අර කුසලය මත ඇතිකර ගත්ත අකුසල සහිත සංචේතනාවන් මත. අකුසල සහිත දේ මත තමයි දුක කියන දේ උපද්ද ගෙන තියෙන්නේ.

ඉතින් ඒ විදියට ප්‍රඥාව මත වුණත් ඒ දුක උපදින්නට පුළුවන්කම තියෙනව. වෙහෙස විඩාව ලෝකයාට ඇති වෙන්නට පුළුවන්කම තියෙනව. ඒ දුක ඒ වෙහෙස ඒ විඩාව ලෝකෙට උපදින්නේ ඇයි? කුමක් මුල් කරගෙන ද? ඒ දුක ඒ වෙහෙස ඒ විඩාව ලෝකෙට ඇති වෙන්නේ කෙලෙස්සය මුල් කරගෙන. ඒ කෙලෙස්සය නැතිනම් අකුසලය ඉපදුනේ කුමක් මුල් කරගෙන ද? කුසලය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙමින්.

ඔබට යම් වෙලාවක දුකක් ඇතිවෙන කොට, ධර්ම මාර්ගයේ යන කෙනෙක් විදියට ලෝකයේ ඉන්න පුද්ගලයෝ ඇසුරු කරන කොට, ඔබට දේවල් මුල් වෙන කොට, ඔබට ඔබ ගැන හිතෙන කොට, ඔබ ටිකක් මේ ප්‍රත්‍යය ධර්ම විභාගය පිළිබඳව **ගම්භීර ඥාණචරිය පච්චවෙක්ඛනතා** කියල අර ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩෙන ආකාරය පිළිබඳව කතා කිරීමේදී අපි කරුණක් කතා කරනවනේ ගැඹුරු දහම් කරුණු පිළිබඳව ප්‍රත්‍යවේක්ෂා කරන්නට කියල. අන්න ඒ ප්‍රත්‍යවේක්ෂණය ඔබ සිද්ධ කරනව නම් ඔබට පෙනෙයි මේ මම මෙබඳු වූ දෙයක් කරනවා කියල පේන තැනක දි මෙතන තියෙන්නේ මේ විදියට ප්‍රත්‍යයන්ගෙන් හටගත්ත ධර්මයන්ගේ පැවැත්මක් නේද කියල. අර මුලින් කරන ලද පුබ්බෙ සුචිණ්ණානි කියල කිව්වේ, පෙර පුරුදු කරන ලද ඒ කර්මයක් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙමින් දැන් අකුසලයක් උපදවන කොට මේ මම, පින් කරපු

මම, ශ්‍රද්ධා සම්පන්න මම, සීල සම්පන්න, සුත සම්පන්න, චාග සම්පන්න, ප්‍රඥා සම්පන්න මම හම්බවෙනව.

මේ ඇති කරගත්ත මේ පුද්ගල බව දෘෂ්ඨිගතිකත්වයත් එක්ක නේද මේ රිදෙන්නේ. මේ ඉන්න පුද්ගලයටනේ ද මේ රිදෙන්නේ. මේ ධර්මයන්ගේ දෙයක් නෙමෙයි. මේ පුද්ගලයගේ පැවැත්මක් නේද මේ දුක කියල ගෙනල්ල තියෙන්නේ. අපිට දකින්න පුළුවන් අර කුසල ධර්මයත්, ඒ කුසල ධර්මය ප්‍රත්‍යය කරගෙන, උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම නිසා අකුසලයක් ඉපදුනු විදියත්, අකුසලය කියන දේ මත තමන්ට දුකට වෙහෙසට විඩාවට පත්වන්න වුණ විදියත් අපිට දකින්නට පුළුවන්කම තියෙනව.

එතකොට ඒ ධර්මයන්ගේ පැවැත්ම කියන දේ මත දුකෙහි හට ගැනීම වුණ බව තේරුම් අරගෙන, ඒ ධර්මයන්ගේ පැවැත්ම තේරුම් අරගෙන, පුද්ගල බව නූපදින තැනකට තමන්ගේ මනස පත්කර ගන්නට ඒ දකින විදිය හේතුවක් බවට පත්වෙනව.

මේ විදියට ශ්‍රද්ධාව මුල් කරගෙන යම්කිසි විදියකින් කෙන කෙනාට මානය දිට්ඨිය උපදවන්න පුළුවන්කම, සුතය මුල් කරගෙන, ඒ වගේම සීලය මුල් කරගෙන, චාගය, ප්‍රඥාව මුල් කරගෙන මානය දිට්ඨිය උපදවන්නට පුළුවන්කම තියෙනව. එතකොට මෙන්න මේ ආකාරයට අපිට ලෝකයෙහි කුසලයන් මුල් කරගෙන අකුසලයන් උපදවන පුද්ගලයන් දකින්නට පුළුවන්.

අර ආත්ම අනාත්ම ආදී කතා ඇති වන්නෙත් මෙහෙම දේවල් මුල් කරගෙන තමයි. ඒ කිව්වේ? ආත්ම අනාත්ම කතා උපදිනව කියල කිව්වේ? දැන් සමහර වෙලාවට සත්ත්වයෙක් ඉන්නව කියල ඔය කියන්නේ. කෝ නෑ හෝ කියන්නට යන අය ඉන්නේ. ඒ සත්ත්වයෙක් ඉන්නව කිව්වත්, නෑ කිව්වත් ඒ කියන්නේ අන්න

ඔය වගේ පසුබිම් මත පිහිටල. ඒ කියන්නේ දැන් **නිවන් දකින්නේ කව්ද? නිවන් දකින්නේ මේ ඉන්න පුද්ගලය. මොකද්ද වෙලා තියෙන්නේ? කුසලයක් අරමුණු කරමින් අකුසලයක් උපදවන්නට යෑම ඇතුලේ.** සිල් රකින්නේ කව්ද? කව්ද භාවනා කරන්නට ඕනේ? ඒ තමයි සත්ත්වයා තමයි භාවනා කරන්නට ඕනේ. **එතකොට ඒ සත්ත්වයා කියන එකෙන් හඳුනාගෙන තියෙන්නේ මොකද්ද? අකුසල සහිත සිතක්. අකුසල සහිත ධර්මයන් ටිකක්. කෙලේසයක පැවැත්මක්. මොනවද? මානය සහ දිට්ඨිය. මේ කෙලෙස් දෙකේ පැවැත්ම.**

මේ කෙලේසය උපදිල තියෙන්නේ මොකක් මුල් කරගෙන ද? කුසලයක් මුල් කරගෙන තමයි ඉපදිල තියෙන්නේ. ඒ නිසා තමයි ප්‍රතිපදාව පුරණ වඩන පුද්ගලයව හම්බවෙන්නේ. සිල් රකින කෙනාව හම්බවෙන්නේ. ප්‍රඥා සම්පන්න කෙනාව හම්බවෙන්නේ. පුද්ගලයව හම්බවෙන්නේ ඒ නිසා තමයි. එතකොට ප්‍රඥා සම්පන්න පුද්ගලයෙක් හම්බවෙන කොට, සිල්වත් පුද්ගලයෙක් හම්බවෙන කොට, ප්‍රතිපදාව වඩන පුරණ පුද්ගලයෙක් හම්බවෙන කොට, ඒ ප්‍රතිපදාව - සීලය - ප්‍රඥාව නැමති මේ කුසල ධර්මයන් ප්‍රත්‍යය වෙලා තියෙනව අර පුද්ගල බව නැමති දිට්ඨිය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙමින්.

එතකොට උපනිඃශ්‍රය කියන එකේදි දැන් අපිට ප්‍රත්‍යය පැහැදිලි කරගන්නට පුළුවන් වඩාත්ම. යම් ධර්මයක් ඒක නිස්සය කර ගනිමින්, නිඃශ්‍රිතයක් හට ගන්නව ද, අන්න ඒක තමයි උපනිස්සයෙහි භාවිතය බවට පත්වෙලා තියෙන්නේ. හැබැයි අනන්තරව උපදින්නට අවශ්‍යතාවයක් නෑ. ඊට අනතුරුව උපදින්න අවශ්‍යතාවයක් නැහැ. තමන් අවුරුදු ගාණකට කලින් කරපු කුසලයක් වුණත් මුල් කරගෙන තමන්ට වර්තමානයේ තුළ අකුසල් උපදින්නට පුළුවන්කම තියෙනව. එතකොට අර ධර්මය මේ වෙලාවෙදි උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව.

එතකොට මේ ප්‍රත්‍යය වීම පිළිබඳව කතා කරන කොට ඔබ හඟින්නට කල්පනා කරන්නට එපා, අර දේවල් තිබිල තමයි දැන් මේ ප්‍රත්‍යය වන්නට ඕනේ කියල. ප්‍රත්‍යය ගැන කතා කරන කොට අපිට මේව හරි නුවණින් සහ සංකීර්ණතාවයෙන් දකින්නට තියෙන දේවල්. අත්ථි බවනුත් සමහර දේවල් ප්‍රත්‍යය වෙනව. නැති වුණත් නැති බව ප්‍රත්‍යය වෙලා තියෙනව සමහර දේවල් උපදවන්නට. ඒ නිසා මේ තියෙනවා කියන දේ මත ගොඩ නැගිල නෙමෙයි ප්‍රත්‍යය විභාගය ගැන කතා කරන්නේ. ප්‍රත්‍යය කියල කියන්නේ යම් ධර්මයක් ඉපදවීම පිණිස ඒ ඒ ධර්මයන්ගේ බලපෑම, සමහර දේවල් තිබිල, ලඟ ඉඳගෙන ප්‍රත්‍යය වෙන කොට, සමහර දේවල් නොතිබී දුර ඉඳගෙන ප්‍රත්‍යය වෙනව. ඒ කියන්නේ සමහර දේවල් ඒ අවස්ථාවට නොයිදීමම තමයි ඒක උපදින්නට ප්‍රත්‍යය කරල තියෙන්නේ. සමහර ධර්මයන් ඒ ඵලය උපදින්නට ඒ සමහර ධර්ම තිබුණේ නෑ. නැති බවෙන් තමයි ඒක ප්‍රත්‍යය වෙලා තියෙන්නේ.

එතකොට මෙන්න මේ ආකාරයට අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව මේ ප්‍රත්‍යය විභාගය පිළිබඳව තේරුම් ගැනීමේදී. ඒක එච්චර සංකීර්ණයි. ඒ වගේම සියුම්. නුවණින් තේරුම් ගන්නට තියෙන විෂයක්. මේ නුවණ පැවැත්වීම ඉතාමත් සියුම්ව විමසා බලන්නෙකුට හැරුන කොට මතු පිටින් අතපත ගාලා මේක තේරුම් ගන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ.

ඉතින් ඒ නිසාම තමයි මේ ධර්මයෙහි නැතිනම් සාසනයෙහි අතුරුදහන් වීම පිළිබඳව කතා කරන කොට මේ පට්ඨානප්‍රකරණය තමයි පළමුව අතුරුදහන් වන ධර්ම කොට්ඨාසය හැටියට දක්වන්නේ. මේක සියල්ලට පළමුව අතුරුදහන් වෙන්නේ. මොකද මේක තීක්ෂණ නුවණින් තේරුම් ගන්නට ඕන දෙයක්. පටිසෝතගාමී ධර්මයෙහි තීක්ෂණ නුවණින්ම තේරුම් ගන්නට ඕනේ ධර්ම කොට්ඨාසය ප්‍රඥාවෙන්

දුර්වලව යන ලෝකෙට වැහෙනව කියන එක සාමාන්‍යය දෙයක්. ඒ නිසා තමයි මිනිස්සු ඉස්සෙල්ලාම අද කාලේ වුණත් අපිට දකින්නට තියෙන්නේ අභිධර්මය ප්‍රතික්ෂේප කරනව. ඒක තමයි හේතුව. අභිධර්මය ප්‍රතික්ෂේප කරන්නට හේතුව මිනිස්සුන්ගේ ප්‍රඥා මට්ටම කියන එක ටිකෙන් ටික පරිහානිය පැත්තක් අංශයක් ගැනීම තමයි ඒකට හේතුව බවට පත්වන්නේ. ඉතින් මෙන්න මේ විදියට අපිට ගන්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම ප්‍රාර්ථනා කිරීම්. කුසලයක් කරල දේවල් ප්‍රාර්ථනා කරනව. කුසලයක් කරල අපි විවිධ දේවල් ප්‍රාර්ථනා කරනව නේ. මෙහෙම සම්පත් ලැබේවා. උපදිනව නම් මෙබඳු ආකාරයේ දේවල් ලැබේවා. මෙබඳු ආකාරයෙහි කරන ප්‍රාර්ථනා තියෙනව. එතකොට ප්‍රාර්ථනා කිරීම කියන එක නරක දෙයක් කියල කියනව නෙමෙයි. හැබැයි අපි තේරුම් ගන්නට ඕනේ ප්‍රාර්ථනාව කියල කියන්නේ යම්කිසි දෙයක් ලබා ගැනීම පිළිබඳව සිතෙහි උපදනා වූ ලෝභයක් - ආසාවක් - තණ්හාවක් කියල, සැප සම්පත් සහ ලෞකික දේවල් බලාපොරොත්තු වෙන තැනකදි. එතකොට අන්න එබඳු වූ මට්ටමක යෙදෙන දේත් අර කුසලය උපනිඃශ්‍රය කරගෙන අකුසලයක ඉපදෙන අවස්ථාවක් හැටියටයි හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.

කෙනකුට නිවන් ප්‍රාර්ථනා කලොත් මොකද්ද ඇති වෙන්නේ? නිකමට හිතුවොත්? එහෙනම් නිවනත් ප්‍රාර්ථනා කරනව නේ මේ කුසල් මට නිවන් පිණිස හේතු වේවා කියල. එතකොට මොකද්ද වෙන්නේ? යම්කිසි කුසලයක් කෙනෙක් නිවන් පිණිස හේතු වේවා කියල ප්‍රාර්ථනා කරන කොට නිවන කියල කියන්නේ තෘෂ්ණා ක්ෂය බව. නිවන පිළිබඳව යම් ආකාරයකට හඳුනගෙන නේ ඒ ගැන කතා කරන්නේ. එතකොට නිවන කියල කියන්නෙත් තෘෂ්ණා ක්ෂය බව. තණ්හාවෙහි නිරෝධය. සත්ත්ව පුද්ගල ආදී ආත්මභාවයන් ආදී දේවල් පිළිබඳව පවතින වැරදි සහගත මනසිකාරයන්ගෙන් මිදීම කියන එක පිළිබඳව තමයි ඒ

බලාපොරොත්තුව, ඒ ප්‍රාර්ථනය තියෙන්නේ. ඒ වගේ අවස්ථාවල උපදින්නේ ලෝභය හෝ රාගය නෙමෙයි. නිවන අරමුණු කරගන්න වෙලාවෙදි උපදින්නේ ඒ කෘත්‍ය සම්පාදනය කරමින් ඡන්දය කියන එක තමයි උපදින්නේ. කැමැත්ත කියන  එක. ඒක අකුසලයක් නෙමෙයි. ඡන්දය යෙදෙන්නේ කුසල පාක්ෂික ධර්මයක් විදියට. ඒ නිසා නිවන ප්‍රාර්ථනා කලා කියන එක, ඒක ලෝභයක් නෙමෙයි. හැබැයි යම්කිසි කෙනෙක් සැප සම්පත් බලාපොරොත්තු වීම, සසරේදි මෙසේ වේවා කියල තමන් පිළිබඳව ඇතිකර ගන්න තැනකදි උපදින්නේ කුසල් නෙමෙයි. එතන තියෙන්නේ භව තණ්හාව. වස්තු තණ්හාව. එතකොට මේ කාමය කියන දේ තමයි එතනදි මුල් වෙලා තියෙන්නේ.

ඒ දේවල් මුල් කරගෙන නිසා ඒ අකුසල් සිත් උපදින්නේ ඒ වෙලාවට අර කුසලය ප්‍රත්‍යය වීම නිසයි කියල ඒ සිත නුවණ දැන් අපිට පවත්වන්නට පුළුවන්කම තියෙනව. ලෞකික පරමාර්ථ වෙන්න පුළුවන්. මේ විදියේ විභාග සමර්ථ වේවා. එහෙම නැත්නම් මෙහෙම ලෙඩ හොඳ වේවා. යම් එබඳු ආකාරයකට කුසලයන් කරනව නම් ඒ කිරීම ඇතුලේ තියෙන දේවල් තමයි ඒ විදියට සකස් වන බව අපිට දකින්නට තේරුම් ගන්නට තියෙන්නේ. ඉතින් මෙන්න මේ විදියට අපිට එය වඩාත්ම වටහා ගන්නට පුළුවන්කම තියෙනව. කුසලයක් මුල් කරගෙන අකුසලයක් උපදින්නට පුළුවන්කම තියෙනව කුසලය ප්‍රත්‍යය වීම ඇතුලෙ දි.

ඒ කුසලය ප්‍රත්‍යය වන්නේ මොන විදියටද? උපනිඃශ්‍රය ප්‍රත්‍යය භාවයෙනුයි ප්‍රත්‍යය වන්නේ. උපනිස්සය කියන තැනදි ඒ භා සමග සම්ප්‍රයුක්තව යෙදිල තියෙන්නට අවශ්‍ය නෑ ආරම්මණ ආදී වශයෙන් පමණක්. මෙතනදි එතන නොයෙදී වුණත් උපනිඃශ්‍රය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වන්නට පුළුවන්. ඒ නිසා තමයි එකෙහි ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය ශක්තිය අපි තේරුම් ගන්නට ඕනේ කියන එක මෙතනදි වඩාත්ම පැහැදිලි කෙරෙන්නේ.

ඊළඟ කාරණාව හැටියට අපිට වටහා ගන්නට පුළුවන්කම තියෙනව **කුසලො ධම්මො - අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. කුසලයක් අව්‍යාකෘත ධර්මයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කොහොමද? කුසලයක් අව්‍යාකෘත ධර්මයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීමේදී අපි මීට පෙර කතා කරල තියෙනව ආරම්මණ උපනිස්සය, අනන්තර උපනිස්සය සහ පකති උපනිස්සය කියල උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව කතා කරල තියෙනව. එතකොට මෙන්න අවස්ථාවන්ට අනුරූපීව යෙදෙන්නට පුළුවන්කම තියෙනව. අව්‍යාකෘත ධර්මයන් උපදවන්නට පුළුවන්කම තියෙනව.

## ***ආරම්මණූපනිස්සය (ආරම්මණ උපනිස්සය)***

**අරහාමග්ගා වුට්ඨහිත්‍වා මග්ගං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති.**

රහතන් වහන්සේ අරිහත් මාර්ගයෙන් නැගී සිටල, **මග්ගං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති,** ඒ මාර්ගය ගරු කරගෙන ප්‍රත්‍යවේක්ෂා කරනව. එතකොට රහතන් වහන්සේ නමක් යම්කිසි විදියකින් ආපහු මාර්ග සිත පිළිබඳව, මාර්ගයෙන් නැගී සිටල, මාර්ග සිත ආවර්ජනා කරන කොට, ඒ මාර්ග සිත ආවර්ජනා කරන මොහොතෙදි ඒ ආවර්ජන සිත් කුසල සිත් හැටියට හෝ අකුසල සිත් හැටියට ගැනෙන්නේ නෑනේ. ඒව අව්‍යාකෘත සිත් හැටියටයි ගන්නේ. එතකොට අර මාර්ග සිත කියන එක ඒක කුසලයක්. මාර්ග සිත කියන්නේ කුසලයක්. එතකොට ඒක මෙනෙහි කරන සිත ඒක කුසල් නෙමෙයි. එතකොට උන්වහන්සේට ඒ මෙනෙහි කරන සිත අව්‍යාකෘත සිතක්. අර මුලින් ඉපදුනු මාර්ග නැමති සිත අරමුණු කලා, ඒ අරමුණ ආරම්මණ උපනිස්සය ප්‍රත්‍යයෙන් තමයි ප්‍රත්‍යය වෙලා තියෙන්නේ.

එතකොට රහතන් වහන්සේ මාර්ගය අරමුණු කරන වෙලාවල් වලදී, ඒ මාර්ගය අරමුණු කරන අවස්ථාවෙදි අරමුණු කරන සිත අව්‍යාකෘත සිතක් වුණාට අර මාර්ග සිත කුසල සිතක්. ඒ කුසලය අරමුණු කරගෙන තමයි උන්වහන්සේගේ මෙනෙහි කිරීම තියෙන්නේ. එතකොට අන්න ඒ විදියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව ආරම්මණ උපනිස්සය කියන ධර්මයෙහි ස්වභාවය.

## *අනන්තරූපනිස්සය (අනන්තර උපනිස්සය)*

ඒ වගේම අනන්තර උපනිස්සය කියල කියන්නේ අපි හඳුනාගත්තා අනතුරුවම ඉපදීම කියන එක. කුසලයක් අකුසලයට අනතුරුව ඉපදීම කියන එක සිද්ධ වන්නට පුළුවන්කම තියෙනව.

**කුසලං - වුට්ඨානස්ස උපනිස්සයො පච්චයෙන පච්චයො.**

එතකොට **කුසලං වුට්ඨානස්ස**, කුසලය කියන එක වුට්ඨානයට අනන්තරූපනිස්ස වශයෙන් ප්‍රත්‍යය වන්නට පුළුවන්කම තියෙනව. ඒ කියන්නේ අර කුසල ජවන චිත්තෝත්පාද උපදින කොට, ඒ කුසල ජවන් සිත් ඉපදීමෙන් පස්සේ අන්තිම ජවන් සිත කුසල සිතක් නේ. ඒ කියන්නේ අපි ඉගෙන ගෙන තියෙනව නේ එක චිත්ත වීථියකදි කුසල සිත් උපදින කොට කුසල සිත් කියල අපි කතා කරන්නේ ජවන් සිතකට නේ කුසලය කියල කතා කරන්නේ. එතකොට එකම කුසලය හත් වතාවක් ඉපදෙමින් නිරුද්ධ වෙනව. මේ වලට කියනව කුසල ජවනයන් කියල.

මෙන්න මේ කුසල ජවන සිත්වල අවසාන හත්වන ජවන සිත හට ගෙන නිරුද්ධ වුණාට පස්සේ ඒ වීථියේ උපදිනව තදාරම්මණ සිත්. එතකොට තදාරම්මණ සිත් උපදින කොට

එහෙම නැතිනම් භවාංග පතනය වුණොත් භවාංග සිත් හරි තදාරම්මණ හෝ වශයෙන් උපදින වෙලාවෙදි තදාරම්මණ සිත් හරි උපදිනව. එතකොට අන්න ඒ ධර්මයෝ අව්‍යාකෘත සිත්. භවාංග සිත් හෝ තදාරම්මණ සිත් අව්‍යාකෘත සිත් හැටියටයි ගන්නේ. කුසල සිත් හෝ අකුසල වශයෙන් කියන්නේ නෑ. ඒ ධර්ම අව්‍යාකෘත සිත්.

එතකොට අන්න ඒ අව්‍යාකෘත සිත් බවට පත්වෙන කොට ඒ දේවල් වලට අනතුරුව, ඒ කියන්නේ දැන් අර මුලින් ඉපදුන සිතට අරමුණක් වෙලා නැහැ අව්‍යාකෘත සිත කියන එක, ඒකට අරමුණක් බවට පත් නොවුණට ඒකට අනතුරුවම තමයි සිත ඉපදිල තියෙන්නේ. දැන් හිතන්න ජවන් සිත් හතක් ගිහිල්ල, ඊට අනතුරුවම ඉපදෙනව තදාරම්මණ සිත කියල. එතකොට ඒ තදාරම්මණ සිත කියන එක විපාක අවස්ථාවක්. එතකොට එබඳු සිතක් උපදින කොට ඒක අව්‍යාකෘත සිතක්නේ. අර සිතට අනතුරුව තමයි ඒක ඉපදුනේ.

එහෙම නැත්නම් හිතන්න ඒක තදාරම්මණ උපදවන්නේ නැති වීථියක් කියල. ඒ දැන් හිත භවාංග ගත වෙනව. භවාංග සිත මොකද්ද? ඒකත් අව්‍යාකෘත සිතක්. එතකොට අර කුසලයට අනතුරුවම තමයි අකුසලය ඉපදිල තියෙන්නේ. ඒ වෙලාවට උපනිඃශ්‍රය වෙලා තියෙනව ඒ හිත අර අව්‍යාකෘත සිත උපදවන්නට. ඒ අවස්ථා දෙකේදිම අර කුසලය උපනිඃශ්‍රය වෙනව අව්‍යාකෘත ධර්මය උපදවන්නට.

හැබැයි ඒ උපනිඃශ්‍රය මොකද්ද? ආරම්මණ උපනිස්සය කියන එක නෙමෙයි. ඒ උපනිස්සය අනන්තරූපනිස්සය කියන එක. අනන්තර ප්‍රත්‍යය කියල අපි කතා කරන්නේ අතුරක් නැතුව ඊළඟ ධර්මය උපදවන්නට ප්‍රත්‍යය වෙන අනන්තර ප්‍රත්‍යය සහ උපනිස්සය ප්‍රත්‍යය කියන මේ දෙකේහිම භාවිතයක් හැටියට තමයි එතන ඉපදිල තියෙන්නේ. ඒකට කියන්නේ

**අනන්තරූපනිස්සය** කියල. එතකොට ඒ අනන්තරූපනිස්සයෙහි යෙදීම තමයි ඒ අවස්ථාවලදි සිද්ධ වෙන්නේ. ඒ **කුසලං වුට්ඨානස්ස** කියල කිව්වා, කුසලය වුට්ඨානයට ප්‍රත්‍යය වෙනව.

ඒ වගේම **මග්ගො - ඵලස්ස උපනිස්සයො පච්චයෙන පච්චයො.** මාර්ග සිත ඉපදීමට අනතුරුවම, ඵලයට පත්වෙන වෙලාවකදි, මාර්ගයට අනතුරුව ඵලයෙහි පහළ වීම සිද්ධ වෙනව. ඒ වෙලාවට ඵලය කියන්නේ මොකද්ද? විපාක අවස්ථාවක්. කුසල අකුසල වශයෙන් නොකියන ලද අව්‍යාකෘත ධර්මයක් ඵලය කියල කියන්නේ. එතකොට අර කුසලයට අනතුරුවම ඵල සිත උපදින කොට ඒ කුසලය අර අව්‍යාකෘතයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඒක අනන්තර ප්‍රත්‍යයෙනුත් ප්‍රත්‍යය වෙනව. උපනිස්සය ප්‍රත්‍යයෙනුත් ප්‍රත්‍යය වෙනව. ඒකට කියන්නේ අනන්තරූපනිස්සය කියල. අනන්තරූපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වීම සිදු කරනු ලබනව.

ඒ වගේම **අනුලොමං - සෙක්ඛාය ඵලසමාපත්තියා උපනිස්සයො පච්චයෙන පච්චයො.**

අනුලෝම සිත සේඛ ආයයීන් වහන්සේලාට ඵල සමාපත්තියට (ඵලසමවතට) සඳහා ප්‍රත්‍යය වෙනවා. ඒ කියන්නේ අර ඵලයට අනුලොම්ව උපදින ඒ සිත් සේඛ ආයයීන් වහන්සේලාට නැවත ඒ ඵල සමාපත්තීන්ට සමවැදීමේදී උපදින ඒ අව්‍යාකෘත සිත් වලට ඒ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරනු ලබනව.

එතකොට මෙන්න මේ ආකාරයට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව උපනිස්සය ප්‍රත්‍යය ප්‍රත්‍යය වෙනවා අව්‍යාකෘත ධර්ම උපදවන්නටත්, ඒ කුසලයක් මුල් කරගෙන අව්‍යාකෘත ධර්මෙ උපදවන ආකාරයට කියන එක පිළිබඳව. අපිට මෙතනදි හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඉතින් මෙන්න මේ ආකාරයට අනන්තරූපනිස්සය, මේ කිව්වේ අනතුරුවම

උපදින ආකාරයන් පිළිබඳව ඒ ආකාරයටත් කතා කරන්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම පකතූපනිස්සය ආදී ලෙස අපිට හඳුනාගන්නට පුළුවන් පකතූපනිස්සය යෙදෙන අවස්ථාවලත් ඒක යෙදෙන ආකාරය පිළිබඳව.

ඊට පස්සේ හම්බවෙනව **නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලං - ඵලසමාපත්තියා උපනිස්සයො පච්චයෙන පච්චයො.** නිරෝධයෙන් නැගී සිටින අනාගාමී සෙඛයන් වහන්සේ නමකට, ඒ කියන්නේ දැන් නිරොධසමාපත්තියට සමවැදිල එයින් නැගී සිටින අනාගාමී ආයසීන් වහන්සේ නමකට ඊට පස්සේ ඒ උපදින සිත දිහා බැලුවහම ඒ නිරෝධයට පෙරාතුව ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලය ඉපදෙනව. ඊට පස්සේ ඒ ඵල සිතෙහි පහළ වීම සිද්ධ වෙනව. එතකොට ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලය අර පසුව උපදින ඵල සමාපත්තියට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව.

එතකොට ඒ මුලින් ඉපදුන කුසලය එතනදි සිද්ධ වුනේ පසුව ඉපදුනු ඵලය කියන ඵල සමාපත්තිය කියන තැන තිබුණු ඒ අව්‍යාකෘත සිතකට ප්‍රත්‍යය වීමම තමයි අවස්ථාවලදිත් සිද්ධ වුණේ.

ඉතින් මෙන්න මේ විදියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව මේ සිතෙහි යෙදීම පිළිබඳව කතා කරන කොට උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව.

එතකොට අපි මෙතනදි කතා කලා වුට්ඨානය පිළිබඳව. ඒ වගේම මාර්ගය ඵලයට සහ අනුලොමය සේඛ ආයසීන් වහන්සේලාට ඵලසමාපත්තිය පිණිස හේතු වන විදියත්, ඒ

වගේම නිරෝධයෙන් නැගී සිටින පුද්ගලයින් පිළිබඳවත් අපි කතා කරන්නට යෙදුනා.

**එතකොට මේ වුට්ඨාන කියල කිව්වේ අමතක කරන්න එපා අර කුසල් සිත් වලට අනතුරුව ජවනයන්ට අනතුරුව පස්සේ උපදින ඒ තදාරම්මණ හෝ භවංග සිත් වලට තමයි ඒක කිව්වේ.** ඒ වගේම මාර්ගයට අනතුරුව ඵල උපදින අවස්ථාවන් වලදී එතනදී අනන්තරූපනිස්සය තමයි ඒ තැන් වලදී පහළ වීම සිද්ධ වුනේ.

එතකොට අර මුලින් කතා කලා වගේම නිරොධ සමාපත්තියට සමවදින අවස්ථාවලදී සහ සේඛ ආයයීන් වහන්සේලා ඵල සමාපත්තියට සමවදින වෙලාවෙදිත් එබඳු ආකාරයටම කුසලය මුල් කරගෙන අව්‍යාකෘතයන් උපදවන බව අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඉතින් මෙන්න මේ කරුණු පිළිබඳව ඔබේ අවධානය වඩාත්ම යොමු කිරීම වැදගත් වෙනව මේ උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව තේරුම් ගැනීමේදී. ඒ නිසා උපනිස්සය ප්‍රත්‍යය කියන එක තේරුම් ගත්තහම මේ ප්‍රත්‍යය ධර්මයන්ගේ ප්‍රත්‍යය කියන්නේ මොකද්ද, ප්‍රත්‍යය ශක්තිය කියන්නේ මොකද්ද කියන එක පිළිබඳව ඔබට වඩාත් වැඩි දුර කරුණු තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව.

**පට්ඨාන දේශනා සාරය (පූජ්‍ය වනවාසී යාගොඩ ධර්මප්‍රභ ස්වාමීන් වහන්සේ)** පොත තමයි අපි මේ දේශනා මාලාවේදී ගොඩාක් උපකාර කර ගන්නේ. අත්පොත හැටියට තබා ගෙන මේ කරුණු පැහැදිලි කරන්නේ. ඉතින් මේ පොත පරිශීලනය කිරීම තුළ ඔබට තවත් ඒ කරුණු කාරණා වඩාත්ම පැහැදිලි කරගන්නට පුළුවන්කම තියෙනව. ඊට අමතරව යෙදෙන තව කරුණු කාරණා පැහැදිලි කිරීම් විදියට.

ඉතින් කුසලයක බලවත් වීම මුල් කරගෙන මේ විදියට උපනිස්සය ප්‍රත්‍යය භාවිතය ගැන කතා කරන්නට පුළුවන්කම තියෙනව. අපි පකතූපනිස්සය කියන එකට අද ගියේ නැහැ. පකතූපනිස්සය කියන එක මුල් කරගෙන අපිට ඉදිරියේදී සාකච්ඡා කරන්නට පුළුවන්කම තියෙනව. අද දවසෙදි අපි කතා කලේ ඒ කුසලයක් මුල් කරගෙන කොහොමද අකුසල් උපදින්නේ. කුසලයක් මුල් කරගෙන කොහොමද අව්‍යාකෘත ධර්මයක් උපදින්නේ කියන එක පිළිබඳව.

ඒ පිළිබඳව කතා කිරීමේදී අපි කතා කලා අව්‍යාකෘත ධර්මයක් උපදින ආකාරය පිළිබඳව කතා කලහම ආරම්මණූපනිස්සය ලෙස අව්‍යාකෘත උපදින්නේ කොහොමද, ඒ වගේම කුසලයක් අනන්තරූපනිස්සය ලෙස ප්‍රත්‍යය වීම ඇතුලේ අව්‍යාකෘත ධර්ම උපදින්නේ කොහොමද කියන එක පිළිබඳව අපි එහිදී වැඩි දුරටත් කරුණු පැහැදිලි කරගන්නට යෙදුනා.

ඉතින් ඔය කරුණු ටික තමයි අද දවසෙදි පැහැදිලි කරගත්තේ. අපි ඉදිරියේදි තව දුරටත් සාකච්ඡා කරමු. කුසලයක උපකාරී බව ලැබ ගෙන කොහොමද ඒ අව්‍යාකෘත ධර්මයන් උපදින්නේ, පකතූපනිස්සය මුල් කරගෙන කියල මොකද පකතූපනිස්සය අපි දීර්ඝ ලෙස සාකච්ඡා කරල තියෙනව මීට ප්‍රථමයෙන්. එතකොට ඒ අනුව අපිට කතා කරන්නට පුළුවන්කම තියෙනව ඒ ධර්මයන් මුල් කරගෙන පකතූපනිස්සයෙහි භාවිතය සිදු වෙන අවස්ථාවන් පිළිබඳව.

**සාදු සාදු සාදු**

# 30.03.2024 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසි හයවෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සූදානම් වන මොහොත.

ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ඒ උතුම් ශ්‍රද්ධර්ම සාගරයෙන් ස්වල්පයක් නමුත් ශ්‍රවණය කරගන්නටයි ඔබ හැම දෙනාම මේ මොහොතෙදි සූදානම්ව සිටින්නේ.

පින්වතුනි, භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන්නට යෙදුන උතුම් ධර්මයෙහි අමාකිර බඳු වූ අභිධර්මයෙහි දැක්වෙන පට්ඨානප්‍රකරණයෙහි සංග්‍රහව පවත්නා සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව යම් හඳුනා ගැනීමකුයි  මේ දේශනා මාලාව තුළ අපි විසින් සිදු කරගන්නේ.

ඉතින් ඒ තුළින් පට්ඨානයෙහි භාග්‍යවතුන් වහන්සේ විවිධ පැතිකඩවල් වලින් විස්තාරිතව දේශනා කල හේතුඵල ධර්ම න්‍යාය අන්තර්ගත වන බව අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. යම්කිසි ඵලයක් හට ගැනීමේදී ඒ සඳහා උපකාර කරනු ලබන ධර්මයන් පිළිබඳව ඉතාමත් ගැඹුරු, ඉතාමත් විශේෂ විග්‍රහයක් අපිට මේ සූවිසි ප්‍රත්‍යය විභාගය හඳුනා ගැනීම තුළ දකින්නට පුළුවන්කම තියෙනව.

**අපි ප්‍රත්‍යය වීම කියන මේ දේ දිහා බැලුවහම නැතිනම් ප්‍රත්‍යය ශක්තිය දිහා බැලුවහම ඒක ඉතාමත් විශේෂව හඳුනා ගත යුතු දෙයක්. ඇතැම් දේවල් ප්‍රත්‍යය භාවයට පත්වන්නේ එය සමීපව සිට උපකාර කිරීමෙන්. ඇතැම් දේවල් සමීප නොවී උපකාර කිරීම තුළ ප්‍රත්‍යය භාවයට පත්වෙනව. ඇතැම් ධර්මයන්ගේ ප්‍රත්‍යය භාවය අපිට හඳුනාගන්නට තියෙන්නේ එය එතෙන් හී නැති බවින් ප්‍රත්‍යය වීම.** මේ ආදී ලෙස ප්‍රත්‍යය වීම පිළිබඳව කතා කරන කොට ඒක ඉතාමත් සියුම් සහ විවිධ පැතිකඩවල් ඔස්සේ සාකච්ඡා කරන්නට පුළුවන්කම තියෙනව.

මේ ප්‍රත්‍යය විභාගයන් පිළිබඳව හඳුනා ගැනීමක් නැති බව හේතුවෙන් බොහෝ දහම් කරුණු පිළිබඳව වුවත් වරදවා වටහා ගන්නට පුළුවන්කම  තියෙනව. ඒ නිසා මේ ධර්මය පිළිබඳව අපි සොයා යෑමේ දී ඒ පිළිබඳව තේරුම් ගැනීමේ දී මේ සූවිසි ප්‍රත්‍යය විභාගය පිළිබඳව තේරුම් ගැනීම අවබෝධ කර ගැනීම ඉතාමත් වැදගත් වෙනව.

අවසාන වශයෙන් අප සාකච්ඡා කරමින් පසු වුණේ උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව. උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව දීර්ඝ ලෙස අපි විවිධ පැතිකඩවල් ඔස්සේ හඳුනාගන්නට යෙදුනා. එහිදී අපි ආරම්මණූපනිස්සය - අනන්තරූපනිස්සය - පකතූපනිස්සය කියන මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන විභාගයන් පිළිබඳව හඳුනාගෙන ඉන් පසු කුසල අකුසල අව්‍යාකෘත ධර්මයන් පිළිබඳව පැහැදිලි කරගන්නා ආකාරයෙන් අපි මේ පිළිබඳව වඩාත් කරුණු කාරණා පැහැදිලි කරගන්නට යෙදුනා.

ඒ අනුව අද දවසේදී අප හඳුනාගන්නට යෙදෙන්නෙත් අපි පෙර කතා කලා වගේම කුසලයක් මුල් කරගෙන අව්‍යාකෘත ධර්මයන් උපදින ආකාරය පිළිබඳවමයි. මෙහිදී තියෙන විශේෂත්වය තමයි කුසලයක් මුල්කර ගෙන මේ අව්‍යාකෘත ධර්මයන්ගේ ඉපදීම

පිළිබඳව කතා කරන කොට අපිට ඒ පිළිබඳව කතා කරන්නට පුළුවන්කම තියෙනව අර ආරම්මණූපනිස්සය වශයෙන් ඒ වගේම අනන්තරූපනිස්සය වශයෙන් සහ පකතූපනිස්සය වශයෙන්. ඉතින් මේ එකක් එකක් මාතෘකාවකට අදාළව මේ තුන් ආකාරයටම කතා කරන්නට පුළුවන්කම තියෙනව.

ඉතින් මීට පෙරාතුව අපි කතා කරපු කාරණාවන්හී දී පැහැදිලි කරන්නට යෙදුනේ ආරම්මණූපනිස්සය භාවය ලැබගෙන අව්‍යාකෘතයන්ගේ පහළ වීමත්, ඒ වගේම ඒ අනන්තරූපනිස්සය භාවය ලැබ ගෙන කුසලයක් මුල් කරගෙන අව්‍යාකෘතයන්ගේ පහළ වීමක් කියන කාරණාවන් පිළිබඳව. අද දවසේ දී වඩාත්ම පැහැදිලි කරගන්නට අපි උත්සාහවත් වන්නේ කුසලයක් මුල් කරගෙන අව්‍යාකෘතයක් ඉපදීම කියන දේමයි. හැබැයි මෙතනදි උපනිස්සය ප්‍රත්‍යය පකතූපනිස්සය විදියටයි භාවිත වන බව අපිට දකින්නට පුළුවන්කම තියෙන්නේ.

***<u>පකතූපනිස්සය</u>***

**සද්ධං උපනිස්සාය - අත්තානං ආතාපෙති පරිතාපෙති පරියෙට්ඨි මූලකං දුක්ඛං පච්චනුභොති.**

**සීලං, සුතං, චාගං, පඤ්ඤං උපනිස්සාය - අත්තානං ආතාපෙති පරිතාපෙති, පරියෙට්ඨි මූලකං දුක්ඛං පච්චනුභොති.**

**සද්ධා සීලං සුතංචාගො පඤ්ඤා - කායිකස්ස සුඛස්ස කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**
**කුසලං කම්මං - විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

**අරහා මග්ගං උපනිස්සාය - අනුපන්නං කිරිය**
**සමාපත්තිං උප්පාදෙති, උප්පන්නං සමාපජ්ජති,**
**සංඛාරෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති.**

**මග්ගො අරහතො - අත්‍ථපටිසම්භිදාය ධම්ම පටිසම්භිදාය, නිරුත්ති පටිසම්භිදාය, පටිභාණ පටිසම්භිදාය, ඨානාඨානා කොසලස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

**මග්ගො ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

**සද්ධං උපනිස්සාය - අත්තානං ආතාපෙති පරිතාපෙති පරියෙට්ඨී මූලකං දුක්ඛං පච්චනුභොති.** එතකොට මෙතනදි දක්වනව **සද්ධං උපනිස්සාය - අත්තානං ආතාපෙති පරිතාපෙති,** ශ්‍රද්ධාව මුල් කරගෙන තමා තවනව. පරිතාපනයට ලක්කර ගන්නව. එතකොට පර්යේෂණය (පරියෙට්ඨී) ඇතිකර ගන්නව. මෙන්න මේ විදියට තමන්ට දුක ලබාදීම කරන්නේ, තමා පර්යේෂණය සඳහා යොදවන්නේ කොහොමද? ***ශ්‍රද්ධාව මුල්කර ගත්තහම කෙනෙක් ඒ ශ්‍රද්ධාවන්තයා තමාගේ ශ්‍රද්ධාවේ තියෙන බලවත් භාවය වැඩිවෙන කොට තමන්ට උපදින අනිකුත් ධර්ම පිළිබඳව සැලකිල්ලක් දක්වන්නේ නෑ. තමන්ට ඇතිවෙන අනිකුත් හානිදායක දේවල් පිළිබඳව තමන්ට ඇතිවන අපහසුතාවයන් පිළිබඳව තැකීමක් කරන්නේ නැහැ.***

අපි දකිනව නේ සමහර වෙලාවට කුසලයක් කරන්නට යන කොට මහා වැස්සේ, මහා ශිතලක වුණත්, මහා ගිනියම් අවුවක වුණත්, ඇතැම් වෙලාවකට විවිධ ස්වරූපයන්ගෙන් කුසලය සඳහා තමන්ගේ සිත නමල, ඒ පීඩාව මැඩ පවත්වා ගෙන, ඊට වඩා තමන්ගේ සිත බලවත් කරගෙන කුසල් කරනු ලබන අවස්ථා අපිට දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඉතින් ඒක ඉතාම වටිනා දෙයක්. හැබැයි ඒ වටිනා ක්‍රියාකාරකම ඇතුළත ක්‍රියාත්මක වන්නේ මොන විදියේ ධර්ම විශේෂයක් ද කියන එක පිළිබඳව සලකා බලන කල අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව කුසල ධර්ම සමූහයක පැවැත්මක්. නැතිනම් චිත්ත චෛතසික ධර්ම සමූහයක පැවැත්මක් තමයි ඒ අවස්ථාව තුළදි උපදින්නේ කියන එක පිළිබඳව.

බොහෝ අවස්ථාවල අපිට ඒ ශ්‍රද්ධාව මුල් කරගෙන බොහෝ පින්වතුන් විසින් ඒ තමන්ට ඇතිවෙන ශීත උෂ්ණ ආදිය ඉවසන අවස්ථා අපිට ගොඩාක් දකින්නට පුළුවන්කම තියෙනව. ඒ හැම අවස්ථාවකදිම ඒ ක්‍රියාත්මක වන අර මුලින් කිව්වා වගේ අපි පුද්ගලයෙක් විදියට ඒක දැක්කට එතන පවතින්නේ මේ චිත්ත චෛතසික රූප කියන මේ ධර්ම සමූහයක පැවැත්මක් නේ. අන්න ඒ පැවැත්ම සිදුවන තැනක පුද්ගලයෙක් එහෙම කරනව කියන එක අපිට පෙනුණට, අපිට දකින්නට තියෙන දේ තමයි එතන ඒ කුසලයක් මුල් කරගෙන ඒ තව කුසල ධර්මයන්ගේ පහළ වීම, කුසලයක් මුල් කරගෙන එතනදි තව අව්‍යාකෘත ධර්මයන් ආදීහී පහළ වීම තමයි අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.

එතකොට ශ්‍රද්ධාව මුල් කරගෙන යම්කිසි කුසලයක නියුක්ත වන කෙනෙක් තමන්ට උපදින **අත්තානං ආතාපෙති පරිතාපෙති** කියල කියන්නේ තමාව තවනව. තමන්ට දුක පැමිණුනත් ඒක විඳ දරාගෙන ඉදිරියට ඒ දේ සිදු කරනව.

දැන් හිතන්නකෝ අව්ව තියෙන වෙලාවකදි මහාසෑය වන්දනා කරන්නට යන කෙනෙක් සමහර විටක අපායේ දුක මොන තරම් ඇද්ද? බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් මම මේ පියවර තැබීම මොන තරම් වටිනවා ද කියල මහා අපරමිත සැදැහැ සිතක් උපදවා ගෙන අර මහාසෑය වන්දනා කරමින් ප්‍රදක්ෂිණා කරනව. සමහර වෙලාවට අව් රශ්මිය වැඩිවෙන කොට ඔහුගේ පාද පිච්චෙන්න පුළුවන්කම තියෙනව. ඒ වගේ දේවල් වෙමින් ඔහු අර මහාසෑය ප්‍රදක්ෂිණා කිරීම සිද්ධ කරනව. සමහර අවස්ථාවක වැස්ස වෙලාවක තෙමෙමින් ශීතලේ ප්‍රදක්ෂිණා කරන්නට පුළුවන්කම තියෙනව.

මේ වගේ අවස්ථාවල ඒ කයට දැනෙන්නේ සැපයක් නෙමෙයි නේ. ඒ වගේ වෙලාවල් වලදි ඒ කයට දැනෙන්නේ දුක් සහගත

වේදනාවක්. එතකොට ඒ කයට (දැනෙන කොට) දුක් සහගත වේදනාවක් උපදින කොට ඒ දුක් සහගත වූ කාය විඤ්ඤාණයක් උපදින්නට ***(දැන් ඒ කාය විඤ්ඤාණය විපාක වශයෙන් උපදින කාය විඤ්ඤාණයක්)*** ඒ දුක් සහගත වූ කාය විඤ්ඤාණයක් උපදින්නට ඒ දුක ලැබෙන්නට උපකාර වෙලා තියෙන්නේ මොකද්ද? ඒ විපාකය ගෙනල්ල දෙන්නට උපකාර වෙලා තියෙන්නේ මොකද්ද? ඒ **පරිතාපෙති** කියන ඒ තැවීම ලබා දෙන්නට උපකාර වෙලා තියෙන්නේ මොකද්ද? කුසලය තමයි මුල් වෙලා තියෙන්නේ. ***වරදවා ගන්න එපා. කුසලය නිසා තැවීම උපදිනව කියනව නෙමෙයි.***

අපි මේ කතා කරන්නේ පකතූපනිස්සය කියන එක. පකතූපනිස්සය කියන එකේදී ඒ දේ මුල් කරගෙන ඊට පස්සේ අර නැවත අනන්තරව  උපදින්නේ නෑනේ, දැන් කුසල සිතකට අනතුරුව විපාක සිත ඉපදෙනව එහෙම නෙමෙයි නේ ඒ අවස්ථාවෙදි වෙන්නේ.  අර ශ්‍රද්ධාව කියන දේ මුල් කර ගත්ත තැනක තමයි අර තාපනය ඇති වෙන්නේ. තැවීම කියන දේ ඇති වෙන්නේ ශ්‍රද්ධාව කියන දේ මුල් කර ගත්තහම.

දැන් එහෙම ශ්‍රද්ධාවක් නැත්නම් එයාට ඒ තාපනය ඇතිවෙනව ද? එහෙම ශ්‍රද්ධාවක් නැති කෙනකුට නම් හිතන්න පුළුවන්, නෑ මම මොකටද මේ අවුවේ ඔතනට යන්නේ. මට ගියා කියල කිසිම ඵලයක් ඇත්තේ නෑ.  තමන්ට ලැබෙන ලෞකික ලාභ ප්‍රයෝජනයක් පිළිබඳව පමණක් දකින්නට, ප්‍රඥාවෙහි කොටසක්වත් නැති කෙනෙක්, සමහර වෙලාවට කම්මස්සකත සම්මාදිට්ඨිය කියන මූලික ප්‍රඥාවෙහි ස්වභාවයවත් හඳුනාගන්නට බැරි පුද්ගලයෙකුට සමහර විට හිතෙන්නට පුළුවන්, මේ වෙලාවෙ මම මොකටද මේ වගේ තැන්වල මේ අවුවේ ඇවිදින්න යන්නේ. මේ විදියට මම ගියහම ඇති ඵලය මොකද්ද? මේ වෙලාවෙදිත් ඉන්ද්‍රිය පිනවන්න දෙයක් සිද්ධ කරනව නම් හොඳයි නේද කියල, ඔහු ඉන්ද්‍රිය පිනවන පැත්තට

අවධානය යොමු කරන්නට පුළුවන්. ඔහු ඉන්ද්‍රිය පිනවීම කියන දේ පිළිබඳව අවධානය යොමු කරල, ඒ පැත්තට යන්න හේතුවක් වුණේ මොකද්ද? අර අර අශ්‍රද්ධාවන්තකම. අර වෙලාවෙදි ශ්‍රද්ධාව නොපිහිටීම කියන එක.

එහෙනම් දැන් අර කායික දුකෙන් පෙළෙමින්, ඒක වෙනම විඳිමින්, ඒ පුද්ගලයා අර මහාසෑය ප්‍රදක්ෂිණා කරනව කියන දේට යන්න හේතු වුණේ මොකද්ද? ඒ හේතුව බවට පත්වුණේ ශ්‍රද්ධාව කියන එක. ශ්‍රද්ධාව තමයි එතනදි මූලික දේ බවට පත්වුණේ.

දැන් අන්න එහෙනම් මේ ආකාරයෙහි ක්‍රියාකාරකම් පිළිබඳව කතා කිරීමේදී අපි චිත්ත චෛතසික ධර්ම විදියටනේ කතා කරන්නේ මේ ප්‍රත්‍යය විභාගය පිළිබඳව කතා කරන කොට. පුද්ගලයෙක් යනව නෙමෙයි. ***එතකොට මේ විදිහේ විපාක සන්තතියක් උපදවන්නට <u>හේතු වුණේ නෑ.</u> උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණා. <u>හේතුවක් විදියට යෙදුනා එහෙම නෙමෙයි.</u> <u>ඒ හේතුවට ඵලයක් හැටියට මේ දුක් විපාකය ලැබුණ නෙමෙයි.</u> උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණා ශ්‍රද්ධාව කියන එක. ශ්‍රද්ධාව උපනිඃශ්‍රය කරගෙන තමයි අර තැවීම සිද්ධ වුණේ.***

ඒ නිසා තමයි **සද්ධං උපනිස්සාය - අත්තානං ආතාපෙති පරිතාපෙති** කියල මේ දක්වන්නේ, ශ්‍රද්ධාව ඇසුරු කරගෙන, ශ්‍රද්ධාව නිසා තැවීමකට ලක් කෙරෙනව කෙනෙක්. තමන් දුක් විඳිනව. දුක් වේදනාව ලබා දෙනව. එතකොට මේ තාපන අර්ථයෙන් කතා කරන්නේ තැවීම - දුක - වෙහෙස - විඩාව. ඒ දේ සිද්ධ කරන්නේ ශ්‍රද්ධාව මුල් කරගෙන.

එතකොට ශ්‍රද්ධාව මුල් කරගෙන ඒ අව්‍යාකෘත ධර්මයක පහළ වීමක්. ඒ විපාක සන්තතිය කියල කියන්නේ අව්‍යාකෘත ධර්මයක්. එතකොට ඒ අව්‍යාකෘත ධර්ම සන්තතියක පහළ වීමට ප්‍රස්තාව සලසා තියෙන්නේ, අවස්ථාව උදා කරල තියෙන්නේ, භූමිය

සකස් කරල තියෙන්නේ කුසලය. ශ්‍රද්ධාව නැමති උපනිස්සය ප්‍රත්‍යය ප්‍රත්‍යය වීම ඇතුලේ. එතකොට මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි එක භාවිතයක් තමයි අපිට මේ හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. එතකොට **සද්ධං උපනිස්සාය,** ශ්‍රද්ධාව ඇසුරු කරගෙන අර විදියේ දුක එන අවස්ථාවලදි එහෙම දේවල් සිද්ධ වෙනව.

ඒ වගේම **සීලං උපනිස්සාය,** සීලය උපනිඃශ්‍රය කරගෙන **අත්තානං ආතාපෙති,** එතකොට තමාව තවනව. සමහර කෙනකුට සීලය මුල් කරගෙන ඇතිවෙන වේදනාවන් තියෙනව. දැන් හිතන්නකෝ **විකාලභොජන ශික්ෂාපදය සමාදන් වෙලා ඉන්න කොට ඔබට අධිකතර කුස ගින්නක් දැනෙනව කියල.** දැන් ඒ කුස ගින්න දැනෙන කොට ඔබට ඒ වේදනාවන් උපදින්නේ ඇයි? ඔබට පුළුවන්නේ ආහාර ටිකක් මුල් කරගන්න. ආහාර ටිකක් ගන්න පුළුවන් නේ එතකොට. ඇයි කෑම කන්නේ නැතුව ඔබ ඉන්නේ? ශික්ෂාපද භේදයට පැමිණීම නිසා. එහිදී මුල් වෙන්නේ මොකද්ද? **සීලය කියන එක.** එතකොට ඒ සීලය කියන ධර්මය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව අර අව්‍යාකෘත ධර්මයන්ට. දුක් වේදනාව විඳිනව කියන තැන කායික දුක උපදින තැන දි උපදින්නේ අව්‍යාකෘත සිතක්. කුසල් සිතකුත් නෙමෙයි. අකුසල් සිතකුත් නෙමෙයි. අව්‍යාකෘත සිතක් උපදින්නේ. ඒ උපදින අව්‍යාකෘත සිතට ප්‍රත්‍යය වුණේ මොකද්ද? අර සීලය කියන දේ තමයි ප්‍රත්‍යය වුණේ. සීලය කියන දේ නැත්නම් ඒ පදනම නැත්නම් ඔබට එහෙම දුක් වේදනාවක් එන්නේ නෑ.

ඒ වගේ සීලය මුල් කරගෙන යම් එබඳු ආකාරයකට තමාගේ තැවීමක් තියෙනව නම් සීලය මුල් කරගෙන තමන්ගේ දුක් පමුණුවා ගැනීමක්, නැතිනම් දුක් පැමිණීම ඉවසීමක් තියෙනව නම් ඒ දුක් පැමිණීම සිදුවන මොහොතෙදි දුකේ පැමිණීම කියන අවස්ථාව මේ උපනිස්සය ප්‍රත්‍යය යෙදෙන අවස්ථාවක් ලෙස

අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ***එතකොට සීලය කියල කියන දේ හේතු කරගෙන දුක ඉපදුන එහෙම නෙමෙයි. සීලය කියන දේ කුසලයක් නේ. ඒක හේතු කරගෙන දුක් උපදින්නේ නෑ.***

එහෙනම් මේ මොකද්ද කතා කලේ? ඒ සීලය පිළිබඳව නැවත නැවත සිත් පහළ කරන කොට ඒ සීලය පිළිබඳව උපදවන සිත නිසා ඒ සිත බලවත් වෙන කොට අර එබඳු අවස්ථාවල ඇතිවන විපාක මට්ටමේ ඇතිවන දුක් වේදනා වුණත් ඉවසන්න පුළුවන්කම තියෙනව. ඒක සංසිඳවන්නට යන්නේ නැතුව. එතකොට ඒ අව්‍යාකෘත ධර්මයන්ට උපකාර කරල තියෙන්නේ මොනවද? මේ තියෙන සීලය කියන කුසලය තමයි ඒ අවස්ථාවෙදි උපනිස්සය ප්‍රත්‍යයෙන් උපකාර කරල තියෙන්නේ. ඒක උපනිස්සය ප්‍රත්‍යයතාවය.

දැන් මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන මේ සියුම් ස්වභාවයන්, මේ සියුම් ලක්ෂණයන් ඔබ හඳුනාගන්නට ටිකක් මෙතනදි කල්පනාකාරී වෙන්න. සියුම් සියුම් ස්වභාවයන්, මේ වෙනස්කම් මොනවද, මේ එකිනෙකට අපි උපනිස්සය ප්‍රත්‍යය බොහෝ කොට කතා කරගෙන එනව. මේව අවස්ථා විදියට පමණක් ගණන් ගන්න එපා. මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම පිළිබඳව බලන්න, මේ මොන වගේ සියුම් යෙදීමක් තුළද මේ කතා කරන්නේ මේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල. ඒ ප්‍රත්‍යයෙහි තියෙන ගැඹුරු බව, ඒ ප්‍රත්‍යයෙහි තියෙන අර්ථය පිළිබඳව ඔබේ අවධානය වඩාත්ම යොමු කිරීම තමයි මෙතනදි ඉතාම වැදගත් වෙන්නේ. එතකොට මෙන්න මේ විදියට අපිට උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම පිළිබඳව සලකා බලන කොට අපිට හඳුනාගන්නට පුළුවන් ඒක අර කියන විපාකයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව.

ඒ වගේම සුතය. අපි ධර්ම ශ්‍රවණය කරගන්නව කියන කොට තමන්ට ඇතිවන නොයෙක් පිඩාවන් පැත්තකින් තබල, ඒ පිඩාවන් විඳගෙන ශ්‍රවණය කරනව. තමන්ට ඇතිවෙන නොයෙක් පීඩාවන් දරාගෙන, තමන්ට ඇතිවෙන වෙහෙස විඩාව දරාගෙන තමන් ගිහිල්ල අර ධර්මය ශ්‍රවණය කරගන්නව. එතකොට ඒ ශ්‍රැතය ඇතිකර ගන්න තැනදි ඒ ශ්‍රැතය තමයි මුල් වෙල තියෙන්නේ අර දුක අත් විඳින තැනට ගන්න. අපි පුද්ගලයෙක් විඳින බව කතා කලාට මොකද්ද වෙලා තියෙන්නේ?

මේ මෙබඳු වූ සිතක බලවත් වීම නිසා තව සිත් ටිකක් උපදවන්නට උපකාර සැලසීමක් තමයි වෙලා තියෙන්නේ. එක සිතක් බලවත් වීම නිසා ඒ සිත් පරම්පරාවක එබඳු බලවත් පහළ වීම නිසා වෙනස් සිත් පරම්පරාවකට උපදින්නට අවකාශය සලසල දීල තියෙනව. ඒ උපකාර බව ලැබ ගෙන තමයි අර අනිත් ධර්ම ටිකේ පැවැත්ම සිද්ධ වෙලා තියෙන්නේ. අනිත් ධර්ම ටික ඉපදිල තියෙන්නේ එහි උපකාර බව ලැබ ගෙන තමයි. එතකොට අන්න ඒ උපකාරී බව ලැබ ගෙන වෙනත් ධර්ම පහළ වන වෙලාවෙදි වෙනත් සිත් උපදින වෙලාවෙදි අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය තමයි මේ ආකාරයට සිද්ධ වන්නේ කියල. උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම තමයි එබඳු ආකාරයකට එබඳු විදියකට ක්‍රියාත්මක වන්නේ. ඒ කියන්නේ අර සත්ත්ව පුද්ගලභාවය දුරු කරගෙන මේ හුදු ධර්මයන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව තේරුම් ගන්නට අපිට ඒක බොහෝ සෙයින්ම උපකාරය සලසනව. අන්න ඒ විදියට ශ්‍රද්ධාව - සීලය - සුතය ඒ විදියට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

ඒ වගේම චාගය. ඇතැම් වෙලාවට චාගය නිසා තමන්ට පුළුවන්කම තියෙනව **අත්තානං ආතාපෙති.** තමාව තැවීමට ලක් කරනව. දන් දීම වෙනුවෙන් සමහර කෙනෙක් මහා දුකක් ගන්නව. වෙහෙසක් ගන්නව. දන් දෙන්න තව නොයෙක් පිඩා

ඉවසමින් දන් දීම කියන දේ ක්‍රියාවට නංවන්නට උත්සාහවත් වෙනව. ඒ වෙලාවල් වලදී මොකද්ද වෙන්නේ? අර තමාට දුක් පැමිණෙද්දී දන් දෙනව කියන තැනදී චාගය බලවත් වෙනව. ඒ පැත්තට බරව බලවත් සිත් උපදිනව. චාගය කියන ධර්මය තමයි එතනදී බලවත් වෙන්නේ. එය බලවත් කරගත්ත සිත් නැවත නැවත නැවත නැවත පහළ වෙන කොට එය උපනිඃශ්‍රය කරගෙන තව සිත් ප්‍රමාණයක් පහළ වෙනව.

එතකොට ඒ දුක උපදින අවස්ථාවේ පහළ වන සිත අව්‍යාකෘතයක්. ඒ අව්‍යාකෘත සිතට අවකාශය සලසා දීල තියෙන්නේ චාගය. චාගය නැත්නම් ඒ අව්‍යාකෘත පහළ වෙන්නේ නෑ. චාගය තියෙන නිසා තමයි ඒ අව්‍යාකෘතය පහළ වෙන්නේ. **<u>ඒක වරදවා ගන්න එපා. මේකේ විපාකයක් හැටියට පහළ වුණා එහෙම නෙමෙයි ඒව.</u>** මේ කියන්නේ උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව. ඒක විපාකය කියන තැනදී එහිම විපාකයක යෙදීමක් නෙමෙයි ඒ වෙලාවෙදී සිද්ධ වෙන්නේ. හැබැයි ඒක කුසලය පැත්තට හිත නැඹුරු කරන කොට එය හේතු කරගෙන දුක උපදින්න පුළුවන්කම තියෙනව.

කෙනෙක් චාගයට යනව. චාගය නිසා මහා අලාභයක් වෙනව කියල හිතන්නකෝ. එතකොට මහා අලාභයක් වෙන එක ඒ වෙලාවෙදී සිද්ධ වෙන්නේ මොකක් නිසා ද? අර චාගය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තමයි ඒක සිද්ධ වෙන්නේ. චාගය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව අර සිදුවුණ දුක තමන්ට ලබා දෙනව කියන තැනට. **<u>ඉතින් අන්න ඒ වගේ අපි මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම පිළිබඳව කතා කරන කොට ඒක අර හේතු වෙනවා වගේ තැනකින් ගන්න එපා. අපිට උඩින් බැලුවහම අපිට හේතු වෙනව වගේ දකින්නට පුළුවන්කම තියෙනව.</u>**

දැන් සමහර වෙලාවෙදි අපි හිතමුකෝ මෙහෙම අවස්ථාවක්. කෙනෙක් කුසලයම සිද්ධ කරනව. පන්සලට හැමදාම යනව. බෝධි පූජාවක් තියෙනව. නැතිනම් හැමදෑම වන්දනා කරන්න පන්සලට යනව. ඔය පන්සලට යන අතර මගදී යම්කිසි විදියකින් සර්පයෙක් දෂ්ට කරල ඔහුට වේදනාවක් උපදිනව. කුසල සිතකින් එයා පන්සලට යනව. ඒ වගේම එතකොට කුසල සිතකින් දන් දෙන්න යන අවස්ථාවක් ගන්නකෝ. චාගය මෙතනදි කතා කරන නිසා. දැන් කෙනෙක් හැමදෑම අසරණ කෙනකුට යමක් දෙන්න යනව. හැමදෑම ගිහිල්ල බත් පාර්සලයක් දීල තමයි යන්නේ. දැන් මේ යන අතර මගදි මේ පුද්ගලයට යම්කිසි අනතුරක් සිද්ධ වෙනව. මේ අනතුර සිද්ධ වෙන කොට ඔහුට කායික දුක් වේදනාවක් උපදිනව. මේ කායික දුක් වේදනාව ඉපදුනේ මොකක් නිසා ද? අර දන් දෙන්න යනවා කියන ක්‍රියාව නිසා තමයි ඒක ඇතිවෙලා තියෙන්නේ. දැන් බැලූ බැල්මට පේන්නේ මේ දන් දෙන්න යෑම නිසා මෙහෙම දෙයක් ඇතිවුණා කියන එක. දැන් මෙතන ප්‍රත්‍යය වීම මොකද්ද වෙලා තියෙන්නේ?

මේ හේතුඵල ධර්මය ඇතුලේ දීර්ඝ විස්තාරිතව අපි ගත්තහම මෙහි තියෙන්නේ අර හේතුවෙන් මේක වුණා කියන එක නෙමෙයි. දන් දෙන්න ගියපු එක හේතු කරගෙන අනතුරකට ලක්වුණා එහෙම නෙමෙයි. දන් දීම කියන එක ඔහු අනතුරු ගොඩකින් මුදවන්න හේතුවක් බවට පත්වෙන්න පුළුවන්. අපි ඒක වෙනම කතා කරමු. හැබැයි මෙතනදි දන් දෙනව කියන එක හේතු වෙලා අනතුරට ලක්වුණා එහෙම නෙමෙයි. මොකද්ද මෙතනදි සිද්ධ වුණ දේ? දන් දීම නැතිනම් අර චාගය පැත්තට බරව උපදපු ඒ කුසල චේතනාවන්ගේ බලවත් වීම මත තමයි එයා හැමදෑම අර යනව කියන එක කලේ. ඒක මුල් කරගෙන තමයි අර යම්කිසි දුක් වේදනාවක් ඉපදුනේ. ඒ දුක් වේදනාව විඳින වෙලාවෙදි උපදින අව්‍යාකෘත සිත් පහළ වුණේ අර කුසලය මුල් කරගෙන ඒ ක්‍රියාව සිද්ධ වුණ නිසා. අන්න ඒ

අවස්ථාවෙදි මොකද්ද වෙලා තියෙන්නේ? කුසලයක් මුල් කරගෙන අව්‍යාකෘත ධර්මයක පහළවීම කියන එක තමයි සිද්ධ වෙලා තියෙන්නේ.

ඒ විදියටම **පඤ්ඤං උපනිස්සාය අත්තානං ආතාපෙති**, ප්‍රඥාව මුල් කරගෙන තමා තවනව. සමහර වෙලාවට ප්‍රඥාව නිසා දුක විඳගෙන ඇතැම් දේවල් සිදු කරන අවස්ථාවන් තියෙනව. මේ හැම අවස්ථාවකදිම  සිදු වෙන ක්‍රියාව දිහා බැලුවහම අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව මේ සෑම මොහොතකදිම ක්‍රියාවට නැංවිල තියෙන්නේ, සෑම මොහොතකදිම සිද්ධ වෙලා තියෙන දේ තමයි කුසලයක් මුල් කරගෙන සිත එක පැත්තකට භාවිත කරගෙන යන කොට එය තව විපාක සිත් සමූහයකට උපදින්නට ප්‍රත්‍යය වෙලා තියෙනව. උපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් තමයි අර විපාක සිත් සන්තතිය විපාක සිත් සමූහය ඉපදිල තියෙන්නේ. ඒක තමයි අපිට එතනදි හඳුනාගන්නට තියෙන්නේ.

ඒ වගේම **සද්ධා සීලං සුතංචාගො පඤ්ඤා - කායිකස්ස සුඛස්ස කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො. සද්ධා සීල සුත චාග පඤ්ඤා** කියන මේ දේවල් කායික සැපයට, කායික දුකට, ඵල සමාපත්තියට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක අපිට හඳුනාගන්නට පුළුවන්. ඒ ටිකත් එකතු කරමින් තමයි අපි මේ හඳුනාගන්නට යෙදුනේ. ඒකම ඵල සමාපත්තියටත් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. අර ධර්මයන් මුල් කරගෙන ඵල සමාපත්තිය උපදවන්නට පුළුවන්කම තියෙනව. ඒ කියන්නේ ඵලයකට පත්වෙලා ඒ ඵලයට සමවැදීමෙහි හැකියාව සියලු ආර්‍යයින් වහන්සේලාට තියෙනව. ඒ **සද්ධා - සීල - සුත - චාග - පඤ්ඤා** කියන මේ ධර්මයන්ගේ භාවිතය මේ ධර්මයන්ගේ වැඩීම තුළ, මේව උපනිඃශ්‍රය වෙලා තියෙනව ඒ ඵලය උපදවන්නට. ඉතින් ඵල සමාපත්තියටත් ඒ ධර්ම උපකාර කරනු ලබනවා.

ඒ වගේම **කුසලං කම්මං - විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** අන්න දැන් තමයි අර විපාක අවස්ථාව කියපු එක අපිට හඳුනාගන්නට තියෙන්නේ. මොකද්ද මේ විපාක අවස්ථාව කියල කිව්වේ? **කුසලං කම්මං විපාකස්ස.** තමන් බලවත් කරන කුසල කර්මයක විපාකය, විපාකයක් විදියට උපදවන්නට මේ උපනිස්සය ප්‍රත්‍යය භාවිත වෙනව. **දුර්වල විපාක වලට මේ උපනිඃශ්‍රය භාවය ලැබෙන්නේ නැහැ. එතකොට දුර්වල කර්ම වලට ඒ නිසා තමයි අපිට විපාක ලබන්නට පුළුවන්කමක් නැත්තේ. දුර්වල කර්ම කලා කියල ඒ දුර්වල කර්ම වලට විපාක ලැබෙන්නේ නැහැ.**

**එහෙනම් විපාක ලැබෙන්නේ මොනවටද? විපාක ලැබෙන්නේ ප්‍රබල බලවත් බල සම්පන්න කර්ම වලට. ඒ කියන්නේ දුර්වල කර්ම වලට විපාක නෑ කියන එකෙන් අදහස් කලේ මේ උපනිස්සය ප්‍රත්‍යය යෙදීම තුළ ඇතිවෙන විපාක නෑ කියන එක.** දුර්වල කර්ම වලට එහෙම නෑ. බලවත් කර්මයකට උපනිස්සය ප්‍රත්‍යය යෙදෙන කොට මොකද වෙන්නේ? අන්න ඒ බලවත් භාවය මත විපාකය බලවත්ව උපදිනව. ඒ නිසා කුසලය බලවත්ව කලහම ඒ බලවත් කුසලයෙහි විපාක බලවත් විදියට පහළ වීම තියෙනව. ඒ අවස්ථාවෙදි විපාක සිත කියන්නේ මොකද්ද? අව්‍යාකෘත සිතක් නේ. එතකොට ඒ අව්‍යාකෘත සිතක් ඉපදිල තියෙන්නේ මොකක් උපනිඃශ්‍රය කරගෙන ද? අර කුසලය උපනිඃශ්‍රය කරගෙන තමයි ඉපදිල තියෙන්නේ.

ඒ නිසා අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව බලවත්ව කුසලයක් කලහම ඒ කුසලය විපාක වශයෙන් බලවත් විපාක විදියට එනව. ඇතැම් කුසල් **දිට්ඨධම්මවේදනීයවම** විපාක වශයෙන් එනව. ඇතැම් කුසල් **අපරාපරියවේදනීය** වශයෙන් විපාක වශයෙන් පැමිණෙනවා. මේ ආකාරයට කුසල්වල විපාක පැමිණීමෙහි විවිධත්වයක් අපිට දකින්නට පුළුවන්කම තියෙනව

නේ. මේ ජීවිතේදිම අපිට විපාක දෙන කුසල් තියෙනව. ඊළඟ ආත්මභාවයේදිම අපිට විපාක දෙන කුසල් තියෙනව **උපපජ්ජවේදනීය** ආදී වශයෙන්. ඊට පස්සේ අපිට අනතුරු ආත්මභාව ගණනාවකදි විපාක දෙන්න පුළුවන් වුණ කුසල් විපාක වශයෙන් පැමිණීම දකින්නට පුළුවන්කම තියෙනව. මේව සිද්ධ වෙන්නේ යම්කිසි කරපු බලවත්ව යන කුසලයකට අනුරූපීව තමයි. ඒ නිසා බලවත්ව කරපු කුසලයන් අර විපාක උපදින අවස්ථාවලදි ඒ විපාකයට උපනිසය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වෙනව.

දන් දුන්නහම දානය කියන දේ උපනිඃශ්‍රය කරගෙන තමයි එහි විපාකය කියන දේ පහළ වන්නේ. එතකොට ඒ වෙලාවේ ඉපදුන සිත සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංස්කාරික සිතක් නම් එයින් ලැබෙන විපාක සිතත් සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංස්කාරික විපාක සිතක්ම තමයි ලැබෙන්නේ. එයට අනුරූපීව ඒ සිතේ පවතින චිත්ත චෛතසික ධර්මයන්ට අනුරූපීව තමයි ඒ ආත්මභාවයෙහි ප්‍රතිසන්ධිය සිද්ධ වුණේ. දැන් ප්‍රතිසන්ධිය ලබා ගන්න හේතු වුණේ එයාට අර දන් දුන්න මොහොත තමයි සිහිපත් වුණේ. එය අරමුණු කරගන්න කොට මරණාසන්න මොහොතෙදි ගති නිමිත්ත කර්ම නිමිත්තක් හැටියට ඉදිරිපත් වුණේ අර දන් දුන්න අවස්ථාව. ඊට අනුරූපීව තමයි ප්‍රතිසන්ධිය සිද්ධ වුණේ. ඒ ප්‍රතිසන්ධි ගත්ත හිත හරියටම අර කුසල සිත වගේම සිතක්. හැබැයි ඒක කර්ම සකස් කරන එකක් නෙමෙයි. ඒක විපාකමය ස්වභාවයෙන් යුක්ත දෙයක්. අරකේ පරිපාක භාවයට ගියපු අවස්ථාවක්. පැසීමට ගියපු අවස්ථාවක්. එයින් පුළුවන්කම තියෙනව තව රූප ආදී උපදවන්නට. ඒ වගේම මේ විපාක පැවැත්ම ඇති කරන්නට.

ඊට පස්සේ ඒ ප්‍රතිසන්ධි සිතට අර කර්මය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණා. අර කර්මය කියන එක පකතූපනිස්සය ආදී වශයෙන් ඒ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කලා.

ඊට පස්සේ ඒ භවයෙහි නැවත භවාංග චිත්ත සන්තතිය විදියට අර ප්‍රතිසන්ධි ගත්ත සිත හා සමාන සිත් පරම්පරාවක් පහළවීම සිද්ධ වෙනව. අන්න ඒ අවස්ථාවල සිද්ධ වෙන්නේ මොකද්ද? ඒ විපාක සිත පහළ කරන්නට හේතුව බවට පත්වුණේ මේ කරපු බලවත් කර්මය. ඒකට තමයි කියන්නේ මෙතනදි පකතූපනිස්සය කියල. පකතූපනිස්සය වශයෙන් උපනිස්සය ප්‍රත්‍යය යෙදීම නිසා තමයි අර විපාක සිත ඒ විදියට පහළ වුණේ. මේ කර්මයට විපාක.

**එතකොට ඒ සිතෙහි ශක්තියක් තිබුණ නම් අනිකුත් චෛතසික සම්ප්‍රයෝගයන් තිබුණ නම් ඒ සිතෙහි බලවත්ව උපදවන රූප ආදිය බලවත්ව උපදිනව නම් මොකද වෙන්නේ? අර රූපයෙහි වෙනස්කම් ඇති කරන්නට පුළුවන්කම තියෙනව.**

ඒ සිතෙහි යෙදුන ප්‍රසාද ආදී රූප බොහොම බලවත් නම් මෙත්තා කරුණා මුදිතා ආදී සිතුවිලි බොහොම බලවත් නම් එතකොට මොකද වෙන්නේ? අර විපාකය පැත්ත බොහොම පැහැපත් ප්‍රසාදවත් දෙයක් බවට පත්වෙනව. දානය කියන දේ මුල් කර ගැනීම නිසා ඔහුට ප්‍රත්‍යය පහසුකම් ලබන්නට පුළුවන්කම තියෙන ආත්මභාවයක් බවට පත්වෙනව.

ඉතින් අන්න ඒ විදියට විපාකය පැත්තේ වෙනස්කම් සිදුවීම ඒ චිත්ත චෛතසික ධර්මයන්ට අනුරූපීව සිද්ධ වෙනව. ඒක කර්මය පැත්තේ තමයි එබඳු පරිපාකයට යෑම තුළ එබඳු විපාකයක් ඇතිකරන ගතිය තිබ්බේ. මෙය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම තුළ තමයි ඒ විපාකය පහළ වෙන්නේ.

එහෙනම් දැන් හිතන්නකෝ ඒ කුසලය කලා, දැන් ඒක ඉවරයි. ඒක නැති අවස්ථාවකදීත් මේ ප්‍රත්‍යය වීම ප්‍රත්‍යය ශක්තිය කියන එක, ඒක නැතිවෙල නැහැ. ඒක නිසා අපි හඳුනාගන්නට ඕනේ මේ ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය ශක්තිය කියන දේ කතා කරන්නේ

මොන විදියකට ද කියල. ඒ කියන්නේ ඒක කොහෙවත් තියෙනව එහෙම නෙමෙයි.

හරියට අපි ගත්තහම පහනක් පත්තු වෙන තැනකදි ඒ ජ්වලන උෂ්ණත්වය, ඊට පස්සේ තිරය, තෙල් ටික, ඒව වෙන වෙනම තිබ්බ කියල එහෙම යෙදීමක් ඇත්තේ නැහැ නේ. හැබැයි එකකට එකක් උපනිඃශ්‍රය වීම තුළ අපිට දකින්නට පුළුවන්කම තියෙනව නිඃශ්‍රය උපනිඃශ්‍රය භාවය ලැබ ගෙන පහණ පත්තු වෙනව කියන එක. එතකොට ඒ පහණ දැල්වෙනව කියන එකේදී පහන් දැල්ල තෙල් ටිකේවත් තිරේවත් එහෙම නැතිනම් ගිනි කූරකවත් කොහෙවත් තිබුණේ නෑ. පහන් දැල්ල කියන එක ඒ එකකටවත් අයිති දෙයක් බවට පත්වුණේ නෑ. එහෙනම් පහන් දැල්ල කොහො තිබිල ද ආවේ කියල අහන එක සුදුසු දේකුත් නෙමෙයි. මේ සම්ප්‍රයෝගයෙන්, ප්‍රත්‍යයෙහි යෙදීමෙන්, මේ ප්‍රත්‍යය ශක්තියෙන් තමයි එහෙම දෙයක් සිද්ධ වුණේ.

ඒ වගේ තමයි අර සිත එහෙනම් කොහෙ හරි තිබිල ද, ඒ කුසලය දැන් මේ මොහොතේ නෑ, ඔබ අතීතයේ දන් දුන්න එකක්. මේ මොහොතේ නෑ දැන්. එහෙනම් ඒ කුසලය කොහොමද මරණාසන්න මොහොතෙදි ප්‍රත්‍යය වෙලා ප්‍රතිසන්ධියක් ලබා දෙන්නට කටයුතු කරන්නේ කියල කෙනකුට හිතෙන්නට පුළුවන්. ඒක තමයි උපනිස්සය ප්‍රත්‍යයෙහි ස්වභාවය. කොහෙද ඒක තිබ්බේ? ඒක කොතනකවත් තිබ්බ නෙමෙයි. අර ප්‍රත්‍යය භාවය ලැබෙන කොට එහෙම දෙයක් උපදින්න පුළුවන්කමක් තියෙනව. ඒක ප්‍රත්‍යය යෙදීම අනුව තමයි ඒක තීරණය වෙලා තියෙන්නේ. ඒ නිසා ඒ උපනිස්සය ප්‍රත්‍යයෙන් අර කුසලය ප්‍රත්‍යය වෙලා තියෙනව. ඒ නිසා තමයි ඊළඟ විපාක සිතෙහි පහළ වීම කියන දේ ඇතිවෙලා තියෙන්නේ, ඒ උපනිස්සය ප්‍රත්‍යය භාවය කියන දේ ඇසුරු කරගෙන. ඒ විදියට අපිට **කුසලං කම්මං - විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

කුසල කර්මය විපාකයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව හඳුනාගන්නට පුළුවන්කම  තියෙනව.

ඒ වගේම **අරහා මග්ගං උපනිස්සාය** - **අනුප්පන්නං කිරිය සමාපත්තිං උප්පාදෙති. අරහා,** රහතන් වහන්සේ, **මග්ගං උපනිස්සාය,** මාර්ගය උපනිඃශ්‍රය කරගෙන, ඒ ලෝකෝත්තර මාර්ගය ඇසුරු කරමින්, **අනුප්පන්නං කිරිය සමාපත්තිං උප්පාදෙති,** නූපන්නා වූ ක්‍රියා සමාපත්ති උපදවීම සිද්ධ කරනව. නූපන්නා වූ කිරිය සමාපත්තීන්ගේ ඉපදවීම පහළ කිරීම සිද්ධ කරනව. ඒ වගේම **උප්පන්නං සමාපජ්ජති,** ඉපදුනු දේට සමවැදීම සිද්ධ කරනව. **සංඛාරෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති,** සංස්කාරයන් අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් විපස්සනා කිරීම සිද්ධ කරනව.

මාර්ගය උපනිඃශ්‍රය කරගෙන රහතන් වහන්සේට ඒ වෙලාවෙදි ඒ උපදින සිත් අපි ක්‍රියා සිත් විදියට හඳුනාගන්නව. හුදු ක්‍රියා මාත්‍රික ධර්ම හැටියට. එතකොට ඒ ක්‍රියා මාත්‍රික ධර්මයන්ගේ පැවැත්ම සිද්ධ වෙන වෙලාවෙදි මොකද්ද වෙලා තියෙන්නේ? අර මාර්ගය කියන්නේ කුසලයක්. ඒ කුසලය උපනිඃශ්‍රය කරගෙන තමයි මේක උපදවන්නේ. ඒ සිත පවතින්නේ, උපදින්නේ. එතකොට එතනදි අර කුසලයක් එබඳු තැනක අව්‍යාකෘත ධර්මයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙන බව හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම **මග්ගො අරහතො** - **අත්‍ථපටිසම්භිදාය ධම්ම පටිසම්භිදාය, නිරුත්ති පටිසම්භිදාය, පටිභාණ පටිසම්භිදාය, ඨානාඨාන කොසලස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** මාර්ග කුසලය රහතන් වහන්සේට  ඒ **අත්‍ථ ධම්ම නිරුත්ති පටිභානයන්** සතර ඥාණයන්ට ද, **ඨානාඨානා** ඥාණයන්ට ද, උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. අපි **අත්‍ථ ධම්ම නිරුත්ති පටිභානයන්** පිළිබඳව අපි මීට පෙර හඳුනාගන්නට යෙදුනා. ඒව

කොහොමද සිද්ධ වන්නේ කියන එක පිළිබඳව. එතකොට ඒ **අත්‍ථ ධම්ම නිරුත්ති පටිභාන පටිසම්භිදාවන්** සඳහා උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මාර්ගය ඉපදවීමේදී ඒ ප්‍රත්‍යය වීම සිදුවන බව අපිට හඳුනාගන්නට පුළුවන්කම තිබුණා.

එතකොට අරිහත් මාර්ගය උපදවන මොහොතෙදි ඒ ධර්මයන් මුල් කරගෙන **අත්‍ථ - ධම්ම - නිරුත්ති - පටිභාන පටිසම්භිදාවන්** පිළිබඳව සිත් යොමු කිරීම තුළ ඒ ඵලය උපදවන්නට පුළුවන්කම ලැබීම නිසා තමයි සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේ නමක්යැ කියල කියන්නේ. එහි විපාකය ලැබෙන කොට නැතිනම් එහි ඵලය උපදින වෙලාවෙදි ඒ **අත්‍ථපටිසම්භිදා - ධම්ම පටිසම්භිදා - නිරුත්ති පටිසම්භිදාය - පටිභාණ පටිසම්භිදාය** සහිතවම ඒ ඉපදීම තමයි ඒ අවස්ථාවෙදි සිද්ධ වන්නේ.

එතකොට එතනදි අපිට වඩාත්ම තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව මේ **අත්‍ථ - ධම්ම - නිරුත්ති - පටිභාන** කියන මේ පටිසම්භිදාවන් මේව මේ සාමාන්‍යයෙන් කතා කරන ඒ පිළිබඳව හඳුනා ගැනීමේදීත් තේරුම් ගත්ත මේ නිකම්ම සරල වාචාලකමට හිතට එන එන විදියට මේ කියවන දේවල් එහෙම නෙමෙයි කියල.

මේව ඉතාම ගැඹුරු අරිහත් ඵලයට පත්වෙන මොහොතෙදි **අත්‍ථ - ධම්ම -නිරුත්ති - පටිභාන පටිසම්භිදාවන්** සහිතව ඒ ඵලයට පත්වීම තමයි සිද්ධ වෙන්නේ. ඒක විශේෂ ඥාණයක්. එතකොට ඒ ඥාණය කියන එක ඵල අවස්ථාවක් හැටියට, අව්‍යාකෘත අවස්ථාවක් හැටියටයි ගණනය කරන්නේ. එතකොට ඒ මාර්ගය උපනිඃශ්‍රය කරගෙන තමයි ඒ ධර්මයන්ගේ පහළ කිරීම ලැබීම සිද්ධ කරගන්නේ. ඒ මාර්ගය උපනිඃශ්‍රය කරගෙන, ඒ ධර්මයන්ගේ පහළ වීම, ඒ ධර්මයන්ගේ ලැබීම සිද්ධ වන නිසා, අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව මේ අවස්ථාවෙදි

ක්‍රියාත්මක වන්නේ කුසල ධර්මයක් මුල් කරගෙන අව්‍යාකෘතයක පහළ වන අවස්ථාවක් හැටියට.

ඉතින් මේ විදියට මේ ප්‍රත්‍යය සමුප්පන්න භාවයෙන් ඒ අව්‍යාකෘත පහළ කරවන්නට, විපාක අව්‍යාකෘත, ක්‍රියා අව්‍යාකෘත පහළ කරවන්නට උපකාර කරල තියෙනව කුසලය කියන දේ. කුසලය මුල් කරගෙන ඒ ධර්මයන්ගේ පහළවීම සිද්ධ වනවා කියන එක අපිට මෙතනදි හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඒ අනුව අපි කුසලයන් මුල් කරගෙන කොහොමද කුසලයන් උපදින්නේ, කුසලයන් මුල් කරගෙන කොහොමද අකුසලයන් උපදින්නේ, කුසලයන් මුල් කරගෙන කොහොමද අව්‍යාකෘත උපදින්නේ කියන එක පිළිබඳව හඳුනාගන්නට යෙදුනා. ඒ එකක් එකක් පිළිබඳව අපි හඳුනාගන්නට යෙදුනේ, කොහොමද ඒ ධර්මයන් උපදින්නේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙමින් කියල. උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව අපි එතනදි තුන් ආකාරයකට හඳුනාගන්නට යෙදුනා. ඒ තමයි අපි එතනදි තේරුම් ගන්නට යෙදුනා ආරම්මණූපනිස්සය විදියටත්, ඒ වගේම අනන්තරූපනිස්සය විදියටත්, ඒ වගේම පකතූපනිස්සය විදියටත්.

ඒ වගේම අපි දැන් මෙතෙක් කතා කල කරුණු පිළිබඳව ගත්තහම අපි කතා කලේ කුසල ධර්මයන් - අකුසල ධර්මයන් - අව්‍යාකෘත ධර්මයන් පිළිබඳව තමයි උපනිස්සය ප්‍රත්‍යය මුල් කරගෙන මේ කතා කරන්නේ. එහිදී මීට පෙරාතුව කතා කලා කුසලයක් මුල් කරගෙන කුසල් උපදින්නේ කොහොමද - කුසලයක් මුල් කරගෙන අකුසල් උපදින්නේ කොහොමද - කුසලයක් මුල් කරගෙන අව්‍යාකෘත ධර්ම උපදින්නේ කොහොමද කියන එක පිළිබඳව අප හඳුනාගන්නට යෙදුනා.

ඒ සෑම එකකදීම අපි පැහැදිලි කරගන්නට යෙදුනා මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම සිද්ධ වෙන කොට ආරම්මණ

උපනිස්සය, අනන්තර උපනිස්සය සහ පකතූ උපනිස්සය වශයෙන් මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය සිදුවන බව අපි එහිදී තේරුම් ගන්නට යෙදුනා. ඒ අනුව ඒ කුසල ත්‍රිකයෙහි පළමු කුසලයට මුල් කරගත්ත මාතෘකා තුනට අනුරූපීව තමයි අපි මේ කාරණාව පිළිබඳව හඳුනාගන්නට යෙදුනේ.

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

එහෙනම් දැන් අපි අකුසලා ධම්මා කියන මාතිකාවට අනුරූප කරුණු තුන පිළිබඳවයි ඊළඟට අවධානය යොමු කරන්නට බලාපොරොත්තු වෙන්නේ. අකුසල ධර්මයක් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම තුළ අකුසල් උපදින්නේ කොහොමද?

***<u>ආරම්මණූපනිස්සය</u>***

එතකොට අකුසල ධර්මයක් මුල් වී අකුසල ධර්මයන් උපදීම තුළ අපිට අකුසලයක් අකුසලයකට ආරම්මණ උපනිස්සය වශයෙන් පහළවීම සිද්ධ කරනව. මොන වගේ අවස්ථාවල ද?

**රාගං - ගරුං කත්වා අස්සාදෙති. අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති. දිට්ඨි උප්පජ්ජති.**

**දිට්ඨිං - ගරුං කත්වා අස්සාදෙති. අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති. දිට්ඨි උප්පජ්ජති.**

මේ විදියට රාගය ගරු කරගෙන ආස්වාදනය කරනව. අභිනන්දනය කරනව. ඊට පස්සේ රාගය ගරු කරගෙන රාගයට අනුව ඒක බොහොම දැඩි ලෙස මුල් කරගෙන ඒක අභිනන්දනය කරනව. ආස්වාදනය කරනව. යම්කිසි කැමති දේකට තමන්ට රාග ආදී වශයෙන් ඇලෙන්නට සුදුසු දේකට නිකම් රළු

මට්ටමෙන් කාටත් ප්‍රකට මට්ටමෙන් අපි ගත්තොත් ස්ත්‍රී පුරුෂ ආදී රූපයක් පිළිබඳව වෙන්නට පුළුවන්. එහෙම නැතිනම් යම්කිසි වස්තූන් පිළිබඳව තියෙන සම්පත්තීන් පිළිබඳව තියෙන සිතේ දැඩි ඇල්ම වෙන්නට පුළුවන්. අන්න ඒ විදියට රාගයක් තමන්ගේ සිතේ දැඩිව රැඳෙන ස්වභාවයක් තියෙනව. ඒක මුල් කරගෙන අස්සාදෙති, අභිනන්‍දති කියල කියනව. ආස්වාදනය කරනව. අභිනන්‍දනය කරනව. එතන සතුටු වෙනව.

**තං ගරුං කත්‍වා රාගො උප්පජ්ජති,** ඒක ගරු කරගෙන රාගය නැවත උපදිනව. රාගය නිසා තමන්ගේ සිත සතුටු වෙන නිසා තමයි ඒ දේ උපදින්නේ. ඒකම මුල් කරගෙන නැවත නැවත රාගය ඉපදීම සිද්ධ කරනව. මේ වෙලාවෙදි වෙන්නේ මොකද්ද? **මේ කියන අකුසල මූලයක් මුල් කරගෙන තව අකුසල් ඉපදිල තියෙනව. ඒ අකුසලය නැවත අකුසල් උපදවන්න හේතුවක් බවට පත්වෙල තියෙනව.**

මේ අකුසලය මුල් කරගෙන තව අකුසලයක් ඉපදීමේදී උපනිඃශ්‍රය ප්‍රත්‍යය භාවය තමයි මෙතන මේ ප්‍රත්‍යය හැටියට යෙදිල තියෙන්නේ. උපනිඃශ්‍රය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය ඉපදීම තුළ තමයි එබඳු ආකාරයකට ඒ අකුසලය ඉපදවීම කියන දේ සිද්ධ කරල තියෙන්නේ. එය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව අකුසලයක් මුල් කරගෙන ඒක අරමුණු අරගෙන ඒකේ ඉපදීම කියන අවස්ථාව.

ඒ වගේම දිට්ඨිය උපදවනව. ඒක කලේ මම. ඒක කලේ පුද්ගලයෙක් ආදී ලෙස මමයි කැමති කියල ඒක පුද්ගලභාව වශයෙන් දැඩිව පරාමර්ශනය කරනව. තදින් අල්ල ගන්නව. රාග වශයෙන් දැඩිව අල්ල ගන්නව. පරාමර්ශනය කරනව. මේ හැම වෙලාවකදිම සිද්ධ වෙන්නේ මොකද්ද? දැන් දෙයක් පිළිබඳව ඇලෙනව. හිතෙන් බැඳෙනව. ඒ ඒ දේ පිළිබඳව හිතෙන් ඇලිල, හිතෙන් බැඳිල, එහිම තමයි ඇලීම තියෙන්නේ කියල අපි රූපය

වෙතම දැඩිව පරාමර්ශනය කරගෙන තදින් ග්‍රහණය කරගෙන ඉන්නව. අන්න ඒ තදින් ග්‍රහණය කර ගැනීම, තදින් අල්ලා ගැනීමත් එක්ක සිද්ධ වන දේ තමයි, ඒ සිදුවන ක්‍රියාවලිය තමයි පරාමර්ශනයත් එක්ක දිට්ඨිය උපදින එක. එතකොට අර අකුසලය අර දිට්ඨිය උපදවන්න හේතුවක් වෙලා තියෙනව. එතකොට මේ රාග සහිත සිත උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම මුල් කරගෙන දිට්ඨිය කියන දේ ඉපදිල තියෙනව. එතකොට මොකද්ද වෙලා තියෙන්නේ? රාග සහිත මේ සිත අකුසලයක්. දිට්ඨි සහිත හිතත් අකුසලයක්. මේ අකුසලයක් මුල් කරගෙන ඒ උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වෙලා තමයි දිට්ඨි සහිත සිත පහළ වෙලා තියෙන්නේ.

මොන විදියට ද මේ උපනිස්සය ප්‍රත්‍යය යෙදුනේ? ආරම්මණ උපනිස්සයක් විදියට. අරක අරමුණු කරමින් තමයි පැවතුනේ. එතකොට මේ ආරම්මණ උපනිස්සය භාවයෙන් ප්‍රත්‍යය වීම තමයි අපිට මෙතනදි හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. ඒකයි රාගය ගරු කරගෙන මේ විදියට ආස්වාදනය කරනව. රාගය මුල් කරගෙන ගරු කරගෙන මේ විදියට සතුටු වෙනවා. ඒක මුල් කරගෙන නැවත රාගය උපදවනවා කියල මේ කතා කලේ. අන්න එබඳු ආකාරයන්ගෙන් අකුසල් මුල් කරගෙන නැවත නැවත නැවත නැවත අකුසල් කිරීමෙහි හැකියාව තියෙනව. අකුසලයක් මුල් කරගෙන නැවත නැවත අකුසල් කිරීමෙහි හැකියාව තියෙන තැන්වලදි උපදින්නේ එබඳු ආකාරයෙහි අකුසලයක් මුල් කරගෙන අකුසලයක් ඉපදවීම පිළිබඳව උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය තමයි සිද්ධ වන්නේ.

මෙතනදි ඔබට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව මේ කතා කරන්නේ අරමුණු කරල. ඒකයි **ගරුං කත්වා** කියන එකෙන් අදහස් කලේ. අර රාග සහිත සිත ගරු කරගෙන තමයි රාගය ඉපදෙව්වේ. රාග සහිත සිත ගරු කරගෙන තමයි දිට්ඨිය

ඉපදෙව්වේ. තව කෙනකුට පුළුවන් ඕනේ නම් දිට්ඨි සහිත සිත ගරු කරගෙන රාගය උපදින්නත්. ඒකයි දිට්ඨි රාග ආදී වශයෙන් කියන්නේ. දිට්ඨි රාගය කියල කියන්නේ. දෘෂ්ටියෙහි දැඩිව ඇලෙනව. ඇලෙන දේහී දෘෂ්ටිය උපදිනව. දෙපැත්තටම මේක යෙදෙන්නට පුළුවන්කම තියෙනව.

මේ වෙලාවල් වලදී මොකද්ද වෙන්නේ? අකුසලයක් මුල් කරගෙන තව අකුසල් ඉපදීම තමයි සිද්ධ වෙන්නේ. අපි පුද්ගලයෙක්ගේ ක්‍රියාකාරිත්වයක් කියල කතා කලාට මේ හැම තැනකදිම සිද්ධ වෙන්නේ මොකද්ද? යම්කිසි හේතු ධර්මයන්ගේ පැවැත්මක් නිසා ඵලයක පහළ වීමක් තමයි මේ හැම තැනකදිම දකින්නට පුළුවන්කම තියෙන්නේ. හේතු සමූහයක ඉපදීමක්, හේතු සමූහයක පැවැත්මක් නිසා මේ යම්කිසි ඵල ධර්මයක ඉපදීමක් සිද්ධ වෙලා තියෙනව. එහෙම නැතිනම් හේතුවක් තව හේතුවක් උපදවන්නට ප්‍රත්‍යය වෙලා තියෙනව. තව හේතුවක් සකස් කරන්නට ප්‍රත්‍යය වෙලා තියෙනව. ඒක තමයි මේ අකුසලයක් අකුසලයකට ප්‍රත්‍යය වෙනවා කියල කියන තැනකදි සිද්ධ වෙන්නේ.

මේ ප්‍රත්‍යය වීම අතරේ හේතු, හේතු වලට ප්‍රත්‍යය වීම, නැතිනම් අකුසල් අකුසල් වලට ප්‍රත්‍යය වීම, අකුසල් අව්‍යාකෘතයන්ට ප්‍රත්‍යය වීම කියල මේ විදියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඉතින් මෙතනදි මේ කතා කරන්නේ ආරම්මණ වශයෙන් අරමුණු කරල. තමන් කරපු අකුසල්, දිට්ඨිමය ස්වභාව වශයෙන්, තමන් අරමුණු කරමින් ඇතිකර ගන්නා වූ ස්වභාවය. ඒකට කියන්නේ ආරම්මණ උපනිස්සය කියල. ආරම්මණ උපනිස්සය වශයෙන් අකුසලයක් තව අකුසල් උපදවන්නට ඕන තරම් ප්‍රත්‍යය වන්නට පුළුවන්කම තියෙනව. ඒ නිසා තමයි ඇලෙන දේවල් මුල් කරගෙන ඔබ නැවත නැවත හිතට සතුටු වෙන්නේ.

නිකම් ඕක ඔබේ ප්‍රායෝගික ජීවිතයේ එදිනෙදා සිහිය පවත්වන තැන් වලට යොදල බලන්නකෝ. අභිධර්ම භාවනාවක් හැටියට ඔබට පුළුවන් සිත යෝනිසෝමනසිකාරයට යොමු කරගන්නට. හිතේ ඔබේ කැමැත්ත ආස්වාදනය අනුව නැවත නැවත දේකට යොමු වෙන කොට මේ වෙලාවෙදි සිදු වන්නේ මෙන්න මේ වගේ ධර්මයක්නේ ද, ප්‍රත්‍යය සමවායෙන් උපන් සිත් සමූහයක පහළ වීමක් නේද සිද්ධ වන්නේ කියල, මේ අකුසලයක් තව අකුසලයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම නේද මේ සිද්ධ වෙලා තියෙන්නේ. අර යම්කිසි දෙයක් රාග වශයෙන් රූපය වෙත නැඹුරු වීම තුළ එහි උපනිඃශ්‍රය භාවය ලැබ ගෙන මේ දැන් නැවත නැවත ඒ රාගය උපදිනව. ඒ රාගය උපදින අරමුණ දිහා බලන කොට නැවත නැවත සිතෙන් ඒ අරමුණ දැකීමට කැමැත්ත උපදිනවා. මේ රාගය ඇසුරු කරමින් නැවත නැවත ඒ අභිනන්දනය ආස්වාදනය කරන කොට ඒ පිළිබඳව රාගය ඉපදීම නේද මේ සිද්ධ වෙලා තියෙන්නේ.

ඒ කියන්නේ අකුසලයක් තව අකුසලයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීමයි මේ සිත පැත්තෙන් වෙන්නේ කියල ඒක හඳුනාගන්න කෝ. තරහ වුණත් ඒ විදියටම තමයි. දිට්ඨියත් ඒ විදියටම තමයි. ආත්ම දෘෂ්ටිය, මේ මම ඉන්නව. මේ පුද්ගල වශයෙන් මේක අල්ලා ගැනීමට තියෙනව. එතකොට අන්න ඒ විදියට පුද්ගලභාව වශයෙන් එහි පිහිටා සිටීම සිද්ධ කරනව. එතකොට මොකද වෙලා තියෙන්නේ? අර රාගය ඉපදුනා. රාගය දිට්ඨී වශයෙන් පරාමර්ශනය කරගත්තා. එහෙම නැතිනම් අර කැමැත්ත උපදවන්නේ අර කෙනාම තමයි. අර දේම තමයි කැමැත්ත උපදවන්නේ. දැඩිව අල්ල ගන්නව. ඒ රාගය දිට්ඨිය උපදවන්නට අස්වාද දිට්ඨිය උපදවන්නට ඒක හේතුවක් බවට පත්වෙලා තියෙනව.

දැන් මොකද්ද සිද්ධ වුණේ? ඔබ ඔබේ ප්‍රායෝගිකව දෛනික ජීවිතය ඇතුලේ මේ කාරණාව පිළිබඳව අත් දකින්න උත්සාහවත්

වෙන්න. ටිකෙන් ටික ඒ පිළිබඳව යෝනිසෝමනසිකාරය නැවත නැවත පවත්වන්නට උත්සාහවත් වෙන්න. ඒ විදියේ යෝනිසෝමනසිකාරය නැවත නැවත නැවත නැවත පවත්වන කොට තමයි ඔබට ඒ කියන කාරණා පිළිබඳව ප්‍රායෝගික ජීවිතය තුළින් අත් දකින්නට පුළුවන්කම තියෙන්නේ.

**එහෙම නැති වුණහම මේ ටික පාඩමක් විතරක් වෙනව නේ. දැන් මේ කියන කාරණාවන් පාඩමක් බවට පත්වුණා කියල කිසීම ප්‍රයෝජනයක් ලැබෙන්නේ නෑ. ඒ නිසා මේක පාඩමක් බවට පත්වීම කියන දේට වඩා එහා ගිහිල්ල අපේ ජීවිතයට මේක මේ ප්‍රායෝගිකව උපකාර කරන දෙයක් බවට පත්වෙන්න ඕනේ. මේක ප්‍රායෝගිකව මේ මනසිකාරය පැවැත්වීම කියන දේ සත්ත්ව පුද්ගලභාවය සිඳ දමන්නට ජීවිතේට හේතු වෙන්න ඕනේ. ඔබේ ජීවිතය තුළ යෙදෙන්න ඕනේ. ඒ හින්දා මේ කියන ක්‍රම ඔබ පාවිච්චි කරල බලන්න.**

උපනිස්සය ප්‍රත්‍යය කොහොමද යෙදෙන්නේ, තමන්ගේ හිත උපදින කොට තව දේවල් ගරු කරගෙන ආස්වාදනය කරමින් එහි මුල් කරමින් උපදවන කොට මේ කුසලය මුල් කරගෙන තව කුසල්වල පහළ වීමක්, උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීමක් නේ සිද්ධ වෙන්නේ. කුසලය මුල් කරගෙන අකුසල්වල පහළ වීමක් නේ මේ සිද්ධ වෙලා තියෙන්නේ. කුසලය මුල් කරගෙන ඒ උපනිඃශ්‍රය භාවයෙන් යෙදීම විදියට නේද මේ අව්‍යාකෘතයන්ගේ පහළ වීමක් වෙලා තියෙන්නේ. අපිට ඒ ඒ අවස්ථාවන් දකින්න පුළුවන්කම තියෙනව මේ හේතුඵල දර්ශනයට තුළට බහාලා ඒ තුළට දාලා අපිට මේ සත්ත්ව පුද්ගලභාවය දුරු වෙන විදියට යෝනිසෝමනසිකාරය පවත්වන්න ඒ දැනුම උපකාර කෙරෙනව.

ඒ වගේම තමයි තමන්ගේ සිත තමන්ට අවැසි පරිදි පාලනයකට නතු කරගන්නට පුළුවන්කමත් තියෙනව. ඇයි? මේ ඵලය

උපදින්නේ, නැතිනම් මේ දේ උපදින්නේ මේ ප්‍රත්‍යය ශක්තිය ලැබ ගෙනනේ. දැන් එක දේක රාග වශයෙන් බැඳෙන කොට එය උපනිඃශ්‍රය වීම තුළ තව රාග වශයෙන් උපදින සිත්වලට ඒක උපකාරවත් වෙලා තියෙනව. එහෙනම් ඔබ මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි ලැබීම සිඳින්නට ඕනේ. උපනිස්සය ප්‍රත්‍යය සිඳින්නට ඕනේ. උපනිස්සය ප්‍රත්‍යය සින්දහම තමයි ඒක අර නැවත නැවත ඒ පැත්තට සිත් පරම්පරාවන් ඉපදමින් යන එක නතර කරන්න පුළුවන්කම තියෙන්නේ.

ඉතින් අන්න ඒ විදියට අපිට අපේ හිත දියුණු කරන්න ඕනේ විදිය, අපේ සිතට අනුව අපිට වැඩ කරන්න ඕනේ විදිය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඉතින් ඒ නිසා ඒ සඳහා ඔබේ මනස භාවිත කරන්න. ඒ සඳහා ඔබේ මනස නැවත නැවත යොමු කරන්න. අප්‍රමාදී වන්නට කියල ඔබ හැම දෙනාටම බොහෝම කරුණා මෛත්‍රියෙන් යුක්තව සිහිපත් කරනව.

**සාදු සාදු සාදු**

# 06.04.2024 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසි හත්වෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සුදානම් වන මොහොත.

ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඒ උතුම් ශ්‍රද්ධර්ම සාගරයෙන් ස්වල්පයක් නමුත් ශ්‍රවණය කරගන්නටයි ඔබ හැම දෙනාම මේ මොහොතෙදි සූදානම්ව සිටින්නේ.

අභිධර්ම පිටකයෙහි පට්ඨානප්‍රකරණයෙහි දැක්වෙන සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳවයි ප්‍රධාන වශයෙන්ම මේ දේශනා මාලව තුළදි අපි හඳුනාගන්නට උත්සාහවත් වෙන්නේ.

එහිදී අපි මීට පෙරාතුව උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව හඳුනාගන්නට යෙදුනා. උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව තේරුම් ගැනීමේදී ඉන් පසුව මාතිකාවන්ට අනුරූපීව අපි පළමු කුසල ත්‍රිකයට අනුව නේ බෙදා දක්ව ගන්නේ. ඒ අනුව කුසලා ධම්මා - අකුසලා ධම්මා - අව්‍යාකතා ධම්මා කියන මේ ධර්මයන්ගෙන් අපි කුසලා ධම්මා කියන දේ මුල් කරගෙන කුසලයක් කොහොමද තව කුසලයකට - අකුසලයකට - අව්‍යාකෘතයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කියන එක පිළිබඳව අවසාන වශයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කරන්නට යෙදුනා.

ඉන් අනතුරුව අකුසලය පිළිබඳව හඳුනාගන්නට ඇවිල්ල අකුසලයක් කොහොමද තවත් අකුසලයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කියන එක පිළිබඳවයි අවසාන වශයෙන් අපි සාකච්ඡා කරමින් පසු වුණේ. ඒ අනුව අපි අකුසලයක් අකුසලයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීමේදී අපි කොටස් තුනකින් එය හඳුනාගන්නට යෙදුනා. ඒ තමයි ආරම්මණ උපනිස්සය - අනන්තර උපනිස්සය - පකතූ උපනිස්සය කියන මේ තුන් ආකාරයකට මේ අකුසලයක් අකුසලයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම කියන මාතෘකාව යටතේ අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

එතකොට අකුසලයක් අකුසලයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව ආරම්මණ උපනිස්සය වශයෙන්. ඒක කොහොමද ආරම්මණ උපනිස්සය වශයෙන් සිද්ධ වන්නේ? අකුසලයක් අරමුණු කරගෙන ඒක නැවත  අභිනන්‍දනය ආදී සිද්ධ කරනව නම් අන්න එබඳු අවස්ථාවල අපි දැක්කා එතනදි ආරම්මණ උපනිස්සය වශයෙන් තමයි උපනිඃශ්‍රය වුණේ.

ඔබ යම්කිසි විදියකට තෘෂ්ණා සහිත සිතකින් යම් දේකට බැඳීමක් ඇතිකර ගන්නව නම් එය නැවත ආස්වාදනය කරනව නම් අන්න ඒ තැනකදි ඔබේ අරමුණ බවට පත්වුණේ අර රාග සහිත බව. ඒක තමයි නැවත ඇලීම් සහිත සිතකින් පරිකල්පනය කරන්නට යෙදුනේ. දැන් ඔබ යම්කිසි විදියකින් යම් රූපයක් දැක්කහම ඔබට ඒ පිළිබඳව සිතේ කැමැත්තක් උපදිනව. ඔබ නැවත වතාවක් අර කැමැත්ත ඉපදුන රූපය පිළිබඳව නැවත පසු අවස්ථාවකදි නැවත කල්පනා කරනව, ඒ කැමැත්ත ඇතිකර ගත්ත අවස්ථාව පිළිබඳව. **එතකොට අන්න ඒ රාගය මුල් කරගෙන නැවත එය අරමුණු කරමින් රාගය උපද්දවල තියෙනව.** රාග සහිත සිතක් උපද්දවල තියෙනව. ඒ රාග සහිත සිත පසුව ඉපදුනු ධර්මය උපදවන්නට ආරම්මණය බවට  පත්වුණේ අර ඊට පෙරාතුව ඉපදුන ඇලීම කියන දේ - රාගය කියන දේ තමයි

ඒකට මූලික හේතුව බවට පත්වුණේ. ඒ රාගය ඇසුරු කරගෙන නැවත රාගය උපදවනව කියන එකේදී ඒකේ ආස්වාදනය පිළිබඳව හිත මෙහෙවනව කියන අවස්ථාවලදී සිද්ධ වන්නේ අන්න එලෙසකට ආරම්මණ උපනිස්සය වශයෙන් ඇතිවීම.

ඒ නිසා තමයි **රාගං - ගරුං කත්වා අස්සාදෙති. අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති. දිට්ඨි උප්පජ්ජති** ආදී ලෙස සඳහන් කරන්නට යෙදුනේ. යම්කිසි තැනක රාගය ගරු කරගෙන ආස්වාදනය කරනව. ඒක මුල් කරගෙන තමන් හිතෙන් දැඩි ලෙස ආස්වාදජනක නැතිනම් සැපවත්ව කල්පනා කරනව. ඒක අභිනන්දනය කරනව. ඊට පස්සේ ඒක ගරු කරගෙන පස්සෙත් ආපහු කල්පනා කරනව. අර දැකපු දෙයක් පිළිබඳව ඔබේ හිතේ ආසාවක් උපදිනව. ආපහු ගෙදර ඇවිල්ල පැත්තකට වෙලා ඉන්න කොට ඔබ ඒ දැකපු දේ පිළිබඳව නැවත සිතෙන් කල්පනා කරන අවස්ථාවක් ගන්නකෝ. ඒ මොකද්ද ඒ වෙලාවට සිද්ධ වෙන්නේ? අර මුලින් ගත්ත රාග සහිත අරමුණ තමයි දැන් ගෙදර ඇවිල්ල පැත්තකට වෙලා ඉඳගෙන නැවත කල්පනා කරන්නේ. 00 04 55

**ඒ අවස්ථාවෙදි ක්‍රියාත්මක වෙලා තියෙන්නේ මොකද්ද ප්‍රත්‍යය? උපනිස්සය ප්‍රත්‍යයතාවය තමයි ඒ ක්‍රියාත්මක වෙලා තියෙන්නේ ආරම්මණ උපනිස්සය වශයෙන්. එතකොට ඒ ධර්මය අපිට ඉවත් කරන්නට නම් ඒ උපනිස්සය ප්‍රත්‍යයතාවය ඉවත් කිරීම තුළ අපිට ඒ ප්‍රත්‍යයොත්පන්නය නැති කරන්න පුළුවන්කම තියෙනව.** රාගය දුරු කිරීම සඳහා මොකද්ද කරන්නට තියෙන්නේ? අර මුල ඉපදුන අරමුණු කිරීම කියන එක, ආරම්මණ උපනිස්සය භාවයෙන් ප්‍රත්‍යය වීම කියන එක පසුව උපදින ධර්මයට, අපිට දුරු කරගන්නට පුළුවන් නම් අර මූල හේතුව නැති කරගන්නට පුළුවන් නම් ඒ පසුව උපදින එක අපිට එලෙස නූපදින ස්වභාවයක පත්කරන්නට පුළුවන්කම තියෙනව.

කෙසේ වෙතත් ආරම්මණ උපනිස්සය කියන එක මම හිතනව පැහැදිලි ඇති කියල. අන්න ඒ විදියට රාගය ගරු කරගෙන හිතමින් නැවත නැවත රාගය උපදව ගන්න කොට ඒ පිළිබඳව හිතෙන් හැසිරීම සිද්ධ කරන කොට ඒ තැනකදි ක්‍රියාත්මක වන්නේ මේ උපනිස්සය ප්‍රත්‍යය. **ඒකට ආරම්මණ උපනිස්සය කියල කියනව.**

දිට්ඨියත් ඒ විදියටම තමයි. යම්කිසි තැනකදි තමන්ට යම් වරදවා ගත්ත දෘෂ්ටියක් උපදිනව. **අභිනිවෙශ පරාමාසො.** ඒ කියන්නේ දැඩිව ග්‍රහණය කරගත්තා වූ දෘෂ්ටියක් ඇතිවෙනව. ඉන් පසුව සෑම පරිකල්පනයක්ම, තමන් ගිහිල්ල නැවත කල්පනා කරන හැම දෙයක්ම අර දෘෂ්ටියට අනුගතව තමයි සිද්ධ කරන්නේ. තමන් ඊට පස්සේ හිතනව. කල්පනා කරනව. නොයෙක් නොයෙක් ආකාරයට හැසිරෙනව.

ඒ හැම අවස්ථාවකදිම ඒ දේ සිද්ධ කරන්නේ මොන විදියටද? ඒ දේ සිද්ධ කරන්නේ එලෙසකට පවත්වා ගෙන යන්නේ ඒ මුලින් ඉපදුනු දිට්ඨිය - පස්සේ ඉපදුන දිට්ඨි සහිත භාවයට ආරම්මණ උපනිස්සය වශයෙන් උපනිඃශ්‍රය වෙලා තියෙනව. ඒ මුලින් ඇතිකර ගත්තා වූ දෘෂ්ටිය තමයි අරමුණු කරමින් පසු පසු වූ දෘෂ්ටීන් නැවත නැවත උපදවන්නට කටයුතු කෙරෙන්නේ. ඒක තමයි උපනිස්සය ප්‍රත්‍යයේ යෙදීම බවට පත් වන්නේ.

ඉතින් මෙන්න මේ විදියට ආරම්මණ උපනිස්සය භාවයෙහි මේ ධර්මය ක්‍රියාත්මක වෙනව වගේම අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව අනන්තරූපනිස්සය භාවයෙහිදිත් මේ ධර්මයෙහි ක්‍රියාකාරිත්වයක් තියෙනව. අනන්තරූපනිස්සය කියල කියන්නේ යම් ධර්මයකට අනතුරුව උපදින අනිත් ධර්මයන්ට, පෙරාතුව ඉපදුනු ධර්මයන්ගේ ප්‍රත්‍යය වීම අපි අනන්තරූපනිස්සය කියල කියනව. න අන්තර, අනන්තර. අනන්තර ප්‍රත්‍යය පිළිබඳව අපි මීට පෙරාතුව යම් හඳුනා

ගැනීමක් කරගන්නට යෙදුනා. ඒ අනුව අනන්තර ප්‍රත්‍යය පිළිබඳව අපි සලකන කොට මේ අනන්තරූපනිස්සය කියල කියන්නේ ඊට අනතුරුවම උපදින ධර්මය උපදවන්නට ඊට පෙරාතුව ධර්මය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වෙනව. ඒකට තමයි අනන්තර ප්‍රත්‍යය කියල කියන්නේ.

ඒ මොන වගේ අවස්ථාවලදී ද මේ අනන්තර ප්‍රත්‍යය කියන එක යෙදෙන්නේ? **පුරිමා පුරිමා අකුසලාඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.** පෙර පෙර වූ අකුසල ස්කන්ධයෝ පසු පසු වූ අකුසල ස්කන්ධයන් උපදවන්නට අනන්තර උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරනු ලබනවා. එතකොට ඒ අවස්ථාවෙදි අනන්තරූපනිස්සය තමයි  ප්‍රත්‍යය වීම සිද්ධ වෙන්නේ. අනන්තරූපනිස්සය කියල කියන කොට මේ පළමු සම්පාදනය කල අකුසලය ඊට පස්සේ ඉපදුනු අනිත් අකුසල් සිතට ප්‍රත්‍යය වෙනව.

දැන් අපි ගත්තහම අකුසල වීථියක ජවන් සිත් හතක් උපදින කොට ඒ ජවනයන් හත දිහා බැලුවහම පළමු ජවනය දෙවෙනි ජවන සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දෙවෙනි ජවන සිත තෙවනි ජවන සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. තුන, සතර වෙනි ජවන් සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මේ ආදී ලෙස අනන්තර ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යය භාවය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. මේ උපනිඃශ්‍රය භාවයනුත් ප්‍රත්‍යය වෙන කොට මේ අනන්තර ප්‍රත්‍යයතාවයෙන්, පෙර වූ අකුසල සිතක් ඊළඟ වූ අකුසල සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු වන බව අපිට දකින්නට පුළුවන්කම තියෙනව.

ඒ කියන්නේ මුලින් හටගත්ත අකුසල ජවනය දෙවනියට උපදින අකුසල ජවනයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. දෙවනියට ඉපදුනු අකුසල ජවනය තෙවනියට ඉපදුනු

අකුසල ජවනයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. එතකොට මේ ජවන ආදී වශයෙන් උපදින පළමු ජවනයෙහි පටන් අර හයවෙනි ජවනය දක්වා ඒ සියල්ලක්ම ප්‍රත්‍යය බවට පත්වෙනව. ප්‍රත්‍යයෝත්පන්නයට ඒ දෙවෙනි ජවනයේ ඉඳලා සත්වෙනි ජවනය වෙනකම් පත්වෙනව. එය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව අනන්තර උපනිස්සයෙන් දෙවෙනි ජවනය උපදවන්නට. දෙවෙනි ජවනය අනන්තර උපනිස්සය ප්‍රත්‍යයෙන් තුන්වෙනි ජවනය උපදවන්නට ප්‍රත්‍යය වෙනව. තුන, හතර උපදවන්නට. හතර, පස්වෙනි සිත උපදවන්නට. පස්වෙනි සිත, හය උපදවන්නට. හයවෙනි සිත හත්වෙනි සිත උපදවන්නට.

එතකොට පළමු එක පච්චය. මෙතන යෙදෙන අනන්තර ප්‍රත්‍යය කියන එක, ඒකට අදාළව යෙදෙන්නේ නෑ. එතනට අදාළව අනන්තර ප්‍රත්‍යයත් යෙදෙනව. ඒකම වෙනම කතා කරන දෙයක්. හැබැයි අකුසලය තවත් අකුසලයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන අවස්ථාවට අපි අනන්තර ප්‍රත්‍යය යොදල ගත්තහම, එතනදි පළමු ජවනය දෙවෙනි ජවනයට අනන්තර ප්‍රත්‍යය සහ උපනිස්සය ප්‍රත්‍යය කියන මේ දෙකම එකතු වෙලා අනන්තරූපනිස්සය කියන ප්‍රත්‍යය භාවයෙන් තමයි ප්‍රත්‍යය වීම සිදු කරනු ලබන්නේ.

එතකොට පළමු සිත ප්‍රත්‍යය. දෙවෙනි සිත ප්‍රත්‍යයයුත්පන්නය. දෙවෙනි සිත ප්‍රත්‍යය. තුන්වෙනි සිත ප්‍රත්‍යයයුත්පන්නය. තුන්වෙනි සිත ප්‍රත්‍යය. සතරවෙනි සිත ප්‍රත්‍යයයුත්පන්නය. ප්‍රත්‍යයයුත්පන්නය කියල කියන්නේ ප්‍රත්‍යයෙන් හටගත්ත දේ කියල කියන එක. මේ විදියට හයවෙනි සිත ප්‍රත්‍යය. හත්වෙනි සිත ප්‍රත්‍යයයුත්පන්නය. ඒ විදියට ගත්තහම ප්‍රත්‍යය භාවයට පත්වෙනව පළමු සිතේ ඉඳල හයවෙනි සිත වෙනකම්. ප්‍රත්‍යයයුත්පන්නය බවට පත්වෙනව දෙවෙනි සිතේ ඉඳල සත්වෙනි සිත දක්වා ප්‍රත්‍යයයුත්පන්නය විදියට අපිට

හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. මේ විදියට පච්චය සහ පච්චයුප්පන්න කියන ධර්මයන් අපිට දකින්නට පුළුවන්.

අනන්තරූපනිස්සය කියන එක තමයි මෙතනදි ප්‍රධාන වශයෙන්ම සාකච්ඡාවට බඳුන් කෙරෙන දේ බවට පත්වෙන්නේ. අනන්තරූපනිස්සය කියන එක. අනන්තර සහ උපනිස්සය කියන මේ ප්‍රත්‍යය භාවයන් දෙකේම එකතුවක් හැටියට අපිට මේක හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. එතකොට මේ තමයි අනන්තරූපනිස්සය කියල කියන්නේ.

## *පකතූපනිස්සය*

ඒ වගේම අකුසලයක් අකුසලයක් උපදවන්නට ප්‍රත්‍යය වෙනව. ඒ ප්‍රත්‍යය වීම සිද්ධ වන්නේ පකතූපනිස්සය වශයෙනුත් ප්‍රත්‍යය වීම. දැන් අපි ඉස්සෙල්ල කතා කලා ආරම්මණ උපනිස්සය. ඊට පස්සේ හඳුනාගත්තා අනන්තරූපනිස්සය. ඒ වගේම පකතූපනිස්සය වශයෙනුත් උපනිඃශ්‍රය භාව වශයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. යම්කිසි ධර්මයක් අනිකුත් ධර්මය උපදවන්නට ප්‍රත්‍යය වීම විදියට.

***මොකද්ද මේ පකතූපනිස්සය කියල කියන්නේ?***

රාගං උපනිස්සාය - ***පාණං හණති, අදින්නං ආදියති, මුසා භණති, පිසුණං භණති, ඵරුසං භණති, සම්ඵං පලපති, සන්ධිං ඡින්දති. නිල්ලොපං හරති. එකාගාරිකං කරොති. පරිපන්ථෙ තිට්ඨති, පරදාරං ගච්ඡති, ගාමඝාතකං කරොති. නිගමඝාතකං කරොති, මාතරං ජීවිතා වොරොපෙති, පිතරං ජීවිතා වොරොපෙති, අරහන්තං ජීවිතා වොරොපෙති, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙති. සංඝං භින්දති.***

මෙන්න මේ ආදී ලෙස දක්වනව විග්‍රහ කරනව ඒ පකතූපනිස්සය වශයෙන් සිද්ධ වන්නේ කොහොමද කියන එක. ඒ කියන්නේ **රාගං උපනිස්සාය,** රාගයක් ඇසුරු කරගෙන රාගයක් නිඃශ්‍රිත කරගෙන උපනිඃශ්‍රය කරගෙන **පාණං හණති,** ප්‍රාණීන් නසනව. **අදින්නං ආදියති,** නොදුන්නා වූ දේ ගන්නව. **මුසා හණති,** බොරු කියනව. ඒ වගේම පිසුණාවාචා. පිසුණු බස් ප්‍රකාශ කරනව බිඳීමේ අදහස් ඇතුව. **ඵරුසං හණති,** බොහොම රළු වචන, අනුන්ගේ සිත් රිදවන වචන භාවිත කරනව. **සම්ඵං පලපති,** හිස් වචන කතා කරනව. ඒ වගේම හොරකම් කිරීම සඳහා අවශ්‍ය ඒ ගෙවල් බිඳ සොරකම් කිරීම ආදී දේවල් සිද්ධ කරනව. එතකොට මෙන්න මේ ආදී ලෙස වැරදි ගණනාවක් මං පැහැර ගැනීම, මං කොල්ල කෑම්,  ගම් වශයෙන් මං කොල්ල කෑම්, ගෙවල් මං කොල්ල කෑම් මේ ආදී නොයෙක් අකුසල දක්වනව මේ විදියට රාගය මුල් කරගෙන සිද්ධ කරන දේවල් හැටියට.

එතකොට මේ පකතූපනිස්සය කියන එක අපි මීට පෙරාතුව හඳුනාගෙන තියෙනව උපනිස්සය ප්‍රත්‍යය හඳුනා ගැනීමේදී. දැන් අපිට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව මේක අර සාමාන්‍යයෙන් යෙදෙන යෙදීමට වඩා ඊට වඩා ටිකක් වෙනස්ව තමයි මේ පකතූපනිස්සය කියන එක අපිට මෙතනදි දකින්නට පුළුවන්කම තියෙන්නේ. ඒ කියන්නේ අර අනන්තරූපනිස්සය සහ ආරම්මණූපනිස්සයේදී අපි දැකපු ස්වභාවයට වඩා පකතූපනිස්සයෙහි තියෙන ස්වභාවය වෙනස්. මේක යම්කිසි කර්තව්‍යක් සඳහා අවශ්‍ය භූමිකාව සකස් කිරීම් විදියට, භූමිය ඉඩ සැලසීම් විදියට තමයි මේ පකතූපනිස්සයෙහි භාවිතය සිද්ධ වන්නේ.

එතකොට දැන් බලන්න මෙතනදි දැන් අපි දන්නව කෙනකු සත්ත්ව ඝාතනයක් සිද්ධ කරනව නම් සත්ත්ව ඝාතනය සිද්ධ කිරීම සඳහා ඔහුට බලපාන්නේ ඒ සඳහා උපනිඃශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වන්නේ ඒ සත්ත්ව ඝාතනය සිද්ධ කරන මොහොතේ

උපදින ද්වේෂ සහගත සිත තමයි ඒකට හේතුව බවට පත්වන්නේ. ද්වේෂ සිතකින් තමයි සමුට්ඨානය වෙන්නේ සත්ත්ව ඝාතනය කියන එක. එතකොට **පාණං හණති** කියන එක, ප්‍රාණය නසනව කියන එක සිද්ධ වෙන්නේ ද්වේෂ මූලික සිතකින්. හැබැයි මෙතනදි දක්වනව **රාගං උපනිස්සාය - පාණං හණති** කියල. රාගය උපනිස්සය කරගෙන ප්‍රාණය නසනව කියන එක.

**එහෙනම් ද්වේෂ සිතකින් නම් සත්ත්ව ඝාතනය කරන්නේ, තව කෙනෙක්ගේ පණ නසන්නේ ද්වේෂ සිතකින් නම් ඇයි මෙතනදි රාගං උපනිස්සාය - පාණං හණති කියල කිව්වේ. රාගය ඇසුරු කරගෙන පණ නසනව කියන මේ වචනය කිව්වේ ඇයි? මොකද්ද රාගය අසුරු කරගෙන පණ නැසීම බවට පත්වන්නේ? රාගය ඇසුරු කරගෙන පණ නසනව කියල කිව්වේ වෙන දේකට නෙමෙයි. යම්කිසි විදියකින් හිතේ තියෙන කැමැත්ත මූලික පදනම, මූලික පසුබිම වෙනවා. හැබැයි සත්ත්ව ඝාතනය සිද්ධ වෙන්නේ ඒක සමුට්ඨානය වෙන්නේ, ඒක** ව්‍යතික්‍රමණයකට ***(යටපත්ව තිබී නැග ආවා වූ කාමරාගය ක්‍රියාවට නැගීම)*** **ලක් වෙන්නේ ද්වේෂ සිතකින්. ඒක වෙනස් වෙන්නේ නෑ.** හැබැයි ඒ ද්වේෂ සහිත සිත උපදින්නටත් අවකාශය සලසන්නේ, උපනිඃශ්‍රය භාවය සකස් කරල තියෙන්නේ වෙනත් දෙයක් නෙමෙයි. ඒ උපනිඃශ්‍රය භාවය සකස් කරල තියෙන එකම ධර්මය තමයි එතන යෙදෙන්නා වූ මේ ***රාගය කියන එක.*** රාගං **උපනිස්සාය** කියල කිව්වේ අන්න ඒ හේතුව නිසා. **රාගං උපනිස්සාය - පාණං හණති**, රාගය ඇසුරු කරගෙන තමයි ඒ පණ නැසීම සිද්ධ කරන්නේ.

ඒ කියන්නේ දැන් උදාහරණයක් විදියට මෙහෙම ගන්නකෝ. කෙනෙක් ඉන්නව, ඔහු මස් මාංශ පිළිබඳව බොහොම අභිරුචියක් දක්වන පුද්ගලයෙක්. එයා මස් කන්න හරි ලෝභයි. එතකොට සමහර පුද්ගලයෝ එහෙම ඉන්නව නේ. ඔහුන්ට මස්

නැතුව කෑම කන්න බෑ. ඒ වගේ එක එක මට්ටම් වලට හුරු වුණ මිනිස්සු ඉන්නව. එතකොට මේ වගේ මනුස්සයෙක් ගැන මොහොතකට හිතන්නකෝ. දැන් මේ කෙනා බොහොම අහරුචියි, බොහොම කැමැතියි මාංශ අනුභවය පිළිබඳව. එතකොට දැන් මාංශ අනුභවය පිළිබඳව කැමති මේ මනුස්සය සතුන් මරාගෙන කනව සතාගේ මස්වලට තියෙන ලෝභය නිසා. එතකොට මස් වලට තියෙන ලෝභය, ඒකට අපි කියනව රාගය කියල. ඒ ලෝභය කියන දේ ඒක උපනිස්සාය. උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව සතාගේ මැරීමට.

හැබැයි මරනව කියන  දේ සිද්ධ වෙන්නේ ලෝභයෙන් නෙමෙයි. ඒක සිද්ධ වෙන්නේ ද්වේෂයෙන්. මොකද? තමන්ට අර මාංශය ලබා ගන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ සතාගේ ජීවිතය තියෙනව නම්. ඒ නිසා ඒකට ගැටීමක් ඇතිවෙනව. පටිඝ සහිත සිතකින් තමයි ඒක සමුට්ඨානය වෙන්නේ. ඒ නිසා ඒ සතා වේදනාවට පත්වුණත් ඔහු ඝාතනය කිරීම සඳහා ඔහුගේ සිත නැඹුරු වීම සිද්ධ වෙනව. ඒ සිතේ යෙදෙන්නේ පටිඝ සහිත භාවය. ඒ නිසා සත්ත්ව ඝාතනය කියන එක අනිවාරයෙන්ම ද්වේෂ මූල සිතකින්ම තමයි සමුට්ඨානය වෙන්නේ.

මේ කර්ම පථය සකස් වෙන්නේ ද්වේශ මූල සිතකින් නම් ඇයි මෙතන උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ? උපනිඃශ්‍රය කියන එකේදී මේ පකතූපනිස්සය කියල කියන්නේ අරමුණ කරගෙන අරමුණ විදියට පත්වෙන දේ හෝ එතන යෙදෙන හේතුව කියන එක නෙමෙයි. එබඳු වූ ද්වේෂ සහිත සිතකින් කරන සත්ත්ව ඝාතනයක් සිද්ධ වන්න හේතුව බවට පත්වුණේ ඔහු සන්තකව තිබුණු ඔහුගේ සිතේ පැවතියා වූ දැඩි මාංශ ලෝභය කියන එක තමයි ඒකට හේතුව බවට පත්වුණේ. ඉතින් මාංශ ලෝභය තමයි අන්තිමේටම ගිහිල්ල හේතුවක් බවට පත්වෙන්නේ. ප්‍රත්‍යයක් බවට පත්වන්නේ අර කියපු අකුසලය, කර්ම පථය සකස් කිරීම සඳහා මූලික වශයෙන්ම ප්‍රත්‍යය භාවයට පත්වෙලා තියෙන්නේ.

ඒ නිසා මේ කියපු කාරණාව අපිට මෙතනදි වඩාත් තේරුම් ගැනීම පුළුවන්කම තියෙනව ඉතාමත් හොඳින්. ***මේ පකතුපනිස්සයෙහි භාවිතය මෙතනදි සිද්ධ වන්නේ ඒකට භූමිකාව සකස් කිරීම විදියට.***

සමහර වෙලාවට ඒ විදියට සතුන් මරනව විතරක් නෙමෙයි හොරකම් කරනවා. හොරකම් කරන එක ලෝභ සහිත සිතකින් වෙන්නත් පුළුවන්. ඒක ද්වේෂ සහිත මෝහ සහිත සිතකින් වෙන්නත් පුළුවන්. හැබැයි ඒ හොරකම් කිරීම කියන එක ඒ වෙලාවෙදි කරන්නේ ලෝභ සහිත සිතකින් වුණත්, ද්වේෂ සහිත සිතකින් වුණත් ඒක කරන්නට මූලික වෙන්නේ රාගය උපනිඃශ්‍රය කරගෙන. ඒකට කැමැත්ත තියෙනව. කෙනකු නිසා කෙනකු ගැන තරහෙන් කෙනකු සන්තක දේ ඉවත් කරන්න පුළුවන්නේ අපිට ගිහිල්ල. කෙනකු සන්තක දේ තරහෙන් ඉවත් කරන්නට පුළුවන්. ආසාව නිසාම ඔහු ඒ දෙය ග්‍රහණය කරගන්න පුළුවන්කමත් තියෙනව. ඔය මොන අවස්ථාව වුණත් ඒ දේ සිද්ධ කිරීමේදී ආසාව කියන දේම මුල් වෙන්නට පුළුවන්කම තියෙනව. ඒකෙදි එතන ඉපදෙන ධර්මය හැටියට නෙමෙයි, ඒක ඊට පෙරාතුව ඒ අකුසලය සකස් කිරීම සඳහා කර්ම පථය නැතිනම් ඒ ක්‍රියාව සිද්ධ කරන්න ඒ භූමිය සකස් කරල තියෙන්නේ වෙනත් දෙයක් නිසා නෙමෙයි. අර රාගය කියන දේ මුල් කරගෙන තමයි.

එතකොට මේ විදියට දැන් එරුසාවාචා කතා කිරීම ද්වේෂ මූල සිතකින් වෙන්න පුළුවන්කම තියෙනව. හැබැයි එයා ඒ කතා කරන එරුසාවාචාව කතා කරන්නේ සමහර වෙලාවට රාගය සමුට්ඨානය කරගෙන. රාගය කියන්නේ දෙයක් පිළිබඳව තියෙන දැඩි බැඳීම. දැඩි ඇලීම කියන දේ මුල් කරගෙන. ඒක රැක ගන්න හරි ඒ මට්ටමකට ගිහිල්ල හරි වෙන්න පුළුවන්. එතකොට මේ ආකාරයට බැලුවහම එතන ද්වේෂ මූල සිතකින් ඒක ඉපදෙව්වට ඒ ද්වේෂය දුවන්නට නැතිනම් ඒ ද්වේෂය ක්‍රියාත්මක වෙන්න

හේතුව බවට පත්වෙලා තියෙන්නේ රාගය. මේ විදියට මානය දිට්ඨිය මේ වගේ අකුසල් මූලික කරගෙන තව අකුසලයක් උපදිනව. ඒ අවස්ථාවෙදි ඒ සිද්ධ වෙලා තියෙන්නේ උපනිස්සය ප්‍රත්‍යය ප්‍රත්‍යය වීම. දැන් බලන්න මෙතනදි උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ අර අනන්තරූපනිස්සය කියන එකට වඩා වෙනස්. ආරම්මණූපනිස්සයට කියන එකට වඩා වෙනස්. මෙතන උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ අර මුලු භූමියම සකස් කරපු දෙයක් හැටියට.

දැන් උදාහරණයක් හැටියට අපි නිතර සිහි කරනව දැන් පටිච්චසමුප්පාදය පිළිබඳව කතා කරන කොට අවිජ්ජා පච්චයා සංඛාරා කියල අවිද්‍යාවෙන් සංස්කාර උපදවනව කියල. එතකොට අවිද්‍යාවෙන් සංස්කාර ධර්ම උපදවනවා කියල කිව්වහම ඒ පුඤ්ඤාභිසංඛාර - අපුඤ්ඤාභිසංඛාර - ආනෙඤ්ජාභිසංඛාර කියන මේ සංස්කාරයෝ උපදිනව. ඒ පුඤ්ඤාභිසංඛාර වුණත් අපුඤ්ඤාභිසංඛාර වුණත් ආනෙඤ්ජ සහගත සංස්කාර ධර්ම වුණත් ඒ හැම එකකටම උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව අවිද්‍යාව කියන එක. උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. අකුසලයකදි සම්ප්‍රයුක්ත වෙනවා. තව තැනකදි ඒක විප්‍රයුක්තව නමුත් උපනිස්සය භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. එතන යෙදිල නැතුව නමුත් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. ඉතින් මෙන්න මේ ආකාරයට අපිට මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදෙන මේ සංකීර්ණ ස්වභාවය පිළිබඳව තේරුම් ගැනීම කියන එක ඉතාම වැදගත් වෙනව.

ඊට පස්සේ මේ අකුසලයන් උපදවන සිත් මොකක් වුණත් මේ අකුසලයන් උපදවන්නට අකුසල් සහිත සිත ජනනය කරන්නට හේතු වෙන්නේ අර මූලික වෙන භූමිය. ඒක උපනිස්සය ප්‍රත්‍යය තේරුම් ගැනීමේදී ඉතාම වැදගත්.

ඒ වගේම **දොසං, මොහං, මානං, දිට්ඨිං, පත්‍ථනං උපනිස්සාය පාණං හණති,** ***අදින්නං ආදියති, මුසා භණති, පිසුණං භණති, ඵරුසං භණති, සම්ඵං පලපති, සන්ධිං ඡින්දති. නිල්ලොපං හරති. එකාගාරිකං කරොති. පරිපන්ථෙ තිට්ඨති, පරදාරං ගච්ඡති, ගාමඝාතකං කරොති. නිගමඝාතකං කරොති, මාතරං ජීවිතා වොරොපෙති, පිතරං ජීවිතා වොරොපෙති, අරහන්තං ජීවිතා වොරොපෙති, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙති.*** **සංඝං භින්දති.**

මේ විදියටම ද්වේෂය නිසා යම්කිසි කෙනෙක් සත්තු මරනවා. මෝහය නිසා සත්තු මරනවා. මානය නිසා සත්තු මරනවා. දිට්ඨිය නිසා සත්තු මරනවා. තමන්ගේ ප්‍රාර්ථනාව මුල් කරගෙන සත්තු මරනවා. මේ විදියට හොරකම් කරනවා. අර කියපු ආකාරයේ නොයෙක් අකුසල් කර්ම පථ සකස් කිරීම සිද්ධ කරනවා. ඉතින් මේ කාරණා මොනවද, මේ කියන අකුසල් මොනවද කියන එක මම එකින් එක එකින් එක වෙන වෙනම විස්තර කරන්නට යන්නේ නැහැ. ඒක ඔබට පරිශීලනය කරගන්නට වඩාත් පහසුවෙන් පුළුවන්කම තියෙනව පට්ඨාන දේශනා සාරය පොත අධ්‍යනය කලොත් එහෙම. වඩා විස්තර සහිතව ඔබට දැන ගන්නට පුළුවන්කම තියෙනව. නමුත් මෙතනදි මේ මූලික කාරණාව පිළිබඳව තමයි අපේ අවධානය අපි යොමු කරන්නට බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා ඒ කාරණාවන් ඔබට වෙනම අධ්‍යනය කරගන්නටත් පුළුවන්කම තියෙනව.

ඉතින් කෙසේ වෙතත් ද්වේෂය - මෝහය - මානය - දිට්ඨිය - ප්‍රාර්ථනාව මේ ආදී තැන්වල මේ උපනිස්සය ප්‍රත්‍යය ප්‍රත්‍යය වෙනව. ඒ කියන්නේ මූලික වන ධර්මයක් හැටියට. එතකොට ඔබ මේව තේරුම් ගැනීමේදී මේ සිත ක්‍රියාත්මක වන ස්වභාවය පිළිබඳව ඔබට මේ ඔස්සේ කරණු කාරණා තේරුම් ගන්නට පුළුවන්කම තියෙන්නේ. වෙන දෙයක් නෙමෙයි. සිත

කොහොමද ක්‍රියාත්මක වෙන්නේ, සිත කොහොමද වැඩ කරන්නේ කියන එක පිළිබඳව මේ කරුණු කාරණා ටික හරියට අධ්‍යනය කරන කොට, මේ කරුණු කාරණාවන් විමසා බලන කොට ඔබට තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව. මේ උපනිස්සය ප්‍රත්‍යය කියන එක ඉතාම වැදගත් මේ සිතෙහි ස්වභාවය පිළිබඳව තේරුම් ගැනීමේදී. මේ පකතූපනිස්සය කියන එක මේක ඉතාම වැදගත් වන දෙයක්. ඔබේ සිත නැවත නැවත එකම විශේෂයක් කරා පවත්වන්නට මේ පකතූපනිස්සය කියන එක ප්‍රධාන වශයෙන්ම බල පවත්වන ධර්මයක්.

දැන් රාගය පැත්තට සිත නැඹුරු කල කෙනකුට වලක්ව ගන්න බෑ නැවත නැවත නැවත නැවත රාග වශයෙන්මයි සිත පහළ වෙන්නේ. මොකද්ද ඒකට හේතුව? ඒ ඒ නැවත නැවත රාග වශයෙන්ම සිත් උපදවනවා, නැවත නැවත රාග වශයෙන්ම සිත් පහළ කරනවා කියන එකේ දී ඒ උපනිස්සය ප්‍රත්‍යය පකතූපනිස්ස වශයෙන් ප්‍රත්‍යය වීම අනිත් ධර්මයන් උපදවන්නට. ඒක තමයි හේතුව බවට පත්වන්නේ. දැන් හිතන්නකෝ ස්කන්ධ පහක් උපදිනව. නිරුද්ධ වෙනව. ***නැවත ඊළඟ ස්කන්ධ පහක් උපදින කොට මේ පළමු ස්කන්ධ පහෙන් මොනව හරි දෙයක් අරකට ගියා එහෙම නෙමෙයි.***

එහෙම මේකේ තිබිල දෙයක් ඒ දේ මාරු වීමක් වුණේ නැහැ අනිකුත් එකට. ව්‍යාපාර ණයක් තිබුණේ නැහැ මේ සිත් අතර. මෙතන ස්කන්ධ පහක් ඉපදුන, ඊළඟට ඒ ස්කන්ධ පහ ඉතුරු නැතුව නිරෝධයට පත්වුණා. හැම ස්කන්ධ පහක් අතරම මොකුත් හුවමාරු වීමක් එහෙම නෑ.

එහෙනම් කොහොමද? දැන් මේ රාග වශයෙන් උපදවනව සිතක්. ඊට පස්සේ උපදින සිතත් රාග වශයෙන් උපදිනව. ඇයි එකම අරමුණකට රාග වශයෙන් නැවත නැවත එහෙම උපදින්න පුළුවන්කම තියෙන්නේ? ඒ විතරක් නෙමෙයි නේ. සිතේ

සාමාන්‍ය ස්වභාවය බලන්න කෝ, අර මම මුලින් කිව්ව වගේ රාගය පැත්තට නැඹුරු කල කෙනකුට දැන් නොයෙක් සිත් උපදිනව. දැන් ගෙදර එක එක වැඩ කරන්න ගියහම ඒ පැත්තටත් සිත් උපදිනව. පන්සලකට ගිහිල්ල වඳින්න ගියත් ඒත් ඒ පැත්තටත් සිත් උපදිනව. හැබැයි එයාගේ හිතේ එයාට රාගය පිළිබඳව තමයි නැවත නැවත වැඩිපුර සිත් පහළ කිරීම් සිද්ධ වෙන්නේ. ආපහු අර කුසලය පැත්තට ගියත් අර රාග සහිත දේ තමයි හිත උපදින ගෙදර බවට පත්වෙල තියෙන්නේ. ආපහු ආපහු රාගය පැත්තට නැඹුරුව තමයි සිත් උපදින්නේ. ද්වේෂය මුල් කර ගත්තහමත් එහෙමයි. නැවත නැවත ද්වේෂය මුල් කරගෙන තමයි සිත් පහළ වෙන්නේ. සිත් උපදින්නේ තරහ මුල් කරගෙන. එතකොට අපිට පේනව හැම වෙලාවකදිම තරහ ගිහිල්ල ඉන්නේ. නිතරම රාගය පැත්තට නැඹුරු වෙලා ඉන්නේ. තමන්ට ඒක දැනෙනව තමන්ට පිඩා කර ධර්මයන් විදියට.

**ඇයි එහෙම සිතකට එහෙම පත්වෙන්නේ? එක හිතකින් තව හිතකට යන දෙයක් නැතුව ඇයි එහෙම දෙයක් වෙන්නේ? දැන් එක වීථියක් ගිහිල්ල කැඩුණ නේ. ඊට පස්සේ කුසල් සිත් සමූහයක් උපදින්නත් පුළුවන්. ආයිත් ඊට පස්සේ ඇයි අර පරණ විදියටම හිත එක ගතියක් විදියට නැඹුරුව යන්නේ. පින්වතුනි ඒ තමයි මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි පකතූපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන ස්වභාවය. එක දෙයක් මුල් කරගෙන නැවත නැවත නැවත නැවත අනිකුත් ධර්ම උපදවනව. ඒ පැත්තට ප්‍රවාහයක් විදියට ඒ පැත්තට නැමෙනව හිත. ඒ පැත්තට බර වෙනව. එතකොට සිත උපදින්නේ ඊට අනුයාතව තමයි.**

යම්කිසි විදියකින් වෙන් වෙන්ව වහින, වෙන් වෙන්ව වැටෙන වැහි බිංදු පොළොවට උරාගෙන, පොළවේ තියෙන නිම්නයන් වලට එකතු වෙලා, ඇළ පාරවල් සකස් වෙලා, දොළවල් බවට පත්වෙලා, ඒවා ගංගා ජල ප්‍රවාහයන් බවට පත්වෙනව වගේ. හරියට වෙන් වෙන්ව පවතින වැහි බිංදු වගේ තමයි සිත්

උපදින්නේ. ඒ වෙන් වෙන්ව සිත ඉපදුනත් මේ වෙන් වෙන්ව උපදනා සිත උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් අනිත් ධර්ම උපදවන්නට අනිත් සිත් උපදවන්නට ප්‍රත්‍යය වීම ඇතුලේ නිරායාශයෙන්ම එයාගේ සිත එක වර්ණයක් අරගෙන තියෙනව. ඒ නිසා තමයි එයා රාග චරිතයක්, එයා ද්වේෂ චරිතයක්, එයා මෝහ චරිතයක්, එයා විතර්ක චරිතයක් මේ ආදි ලෙස අපි ඔහුගේ සිත වර්ගීකරණයට ලක් කරන්නේ සහ එහෙම වර්ගීකරණයට ලක් කරන්න පුළුවන්කම තියෙන්නෙත් ඒ නිසා.

**එහෙනම් අපිට ස්වභාවයෙන්ම කෙනකුට හිත ඕනේ නම් තමන්ගේ භාවය වෙනස් කරගන්න ඕනේ නම් හිත වැඩ කරන විදිය තමන්ට නතර කරගන්න අවශ්‍ය නම්, මොකද්ද කරන්න ඕනේ. එහෙනම් කරන්න අවශ්‍ය වෙන්නේ අන්න ඔය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයයුප්පන්න ධර්ම ඉපදවීම කියන එක අපි අයින් කරන්න ඕනේ. ඒක අයින් කරන්නේ නැතුව බෑ. ඒ නිසා උපනිස්සය ප්‍රත්‍යය කියන එක ක්‍රියාකාරී වීමට හානි පැමිණිවීම තමයි අපිට එතනදි තාක්ෂණික වශයෙන් මේ සිත කරන්නේ. වෙන දේකට වෙනස් කිරීම කියන එක. මේ ක්‍රමය තමයි අපිට අපේ ලෞකික ජීවිතය තුළ වුණත් ඔබට මේ පාවිච්චි කරන්න පුළුවන් බොහොම වටිනා තාක්ෂණික ක්‍රමවේදයක් මේක.**

දැන් සමහර වෙලාවට කෙනකුට ඕන වෙනව යම් සිද්ධියක් අමතක කරන්න. ඒක ඔබට අමතක කරන්න බෑ. ඇයි ඒක ඔබට මතක කරන්න බැරි? උපනිස්සය ප්‍රත්‍යය නිසා. තව සිතක්, තව සිතක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. එතකොට ඒක දෙයකට බරව නැඹුරුව නැවත ඒ උපනිස්සය ප්‍රත්‍යයෙන් අනිත් ධර්ම උපදවන්නට ඒක ප්‍රත්‍යය වෙන්න ගත්තට පස්සේ වෙන මොනවා කරන්න ගියත් ඒකට සිත යොමු කරල ආපහු ඉඩ ලැබුණ ගමන් ගෙදර වගේ සිත එනවා අර මූලික අරමුණට. ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි තියෙන බලවත්කම.

දැන් උපනිස්සය ප්‍රත්‍යය කියන එක අපි වෙනස් කරන්න ඕනේ. ඒක තියෙනකම් අපිට බැහැ ඒ පැත්තට බරව එනව කියන එක නතර කරන්න. එහෙනම් අර තමන්ට ගැටෙන හෝ වේවා දුක හිතන හෝ වේවා තමන්ගේ හිතට පිඩාවක් ඇතිවෙන හෝ වේවා අරමුණ වෙනස් කිරීමට නම් හිත ක්‍රියාත්මක වන ආකාරය ඔබ තේරුම් ගන්නට ඕනේ. එය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම කියන එක තමයි අපි ඉවත් කරගන්නට ඕනේ. එහෙනම් උපනිස්සය ප්‍රත්‍යය කියන එකේදී ඒ නිඃශ්‍රය භාවය ඉවත් කර ගැනීමට අදාළ වන උපක්‍රම පාවිච්චි කිරීම තමයි අපිට ඒක නතර කරගන්න තියෙන ක්‍රමවේදය බවට පත්වන්නේ.

**කෙනකුට දෙයක් අමතක කරන්න බැරි ඇයි? ඒක මතක් වෙන්නේ ඇයි කියල ඇහුවොත්? ඔහු ඒක මතක් කරන නිසා තමයි මතක් වෙන්නේ.** ඒ මනසිකාරය ඔස්සේ යන නිසාම තමයි මතක් වෙන්නේ. යම් වෙලාවකින් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන එක සිඳින්න පටන් ගත්තොත් ටික ටික ටික ටික ඒක නැතිවෙන්න පටන් ගන්නව. ඒ කියන්නේ අපි ඒකට අර **විතක්කසණ්ඨාන සූත්‍ර (බු. ජ. ත්‍රි. මනි (1) පිටු 300)** වගේ සූත්‍ර වගේ ගන්නකෝ. ඒ පකතූපනිස්සයෙන් උපනිඃශ්‍රය වීම තමයි ඒ තැන්වලදි ඒ විවිධ ක්‍රම පාවිච්චි කරල නතර කරල තියෙන්නේ. ඒ කියන්නේ විතර්ක හිතට උපදින කොට ඒව නතර කරන්නේ කොහොමද කියල එතනදි කතා කරනව. **ඇතැම් වෙලාවට ඒ ගැන මෙනෙහි නොකර ඉඳීමෙන් පුළුවන්කම තියෙනව. ඇතැම් වෙලාවකට ඒකේ තියෙන ආදීනව ආදී බලල අපිට පුළුවන්කම තියෙනව නතර කරන්න. විවිධ ක්‍රම අපිට පාවිච්චි කරන්න පුළුවන්කම තියෙනව හිතට එන යම් අරමුණක් නතර කරන්න. දුක් සහිත අරමුණක්. එතකොට අපිට දෙයක් අමතක කරල, දෙයක් අත හැරල දාල හිතෙන් ඒ ඔස්සේ කණගාටුවට පත්නොවී ඉන්න ඕනේ නම් ඒ උපනිස්සය ප්‍රත්‍යය හඳුනාගෙන උපනිස්සය ප්‍රත්‍යය සිඳීම තමයි කරන්නට ඕනේ වෙන්නේ.**

ඒ කියන්නේ නැවත නැවත ඊට අනුයාතව උපදින සිත්වලට අපි දෙන ඉඩකඩ අයින් කරල වෙන අරමුණකට අපි ඉඩකඩ ලබාදීම ඇතුලේ, උපනිස්සය ප්‍රත්‍යය ලබාදීම ඇතුලේ, අපිට පුළුවන් ඒ හිත එකම සිදුවීමක් අරභයා නැවත නැවත සිතමින් කලකිරීමට පත්වෙමින් වේදනාවට පත්වෙමින් තරහට පත්වෙමින් යනව නම් ඒ ක්‍රමය නතර කරන්න පුළුවන්කම තියෙනව. අර උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන දේ වෙනස් කරන්න. ඒක තව දේකට මාරු කරන්න. එතකොට අපිට අරක උපදින කොටම වෙනද දුක හිතෙන හෝ තරහ යන හෝ මොනව හරි අකමැත්ත ඇතිවෙන හෝ අරමුණක් මතක් වෙන කොටම ඒක සලකුණු කරන්න තව හොඳ අරමුණකට යන්න. ප්‍රශ්නයක් ඇති නොවන අරමුණකට. එතකොට අපිට හිත සකස් කරගන්න පුළුවන්කම තියෙනව.

ඉතින් මේ ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව නිවැරදිව තේරුම් ගැනීමේදී අපේ හිත හරි හසුරුවා ගැනීමට අපිට විශාල පහසුවක් සැලසෙනව. අපේ හිතේ ඉතාම ඉක්මනට අපිට අවශ්‍ය පරිදි ක්‍රියාත්මක කරගන්න පුළුවන් ආකාරයට මේ සිත සකස් කරගන්නට ඒ ඔස්සේ අපිට පුළුවන්කම ලැබෙනව. ඉතින් ඒක මේ ධර්මය තේරුම් ගැනීමේදී අපි ලබන විශේෂ දෙයක්. විශේෂ ලක්ෂණයක් හැටියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඉතින් මෙන්න මේ විදියට යම්කිසි විදියකින් ඒ සිතක උපදින්නා වූ ද්වේෂය - මෝහය - මානය - දිට්ඨිය - ප්‍රාර්ථනා ආදී ධර්මයන් මුල් කරගෙන උපනිස්සය ප්‍රත්‍යයෙන් නැවත ඒ ධර්මයන්ගේ ඉපදවීම සිද්ධ කරනව. අර අකුසල් සිද්ධ කිරීම් කරනව. සතුන් මැරීම හොරකම් කිරීම ඒ වගේම පිසුණාවාචා කීම, බොරු කේලම් හිස් වචන කීම, ගෙවල් බිඳීම, මං කොල්ල කෑම්, නොයෙක් නොයෙක් ඕනෑම අපරාද ගොඩාක් දාන්න පුළුවන්කම තියෙනව. ඉතින් ඔය හැම දෙයක්ම මොනව මුල් කරගෙන ද කරන්නේ? එක්කෝ රාගය මුල් කරගෙන, එක්කෝ

ද්වේෂය මුල් කරගෙන, එක්කෝ මෝහය මුල් කරගෙන, එහෙම නැතිනම් මානය මුල් කරගෙන, එහෙම නැතිනම් දිට්ඨිය මුල් කරගෙන, නොයෙක් දේවල් මුල් කරගෙන ඒ දේවල් කරනව. ඒකෙන් කියන්නේ ඒ සිතෙන් ඒක සමුට්ඨානය කරනව කියනව කියන එක නෙමෙයි. ඒ අකුසලය නගා සිටුවන සිතක් වෙනම තියෙනව. ඒ අකුසලය නගා සිටුවන, ඒ අකුසලය උපදවනු ලබණ සිතක් වෙනම තියෙනව. ඒ අකුසලය නගා සිටුවන අකුසලය උපදවන්නා වූ සිත වෙනම තියෙන කොට ඒ ප්‍රවාහයක් විදියට හිත ගලාගෙන යන්න එයාට හිත සකස් කරල තියෙනව වෙනමම ක්‍රමයකට. ඒක තමයි මෙතන පකතූපනිස්සය කියන එකේදී අර්ථ කථනය කරන්නේ. නැතිනම් ඒක හඳුන්වන්නේ.

දිට්ඨිය කියන එක මුල් කරගත්ත කියල කියන්නකෝ. දිට්ඨිය කියන එක මුල් කරගත්තහම එයාට උපදින හැම සිතක්ම දිට්ඨිය මුල් කරගෙන නෙමෙයි. හැබැයි එයා දිට්ඨි සහිත පුද්ගලයෙක්. ඇයි? එයා හැම දේම ගලපන්නේ, ගෝචර කරගන්නේ, හිතන්න යන්නේ, අර දෘෂ්ටියට අනුගතව තමයි එයා වැඩි වශයෙන් ඉන්නේ. ඇයි? අර දිට්ඨි සහිත සිත උපනිඃශ්‍රය වීම කියන එක. ඒක ඔබේ සිතෙත් ඔබ හඳුනාගන්න ඔබේ හිතෙත් මොනවද උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කියන එක පිළිබඳව. කුසල් ද අකුසල් ද කියන එක පිළිබඳව අවධානයක් යොමු කිරීම ඉතාම වැදගත් වෙනව.

ඒ වගේම ඊළඟ කාරණාව බලන කොට **රාගො, දොසො, මොහො, මානො, දිට්ඨි, පත්‍ථනා, රාගස්ස, දොසස්ස, මොහස්ස, මානස්ස, දිට්ඨියා, පත්‍ථනාය උපනිස්සය පච්චයෙන පච්චයො.**

රාගය, රාගය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. එතකොට රාගය කියන ධර්මය රාගය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කිව්වහම

දැන් අපි ඒ පිළිබඳව මූලික වශයෙන් අර කාරණාවත් එක්ක අනුගතවම හඳුනාගන්නට යෙදුනා. රාගයට නැඹුරුව කෙනකුගේ සිත උපදින්නේ කොහොමද? ද්වේෂයට නැඹුරුව කෙනකුගේ සිත උපදින්නේ කොහොමද? මෝහයට නැඹුරුව කෙනකුගේ සිත උපදින්නේ කොහොමද කියන එක පිළිබඳව. ඒ කියන්නේ උපනිඃශ්‍රය භාවය රාගය ලැබුවට පස්සේ නැවත නැවත නැවත නැවත ඔහුට රාගය උපනිඃශ්‍රය කරගෙන රාග සහිත සිත් උපදිනව. ඔහුගේ චරිතය රාග චරිතයක් බවට පත්වෙනව. ගැටීම කියන දේ මුල් කරගෙන ද්වේෂය උපදින්නට ගත්තහම ඔහුගේ චරිතය ද්වේෂ චරිතයක් බවට පත්වෙනව. මෝහය මුල් කරගෙන මෝහය උපදින්නට ගත්තහම ඔහුගේ චරිතය මෝහ චරිතයක් බවට පත්වෙනව. දිට්ඨිය මුල් කර ගත්තහම දිට්ඨි චරිතයක් බවට පත්වෙනව. මානය මුල් කරගත්තහම ඒ මානයෙන් දැඩි වුණ චරිතයක් බවට ඔහුගේ චරිතය පත්වෙනව. ඔහු හැම දේකදීම ඉදිරිපත් වෙන්නේ මානය කියන දේ. පත්ථනය කියන ප්‍රාර්ථනය කියන දේත් එහෙමයි.

එතකොට මේ විදියට ගත්තහම යම් ධර්මයක් පින්වතුනි බහුලීකෘත කරනව නම් යම් ධර්මයක් වඩනව නම් ඒ වඩන ඒ බහුලීකෘත කරන ධර්මය පැත්තට නැඹුරුව තමයි ඔහුගේ සිත නැවත නැවත භාවිත වෙන්නේ. නැවත නැවත උපදින්නේ කියන එක පිළිබඳව අපිට දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. මේක තමයි අකුසලයක් මුල් කරගෙන අකුසල්වල පහළ වීම පිළිබඳව කතා කිරීමේදී අපිට හඳුනාගන්නට තියෙන මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම කියන එක. උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය කියන එක. එතකොට මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම සහ මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය කියන එක අපි තේරුම් ගත්තා තුන් ආකාරයකට. ඒ තමයි ආරම්මණූපනිස්සය අනන්තරූපනිස්සය සහ පකතූපනිස්සය කියන මේ ආකාරයන්ට අපි මේක හඳුනාගන්නට යෙදුනා.

ඒ වගේම අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව මේ අකුසලයක් මුල් කරගෙන අකුසල් ඉපදීම කියන එකේදී කර්මපථ විදියට ගත්තහමත් මේ උපනිස්සය ප්‍රත්‍යය ඒ ඒ අකුසල කර්ම පථයන්ට උපකාරී වීම කියන එක අපිට දකින්නට පුළුවන්කම තියෙනව.

**පාණාතිපාතො - පාණාතිපාතස්ස, අදින්නාදානස්ස, කාමෙසුමිච්ඡාචාරස්ස, මුසාවාදස්ස, පිසුණාවාචාය, ඵරුසාය වාචාය, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය, ව්‍යාපාදස්ස, මිච්ඡා දිට්ඨියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

**පාණාතිපාතස්ස.** පාණාතිපාතෙ, පාණාතිපාත කරන්නාට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. **අදින්නාදානස්ස.** අදින්නාදානෙ, අදින්නාදානය කරන්නාට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. **කාමෙසුමිච්ඡාචාරස්ස.** කාමයේ වරදවා හැසිරීම, කාමයේ වරදවා හැසිරෙන්නාට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. ඉතින් මෙන්න මේ විදියට ඒ ඒ අකුසලයන් ඒ ඒ අකුසලයන් කරන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව.

දැන් අපි දන්නව පාණාතිපාත කියල කියන කොට ***පාණ අතිපාත*** කියල කියන්නේ පාණ **(ජීවිතින්ද්‍රිය රූපයයි.)** කියන්නේ ප්‍රාණය කියන එක නැතිනම් පණ කියන එක. අතිපාත කියන්නේ හෙලීම කියන එක, එහෙමත් නැතිනම් ඒක නැති කිරීම කියන එක තමයි පාණාතිපාත කියල කියන්නේ. එතකොට මේ කතා කරන්නේ අර **ජීවිතින්ද්‍රියෙහි** පැවැත්ම කියන දේ ඉවත් කිරීම. **ජීවිතින්ද්‍රිය** උපච්ඡේදයට පත්කිරීම කියන එක තමයි මෙතනදි කතා කරන්නේ. ඒක උපදින්නේ **(පරපණ නැසීමේදී)** ද්වේෂ මූල සිතක් විදියට තමයි උපදින්නේ.

යම්කිසි විදියකින් මේක සිත් වශයෙන් දක්වන කොට භවාංග, භවාංග චලන, භවාංගුපච්ඡේද ආදී සිත් බිඳී පරපණ අරමුණු කෙරෙමින් මනොද්වාරාවර්ජනයෙන් සිත් පහළ කරල ඉන් අනතුරුව ද්වේෂ මූල සිතක් ජවන වශයෙන් සත්වරක් ඉපද නිරුද්ධ වුණාට පස්සේ නැවත නැවත ඒ හිත භවාංග ගත වෙමින් භවාංග සිත් උපදිනව. ඊට පස්සේ එම ජවන් සිත්හී පහළ වුණ චේතනාව මුල් කරගෙන තමයි නැතිනම් ඒ චේතනාව තමයි ප්‍රාණඝාත අකුසල කර්මය කියල අපි අකුසලයක් හැටියට හඳුන්වනු ලබන්නේ.

එතකොට මනොද්වාරික වීථියක යම්කිසි විදියකින් භවාංග, භවාංග චලන, භවාංගුපච්ඡේදය වෙලා මනොද්වාරාවර්ජනය අර සතාගේ පරපණ අරමුණු කරමින් ඒ පරපණ ඒ සතාගේ පණ ඇති බවට තියෙන අකමැත්ත ප්‍රතිරෝධය දක්වමින් ද්වේෂ සහිත සිතක් විදියට ඒ මනොද්වාරික සිත් පහළ කිරීම් සිද්ධ කරනව. එතකොට මේ මනොවිඤ්ඤාණ සිත් පහළ කලාට පස්සේ ඒ මනොවිඤ්ඤාණ ජවන සිත් ද්වේශ සහිත සිත් විදියටයි උපදින්නේ. එතකොට අන්න ඒ සිත්වල තියෙන චේතනාව තමයි සත්ත්ව ඝාතනය කරන පාණාතිපාත කර්මය විදියට සකස් වීම සිදු කරන දේ බවට පත්වන්නේ. ඒ සිතේ උපදින චේතනාව. ඉතින් ඒ චේතනාව නැවත නැවත සමුට්ඨානය වෙමින් තමයි එහි තමන්ගේ කායයී සිද්ධ කරමින් ඒ කාය විඤ්ඤප්ති ආදී ධර්මයන් උපදවන කොට නැවත නැවත ඒ කායික ක්‍රියාකාරකම්වල අපිට සතා මරන්නට අවශ්‍ය ක්‍රියාකාරිත්වය ගොඩ නැගෙන බව හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.

එතකොට සිත් ගණනය කරන්න බැරි තරම් ප්‍රමාණයක් සතෙක් මරණ මොහොතකදි ඒ සතා මැරීම සඳහා ඉපදී තියෙනව. ඉතින් ඒ හැම ධර්මයකටම විපාක ගෙනවිත් දීමේ ශක්තියක් තියෙනව. සතෙක් මරණව කියන කොට, එක සිදු වීමක්, මදුරුවෙක්

මරණාව කියල හිතන්නකෝ. පොඩි මොහොතක් නේ යන්නේ. වැඩි වෙලාවක් නෙමෙයි නේ. මදුරුව ඇවිල්ල විදිනවයි, මදුරුවට ප්‍රහාරයක් එල්ල වෙනවයි දෙකම එකට වගේ නේ වෙන්නේ සාමාන්‍යයෙන්. අපි දැකල තියෙනව ගොඩක් වෙලාවට එකට තමයි සිද්ධ කරන්නේ.

එතකොට ඒ අවස්ථාවෙදි ඔබ හිතනවද ඔබට සිත් කීයක් වගේ උපදියි ද කියල? ඔබට හිතන්න බැරි තරම්, ගණනය කරන්න බැරි තරම් ප්‍රමාණයක් සිත් උපදිනව. ඒ සිත් වලින් උපදින විඤ්ඤප්ති රූප ආදී ධර්මයන්ගේ ක්‍රියාකාරිත්වය නිසා, ඒ චිත්ත කිරිය වායෝ ධාතුවෙහි තදවීම නිසා තමයි මේ අත ටික ටික එස වෙනවා කියන හැම දෙයක්ම සිද්ධ කරල තියෙන්නේ. ඒ සඳහා වැය වෙලා තියෙන්නේ එක සිතක් නෙමෙයි. අනවතරයෙන් බලපවත්වණු ලබන උපදිනු ලබන සිත් සමූහයක්, ගණනය කරන්න බැරි තරම් වීථි ප්‍රමාණයක් ඉපදෙමින්, සිත් වශයෙන් පහළ වෙමින් තමයි ඔබට ඒ අත ඔසවනවා කියන එක ක්‍රියාත්මක කරල තියෙන්නේ. ඒ සතා මරණාව කියන එක ක්‍රියාත්මක කරල තියෙන්නේ. මරණාව කියන තැනදි ඒ උපදින සෑම අකුසල ජවන සිතක්ම ඔබට විපාක ගෙනවිත් දීමේ ශක්තියෙන් යුක්තයි. චේතනාව.

එතකොට මේ අවස්ථාවකදි එක වරක් සතෙක් මැරුවට පස්සේ ඒ ඉපදුනු බලවත් සහිත අරමුණ නැවත සතෙක් ඝාතනය කරන්නට ඔහුගේ තියෙන අර හිරිඔතප් කියන දේ ඉවත් කරල දානව. අන්න ඒකත් උපනිඃශ්‍රය වෙනව තව සතෙක් මරන්න. මුලින් සතෙක් මරපු කෙනකුට තව සතෙක් මරණ එක පහසුවෙන් කරන්න පුළුවන්. එක බොරුවක් කල කෙනකුට තව බොරුවක් කියනව කියන එක බොහොම පහසුවෙන් කරන්න පුළුවන්කම තියෙනව. කාමයේ වරදවා හැසුරුණු කෙනකුට ඊළඟට කාමයේ වරදවා හැසිරීම කියන එක පහසුවෙන් කරන්න

පුළුවන්කම තියෙනව. ඒක තමයි හිතේ ස්වභාවය. ඒක තමයි ක්‍රියාත්මක වන විදිය.

එතකොට එහි බලවත් භාවය ලැබගෙන ඒ කියන්නේ අනිවාරයෙන් උපදවනව කියන එක නෙමෙයි. අනිවාරයෙන් ඒ සිද්ධිය ආයෙත් වෙනව කියන එක නෙමෙයි. ඒ ගැන කම්පනයක් ඇතිවෙල ඒ නිසා නොවෙන්නත් පුළුවන්. හැබැයි බහුල වශයෙන්ම ඒක නැවත වෙන්න තියෙන ඉඩකඩ වැඩියි. ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම නිසා, ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය නිසා තමයි එබඳු ආකාරයකට එලෙසට සකස් වීම සිද්ධ වෙන්නේ. උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදීම, උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය, සකස් වීම සිද්ධ වන්නේ අන්න එබඳු වූ ආකාරයකට. ඒ නිසා උපනිස්සය ප්‍රත්‍යය කියන එක මෙතනදි ඉතාම වැදගත්. අපි තේරුම් ගැනීම ඉතාම වැදගත්. ඒ හැම තැනකදිම අකුසලයක් තව අකුසලයක් උපදවන්නට ඒ උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. ඒ කියන්නේ අපේ හිත කුසල් කරන කෙනකුට කුසලයට වගේම අකුසල් කරන කෙනකුටත් ඒ අකුසලයට බරව දෙයක් කලාම නැවත නැවත එබඳු දේවල් කිරීම සඳහා සිත ක්‍රියාත්මක වෙනව.

අපි කෙනෙක් කරනව කියල හිතුවට මෙතන සිද්ධ වෙන්නේ මොකද්ද? මෙන්න මේ ප්‍රත්‍යය සමවායන්ගෙන් ඒ ඒ ධර්මයෝ නැවත නැවත ඉපදවීම තමයි අපිට මෙතනදි දකින්නට පුළුවන්කම තියෙන්නේ. ඒ කියන්නේ කෙනෙකුගේ හෝ පුද්ගලයෙකුගේ හෝ ක්‍රියාකාරිත්වයක් නොවී ඒ ඒ ධර්මයන්ගේ පැවැත්ම නැවත නැවත විවිධ ස්වරූපයන්ගෙන් ඉපදවීම කියන එක තමයි අපිට දකින්නට පුළුවන්කම තියෙන්නේ. දැන් මෙන්න මේ ආකාරයට අපි උපනිස්සය ප්‍රත්‍යය හඳුනාගන්න කොට මේ උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව ඔබ හඳුනාගන්නා විදිය, ඔබේ ජීවිතයට සමානුපාත කරන්නට, ඔබේ ජීවිතයත් එක්ක එකට

යොදා ගන්නට, ඔබේ ජීවිතය තුළ ඒ ධර්මය අත් දකින්නට ඔබ උත්සාහවත් වන්නට ඕනේ.

කොහොමද ඔබේ ජීවිතය තුළ ඒක අත් දකින්නේ? කොහොමද ඔබ ඔබේ ජීවිතය තුළ ඒක පුරුදු කරන්නේ? කොහොමද ඒක පුහුණු කිරීමකට ලක් කරන්නේ? ඔබේ හිත දිහා බලාගෙන ඉන්න කොට ඔබට තේරුම් ගන්නට පුළුවන් ඔබේ සිත නැවත නැවත දේවල් පිළිබඳව උපදින අවස්ථා. දුක හිතෙන වෙලාවල් වෙන්න පුළුවන්. තරහ යන වෙලාවල් වෙන්න පුළුවන්. කැමැත්ත ඇතිවෙන වෙලාවල් වෙන්න පුළුවන්. මේ වගේ අවස්ථා දිහා ඔබ හොඳට බලන්න.

ඇයි සිත නැවත නැවත ඒ පැත්තට බරව උපදින්නේ? ඔබට කෙනෙක් පිළිබඳව අමනාපයක් ඇති වුණහම ඇයි ඒ අමනාපය නැවත නැවත එන්නේ? දැන් අද ඒ පුද්ගලය දැක්කහම ඇසුරු කරහම අමානාපයක් ඇති වෙනව. ආපහු තව වැඩ කටයුතු කරල හෙට දවසෙදිත් ඒ පුද්ගලය හම්බවෙන කොට ආයෙත් අමනාපය උපදිනව. දැන් ඇයි ඒ අමනාපය උපදින්නේ? දැන් සිතකින් සිතකට දෙයක් සම්ප්‍රේෂණය වෙන්නේ නැහැ නේ. ඊට පස්සේ මුලු දවස තිස්සෙම අපිට ඒ කෙනාව ඇසුරු වෙලත් නෑ. ඒ අරමුණ සිහි වෙලත් නෑ. හැබැයි ඊළඟ දවසෙ දකින කොට ආපහු ද්වේෂය ඉපදිල.

ඇයි ඒ තරහ උපදින්නේ? අන්න ඒ වගේ තැන් වලදි හඳුනාගන්න මේ මම මේ ඉන්න කෙනෙක් ගැන තරහ උපදිනව කියල හිතුවට මෙතන ක්‍රියාත්මක වෙන්නේ මේ යාන්ත්‍රික ක්‍රියාවලියක් වගේ දෙයක් නේ. මේ කලින් හටගත්ත ධර්මයක් දැන් උපනිස්සය ප්‍රත්‍යය වෙමින් නැවත දැන් උපදින ද්වේෂය උපදවන්න ප්‍රත්‍යය භාවයක් සපයල තියෙනව. ඒ ප්‍රත්‍යය මත තමයි මේ දැන් උපදින ඵලය උපදින්නේ අර උපනිස්සය ප්‍රත්‍යය මුල් කරගෙන. එහෙනම් මෙතන සිද්ධ වෙන්නේ එකම අකුසල

විෂයක් පිළිබඳව ඒ උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය නේද? දිගෙන් දිගට සත්තු මරණ හොරකම් කරන බොරු කියන ඒ වගේ දෙයක් වෙන කොට අපි මොකද්ද දකින්න ඕනේ? මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය නේද, මේ අකුසලයට බරව යන මේ උපනිස්සය ප්‍රත්‍යය ක්‍රියාකාරිත්වය නිසා මේකෙම විපාක ජනනය කරන පැත්තටත් ඒ විදියටම උපදිනව.

එහෙනම් මේක නතර කරගන්න ඕනේ නේද? එහෙනම් මේක නතර කරන්න තාක්ෂණික පැතිකඩෙන් අපිට පුළුවන්කම තියෙනව උපනිස්සය ප්‍රත්‍යය වෙනස් කරන්න. උපනිඃශ්‍රය වීම කියන එක වෙනස් කරන්න. ඊට ප්‍රතිවිරුද්ධ ධර්මයක් දැන් උපනිඃශ්‍රය කරගන්න. එතකොට ඒ පැත්තට බරව උපනිඃශ්‍රය සහිත බව උපදින්න පටන් ගන්නව. ඒක හිරි ඔතප් ආදී ධර්ම ටික උපද්දවල අර අකුසලයෙන් මිදෙන පැත්තට මෙනෙහි කරල, කුසලය පැත්තට හිත පිහිටුවල, අන්න ඒ විදියට උපනිස්සය ප්‍රත්‍යය අපිට භාවිත කරන්නට පුළුවන්කම තියෙනව.

ඉතින් ඔබ අප්‍රමාදී වන්න. ඔබ උත්සාහවත් වෙන්න කොහොම හරි ඒ තත්ත්වයට ඔබේ හිත ඔබේ මනස පත්කර ගැනීම සඳහා ඔබේ මනස අප්‍රමාදීව භාවිත කිරීම සඳහා. අන්න එතකොට තමයි මේ ධර්මයෝ ඔබ ප්‍රායෝගිකව වැඩුව කියන්නේ. මේ ධර්මය ඔබ ප්‍රායෝගිකව ඔබේ ජීවිතය ඇතුලේ ක්‍රියාත්මක කලා බවට පත්වෙන්නේ එතකොට. එහෙම නැති වුණොත් මේ ධර්මය ඔබ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල දෙයක් බවට පත්වෙන්නේ නෑ. ඔබේ ජීවිතය තුළ ඔබ යොදා ගත්ත දෙයක්, උපකාර කරගත්ත දෙයක් බවට පත්වෙන්නේ නැහැ. ඒ හින්දා වැදගත් වෙන්නේ කොහොම හරි අපි බණ ඇහුව්ව, කොහෝම හරි අපි මේක පාඩමක් විදියට මම දැන් මේ ප්‍රත්‍යය දැන ගෙන ඉන්නව කියන්න නෙමෙයි. අපිට අවශ්‍ය වෙන්නේ අපේ එදිනෙදා ජීවිතය තුළ මේ කෙලෙස් ප්‍රහාණය කිරීම සඳහා මේ කියපු කරුණු කාරණා ටික උදව් කර ගැනීම. මේ කියපු කරුණු

කාරණා ටික උපකාර කරගැනීම තමයි අපිට වැදගත් වෙලා තියෙන්නේ.

ඒ නිසා උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව අපි භාවිතය ගැන කතා කරන කොට ඒක ප්‍රායෝගිකව ඔබේ ජීවිතය තුළ ඔබට දකින්නට, ඔබට පෙනෙන්නට පුළුවන්කම තියෙන්නට ඕනේ භාවනාවක් තුළ, කොහොමද ඒ උපනිස්සය ප්‍රත්‍යය ක්‍රියාත්මක වෙන්නේ, කොහොමද ඒ උපනිස්සය ප්‍රත්‍යය භාවිත වෙන්නේ කියන එක භාවනාවක් හැටියට ඔබට අත් දකින්නට පුළුවන්කම ලැබිල තියෙන්නට ඕනේ. අන්න ඒ තුළ තමයි ඔබේ ජීවිතය ඔබට සම්පූර්ණම නිවෙන තැනකට පත්කර ගන්නට පුළුවන්කම තියෙන්නේ. මේ මාර්ගය වෙන තැනකට නොගොස්, ඒ කියන්නේ ඉගෙන ගැනීම් ආදී දේවල් ටික වෙනමම තැනකට සීමාවක් නොවී ඔබේ ප්‍රතිපදාව උපදවන්න පුළුවන් දෙයක් බවට පත්වෙලා තියෙන්නේ අන්න ඒ විදියට ප්‍රායෝගික භාවිතය ගැන ඔබ අවධානය යොමු කලොත්. ඒ නිසා අප්‍රමාදී වන්නට කියල ඔබ හැම දෙනාටම බොහොම කල්‍යාණ මිත්‍ර බවෙන් සිහිපත් කරනව.

**සාදු සාදු සාදු**

# 13.04.2024 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසිඅට වෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සුදානම් වන මොහොත.

ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නට යෙදුන ඒ උතුම් ශ්‍රද්ධර්ම සාගරයෙන් ස්වල්පයක් නමුත් ශ්‍රවණය කරගන්නටයි ඔබ හැමදෙනාම මේ මොහොතෙදි සූදානම්ව සිටින්නේ.

පින්වතුනි, මේ නව වසරක් උදාවන මොහොතක්. වසරක් ගෙවිල යනව කියන්නේ අපිට මේ ලෝකය තුළ ජීවත් වන්නට තිබෙන කාලයෙන් තවත් වසරක් ඉක්මී ගියා කියන එක. ඒ නිසා අපි සතුටු වෙනවට වඩා එක පැත්තකින් අපිට මරණයට තව වසරකින් ලං වීමක් සිද්ධ වුණේ. ඒ නිසා අප්‍රමාදී වීම පිළිබඳවත් හැඟීමක් ඇතිකර ගැනීම වැදගත් වෙනව. ජීවිතයේ අලුතෙන් ආරම්භයක් අරගෙන ගුණ ධර්මයන් වගේම ඔබේ ඒ මාර්ගය උපදවා ගැනීම පැත්ත පිළිබඳවත් වඩා දියුණුවක් සලසා ගැනීම පිළිබඳව සැලකිල්ලක් දැක්වීම ඉතාමත් වැදගත් වෙනව. ඒ නිසා නව වසරක් උදාවන මොහොතකදි පෙර වසර වලට වඩා ඔබ මේ වසර තුළ තමන්ගේ ධර්ම ඤාණය දියුණු කරගෙන මේ ධර්මාණු ධර්ම ප්‍රතිපත්තිය තුළ යෙදෙන්නට දැඩිව අධිෂ්ඨානයක් ඇතිකර ගැනීම හැම දෙනාටම ඉතාම වැදගත් වෙනව.

අප මේ දේශනා මාලාව තුළදී සාකච්ඡා කරණු ලබන්නේ අභිධර්ම පිටකයෙහි පට්ඨානප්‍රකරණයෙහි දැක්වෙන සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව. සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව යම් හඳුනා ගැනීමක් සිද්ධ කරගන්නටයි මේ දේශනා මාලාව තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ.

ඒ අනුව අවසාන වශයෙන් උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව අපි දීර්ඝ ලෙස කරුණු සාකච්ඡා කලේ. මේ ප්‍රත්‍යය විසි හතරෙන්ම ඉතාමත් දීර්ඝතම වශයෙන් පැහැදිලි කරගන්නට තියෙන ඉතාමත් සියුම් ප්‍රභේදයන්ගෙන් යුක්ත වුණ ප්‍රත්‍යය තමයි මේ උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ. ඉතින් උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව මූලික වශයෙන් හඳුනාගෙන කුසල අකුසල වශයෙන් එහි බෙදා දැක්වීම තමයි ප්‍රධාන ලෙස අප සිද්ධ කරගන්නට යෙදෙන්නේ. ඒ අනුව මීට ප්‍රථමයෙන් අපි අකුසලය පිළිබඳව කතා කරන කොට, අකුසලයක් අකුසලයකට කොහොමද උපනිඃශ්‍රය වශයෙන් ප්‍රත්‍යය වන්නේ, ඒ වගේම කුසලයක් කුසලයකට කොහොමද උපනිඃශ්‍රය වශයෙන් ප්‍රත්‍යය වන්නේ කියන කරුණු පිළිබඳව අපි සාකච්ඡා කරන්නට යෙදුනා.

**අද දවසෙදි අපි බලාපොරොත්තු වන්නේ අකුසලයක් කොහොමද අව්‍යාකෘත ධර්මයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කියන එක පිළිබඳව හඳුනා ගැනීමක් සිද්ධ කරගන්නට.**

**අකුසලො ධම්මො - අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** අකුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිදු කරනු ලබනව. කොයි වගේ අවස්ථාවලදි ද? **අකුසලං - වුට්ඨානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** අකුසලය වුට්ඨානයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. මෙතනදි වුට්ඨානය කියල කියන්නේ විපාක අවස්ථාවක්. එහෙම නැතිනම් අව්‍යාකෘත

අවස්ථාවක් කියන එකට. එතකොට මේ අකුසල ධර්මයන් පිළිබඳව අපි සලකා බැලීමේදී උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සැලකිල්ලක් දැක්වීමේදී අපි තේරුම් ගන්නට යෙදුනා ***අනන්තරූපනිස්සය වශයෙන් සහ පකතූපනිස්සය වශයෙන්*** කියන මේ කොටස් දෙකක් විදියට අපිට මේක හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

## ***<u>අනන්තරූපනිස්සය</u>***

ඉතින් මෙතනදි යම්කිසි ආකාරයකට අව්‍යාකෘත ධර්මයක් උපදවන්නට අකුසලයක් ප්‍රත්‍යය වීම කියන තැනදි උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය සිදුවන ආකාරය පිළිබඳව විශේෂයෙන් සලකා බලන කල අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ අනන්තරූපනිස්සය හැටියට ක්‍රියාත්මක වන අවස්ථා. ඒ කියන්නේ අපි දන්නව අනන්තර ප්‍රත්‍යය තුළ කතා කලේ අනතුරුවම ඉපදීම කියන එක. **ඒ අනන්තරය සහ උපනිඃශ්‍රය භාවය කියන මේ දෙකම උපයෝගී වීම තුළ අනන්තරූපනිස්සය කියල අපි මේ ප්‍රත්‍යය විශේෂයෙන් මෙතනදි හඳුනාගන්නව.** එතකොට අනන්තරූපනිස්සය කිව්වහම උපනිස්සය ප්‍රත්‍යය ක්‍රියාත්මක වෙනව. හැබැයි අනන්තර ප්‍රත්‍යය හා සමගාමීව තමයි මෙහි ක්‍රියාකාරිත්වය අපිට දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.

එතකොට **අකුසලං - වුට්ඨානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො** කියන කොට අකුසලය වුට්ඨානයට උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වීම සිදු කරනු ලබනව. ඒ කියන්නේ දැන් අකුසල ජවන ආදිය උපදින කොට අපි දන්නව අකුසල් සිත් උපදින චිත්ත වීථියක් අරගෙන බැලුවහම ජවන සිත් හතට අනතුරුව උපදින තදාරම්මණ සිත් දෙකක් තියෙනව. එතකොට මේ තදාරම්මණ කියන සිත් අව්‍යාකෘත සිතක් ලෙසයි

ගැනෙන්නේ. නැතිනම් කුසල අකුසල වශයෙන් නොවූ විපාක අවස්ථාවක් හැටියටයි ඒ තදාරම්මණ සිත් පිළිබඳව අපිට සලකන්නට පුළුවන්කම තියෙන්නේ.

එතකොට මේ සත්වෙනි ජවන සිත හා පළමු තදාරම්මණ අතර සිද්ධ වන සම්බන්ධය, එහෙම නැතිනම් ප්‍රත්‍යය වීම කියන එක, අවසාන සත්වන ජවනය අර තදාරම්මණය උපදවන්නට ප්‍රත්‍යය වීමේදී උපනිස්සය ප්‍රත්‍යය භාව වශයෙනුත් ප්‍රත්‍යය වෙනව. අනන්තර ප්‍රත්‍යය භාව වශයෙනුත් ප්‍රත්‍යය වෙනව. ඒ නිසා මේ දෙකම එකතුවක් විදියට අනන්තරූපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වෙනවා කියල අපිට මෙතනදි හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. එතකොට මෙතනදි ක්‍රියාත්මක වෙන්නේ අකුසලයක් අව්‍යාකෘතයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. අනන්තරූපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වීමකුයි මෙතනදි දකින්නට පුළුවන්කම තියෙන්නේ. ඒ කියන්නේ ඊට අනතුරුවම අනිවාර්යයෙන්ම උපදිනව කියන එක.

දැන් අපි දන්නව ඇතැම් චිත්ත වීථීන් පිළිබඳ සැලකිල්ලක් දක්වන කොට ඇතැම් අවස්ථාවලදි මේ තදාරම්මණ සිත් දෙක ඇති නොවී සිත භවාංග පතනය වෙනව. ඒ කියන්නේ සිත භවාංග ගත වීමට ලක් වෙනව. අන්න ඒ සිත භවාංග ගත වීමට ලක්වෙන මොහොතෙදි සිද්ධ වන ක්‍රියාවලිය පිළිබඳ අපි සැලකිල්ලට ගත්තොත් අපිට දකින්නට පුළුවන්කම තියෙන්නෙත් මේ ප්‍රත්‍යයතාවයමයි. ඒ භවාංග සිත කියල කියන්නේ අව්‍යාකෘත සිතක්. අර අකුසලය ඒ අව්‍යාකෘතයට අනන්තරූපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම් විදියට තමයි අපිට දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. මේ අකුසලයක් අව්‍යාකෘතයක් උපදවන්නට අනන්තරූපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වන ආකාරය තමයි අපිට එලෙස දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.

මේ විදියට අකුසල් සිත් දිහා අපි බැලුවහම ලෝභ මූල ඒ වගේම දෝෂ මූල මෝහ මූල ආදී සිත් වලත් මේ විදියට තදාරම්මණ අවස්ථාවන් පිළිබඳව අපිට සලකා බලන්නට පුළුවන්කම තියෙනව. ඒ වගේම භවාංග පතනයට ලක්වෙන අවස්ථාවන් පිළිබඳවත් අපිට සලකා බලන්නට පුළුවන්කම තියෙනව. මේ හැම අවස්ථාවකදිම පොදුවේ ගත්තහම සිද්ධ වන්නේ අකුසලයක් අව්‍යාකෘතයකට අනන්තරූපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වීම තමයි අපිට මෙතනදි හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. ඒ නිසා මේ වගේ අවස්ථාවන් පිළිබඳව අපි තේරුම් ගැනීමේදී අනන්තරූපනිස්සය ප්‍රත්‍යය කියන ධර්මයෙහි යෙදීම තමයි අපිට වඩාත්ම තේරුම් ගන්නට සිද්ධ වෙන්නේ. ***{දොළොස් අකුසල ජවනයන්ගෙන් අකුසල් චිත්ත වීථියේ අන්තිමජවනය තදාරම්මණ හෝ භවංගයට අනන්තරූපනිස්සයෙන් ද, ලෝභමූල මෝහමූල අන්තිම ජවනය එකළොස් තදාරම්මණයන්ටද තදාරම්මණ නොයෙදෙන කල්හී භවාංග 19 (උපේක්ඛා සන්තීරණ 2, මහවිපාක 8, රූප අරූප විපාක 9) ට ද අනන්තරූපනිස්සයෙන් ප්‍රත්‍යය වේ. දෝසමූල අන්තිම ජවනය උපේක්ඛා තදාරම්මණ සයටද (සන්තීරණ 2, මහවිපාක 4), තදාරම්මණය නොයෙදෙන අවස්ථාවලදී එම උපේක්ඛා කාමභවංග සයටද අනන්තරූපනිස්සයෙන් ප්‍රත්‍යය වේ}***

## ***<u>පකතූපනිස්සය</u>***

ඊට පස්සේ අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව පකතූපනිස්සය කියන එක. පකතූපනිස්සය ප්‍රත්‍යය. එතකොට පකතූපනිස්සය යෙදෙන්නේ කුමක් පිළිබඳව ද කියල ඔබ දැන් දන්නව. අකුසලයක් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙමින් අව්‍යාකෘත ධර්මයක් උපදවන කල පකතූපනිස්සය වශයෙනුත් උපනිස්සය ප්‍රත්‍යය යෙදෙනව. දැන් අනන්තරූපනිස්සය තමයි අපි හඳුනාගන්නට යෙදුනේ. ඒ වගේම පකතූපනිස්සය

වශයෙනුත් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. මොන වගේ අවස්ථාවලදි ද?

**රාගං උපනිස්සාය - අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියෙට්ඨි මූලකං දුක්ඛං පච්චනුභොති.**

**රාගං උපනිස්සාය,** රාගය උපනිඃශ්‍රය කරගෙන **අත්තානං ආතාපෙති, පරිතාපෙති,** තමාව තවනව. හාත්පස තැවීම සිද්ධ කරනව. **පරියෙට්ඨි මූලකං දුක්ඛං පච්චනුභොති,** ඒ විදියට පර්යේෂණා මුල් කරගෙන ඒ දුක අනුභව කිරීම සිද්ධ කරනව. එතකොට මේ විදියට ඒ දුක අත් විඳින කොට ඒ උපදින දුකට නැතිනම් එබඳු අවස්ථාවල උපදින යම් දුක් සහගත ස්වභාවයක් තියෙනව නම් අන්න ඒ දුක් සහගත බව කියන එකට ප්‍රත්‍යය වුණේ මොකද්ද? අර රාගය තමයි ප්‍රත්‍යය භාවයට පත්වුණේ.

දැන් ඕක අපි සාමාන්‍ය විදියට කතා කලොත් එහෙම රාගය මුල් කරගෙන යම් කිසි කෙනෙක් අපි හිතමුකෝ යම් දුකක් විඳිනව කියල. කායික වශයෙන් යම්කිසි දුකක් විඳිනව. එතකොට කායිකව උපදින යම්කිසි දුක්ඛ වේදනාවක් තියෙනව නම් ඒ කායිකව උපදින දුක්ඛ වේදනාවට, ඒ කායිකව උපදින වෙහෙසට හේතුවක් බවට පත්වන්නේ මොකද්ද? අර රාගය තමයි මුල් වෙන්නේ. රාගය උපනිඃශ්‍රය කරගෙන තමයි අර කායික තැවීම කියන දේ උපදින්නේ. අන්න එබඳු ආකාරයකට රාගය මුල් කරගෙන මානසික තැවීමක් ඇති කරගත්තත් ඒ වගේ අවස්ථාවන්හී දී අපිට දකින්නට පුළුවන්කම තියෙනව අව්‍යාකෘත ධර්මයන් උපදින අවස්ථාවන් පිළිබඳව එබඳු අවස්ථාවන්හී දී. ඉතින් මේ තැන් වලදි සිද්ධ වන්නේ ද අකුසලයක් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙමින් අව්‍යාකෘත ධර්මයක් ඉපදවීම තමයි මේ තැන් වලදිත් දකින්නට පුළුවන්කම තියෙන්නේ.

දැන් කායිකව විඳින දුක්ඛ වේදනාව කියන දේ අපි දන්නව කාය විඤ්ඤාණය කියන එක, ඒක දුක්ඛ වේදනාවක්. එතකොට අකුසල විපාක දුක්ඛ වේදනාවක් හැටියට අපි එක හඳුනාගන්නේ. එතකොට මේ කායිකව උපන් දුක්ඛ වේදනාව කියන එක උපදවන්නට හේතු වුණේ මොකද්ද? අපිට කියන්නට පුළුවන් පෙර කල කර්මයක් තමයි ඒකට හේතුව බවට පත්වුණේ කියල. **හැබැයි දැන් අපි ඒකට වර්තමාන වශයෙන් මූලික වුණේ මොකද්ද? රාගය කියන දේ. වර්තමාන වශයෙන් මූලික වුණේ රාගය කියන දේ.** නැත්නම් කැමැත්ත කියන එක.

දැන් හිතන්නකෝ යම්කිසි විදියකින් අපි උපමාවක් ගත්තොත් කෙනෙක් යම්කිසි දෙයක් පිළිබඳව ආසාවෙන්, හිතන්නකෝ මිල මුදලකට හරි රත්තරන් වැනි දේකට ආසාවෙන් යම්කිසි කෙනෙක් යනව යම් කටයුත්තක් කරන්න. ඒ යන කොට ඔහුට ඒ සඳහා යන මාර්ගයෙහි අපමණ පීඩාවන්ට මුහුණ දෙන්නට සිද්ධ වෙනව කියල. එක පැත්තකින් ගත්තහම ඒ පීඩාවන්ට මුහුණ දීමේ දී ඇතිවෙන දුක්ඛ වේදනාවන් ඔහුට ලැබෙන්නේ ඒ කාය විඤ්ඤාණ උපදින අවස්ථාවලදි විපාක කාය විඤ්ඤාණ වශයෙන් නේ ඒව උපදින්නේ. අකුසල විපාක කාය විඤ්ඤාණ සිත් වශයෙන් තමයි ඒ සිත උපදින්නේ. හැබැයි ඒ ඒ අවස්ථාව ජනනය වෙන්නේ, ඒ අවස්ථාව උපදින්න හේතු වුණේ මොකද්ද? වර්තමාන රාගය තමයි හේතු වුණේ වර්තමානයේ පැවැත්ම සකස් කරනව කියන දේ කරන්නට.

අන්න ඒ නිසා තමයි **රාගං උපනිස්සාය - අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියෙට්ඨි මූලකං දුක්ඛං පච්චනුභොති** කියල දැක්කුවේ තමාව තවනව කියල. රාගය මුල් කරගෙන, රාගය නිඃශ්‍රිත කරගෙන, රාගය ඇසුරු කරගෙන තමාව තැවීමකට ලක් කරනවා කියල කිව්වේ අන්න ඒ හේතුව නිසා. අන්න එතකොට තමන්ව තැවීමකට ලක් කරනව නම් රාගය නිසා, රාගය ඇසුරු කරගෙන, රාගය මුල් කරගෙන, එබඳු අවස්ථාවල රාගය නැමති

අකුසල ධර්මය අර තැවීම නැතිනම් අර වේදනාත්මක භාවයන් ඇති කිරීම කියන තැනට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

**දොසං මොහං මානං දිට්ඨිං පත්‍ථනං උපනිස්සාය - අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියෙට්ඨිං මූලකං දුක්ඛං පච්චනුභොති.** ඒ වගේම ද්වේෂය නිසා තමාව තවනව නම් එතකොට මෝහය නිසා, මානය නිසා, දිට්ඨිය නිසා, පත්‍ථනය නිසා මේ තමාව තැවීමකට ලක් කරනව නම් අන්න ඒ සෑම අවස්ථාවකදිම මොකද්ද වෙන්නේ? අර ලෝභය කියන්නේ - දෝසය කියන්නේ - මෝහය කියන්නේ - මානය කියන්නේ - දිට්ඨිය කියන්නේ - ප්‍රාර්ථනය කියල කියන්නේ, මේ හැම දෙයක්ම පින්වතුනි අකුසල ධර්ම. ඒ අකුසල ධර්මය නිසා උපදින අර විදියේ වේදනාත්මක භාවයන් තියෙනව නම් එබඳු අවස්ථාවල උපදින ඒ අව්‍යාකෘත සහගත සිත් උපදින්නට හේතුව බවට පත්වුණේ අර ද්වේෂය, මෝහය, ඒ වගේම මානය, දිට්ඨිය සහ ප්‍රාර්ථනය කියන මේ වගේ දේවල් තමයි උපනිඃශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වුණේ. එතකොට ඒක අනතුරුවම ප්‍රත්‍යය වීමක් නෙමෙයි නේ. මේ සිත හටගත්තා, ඊළඟ සිත ඊට අනතුරුවම උපදින විදියට ප්‍රත්‍යය වීමක් නෙමෙයි එතනදි සිද්ධ වෙන්නේ.

එතනදි සිද්ධ වෙන්නේ මොකද්ද? අර සමස්ත පසුබිම් වශයෙන්, වර්තමානය තුළ එබඳු වූ අවස්ථාවන්හී දී එබඳු වූ චිත්ත චෛතසික ධර්ම උපදින්නට අර රාග සහිත භාවය හේතු වෙලා තියෙනව. ද්වේෂ සහිත භාවය හේතු වෙලා තියෙනව. මෝහ සහිත බව හේතුවක් බවට පත්වෙල තියෙනව. නැතිනම් මානය දිට්ඨි සහිත බව හේතුවක් වෙලා තියෙනව. ප්‍රාර්ථනය කියන එක හේතුවක් බවට පත්වෙලා තියෙනව. මේ හැම අවස්ථාවකදිම අකුසලයක් මුල් කරගෙන කෙනකුට අව්‍යාකෘත ධර්මයන්ගේ පහළ වීමක් තමයි සිද්ධ වෙන්නේ.

දැන් හිතන්නකෝ යම්කිසි කෙනෙක් ප්‍රාර්ථනයක් නිසා යම්කිසි හිතේ පවතින තෘෂ්ණා සහිත අභිලාෂයක් නිසා යම් පූජාවක් කරනව. ඒ පූජාව කරන කොට ඔන්න කටු ගහල එල්ල ගෙන යනව කියල හිතන්නකෝ. ඒ වගේ අවස්ථාවන් අපිට දකින්න පුළුවන් නේ. දැන් මොකද්ද ඒ ක්‍රියාත්මක වෙන්නේ? අර අකුසලයක් ඒ ප්‍රාර්ථනය කියන දේ තමන්ගේ තෘෂ්ණා ඡන්දය, තෘෂ්ණා සහිත කැමැත්ත කියන දේ එතෙන්දි පාවිච්චි වෙලා තියෙනව. මොකකට ද? අර කියන දුක් වේදනාව උසුලාගෙන ඉන්නව කියන දේ ඇති කරන්නට ඒක හේතුවක් වෙලා තියෙනව. එතකොට අකුසලය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව අර අව්‍යාකෘත ධර්ම උපදවන්නට.

ඒක ඊට අනතුරුවම සිතකට පස්සේ තව සිතක් අනතුරුව උපදිනවා කියන විදියට ඉපදවීමක් නෙමෙයි එතනදි සිද්ධ වෙන්නේ. දැන් එතනදි සිද්ධ වෙන්නේ මොකද්ද? ඊට අනතුරුව තව එකක් ඉපදීමක් විදියට නොවී ඒ අවස්ථාවේ උපදින චිත්ත චෛතසික ධර්මයන්ට භූමිය සකස් කරල තියෙන්නේ ඒ ඔහුගේ තියෙන තෘෂ්ණා සහිත ප්‍රාර්ථනාව කියන එක. අන්න ඒ ප්‍රාර්ථනාව නැමති ඒ අවස්ථාවෙහි තිබුණ ඒ අකුසල භූමිය තමයි අර ඉපදෙන චිත්ත චෛතසික ධර්මයන්ට ප්‍රත්‍යය වීම සිද්ධ වන්නේ. අන්න එතන උපදින විපාක ධර්ම ටිකක් තියෙනව නම් ඒ තමාව තැවෙන දුක් විඳින විපාක ධර්ම ටික සියල්ලක්ම අර අකුසලය නිසා ඉපදුනු දේවල්. ඒ විදියට අපිට දකින්නට පුළුවන් පකතූපනිස්සය වශයෙනුත් ප්‍රත්‍යය වීම කියන එක හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

දැන් මෙතනදි ලෝභ - ද්වේෂ - මෝහ කියන මේ ටික දැම්මහම ඒ කියන්නේ රාග - දෝස - මෝහ කියන මේ තුන දැම්මහම ප්‍රමාණවත් නේ. සියලු අකුසල් සිත් ටික මෙතනදි ඇතුළත් වෙනව. ඒ වුණාට මෙතනදි දැන් මානය - දිට්ඨිය - පත්‍ථනය කියල තුනකුත් එකතු කරල අභිධර්මය තුළදි මේ ගැන පැහැදිලි

කිරීම සිද්ධ කරනව. **ඒකට හේතුව තමයි මානය සහ දිට්ඨිය කියන මේ දේවල් එකට යෙදෙන්නේ නැතුව යනව.** අන්න ඒ නිසා තමයි මේ කාරණාවන් වෙන් කොට දක්වන්නට අවශ්‍ය නිසා ඒ සිත් වශයෙන් කතා කරන කොට එකට කතා කරන්නට වුණත් ඒ සිත්වල යෙදෙන ධර්මයන්ගේ වෙනස් බව නිසා තමයි මෙතනදි මානය දිට්ඨිය සහ පත්‍ථනය කියන මේ ධර්ම විශේෂයෙන්ම වෙන් කොට සඳහන් කරන්නට යෙදෙන්නේ. එතකොට මෙන්න මේ ආකාරයන්ට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව පකතූපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වීම කියන එක.

**රාගොදොසො මොහො මානො දිට්ඨි පත්‍ථනා - කායිකස්ස සුඛස්ස, කායිකස්ස දුක්ඛස්ස, ඵල සමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඒ වගේම රාගය - ද්වේෂය - මෝහය - මානය - දිට්ඨිය - ප්‍රාර්ථනය කියන මේ දේවල් **කායිකස්ස සුඛස්ස,** කායික සැපයට, **කායිකස්ස දුක්ඛස්ස,** කායික දුඛයට, ඒ වගේම රාග ආදී ධර්මයන්ගෙන් මිදීම සඳහා ඵල සමාපත්තියට සමවදින අවස්ථාවන්වල, දැන් සෝතාපත්ති ආදී ආර්‍යයින් වහන්සේලා දැන් ඵල සමාපත්තියට සමවදින කොට රාග ආදී ධර්මයන්ගෙන් ඉක්මීම සඳහා, එතකොට දැන් රාගයෙන් ඉවත් වන්නට, රාගය යටපත් කරන්නට, රාගය දුරුකර ගැනීම සඳහා, රාගී පීඩා නැතිකර ගැනීම සඳහා තමයි ඵල සමාපත්තියට සමවැදීම සිද්ධ කරන්නේ. ඵලය ආවර්ජනා කරල ඒ ඵල සමාපත්තියට සමවදින්නේ. දැන් සෝතාපන්න ආර්‍යයින් වහන්සේට රාගය අප්‍රහීණයි නේ. ප්‍රහීණ නැහැ නේ. රාගය උපදින්නට පුළුවන්කම තියෙනව. ඉතින් රාගය උපදින අවස්ථාවකදි සෝතාපන්න ආර්‍යයින් වහන්සේ නමකට එබඳු අවස්ථාවකදි උන්වහන්සේ ඇතැම් විටක ඵල සමාපත්තියට සමවදිනව.

ඇයි ඒ ඵල සමාපත්තියට සමවදින්නේ? ඵල සමාපත්තිය කියන එක අව්‍යාකෘත අවස්ථාවක් නේ ඒ වෙලාවේ උපදින සිත්. ඇයි ඒ අව්‍යාකෘතය ඉපදුනේ? අර රාගය මුල් කරගෙන. රාගය නිසා තමයි ඒකෙන් මිදීම සඳහා තමයි වැයම් කරමින් මේ ඵල සමාපත්තියට සමවැදීම සිද්ධ කලේ. එතකොට උපනිස්සය ප්‍රත්‍යය කියන මේ ප්‍රත්‍යයෙහි යෙදීම පිළිබඳව මම හිතනව ඔබට මේ ඔස්සේ ඉතාම සියුම් වුණ අදහසක් ඇති කරගන්නට පුළුවන්, මොකද්ද මේ  කතා කරන උපනිස්සය ප්‍රත්‍යය කියන්නේ කියලා යම්කිසි දළ අවබෝධයක් ඇති කරගන්නට මේ කාරණාව ඉතාම පහසු වෙනව.

සෝතාපන්න ආයයීන් වහන්සේ නමක් කියල හිතන්නකෝ. එතකොට උන්වහන්සේ අකුසලයෙන් මිදීම සඳහා ඵල සමාපත්තියට සමවදිනව. උන්වහන්සේට සෝතාපත්ති ඵලයට පත්වුණ උතුමන් වහන්සේට සෝවහන් ඵල මට්ටමේදී දිට්ඨි ආශ්‍රවය සම්පූර්ණයෙන්ම ප්‍රහීණයි. විචිකිච්ඡා ආශ්‍රවය සම්පූර්ණයෙන්ම ප්‍රහීණයි. සීලබ්බතපරාමාසයත් ප්‍රහීණයි. හැබැයි තාම කාමරාගය දුරුවෙලා නෑ. තාම පටිඝ සඤ්ඤාවත් දුරුවෙල නෑ. එතකොට මේ කාමරාග පටිඝ ආදී දේවල් උපදින කොට ඒ කාමරාග පටිඝ උපදින දේවල් යටපත් කිරීම සඳහා උන්වහන්සේ අර තමන් අවබෝධ කරගත්ත ඵලයට, එහෙම නැතිනම් ඒ සාක්ෂාත් කල ඒ ඵලයට, නැතිනම් ඵල සිත ආවර්ජනා කරමින් ඒ ඤාණ දර්ශනය නැවත පවත්වන්න පුළුවන්කම තියෙනව. එතකොට ඵල සිතට සමාපත්තියක් ලෙස හෝ ඒ ඵලයට සමවදින කොට ඒ ඵලයට සමවදින්න හේතුව බවට පත්වුණේ අර අකුසලයෙන් මිදීම කියන දේ. අකුසලය යටපත් කිරීම. අකුසලයෙන් ඉවත්වීම තමයි ඒකට හේතුව බවට පත්වුණේ.

එහෙනම් අකුසලයෙන් ඉවත් වීම සඳහා ඵල සමාපත්තියට සමවදිනවා කියන අවස්ථාවලදි අපිට හඳුනාගන්නට පුළුවන්කම

තියෙනවා අකුසලයෙන් ඉවත් වීම සඳහා ඵල සමාපත්තියට සමවදින වෙලාවෙදි අකුසලය කියන එක උපනිඃශ්‍රය කරගෙන තමයි අර ඵල සමාපත්තියට සමවැදුනේ. එතකොට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියන එකේදී හිතන්න එපා ඒ ධර්මය උපකාර කරල මේක යෙදිල තියෙනව කියල. දැන් ඒ ධර්මය දුරු කරන්න තමයි මේක පාවිච්චි කලේ. හැබැයි ඒ දුරුකිරීම සඳහා ඵල සමාපත්තියට සමවැදීම සිද්ධ කලත්, ඒ ද කියන්නේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණා කියල. එතකොට එතන තියෙන සියුම් ස්වභාවය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියන එකේදී මේ උපනිඃශ්‍රය කියල කියන්නේ මොකක්ද කියන එක ඔබට තේරුම් ගන්න ඒ කාරණාව ඉතාම වැදගත්.

දැන් අපි හරියට කිව්වොත් එහෙම මැටි වලින් තමයි වළඳ හදල තියෙන්නේ කිව්වහම ඒ වළඳේ මැටි අන්තර්ගත වෙලා තියෙනව කියල අපි කතා කරනව. අන්න ඒ වගේ දැන් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල කිව්වහම අපිට හිතට කෙනකුට එක පාර දැනෙන දේ තමයි අකුසලය මේ අව්‍යාකෘතයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල කිව්වහම, නැතිනම් මෙතන උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන වචනය කිව්වත් හිතනව, අර මැටි වලින් වළඳ හැදිල තියෙනව වගේ මේ උපනිස්සය ප්‍රත්‍යය යෙදෙන දේ මෙහි අන්තර්ගතයි ඵලයෙහි කියල. අකුසලය කුසලයකට උපනිඃශ්‍රය වෙනව කියල කිව්වහම අපිට අකුසලය නිකම් කුසලයත් සමග තියෙනව වගේ. මේ අකුසලයෙන් තමයි කුසලය උපද්දල තියෙන්නේ වගේ. ඒ වගේ මෙතන තියෙනව වගේ අදහසක් එනව. නෑ. එහෙම නෙමෙයි. ඒකට අදාළ භූමිය සකස් කිරීම සඳහා උපනිඃශ්‍රය භාවය සිද්ධ කරනව. ඒකට පකතූපනිස්සය විදියට අපි හඳුනාගන්නේ අන්න ඒ හේතුව නිසා තමයි.

අර ඵල සමාපත්තියට සෝවහන් ආර්‍යයින් වහන්සේ සමවදිනව. ඒ සමවදින්නේ අකුසලයන්ගේ දුරු කිරීම් සඳහා, යටපත් කිරීම

සඳහා, නැතිනම් ඉවත් කිරීම සඳහා ඵල සමාපත්තියට සමවදින කොට අර අකුසල් මුල් කරගෙන අකුසල් යටපත් කිරීම කියන දේ මුල් කරගෙන තමයි ඵල සමාපත්තියට සමවැදුනේ. ඒ නිසා ඒක උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදෙන අවස්ථාවක් හැටියට අපිට දකින්නට පුළුවන්කම තියෙනව. ඉතින් මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි යෙදෙන සියුම් ස්වභාවය පිළිබඳව මෙබඳු තැන්වලදී ඔබට වඩාත් වටහා ගන්නට පුළුවන්කම තියෙනව.

**අකුසලං කම්මං - විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** ඒ වගේම අකුසල කර්මය කියන එක විපාක ධර්මයක් උත්පාදනය කරන කොට, අකුසලයන්ගේ විපාකයක් සකස් කරන කොට, ඒ විපාකයට අකුසලය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දැන් අකුසලයක් අව්‍යාකෘතයකට ප්‍රත්‍යය වන විදිය ගැන නේ කතා කරන්නේ. දැන් අකුසලයක් නිසා යම්කිසි විපාකයක් උපදිනව නම් ඒ විපාකය අර අකුසලයෙහි උපනිඃශ්‍රය භාවය ලැබ ගෙන පහළ වන දෙයක්. උපනිඃශ්‍රය බව ලබන්නට ඒ ධර්මය දැන් මේ තියෙන්නට අවශ්‍යතාවයක් ඇත්තේ නැහැ. දැන් නොතිබුණු සම්පූර්ණයෙන්ම නැතිවෙල ගියපු දේක වුණත් ඒ ශක්තිය ලැබ ගෙන වර්තමානයෙහි හට ගන්නට පුළුවන්කම තියෙනව. ඒ අවස්ථාවන් තමයි අපිට මේ අකුසල විපාක සකස් වීම කියන දේ තුළ අපිට දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ. අකුසල විපාකයන්ගේ හට ගැනීම, අකුසල විපාකයන්ගේ සකස් වීම කියන එක අපිට දකින්නට පුළුවන්කම තියෙන්නේ අන්න ඒ හේතුව මුල් කරගෙන ඒ හේතුව නිසා.

ඒ කියන්නේ කුසල විපාක, අකුසල විපාක, ද්විපඤ්ච විඤ්ඤාණ සිත් ආදී දේවල් පහළ වන්නේ, ඒ වගේම යම්කිසි විදියකින් වෙන යම් රෝග පිඩා ආදී දේවල් ඇතිවන අවස්ථාවන් වලදි, කර්මජ ආබාධයන්ගේ හට ගැනීම සිද්ධ වන අවස්ථාවලදි, ඒ හැම දේකදිම බල පවත්වන ධර්මය, බලපවත්වන විශේෂය මොකද්ද? අකුසල විපාක හැටියට පැමිණීම. පෙර කල අකුසල

විපාක හැටියට පැමිණීම. අකුසල විපාක හැටියට පැමිණෙන කොට අපි දන්නව ඒව අපිට දිට්ඨධම්මවේදනීය වශයෙන් පැමිණෙනවා. ඒ වගේම මතු ආත්මභාවයෙහි ඒකාන්තයෙන් විපාක දෙන දේවල් තියෙනව. ඒ වගේම අනිකුත් ආත්මභාවයන්හී විපාක දීමට පැමිණෙන ධර්ම තියෙනව. එතකොට මේ විදියේ අකුසල් කලහම ඒ අකුසල් මෙලොව වශයෙනුත් ඒ වගේම අපිට ඊළඟ ආත්මභාවයෙනුත්, ඊට පස්සේ ඊට අනතුරු ආත්මභාවයන්හීත් විපාක දෙන ආකාරයෙහි කර්ම සකස් වීම සිද්ධ වෙන කොට ඒ හැම විපාකයක් ලබන අවස්ථාවකදිම මොකද වෙලා තියෙන්නේ? ඒ විපාකයට අර අකුසලය උපනිඃශ්‍රය වීම තුළ තමයි ඒ ඵලය උපදින්නේ.

ඒ කියන්නේ දැන් අකුසලයක් කිරීම ඇතුලේ එහි විපාකය ලැබෙනවා කියන එකට ඉඩකඩ සකස් වෙලා තියෙනව. අකුසලයක් කිරීම ඇතුලේ ඒ ප්‍රත්‍යය ක්‍රියාත්මක වන මොහොතෙදි අනිවාරයෙන්ම එහි ඵලය අත් විඳින්නට සිද්ධ වෙනව කියන එක නියතියක් විදියට සකස් වෙලා තියෙනව. අන්න ඒක තමයි අපිට එතනදි හඳුනගන්නට පුළුවන්කම තියෙන්නේ. උපනිඃශ්‍රය භාවය කියන දේ ලැබෙන්නේ අන්න එලෙස යෙදීමක් විදියට. ඒ නිසා **අකුසලං කම්මං - විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** අකුසල කර්මයක් විපාක ධර්මය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව.

ඒ වගේ අපිට ඊළඟ ධර්ම කොට්ඨාසයත් අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව කතා කරන කොට. දැන් අපි කතා කලේ අකුසලය පිළිබඳව. අකුසලය අකුසලයට, අකුසලය කුසලයකට සහ අකුසලය අව්‍යාකෘතයකට කොහොමද උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කියන එක පිළිබඳව තමයි අපි වඩාත්ම හඳුනාගන්නට යෙදුනේ.

දැන් අපි අද දවසෙදි අව්‍යාකෘත ධර්මයක් කොහොමද බලවත් උපකාරය සිද්ධ කරගෙන තව අව්‍යාකෘත ධර්මයක් උපදවන්නේ කියන එක පිළිබඳවත් අපිට විමසා බලන්නට පුළුවන්කම තියෙනව. එතකොට අව්‍යාකෘත ධර්මයක් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම තුළ තවත් අව්‍යාකෘත ධර්ම උපදින අවස්ථා අපිට දකින්නට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. **ඒ ආකාරයට අව්‍යාකෘත ධර්මයක් තව අව්‍යාකෘත ධර්මයක් උපදවීම සඳහා උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙනවා** කියන එක පිළිබඳව සැලකිල්ලට ගන්න කොට අපිට දකින්නට පුළුවන්කම තියෙනවා ආරම්මණ උපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. ආරම්මණ උපනිස්සය කියල කියන්නේ යමක් අරමුණු කිරීම් විදියට. කොහොමද?

## ***ආරම්මණ උපනිස්සය***

**අරහා ඵලං - ගරුං කත්වා පච්චවෙක්ඛති**
**නිබ්බාණං - ගරුං කත්වා පච්චවෙක්ඛති**
**නිබ්බාණං - ඵලස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

**අරහා ඵලං - ගරුං කත්වා පච්චවෙක්ඛති.** එතකොට අපිට දකින්නට පුළුවන්කම තියෙනව රහතන් වහන්සේ ඵලය ගරු කරගෙන ප්‍රත්‍යවේක්ෂා කරනව කියන එක. එතකොට ප්‍රත්‍යවේක්ෂා කරනව කියන කොට ප්‍රත්‍යවේක්ෂා කරන සිත ක්‍රියා සිතක්. ඒක කුසල හෝ අකුසල වශයෙන් නෙමෙයි රහතන් වහන්සේට ඒ සිත උපදින්නේ හුදු ක්‍රියා මාත්‍රික ධර්මයක් හැටියට. එතකොට ඒ ඵලය ආවර්ජනා කරන කොට නැතිනම් ඒ ඵලය පිළිබඳව නැවත ප්‍රත්‍යවේක්ෂා කරන කොට අන්න එබඳු අවස්ථාවලදි මොකද්ද වෙන්නේ? අරිහත් ඵල සිත කියල කියන්නේ විපාක අවස්ථාවක් නේ. අන්න ඒ විපාකය අරමුණු කරමින් ක්‍රියා සිතක පහළ වීමක්. ඒ කියන්නේ විපාක සිතක් උපනිඃශ්‍රය වෙලා තියෙනව අර ක්‍රියා චිත්තය සකස් කරන්නට.

එතකොට එතනදි අව්‍යාකෘත ධර්මයක් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම තුළ තවත් අව්‍යාකෘත ධර්මයක සකස් වීමක් සිදුවුණ බව අපිට දකින්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම **නිබ්බාණං - ගරුං කත්‍වා පච්චවෙක්ඛති,** නිර්වාණය ගරු කරගෙන ප්‍රත්‍යවේක්ෂා කරනව. නිර්වාණය කියල කියන්නේ අව්‍යාකෘත ධර්මයක්. කුසල අකුසල වශයෙන් කතා නොකරන ධර්මයක් තමයි නිර්වාණය කියල කියන්නේ. නිර්වාණය ගරු කරගෙන නිවන ප්‍රත්‍යවේක්ෂා කරන කොට ඒ ප්‍රත්‍යවේක්ෂා කරන ක්‍රියා සිතට **(කාමාවචර ඤාණසම්ප්‍රයුක්ත ක්‍රියා සිත්)** අරමුණු වෙන්නේ නිර්වාණ ධාතුව. ප්‍රත්‍යය වෙලා තියෙනව අර ආවර්ජනා කරන නැතිනම් ප්‍රත්‍යවේක්ෂා කරන ඒ ක්‍රියා මාත්‍රික සිත් වලට ප්‍රත්‍යය වෙලා තියෙනව. එතකොට නිර්වාණය උපනිස්සය කරගෙන තමයි ඒ ප්‍රත්‍යවේක්ෂාව සිද්ධ කරන්නේ. එබඳු අවස්ථාවලදි සිද්ධ වන්නේ ඒ අව්‍යාකෘත ධර්මයක් උපනිස්සය ප්‍රත්‍යයෙන් තවත් අව්‍යාකෘත ධර්මයකට ප්‍රත්‍යය වන බවයි කියන එක අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම **නිබ්බාණං - ඵලස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** නිර්වාණ ධාතුව ඵලයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. නිවන කියන එක ඵලයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. නිවන එකක්. ඵලය තවත් එකක්. ඵලය කියල කියන්නේ ඵල චිත්තයක්. ඒක ඵල සිතක්. ඵල සිත කියන්නේ නිවන නෙමෙයි. නිර්වාණ ධාතුව නෙමෙයි ඵල සිත කියල කියන්නේ. ඵල සිත කියල කියන්නේ සංඛත ධර්මයක්. ඒක හේතු නිසා හටගන්න දෙයක්. ඒ නිසා ඒ සිත බිඳෙනව. ඒ සිත නැතිවෙනව. හැබැයි නිර්වාණය කියල කියන්නේ සංඛත ධර්මයක් නෙමෙයි. අපි හිතනව නම් ඵල සිත තමයි නිවන කියල එහෙනම් අපි නිවන සංඛත ධර්මයක් විදියට හඳුනාගත්ත වෙනව. හැබැයි නිවන කියල කියන්නේ සංඛත ධර්මයක් නෙමෙයි. නිවන අසංඛත

ධාතුව. ඒක හේතු නිසා සකස් වන ධර්මයක් නෙමෙයි. හැබැයි නිවන මේ ඵල සිත හටගන්නට නැතිනම් ඵල සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව.

ඵල සිතක් උපදින්නේ නිවනට නැඹුරුව. නිවන අරමුණු කරමින් තමයි ඵල සිතක පහළ වීම සිද්ධ වෙන්නේ. එහෙනම් ඵල සිත කියන ධර්මය නිවනට නැඹුරුව නිවන අරමුණු කරගෙන පවතින දෙයක්. හැබැයි සිත සංඛත සිතක්. හැබැයි අසංඛත ධාතුව උපනිඃශ්‍රය කරගෙනයි තියෙන්නේ. අසංඛත ධාතුව ඒ නිසා නිවන, ඵල සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව. අසංඛත ධාතුව ඵල සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ නැති වුණොත් එහෙනම් එතන නිවීමක් දුකේ නැති වීමක් ගැන කතා කරන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා අපිට එතනදි තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව නිවන කියන එක ඵල සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. නිර්වාණ ධාතුව කියල කියන්නේ නිවන කියල කියන්නේ අව්‍යාකෘත ධර්මයක්. ඒ වගේම ඵල සිත කියල කියන්නේ ඵල අවස්ථාව කියල කියන්නෙත් අව්‍යාකෘත ධර්මයක්. එහෙනම් මොකද්ද එතනදි සිද්ධ වුණේ? අව්‍යාකෘත ධර්මයක් තවත් අව්‍යාකෘත ධර්මයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම තමයි ඒ අවස්ථාවෙදි සිද්ධ වුණේ.

මෙන්න මේ විදියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව උපනිස්සය ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යය භාවය කියන එක. අව්‍යාකෘත ධර්මයක් තවත් අව්‍යාකෘත ධර්මයක් උපදවන්නට ප්‍රත්‍යය වන අවස්ථාවන්හි දි මෙහි යෙදීම පිළිබඳව ඒ විදියට අපිට දකින්නට පුළුවන්කම තියෙනව.

## *අනන්තර උපනිස්සය*

ඒ වගේම මේ ආරම්මණ උපනිස්සය වගේම අනන්තර උපනිස්සය විදියටත් අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘත ධර්මයන්ට ප්‍රත්‍යය වීම සිදු කරණු ලබනව. මොකද්ද අනන්තර උපනිස්සය කියල කියන්නේ **පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඒ කියන්නේ පළමු පළමු විපාක අව්‍යාකෘත ධර්මයන් ඒ සිත් වල උපදින චිත්ත චෛතසික ධර්ම පසුව උපදින විපාක කිරිය සිත් වලට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. මේක අනන්තර උපනිස්සය වශයෙන් උපදින අවස්ථාවන්. දැන් හිතන්නකෝ කිරිය ජවන උපදිනව කියල. එතකොට යම් චිත්ත වීථියක කිරිය ජවන උපදින කොට ඒ ක්‍රිය ජවන් සිත් හතක් උපදිනව. පළමු ජවන සිත දෙවෙනි ජවන සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. අපි මීට පෙර ඒක හඳුනගෙන තියෙනව. දෙවෙනි සිත තුන්වෙනි සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. තුන හතරට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මෙතනදි සිදුවන උපනිස්සය ප්‍රත්‍යය ඊට අනතුරුවම ඒ ධර්මය උපදවන්නට ප්‍රත්‍යය වීමක් විදියටයි වෙන්නේ.

ඒක උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ ඊට අනතුරුවම ඒ අනිත් ධර්මය උපදවනව කියන තැනින්. ඒ නිසා අපි ඒක විශේෂ නමින් හඳුන්වනව අනන්තර උපනිස්සය කියල. එහෙනම් මේ ක්‍රියා සිත් හතක් මේ ජවන් හැටියට උපදිනව නම් ක්‍රියා ජවනයන් කියන තැන් වලදි පළමු ක්‍රියා ජවනය දෙවන ක්‍රියා ජවනය උපදවන්නට අනන්තර උපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වෙනව. දෙවන ක්‍රියා ජවනය තෙවන ක්‍රියා ජවනය උපදවන්නට අනන්තර උපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වෙනව. තෙවන එක සිවුවෙනි ක්‍රියා ජවනය උපදවන්නට අනන්තර උපනිස්සය

වශයෙන් ප්‍රත්‍යය වීම සිදු කරණු ලබනව. මෙන්න මේ විදියට අනන්තර උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය අපිට දකින්නට පුළුවන්කම තියෙනව විපාක ධර්මයන් අතර ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව බලන කොට.

එතකොට මෙතනදි කතා කරන්නේ අනන්තර උපනිස්සය නිසා අර භූමින් සකස් කරනව වගේ තැනක් නෙමෙයි. මේ සිතට අනතුරුව ඊළඟ සිත උපදවනව කියන තැනක තමයි අපිට කතා කරන්න පුළුවන්කම තියෙන්නේ. ඒ නිසා තමයි **පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො** කියල මේ පිළිබඳව පැහැදිලි කලේ. අර පෙර ඉපදුන විපාක හෝ ක්‍රියා අව්‍යාකෘත ධර්ම ඊට පසුව උපදින විපාක හෝ ක්‍රියා අව්‍යාකෘත ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එකයි එතනදි අදහස් කරන්නට යෙදුනේ.

**භවංගං - ආවජ්ජනාය**
**කිරියං - වුට්ඨානස්ස**
**අරහතො අනුලොමං - ඵලසමාපත්තියා**
**උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඒ වගේම **භවංගං - ආවජ්ජනාය,** භවංගය ආවර්ජනා කරන කෙනාට මේ උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය සිද්ධ වෙනව. එතකොට භවාංගයෙන් හිත මිදිල ආවර්ජනාවට ලක් වෙනව. භවාංගය කියල කියන්නේ මොකද්ද? විපාක මට්ටමේ ඉපදුනු චිත්ත පරම්පරාවක්. ඊට පස්සේ ආවජ්ජනාය කියල කියන්නේ ක්‍රියා මට්ටමේ සිතක්. එතකොට භවාංග ගතව තිබුණ සිත ඊට පස්සේ ඊට අනතුරුව ආවජ්ජන චිත්තය උපදවන කොට දැන් අපි චිත්ත වීථියක් ගන්න කොට භවාංග - භවාංග චලන - භවාංගුපච්ඡේදය කියල සිත් තුනක් පිළිබඳව අපි කතා කරනව. මේ තුනම භවාංග සිත් හැටියට නේ කතා කරන්නේ. භවාංග

අවස්ථාව. භවාංග චලනය වන අවස්ථාව, භවාංගයෙන් නැගී සිටින අවස්ථාව. එතකොට මේ සිත් තුනම භවාංග කුලකයෙහි ලා තමයි භවාංග ගණයෙහි ලා තමයි කතා කරන්නේ. භවාංගයත් - භවාංග චලනයත් - භවාංගුපච්ඡේදයත් කියන මේ තුනම භවාංග මට්ටමේ සිත් හැටියටයි ගණනය කරන්නේ.

ඊට පස්සේ උපදින සිත ද්වාරවජ්ජනය (**පඤ්චද්වාරවජ්ජන, මනොද්වාරවජ්ජනය)**. ද්වාරයක් ආවර්ජනා කරනව. එක්කෝ ඇස, එක්කෝ කන, එක්කෝ නාසය. මොකක් හරි ද්වාරයක් ආවර්ජනා කිරීම තමයි එතනදි සිද්ධ වන දේ. එතකොට අන්න ඒ ආවජ්ජනා සිත, භවංගං ආවජ්ජනාය කියන කොට අර භවාංග මට්ටමේ සිත, භවාංගය - භවාංග චලනය - භවාංගුපච්ඡේද කියන මට්ටමේ උපච්ඡේදන සිත මෙතනින් සිඳිල නේ ආවර්ජනාවට ලක් කරන්නේ. අන්න ඒ සිඳිල ආවර්ජනාවට ලක් කරනව කියන තැනදි ඒ ආවජ්ජන සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මොකද්ද? භවාංග සිත. භවාංග සිත කියල කියන්නේ විපාක මට්ටමේ සිතක්. ආවර්ජනා සිත කියල කියන්නේ ක්‍රියා සිතක්. ඒ විපාකය ඒ ක්‍රියා සිතට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම කියන එක තමයි එතනදි දකින්නේ. ඒ අවස්ථාවෙදි ඒ කියන්නේ භාවිත වෙලා තියෙන්නෙත් විපාක අව්‍යකෘත ධර්මයක් අර ආවර්ජනය නැමති ක්‍රියා අව්‍යාකෘතයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම කියන තැන තමයි අපිට දකින්න පුළුවන්කම තියෙන්නේ.

**කිරියං** - **වුට්ඨානස්ස** කියල කියන කොට මෙතනදි අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව වුට්ඨාන කියන්නේ නැගී සිටීම කියන අර්ථය. මෙතනදි අර ආවර්ජනා කරන ක්‍රියාවන් කියන එක අතහැරල (ආවජ්ජනා ක්‍රියා සිත) අනිකුත් ක්‍රියා සිත්, කාමාවචර ක්‍රියා - රූපාවචර ක්‍රියා -ආරූපාවචර ක්‍රියා ආදී වශයෙන් මේ උපදින ක්‍රියා සිත් දිහා බැලුවහම මෙන්න මේ ක්‍රියා සිත්, එක වීථියක ඒ ක්‍රියා සිත් වලට අනතුරුව උපදින

තදාරම්මණ සිත් වලට, අපි දන්නව චිත්ත වීථියක් ගත්තහම, චිත්ත වීථියෙහි ක්‍රියා ජවන හතක් ඉපදිල ඊට පස්සේ අපි අර මුලින් හඳුනගත්ත වගේ තදාරම්මණ දෙකක් ඉපදිල තමයි ඒ චිත්ත වීථිය නිරුද්ධ වෙන්නේ. නැතිනම් ඒ චිත්ත වීථිය බිඳෙන්නේ. ඊට පස්සේ ඇතැම් අවස්ථාවලදී තදාරම්මණ උපදින්නේ නැතුව කෙලින්ම භවංගපතනය වෙනව. භවංග ගත වීම සිද්ධ වෙනව.

ඒ හැම අවස්ථාවකදිම මොකද්ද සිද්ධ වුණේ? ඒ සෑම අවස්ථාවකදිම සත්වන ක්‍රියා සිත අර තදාරම්මණයට හෝ සත්වන ක්‍රියා ජවනය භවාංගයට හෝ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මොන උපනිඃශ්‍රය විදියට ද? මේ කතා කරපු අනන්තර උපනිස්සය විදියට. අව්‍යාකෘතයක් අව්‍යාකෘතයකට ප්‍රත්‍යය වන අනන්තර උපනිස්සය විදියට ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. ඒක අපිට වඩාත්ම පැහැදිලි කරගන්නට පුළුවන්කම තියෙනව අර සිත් වල ඉපදීම යෙදීම පිළිබඳව විශේෂයෙන් තේරුම් ගැනීම ඇතුලේ.

ඒ කියන්නේ චිත්ත වීථියක යෙදීමේදී ජවන චිත්තෝත්පාදයන්ට අනතුරුව තදාරම්මණ සිත් උපදිනව. ඇතැම් වීථීන්ගේදී තදාරම්මණ උපදින්නේ නැතුව මහත්තාරම්මණ වෙන කොට අපිට දකින්න පුළුවන්කම තියෙනව තදාරම්මණ වශයෙන් ඇති නොවී ඒ සිත භවාංග ගතවන අවස්ථා අපිට දකින්නට පුළුවන්කම තියෙනව. එබඳු අවස්ථාවලදී අපිට තේරුම් ගන්නට පුළුවන් මෙන්න මේ ක්‍රියාකාරිත්වය. ඒ කියන්නේ අර ක්‍රියා ජවනය විපාක තදාරම්මණ එහෙම නැතිනම් ඒ භවාංගයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වුණා කියන එක දකින්න පුළුවන්කම තියෙනව. ඒකයි **කිරියං - වුට්ඨානස්ස** කියල දක්වන්නට යෙදුනේ.

ඒ වගේම **අරහතො අනුලොමං - ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.** රහතන් වහන්සේට අනුලොමය සහ ඵලසමාපත්තිය කියන එකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. ඒ කියන්නේ අර අනුලොම අවස්ථාව. රහතන් වහන්සේට අනුලොම කියන අවස්ථාව ඵල සමාපත්තියට පත්වෙන්නට හේතු වෙනව. අපි දැන් අනුලොම කියන කොට සාමාන්‍යයෙන් අර කාමාවචර මහා කුසල සිත් උපදින්නේ. එතකොට රහතන් වහන්සේට උපදින කොට ඤාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් විදියට පහළ වෙනව. එතකොට මෙන්න මේ මහා ක්‍රියා සිත් විදියට ඒ උපදින සිත් ටික අර ඵල සමාපත්තියට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. ඒක අනුලොමය ඵල සමාපත්තියට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව රහතන් වහන්සේට කියල කියන්නේ ඒ නිසා. එබඳු අවස්ථාවලදි අර ක්‍රියා සිත් හතර තමයි උපදින්නේ අනුලොම වශයෙන්. ඒ අනුලොමය ඵල සමාපත්තියට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන තැනදි ක්‍රියාත්මක වන ධර්මය තමයි අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයක් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක තමයි මෙතනදිත් අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙන්නේ.

## *පකතූපනිස්සය*

ඒ වගේම අපිට පකතූපනිස්සය කියන එකත් අපිට එලෙසම හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. මොකද්ද පකතූපනිස්සය කියන කොට අර කලින් සාකච්ඡා කලා වගේම **කායිකංසුඛං - කායිකස්ස සුඛස්ස කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.** කායික සැපය කියන එක කායික සැපයටත්, ඒ වගේම කායික දුක්ඛයටත්, ඒ වගේම ඵල සමාපත්තියටත් **උපනිස්සය පච්චයෙන පච්චයො,** උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. කායික දුක කායික සැපටත් කායික

දුක්ඛයටත් ඵල සමාපත්තියටත් **උපනිස්සය පච්චයෙන පච්චයො**, උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල මේ විදියට අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

එතකොට මේ කාරණාව පිළිබඳව පැහැදිලි කරගන්න කොට හිතෙන්නට පුළුවන් **කායිකංසුඛං - කායිකස්ස සුඛස්ස කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො** කියන කොට කොහොමද කායික සැපය, කායික සැපයට සහ කායික දුකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කියන එක. දැන් යම්කිසි කෙනකුට කායික වශයෙන් සැප සහගත බවක් දැනෙන කොට ඒ කායික වශයෙන් දැනෙන සැප සහගත බව කායික වශයෙන් දැනෙන සැප සහගත බවටම උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. ඒ වගේම ඒ සැප සහගත බව නැතිවෙල කායික දුකක් හටගන්න කොට ඒ දුකටත් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. කායික වශයෙන් හටගත්ත සැපය නැතිවෙන කොට දුක උපදිනව. එතකොට අර කායික සැපය නැතිවීම නේ මේ සිද්ධ වුණේ. එතකොට ඒ සැපය අර දුක ඇතිවීම කියන එකටත් කායික දුකටත් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව. ඒ වගේම කායික සැපය මුල් කරගෙන ඵල සමාපත්ති ආදී උපදවන අවස්ථාවලදීත් සිද්ධ වන දේ තමයි ඒද උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය, උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම කියන එක එතනට අදාළව.

මේ පකතූපනිස්සය ටිකක් අපිට විස්තාරත්මකව කතා කරන්නට සිද්ධ වෙනව. අපි ඉදිරියට ඒ පිළිබඳව තව දුරටත් වැඩි දුරට සාකච්ඡා කරමු.  අද කරුණු කාරණා ටිකක් කරුණු වශයෙන් ගොඩක් සාකච්ඡා කෙරුණු නිසාම.

**සාදු සාදු සාදු**

# 20.04.2024 දින පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ විසින් අනන්ත නය ඇත්තා වූ පට්ඨානමහාප්‍රකරණය අනුසාරයෙන් දේශනා කොට වදාළ වූ විසි නවවෙනි පට්ඨාන දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො .......///**

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි. හැම දෙනාම උතුම් ශ්‍රද්ධර්ම ශ්‍රවණය සඳහා සුදානම් වන මොහොත.

ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඒ උතුම් ශ්‍රද්ධර්ම සාගරයෙන් ස්වල්පයක් නමුත් ශ්‍රවණය කරගන්නටයි ඔබ හැමදෙනාම සූදානම්ව වන්නේ.

අභිධර්ම පිටකයෙහි පට්ඨානප්‍රකරණයෙහි දැක්වෙන සූවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳවයි පිළිවලින් අපි සාකච්ඡාවට බඳුන් කරන්නේ. සමස්ත පට්ඨානය පිළිබඳව කෙරෙන අධ්‍යනයකට වඩා සූවිසි ප්‍රත්‍යයන් යනු මොනවාද, ඒ ප්‍රත්‍යයන්ගේ ස්වභාවය මොන ආකාරයක්ද යන්න පිළිබඳවයි අපේ මේ සාකච්ඡාවෙහි මූලික අභිලාෂය බවට පත්වන්නේ.

ඒ අනුව අපි පියවරෙන් පියවරට එක් එක් ප්‍රත්‍යය පිළිබඳව සාකච්ඡා කරමින් ඇවිත් උපනිස්සය ප්‍රත්‍යය පිළිබඳව තමයි අවසාන වශයෙන් සාකච්ඡාවට බඳුන් කරන්නට යෙදුනේ. ඒ අනුව අව්‍යාකෘත ධර්මයක් උපනිඃශ්‍රය වීම තුළ අව්‍යාකෘත ධර්මයන් උපදින්නේ මොන ආකාරයකටද ආදී ලෙස අපි මේ පිළිබඳව සාකච්ඡා කිරීම පටන් ගෙන යම් ටික දුරක් සාකච්ඡා කලා. නමුත් අපිට පසුගිය දිනක කල දේශනාවක් මග හැරීමක් නිසා එහි කරුණු කීපයක් අඩංගු දේශනාවක් විකාශ වී නොතිබීම අපිට කීපදෙනකු විසින් දන්වා තිබුණා. ඒ නිසාම එය

නැවත කෙටියෙන් සඳහනක් කරල අපි අද දවසෙදි තියෙන මාතෘකාව පිළිබඳව සාකච්ඡා කරන්නටයි බලාපොරොත්තු වන්නේ.

කුසල ධර්මයන් පිළිබඳව සහ අකුසල අව්‍යාකෘත ධර්මයන් පිළිබඳවයි අපි උපනිස්සය ප්‍රත්‍යය මුල් කරගෙන කතා කරන්නේ. මේ පිළිබඳව අපි මේ දේශනාව පවත්වා ගෙන ආපු පිළිවෙල දන්නා ඔබ හඳුනාගෙන තියෙනවා ඒ මාතිකා ත්‍රිකයට අනුව කොහොමද මේ දේශනා ටික පැමිණෙන්නේ කියල. ඒ ක්‍රමය ඔස්සේ අපි බලන කොට අකුසලය කියන මාතෘකාවට අනුව නැතිනම් අකුසලා ධම්මා කියන මාතෘකාවට අනුව අකුසලයක් උපනිඃශ්‍රය වීම තුළ අකුසල් උපදින්නේ කොහොමද, අකුසලයක් උපනිඃශ්‍රය වීම තුළ කුසලයන් උපදින්නේ කොහොමද, අකුසලයන් උපනිඃශ්‍රය වීම තුළ අව්‍යාකෘත ධර්මයන් උපදින්නේ කොහොමද කියන එක පිළිබඳව තමයි අපි සාකච්ඡා කරන්නට යෙදුනේ. එහිදී වඩාත් පැහැදිලි නොවුණු කාරණාවක් හැටියට සඳහන් කරන්නට යෙදුනේ අකුසලයක් මුල් කරගෙන උපනිඃශ්‍රය වීම තුළ කුසල ධර්මයන් කොහොමද හට ගන්නේ, කුසල ධර්මයන් කොහොමද පහළ වන්නේ කියන එක පිළිබඳව වඩා පැහැදිලි කිරීමක් සිද්ධ වුණේ නැහැ කියල.

**අකුසලයක් මුල් කරගෙන කුසලයන් ඉපදීමේදී අපි දන්නව අනන්තර උපනිස්සය වශයෙන් එහි යෙදීමක් සිද්ධ වෙන්නේ නැහැ කියල. ඒ කියන්නේ සිත උපදින ක්‍රමය අනුව සිත උපදින වීථීන් අනුව ගත්තහම යම් ආකාරයක අකුසල සිතක් ඉපදුනොත් එහෙම ඒකට අනතුරුවම නැවත කුසල සිතක් උපදිනවා කියන එකක් සිද්ධ වන්නේ නැහැ. ඒ නිසා අනන්තරූපනිස්සය ස්වභාව වශයෙන් ඒ උපනිස්සය ප්‍රත්‍යය අකුසලයක් කුසලයකට උපනිඃශ්‍රය වන්නේ නැහැ.** ***(අකුසල් උපනිඃශ්‍රය කොට කුසල් පහළ වීමේදී අකුසල් ගරු වශයෙන් අරමුණු කොට කුසල් නූපදින හෙයින් ආරම්මණූපනිස්සය නොලැබේ. කුසල සිතකින් අකුසල්***

*සිතක් ගරුකොට අරමුණු නොකෙරේ. අකුසලයෙන්, කුසලයෙහි අකුසලය හා සමග අතරක් නැතුව කුසල් නූපදින හෙයින් අනන්තරූපනිස්සය ද නොලැබේ.)*

හැබැයි පකතූපනිස්සය වශයෙන් උපනිඃශ්‍රය වන්නට පුළුවන්කම තියෙනව. පකතූපනිස්සය වශයෙන් උපනිඃශ්‍රය වීම සිදුවන අවස්ථා පිළිබඳව අපි විමසා බැලුවොත් එහෙම අපිට දකින්නට පුළුවන්, **පාණං හනත්වා තස්ස පටිඝාතත්‍ථාය - දානං දෙති. සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති. අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

**පාණං හනත්වා තස්ස පටිඝාතත්‍ථාය - දානං දෙති.** යම්කිසි කෙනෙක් සතුන් මැරීම කියන දේ සිද්ධ කරල එය වලක්වා ගැනීම සඳහා, එයින් ලැබෙන විපාක පිළිබඳ හෝ තේරුම් අරගෙන ඒ වගේම ඒ පව් දුරු කිරීම සඳහා ඒ කෙනා දන් දීම සිද්ධ කරනව. ඒ වගේම **සීලං සමාදියති,** සිල් සමාදන් වෙනව. **උපොසථ කම්මං කරොති,** උපෝසථ කර්මයන් සිද්ධ කරනව. ඒ වගේම **ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති,** ධ්‍යාන වඩනව. විදර්ශනාව වඩනව. **මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති,** මාර්ගය උපදවනව. අභිඥා ලැබීම සිද්ධ කරනව. **සමාපත්තිං උප්පාදෙති,** සමාපත්තීන් උපදවනව.

දැන් මේ අවස්ථාවන්වලදි යම් එබඳු ආකාරයකට අකුසලයක් සිද්ධ වුණ කෙනෙක් ඒ අකුසලයන්ගේ විපාක දුරු කිරීම සඳහා, ඒ අකුසලයන් ඉවත් කිරීම සඳහා යම් එබඳු ආකාරයකට කුසලයන් රැස් කරනව නම් කුසල කර්ම සිද්ධ කරනව නම් අන්න එබඳු අවස්ථාවක් පිළිබඳව තමයි මේ කතා කරන්නේ.

එතකොට මේ **තස්ස පටිඝාතත්‍ථාය** කියල කියන්නේ ඒ පටිඝාතය කිරීම කියන එකෙන් අදහස් වෙන්නේ ඒ අකුසලය අපි

ප්‍රතිඝාතනය කරනව කියන එකේ මූලික බලාපොරොත්තුව නැතිනම් මූලික අභිලාෂය බවට පත්වන්නේ එතන **තස්ස පටිබාහනත්‍ථාය**, ප්‍රතිබාහනය කිරීම කියන අර්ථය. ඒ කියන්නේ ප්‍රතිබාහනය කියල කියන්නේ **විපාකො තස්ස අනුප්පාදනත්‍ථාය** කියල කියනව, එතන අනුප්පාදය ඇති කිරීම, විපාකය එලෙසට බොහොම දැඩි විපාකයක් ලෙස නොලැබෙන පරිදි ඒ කර්මය සකස්  කරගැනීම කියන එක තමයි මෙතනදි මූලික පරමාර්ථය බවට පත්වන්නේ. ඉතින් මේක තමයි සිතක යෙදෙන සාමාන්‍යය ස්වභාවය. ඒකයි බොහෝ වෙලාවට මේ දහම් කරුණු පිළිබඳව තේරුම් ගන්න කෙනාට තමන්ගේ සිත තමන්ට කැමති පරිදි සකස් කරගන්න කෙනෙක් බවට පත්වන්නට පුළුවන්කම තියෙනව.

තමා අතින් සිදුවුණ දේවල් පිළිබඳව පසු තැවීමකට ලක් නොවී ඊට වඩා කුසලයන්ගෙන් තමන්ගේ ජීවිතය පරිපූර්ණ භාවයට පත්කර ගන්නට පුළුවන්කම තියෙන්නේ එහි ක්‍රියාත්මක විෂය පිළිබඳව මූලික අවබෝධයක් ඇති කෙනකුට. යම්කිසි විදියකින් ඇතැම් කෙනෙක් සත්ත්ව ඝාතන ආදිය සිද්ධ කරල ඒ මත පසුතැවීමෙන් යුක්තව ඉන්නව නම් පසු කාලකදි වුණත් ඒක ඔහුට තව අකුසල රැස් කරන දෙයක්. ඒක තේරුම් ගැනීම ඒ ගැන පසුතැවිලි වීම කියන එක නෙමෙයි, එයින් නිදහස් වන්නට, එයින් මිදෙන්නට තියෙන ක්‍රමය බවට පත්වන්නේ. ඉතින් එතනදි යම්කිසි කෙනකුට ඒ සඳහා අනුගමනය කල හැකි ක්‍රියා මාර්ගයන් පිළිබඳව තමයි මෙතනදි මේ කරුණු වශයෙන් දක්වන්නට යෙදුනේ. ඒක **පටිඝාතත්‍ථාය** කියල කිව්වේ ඒක ප්‍රතිඝාතය කිරීම සඳහා **පටිබාහනත්‍ථාය** ප්‍රතිබාහනය කිරීම සඳහා විපාක වශයෙන් අපි කිව්වා **අනුප්පාදනත්‍ථාය** කියල.

**අනුප්පාදය ඇති කරන්න, විපාක වශයෙන් ඒක දැඩි ලෙස නොලැබෙන්නට ඒ සඳහා වෑයම් කිරීමක් කරන්න පුළුවන්. එහෙම හිත තැබීමක් කරන්න පුළුවන්කමක් තියෙනව.**

**කොහොමද? ඒක සිද්ධ කරන්න පුළුවන් ආකාරය තමයි අර කුසල පාක්ෂික ධර්ම බලවත් කිරීම කියන එක තුළ. කුසලය පැත්ත දියුණු කිරීම බලවත් කිරීම තුළ තමයි එයට අපිට හැකියාවක් සැලසෙන්නේ.**

අපි දන්නව දුටුගැමුණු රජ්ජුරුවෝ යුද්ධයක් කලා. එතකොට අපි දන්නව යුද්ධ කරන කොට බොහෝ මිනිස්සු ප්‍රමාණයක් අපසුතාවයට පත්වෙනව. ඒ වගේම මරණයට පත්වෙනව. වධ බන්දනයන්ට පත්වෙනව. නොයෙක් ආකාරයේ දේවල් සිද්ධ වෙනව යුද්ධයක් කියන දේ ඇතුළත. හැබැයි මේ යුධ පෙරමුණේ මහරහතන් වහන්සේලා තබාගෙන වැඩම කලා. යුද්ධ කරන්නට නෙමෙයි. රජ්ජුරුවන්ට දානය පූජා කරල කුසල් රැස් කරගැනීමේ මූලික අභිලාෂය ඇතුව.

ඇත්තටම ඒ දුටුගැමුණු රජ්ජුරුවන්ගේ කතා ප්‍රවෘත්තිය පිළිබඳව අපි නිරීක්ෂණය කරල බලන කොට ඒ ප්‍රවෘත්තිය ඇතුලේ අපිට දකින්නට පුළුවන්වන කාරණා තියෙනව. එකක් ධර්ම ඥාණය. ඒ වගේම ඒ රජතුමාට කොච්චර දුරට අනුසාසනා ලැබෙන්නට ඇති ද කියන එක පිළිබඳව මේ අභිධර්ම කාරණා පිළිබඳව විමසා බලන කොට වුණත් අපිට තේරුම් ගන්න පුළුවන්කම තියෙනව. දකින්නට පුළුවන්කම තියෙනව. ඉතින් දැන් මේ සිත් උපදින විදිහ ගත්තම අපි අන්‍යයන් කෙරෙහි බොහොම ද්වේෂ සහගතව බොහොම තරහ උපදවා ගෙන ගිහිල්ල යුද්ධයක් කලොත් එහෙම එතනදී ලැබෙන විපාකයත්, ඇතැම් වෙලාවකදී කෙනෙක් ගිහිල්ල මේ දේ නොවුණොත් එහෙම මීට වඩා විනාශයක්, බොහෝ දෙනකුට අපහසුවක් ඇති වෙනව. ඒ වගේම මේ ලෝකෝත්තර ධර්මයත් පවතින්නේ නෑ කියල හිතල, එහෙමත් නැතිනම් තමන් ඒ අකුසලය සිද්ධ වන අවස්ථාව ඇතුළත තව කුසල පාක්ෂික ධර්ම පිළිබඳව තමන්ගේ සිත නැඹුරු කිරීමක් කරනව නම් අන්න එබඳු අවස්ථාවලදී අර

අකුසලය වටා තව කුසල් සිතුවිලි උත්පාදනය වීම සිද්ධ වෙන කොට අර අකුසල හුදෙකලා වෙනව.

ඒක මේ සිතෙහි යෙදෙන විදිය. සිතෙහි යෙදෙන ක්‍රමය. ඒක වෙනත් දෙයක් නෙමෙයි. ඒක තමයි එහි තියෙන නියාමනය. ඒක තමයි නියාම ධර්මයක් හැටියට අපිට හඳුනාගන්නට තියෙන ක්‍රමය බවට පත්වන්නේ. ඒක පරිවාර කොට ගත්තහම කුසල්. ඒ අකුසලය දුර්වල වෙනව. ඒක තමයි එතන තියෙන ස්වභාවය. ඒ වගේම කුසල් පරිවාර කරගත්තහම අකුසලය දුර්වල වෙනව වගේම, අකුසල් පරිවාර කරගත්තහම කුසලයක් වටා ඒ කුසලයත් දුර්වල වෙනව. ඒක දෙපැත්තටම ක්‍රියාත්මක වන දෙයක්.

හැබැයි මෙතනදි අපි කතා කරන්නේ අකුසලයක් උපනිඃශ්‍රය වීම තුළ කුසලක් උපදින ආකාරය පිළිබඳව. එතකොට අකුසලයක් උපනිඃශ්‍රය වෙනව කුසලයක් උපදින්නට. දැන් අකුසලය උපනිඃශ්‍රය වෙනව කියන තැනදි කොහොමද මේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙන්නේ? මේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වන්නේ අර අකුසලයක් කරල ඒ අකුසලය යටපත් වීම සඳහා නැවත කුසල් කරන අවස්ථාවන්වලදි. අකුසලය සිදු වීම තමයි උපත්ථම්භක වෙන්නේ. අකුසලය සිදු වීම කියන දේ තමයි උපනිඃශ්‍රය වන්නේ අර කුසලය උත්පාදනය කරන්නට. ඒ කුසලය සිද්ධ කරන්න.

එතකොට අපි උදාහරණයක් හැටියට අර දුටුගැමුණු රජ්ජුරුවෝ යුද්ධ කරපු වෙලාවෙදි ඔහු දන් දුන්න නම් ඔහු යම් එබඳු ආකාරයකට මගේ මේ ව්‍යායාමය මේ බුද්ධ සාසනය පැවැත්වීම සඳහා මිසක මේ රාජ්‍ය සම්පත් ලබාගෙන මගේ බල පරාක්‍රමය තියන්නට නෙමෙයි කියන අදහස් ඔහු උපදව ගත්ත නම් ඒ හිතන සිත් කුසල් සිත්. ඒව සිත් වශයෙන් ගත්තහම අකුසල් සිත් නෙමෙයි. එතකොට අර කෙනකුට වධ බන්දනයට පත්කරන්න, හිංසාවට පත්කරන්න, යුද්ධයක් කරන්න, කෙනෙක් මරන්න

හිතනව නම් ඒක කුසල් වෙන්නේ නැනේ. ඒක අකුසල්. ඒ අකුසලය කියන දේ පරිවාර කරගත්තහම කුසල ධර්මයන්ගෙන් ඒ අකුසලය දුර්වල වෙනව. ඒකෙන් කියන්නේ නෑ අකුසල කියන දේ සම්පූර්ණම නැතිවෙල යනව කියල. ඒක අකුසල් නෙමෙයි. ඒ මරණ එකත් කුසලයක් වෙනව කියල කියන්නේ නැහැ. ඒ නිසා වරදවා ගන්නට එපා මේ කියන දේ.

යුද්ධය නිසා මැරෙන අය කොහෙද උපදින්නේ කියල අහන කොට බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රශ්නය අහන්නට එපා කියල එක වෙලාවකදි දේශනා කරනව. *(බු. ජ. ත්‍රි. යොධාජීව සූත්‍රය සනි (4) පිටු 562)* ඇයි? ඒක අකුසලයක් සිද්ධ වන මොහොතක්. අකුසලය කියන දේ දුක් විපාක තමයි ලැබෙන්නේ. ඒක ලෝකේ අකුසලය සිද්ධ කිරීමෙහි උපනිඃශ්‍රය භාවය ලැබුණේ කුසලයක් නිසා කියන එක තුළ අකුසලයෙන් සැප විපාක ලැබෙන්නේ නැහැ. අකුසලයෙන් ලැබෙන්නේ දුක් විපාක. ඒක තමයි ස්වභාවය. හැබැයි අකුසලයක් සිද්ධ වෙන කොට ඒ අකුසලය විපාක කරා පැමිණීමෙහි ශක්තිය අඩු කරන්න පුළුවන්කම තියෙනව. ඒ තමයි ඒ වටා කුසල් සම්පාදනය කිරීම කියන දේ සිදු කිරීම තුළ.

ඒක නිසා තමයි දක්වන්නේ **පාණං හනත්‍වා තස්ස පටිඝාතත්‍ථාය දානං දෙති.** සතෙක් මරල ඒක පටිඝාතය කිරීම සඳහා මොකද කරන්නේ, **දානං දෙති.** දානය දෙනව. ඒක යටපත් කරන්නට, ඒකෙන් ලැබෙන අකුසල විපාකය කියන දේ දුර්වල කරන අදහස ඇතුව මොකද කරන්නේ? කෙනෙක් දන් දෙනව. කෙනෙක් සිල් රකිනව. පෙහෙවස් රකිනව. ඒ වගේම තව කෙනෙක් භාවනාවට යොමු වෙනව. තව කෙනෙක් ධ්‍යාන උපදවනව. විදර්ශනාව වඩනව. අර අරමුණුවල තියෙන බලවත් බව දුරු කරල දාන්නට සමර්ථ වන ඥාණ දර්ශනයන් පාවිච්චි කරනව.

ඒ හැම අවස්ථාවකදිම මොකද වෙන්නේ? අර අකුසලය විපාක දෙන්න තියෙන තත්ත්වය ටිකෙන් ටික දුරුවල භාවයට පත්වෙනව. අභිඥා උපදවනව. මේ වගේ අවස්ථාවන් සිද්ධ වෙන කොට මේ පුද්ගලයගේ අර අකුසලය විපාක දෙන්න තියෙන තත්ත්වය යටපත් වීම තමයි සිද්ධ වෙන්නේ. හිතන්නකෝ කෙනෙක් ධ්‍යානයක් ඉපදෙව්ව කියල. ධ්‍යානයක් උපදව ගත්තත් එහෙම එයා සමහර විටක බොහෝ අකුසල් කරපු කෙනෙක් වෙන්න පුළුවන්. හැබැයි අර අකුසල විපාක යටපත් වෙලා ගිහිල්ල ඊළඟට විපාක දෙන්නේ මොකද්ද? නොපිරිහුණු බවක තිබුණොත් ඊළඟට එයාට ඒක බ්‍රහ්ම ලෝක උප්පත්තිය ලබන්න තමයි තියෙන්නේ. අකුසල් විපාක නොදී තියෙන්නෙ නෑ කවදාවත්. අර කරපු අකුසල් ඊළඟ ජීවිතේ නොවුණත් කර්ම විපාක වශයෙන් අනිත් ජීවිතවල විපාකදීම සඳහා එන්න පුළුවන්, එන්න බැරිකමක් නෑ. ඒව වෙන්න පුළුවන්. හැබැයි කුසලය ඒ වටා බලවත් කිරීම තුළ ඒ අකුසලය දුර්වල භාවයට පත්වීම සිද්ධ වෙනව. ඉතින් ඒක මේ කාරණාවත් එක්කම මතක් කරන්නට අවශ්‍ය වුණ කාරණාවක්.

ඉතින් කෙසේ වෙතත් අපි කතා කරන මාතෘකාව දෙසට අපි නැවත හැරුණොත් යම්කිසි තැනක දි අකුසලය කියන දේ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කුසල් උපදවන්නට. ඒ උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ කොහොමද කියන එක පිළිබඳව තමයි මෙතනදි ඉතාම වැදගත් වෙන්නේ. ඒ කියන්නේ උපනිස්සය ප්‍රත්‍යය අපිට මෙතනදි හඳුනාගන්නට පුළුවන්කමක් තියෙනව නේ. මොකක්ද මේ උපනිස්සය ප්‍රත්‍යය කියන්නේ කියල. මොකද්ද උපනිස්සය ප්‍රත්‍යය කියල කියන්නේ? මෙතනදි මේ උපනිඃශ්‍රය භාවය කියල කියන්නෙ වඩාත්ම තේරුම් ගන්න පුළුවන්, එතන යෙදිල සහජාත ආදී වශයෙන් එහෙම උපකාර කිරීමක් එහෙම නෙමෙයි එතනදි සිද්ධ වෙන්නේ. එහෙනම් කොහොමද උපනිස්සය ප්‍රත්‍යය ක්‍රියාත්මක වෙලා තියෙන්නේ. හරියට භූමිය සකස් කරන විදියට. ඊට පස්සේ කරන කුසල් වලට

දන් දෙනව කියන එකට එයා අතින් කෙරුණු අකුසල් යටපත් කරගන්න අදහසින් තමයි කුසල් කරන්නේ.

භාවනා කරන්නේ මොකටද? අර අකුසල් කෙරිල තියෙනව. ඒ අකුසල් කෙරුණු නිසා ඒවගෙන් දුක් විපාක ලැබෙනව. ඒ දුක් විපාක නොලැබී තියෙන විදියට ඇති කරගන්න ඕන නිසා තමයි එයා භාවනා කරන්නේ. එයා විදර්ශනාව කරනව. අර අකුසල් සහගත අරමුණ ඉදිරිපත් වෙල ඒව විපාක පිණිස පැමිණීමේ දී බලවත් විපාක ඇති කරන්න පුළුවන්කම තියෙනව. ඒ නිසා තමයි එයා විදර්ශනා වඩන්නේ. අභිඥා උපදවන්නේ. සමාපත්ති ලබන්නේ. අන්න ඒ කුසලයට භූමිය සකස් කරල තියෙන්නේ මොකද්ද? අකුසලය. ඉතින් ඒ නිසා අකුසලය කියන දේ ඒකත් උපකාර බවක්. දැන් හිතන්නට එපා යම්කිසි දෙයක් උපදවන්නට ප්‍රත්‍යය වෙනවා කිව්වහම මේක හරි ගැඹුරු විග්‍රහයක් තුළ තේරුම් ගන්නට ඕන දෙයක්. ගැඹුරු විග්‍රහයක් තුළ අපිට නුවණ මෙහෙවල තමයි ඒක අවබෝධ කරගන්න පුළුවන්කම තියෙන්නේ. සමහර දේවල් ඒක ඇති බවෙන් ප්‍රත්‍යය වෙන කොට සමහර දේවල් නැති බවෙන් ප්‍රත්‍යය වන්නට ඕනේ.

ඒ කියන්නේ හිතන්නකෝ අපි පහනක් පත්තු කරන්න යන කොට එතන දැල්වීම තියෙන කොට තෙල් ටික තිරය මේ හැම දෙයක්ම එතන යෙදිල ඒ දැල්ල දැල්වෙන්න උපකාර කරන්නේ. ඊට පස්සේ අපි ගත්තොත් එහෙම ඒ දැල්ල දැල් වෙන්න අනවශ්‍ය දේවල් තියෙනව කියල. ඒව කොයි විදියට ද ප්‍රත්‍යය වෙලා තියෙන්නේ? ඒව නැති බවෙන් ප්‍රත්‍යය වෙලා නේ තියෙන්නේ. ඒ දේවල් නැති බව, අපි හිතමුකෝ ජලය කියල හිතන්නකෝ එතන. එතකොට එතන වතුර නෑනේ. ඒ නිසානේ ඒක දැල් වෙන්නේ. අග්නිය වැඩි වෙලා තියෙන්නේ. එතකොට ජලය එතන තිබ්බොත් එහෙම? එතකොට දැන් ජලය එතනට වැඩිපුර ආවොත් මොකද වෙන්නේ? එතකොට අර දැල් වීම නැති වෙනව. එතකොට ජලය නැති බව එතනදි ප්‍රත්‍යය වීමක්.

ඒ නිසා ප්‍රත්‍යය වීම කියන එක රළු මට්ටමෙන් දකින්න එපා, දෙයක් ඇවිල්ල නිකම් හැප්පිල උදව් කරනව වගේ තැනකින් එහෙම දකින්න එපා ප්‍රත්‍යය වෙනවා කියන එක. ඉතින් ප්‍රත්‍යය වීම කියන දේ ඒ වගේ බොහොම සියුම්ව තේරුම් ගන්න ඕනේ දෙයක්.

උපනිස්සය ප්‍රත්‍යයේදී ඒක ඔබට වඩාත්ම වටහා ගන්න පුළුවන්කම තියෙනව, කොහොමද මේ අකුසල් කරන දේවල් කුසලයකට උපනිඃශ්‍රය වන්නේ කියල භූමිය සකස් කරගැනීම තුළ. ඔබට පුළුවන් ඒ විදියට ඒකේ න්‍යාය තේරුම් ගත්තහම ඒ දේවල් ඔබේ ජීවිතය තුළ ප්‍රායෝගිකව සිද්ධ කරන්න පුළුවන්කම තියෙනව. හිතන්නකෝ කෙනෙක් ඉන්නව තමන් අතින් සිදු වුණ අකුසල් පිළිබඳව පසුතැවිලි වන අය. පසුතැවිලි වීම කියන්නේ කුසලයක් නෙමෙයි. ඒක අකුසලයක්. හැබැයි එයාට පුළුවන් අර අකුසලය සිහිවෙන හැම වෙලාවකදිම ඒක සනිටුහන් කරල කුසලයකට හිත තියන්න පුළුවන්කම තියෙනව. බුදු ගුණ හිතන්න, විදර්ශනාවකට හිත තියන්න, ඊට පස්සේ මෛත්‍රී භාවනාවකට හිත තියන්න. යෝනිසෝ මනසිකාරයකට, ධර්ම මනසිකාරයකට හිත තියන්න, හිත පුරුදු කරල තියෙනව. අර සිහිපත් වීමම, අර **ධජග්ග සූත්‍රයේදී (බු. ජ. ත්‍රි. සනි (1) පිටු 388)** කොඩිය දකින කොට සිහි කරගන්න කියල කිව්ව වගේ හරියට අර අරමුණ එන කොටම සිහි කරගන්නව "**ආ මේ කුසල් මෙනෙහි කරන මොහොත**" කියල. එතකොට අර අකුසලය විපාක දෙන ශක්තිය හීන වෙලා යනව. හේතුව? ඒක අරමුණු වශයෙන් එන්නේ බොහොම අඩුවෙන්. විශේෂයෙන් ප්‍රතිසන්ධි විපාක පැත්තට ඒක බලපෑම් ඇති කරනව.

අන්න ඒ වගේ තැන් වලදි සිදුවන ක්‍රියාවලියක් හැටියට අපිට තේරුම් ගන්න පුළුවන්කම තියෙනව මේ අකුසලයක් උපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වීම තුළ කුසලයක හට ගැනීම සිද්ධ වෙනව කියන එක තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව. එතකොට

යම්කිසි විදියකින් යම් කෙනෙක් අකුසලයක් සිද්ධ කරල ඒ අකුසලය පිළිබඳව කුසලයකින් ඒක පසකින් තබනව නම් මේ ලෝකේ බබළනව වැහි වලාවෙන් මිඳුනු සඳ වගේ කියල භාග්‍යවතුන් වහන්සේ දේශනා කරල තියෙනව.

ඒ නිසා අකුසලය කුසලයකින් වසන්නට පුළුවන්කම තියෙනව. අංගුලිමාල තෙරුන් වහන්සේ ගිහි කල බොහෝ මනුෂ්‍ය ඝාතනයන් සිද්ධ කලත් උන්වහන්සේ මාර්ග කුසලයෙන් වසා දැමුවේ මොනවද? මාර්ග කුසලයෙන් නැසුවේ මොනවද? සියලු අකුසල ධර්මයන් නැසුව. අකුසල ධර්මයන් මුල් කරගෙන එන්න තිබුණ අනාගත විපාක තිබ්බ නම් ඒ විපාක සියල්ලත් උන්වහන්සේ නසා දැමුව. ඒ නිසා කුසලයෙන් තමයි ඒ අකුසලයන් නසන්නට පුළුවන්කම තියෙන්නේ. අකුසල් නැසීම තුළ **යස්ස පාපං කතං කම්මං කුසලෙන පිථීයති සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා.** ***(බු. ජ. ත්‍රි. ඛුනි ධම්මපදපාළි ලොකවග්ග ගාථා අංක 173 පිටු 68)*** මේ ලෝකය බබළවන්නට පුළුවන්කම තියෙනව. හරියට **අබ්භා මුත්තො'ව චන්දිමා.** වැහි වලාවෙන් මිඳුනු හඳක් වගේ ඒක කරන්න පුළුවන්කම තියෙනව.

ඒ වගේම **අදින්නං ආදියිත්‍වා තස්ස පටිඝාතත්‍ථාය - දානං දෙති. සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති. අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

**අදින්නං ආදියිත්‍වා,** යම්කිසි කෙනෙක් හොරකම් කරල, හොරකම් කරගත්ත එක දුරු කරගැනීම සඳහා, අකුසල යටපත් කරගැනීම සඳහා දානය දෙනව. දැන් මොහොතකට හිතන්නකෝ සමහර වෙලාවට කෙනෙක් හොරකම් කරල දන් දෙනව කියල. එතකොට කෙනෙක් මොන විදියට ද මොන ඇහෙන් ද මොන කෝණයකින් ද මේක දිහා බලන්නේ කියල හිතන්නකෝ. ඔය

දන් දුන්නට වැඩක් නෑ. ඕව නිකම් හොරකම් කරපු සල්ලි නේ දන් දෙන්නේ. හොරකම් කරපු දේවල් වලින් නේ ඔය කරන්නේ. එහෙම කෝණයකින් තමයි සමාජයේ බොහෝ වෙලාවට ඒ දේ දිහා බලන්නේ.

අපි මෙහෙම හිතමුකෝ, රළු කතාවක් විදියටම කිව්වොත්. කෙනෙක් සත්තු මරනව. සත්තු මරල මස් විකුණනව. මස් විකුණල අර හම්බ කරපු දෙයින් දානේ දෙනව. අර හම්බ කරපු දෙයින් දානයක් දෙනව කියල හිතන්නකෝ. එයා දානේ දීම සඳහා සත්තු මරල ඒක හම්බ කලා නෙමෙයි. එයා ජීවත් වෙන්න සත්තු මරල මස් විකුණල එයා අධාර්මික විදියට තමයි එයා මුදල් උත්පාදනය කරගත්තේ ජීවත් වෙන්න. ඒකෙන් එයා දානයක් දෙනව. දැන් කෙනකුට කියන්න පුළුවන්කම තියෙනව මේ මේ විදියේ පව් කරන මේ විදියේ මනුස්සයෙක් නේ ද මේ දානේ දෙන්නේ. ඕකේ ඇති වැඩක් තියෙනවද කියල. ඕන නම් අපේ බෞද්ධ පින්වතුන් කියන්න පුළුවන්කම තියෙනව ඒ වගේ මිනිස්සුන්ගෙන් දානේ භාර ගන්නත් එපා කියල. කෙනෙක් හොරකම් කරනව. හොරකම් කරන කෙනෙක් ඇවිල්ල දානේ දෙන කොට කියන්න පුළුවන් ඔය මනුස්සය හොරෙක්. ඔය දානේ භාර ගන්නත් එපා එළවල දාන්න කියන්න පුළුවන්කම තියෙනව.

හැබැයි පින්වතුනි කුසලය කියන දේ දිහා බැලුවහම, ලෝකේ මේ ධර්මයන්ගේ ප්‍රත්‍යය වීම කියන දේ දිහා බැලුවහම මෙතනදි සිදු වන යහපත මොකද්ද? කුසලය කුසලයමයි. අකුසලය අකුසලයමයි. ඒව මිශ්‍ර වීමක් නෑ කවදාවත්. කුසලය අකුසලය මිශ්‍ර වීමක් නෑ. ප්‍රත්‍යය වීමක් තියෙනව. අර අකුසලය ප්‍රත්‍යය වුණොත් යම් අවස්ථාවක මේ කුසලයට, ඒක වටින්නේ නැද්ද? වටිනව. කුසලය වටිනව හැමදෑම. අකුසලය ප්‍රත්‍යය කරගෙන හරි කුසල් කරනව නම් කුසලය තමයි වටින්නේ.

අර ***පෙතවත්ථුප්‍රකරණයෙහි*** එක කතාවක් දැක්වෙනව. එක උපාසකයෙක් හිටිය අපූරු උපාසකයෙක්. ඔහු සිල් සමාදන් වෙනව රාත්‍රි කාලෙදි. ඒ වගේ ඔහු දහවල් කාලෙදි දඩයමේ යනව. රාත්‍රි කාලෙදි උපාසකතුමෙක්. සිල් සමාදන් වෙලා සිල් රකිනව. දහවල් කාලෙදි දඩයමේ යනව. ***(බු. ජ. ත්‍රි. ඛුද්දක නිකාය මිගලුද්දක පෙතවත්ථු (පඨම සහ දුතිය) පිටු 92 සහ 94)*** මේ චරිතය ගැන සාමාන්‍ය සමාජයේ ඇහෙන් බැලුවොත් මොකද්ද අපි දෙන නිර්වචනය? අපිට ගොඩක් නිර්වචන තියෙයි. හැබැයි විපාක දෙන විදිහ දිහා බැලුවහම අපිට බලන්න පුළුවන්කම තියෙනව මේ අපි පුද්ගලයෝ විදියට කතා කලාට මේ කුසල අකුසල ධර්මයන්ගේ සකස් වීමක් නේ. හේතු ඵල ධර්මයක් නේ. හේතු හැදුවේ මොන විදියට ද ඵලය ඒ විදියට ලැබෙන්නේ.

ඔහු මරණයට පත්වෙලා වේමාණික ප්‍රේතයෙක්ව උපදින්නේ. වේමාණික ප්‍රේතයෙක් වෙලත් ඉපදුනත් අර සිල් සමාදන් වෙලා කුසලය පුරපු රාත්‍රි කාල සීමාව ඔහු සැප සම්පත් විඳින කෙනෙක් විදියට බොහොම සැප සම්පත් බුක්ති විඳින දෙවියෙක් ලෙස කටයුතු කරනව. ඒ වගේම උදේ යාමය වෙන කොට ඉතාම දුඃඛිත තත්ත්වයකට පත්වෙල ඉතාම දුක් වේදනාවන් විඳින එයින් පෙළෙන කෙනෙක් බවට පත්වෙනව. ඔහුගේ ආත්මභාවය ඒ විදියේ දෙයක්.

එතකොට දැන් මේ වගේ අවස්ථා බැලුවහම දැන් බලන්න කුසලයේ විපාක මොකද්ද? අකුසලයේ විපාක මොකද්ද වුණේ කියල. ඒ නිසා කුසල් කිරීම කියන දේ කාටත් පොදුවේ කරන්න පුළුවන්කම තියෙන දෙයක්. ඒක සත්තු මරණ කෙනෙක් ද, හොරකම් කරන කෙනෙක් ද, කාමයේ වරදවා හැසිරෙන කෙනෙක් ද, බොරු කියන කෙනෙක් ද, මත්පැන් පානය කරන කෙනෙක් ද ඒක නෙමෙයි අදාළ වෙන්නේ. කුසල් කිරීම හැම දෙනාටම වැදගත්. අර අකුසලය යටපත් කර ගැනීම සඳහා

වුණත් යම්කිසි කෙනෙක් කුසල් ප්‍රබල ප්‍රබල ලෙස කරනව නම් ඔය මොන දේ කරලත් වැඩක් නෑ තමන් අකුසල් කරල තියෙනවනේ ද කියල ලෝකයා මොන වචන කිව්වත් එහි යෙදෙන ධර්මය තමයි ඒ කුසලය බලවත් කිරීම තුළ අර අකුසලය යටපත් කරන්නට පුළුවන්කම තියෙනව. ඒක තමයි ධර්මය. ඒ කියන්නේ එහි ක්‍රියාත්මක වන ස්වභාවය ඒක. අකුසලය කියන දේ පිරිවට කරගත්තහම කුසල්. ඒක වට කරගත්තහම එහි බලය හීන වෙනව කොහොමත්. ඒ නිසා ඒ කුසල් දියුණු කිරීම කියන එක වැදගත් ඔහු කෙලෙස කටයුතු කලත්.

**ඉතින් අදින්නං ආදියිත්වා තස්ස පටිඝාතත්‍ථාය.** ඉතින් නොදුන් දේ අරගන්න කෙනෙක්, හොරකම් කරන කෙනෙක්, ඒ හොරකම් කරල ඇති කරගන්න තත්ත්වය **පටිඝාතත්‍ථාය.** ඒක යටපත් කරගැනීම සඳහා, ඒක ඉවත් කරගැනීම සඳහා ගන්න මහන්සියක්, වෑයමක් තියෙනව නම් ඒ සඳහා දන් දෙනවා, ඒ සඳහා එයා සිල් රකිනව, ඒ සඳහා ඔහු භාවනා කරනව, විදර්ශනාව වඩනව, සමාපත්ති උපදවනව, අභිඥා උපදවනව, මේ වගේ දේවල් කරනව නම් ඒ හැමදේටම හේතු වෙලා තියෙන්නේ ඔහුගේ හොරකම. ඒක යටපත් කරගන්න තමයි එයා මේ ඔක්කොම කරල තියෙන්නේ. ඒ අවස්ථාවලදි මොකද්ද වෙලා තියෙන්නේ? අර අකුසලය කුසල් උපදවන්නට ප්‍රත්‍යය වෙලා තියෙනව.

**මුසා භණිත්වා, පිසුණං භණිත්වා, ඵරුසං භණිත්වා, සම්ඵංපලපිත්වා, සන්ධිං ඡින්දිත්වා නිල්ලොපං හරිත්වා, පරිපන්ථෙ ඨත්වා, පරදාරං ගනත්වා, ගාමඝාතං කරිත්වා නිගමඝාතං කරිත්වා, තස්ස පටිඝාතත්‍ථාය දානං දෙති, සීලං සමාදියති උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති. අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

ඒ වගේම යම්කිසි විදියකින් **මුසා භණිත්වා,** මුසාවාද කියල, නැතිනම් බොරු කියල, ඒ වගේම **පිසුණං භණිත්වා, ඵරුසං භණිත්වා, සම්ඵංපලපිත්වා,** කේලාම් කියල, ඵරුස වචන කියල, හිස් වචන කියල, ඒ වගේම **සන්ධිං ඡින්දිත්වා නිල්ලොපං හරිත්වා,** සන්ධි බිඳල, ඒ කියන්නේ ගෙවල් කඩල, ගම් පැහැර හැරගෙන, මං කොල්ල කාල,  ඒ වගේම පාරේ රැකල ඉඳල මේව අරගෙන, ඒ වගේම **පරදාරං ගනත්වා,** ඒ පරදාර සේවනයන් සිද්ධ කරල, ඊට පස්සේ මෙබඳු ආකාරයේ නොයෙකුත් විලොපක අකුසල් කරල, එය යටපත් කරගැනීම සඳහා කුසල් බලවත් කරනව. කුසල් භාවිත කරනව.  එබඳු අවස්ථාවල කුසලය උපදවන්නට අර අකුසලය උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව. එහෙනම් උපනිඃශ්‍රය කියන දේදී ඒ අදාළ භූමිය සකස් කරමින් ඊට අවශ්‍ය වට පිටාව සකස් කරමින් මේ ප්‍රත්‍යය වෙනව කියන එක හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. එතකොට අකුසලය තමයි ප්‍රත්‍යය. කුසලය ප්‍රත්‍යයෝත්පන්නය. අර අකුසලය ප්‍රත්‍යය වෙන කොට කුසලය ප්‍රත්‍යයෝත්පන්නය බවට පත්වෙනව. ඉතින් මෙන්න මේ විදියට ඒක කරන්නට පුළුවන්කම තියෙනව.

**මාතරං ජීවිතා වොරොපෙත්වා තස්ස පටිඝාතත්ථාය - දානං දෙති, සීල සමාදියති, උපොසථ කම්මං කරොති.**

ඒ වගේම **මාතරං ජීවිතා වොරොපෙත්වා,** මව දිවියෙන් තොර කරල **තස්ස පටිඝාතත්ථාය,** ඒක ප්‍රතිඝාතය කිරීම සඳහා එයා උත්සාහවත් වෙනව. එතකොට අර විදියට කුසල් කරනව. ඒක දුරුකර ගැනීම සඳහා අවැසි කුසල් කරනව. ඒ වෙලාවට වෙන්නෙත් අකුසලය තමයි උපනිඃශ්‍රය වෙලා තියෙන්නේ කුසල් උපදවන්නට. එතකොට කෙනකුට හිතෙන්නට පුළුවන් ආනන්තරිය අකුසල කර්මයක් නේ. අනිවාර්යෙන්ම ඔහු දුගතියට නියත වෙනව නේ. අවීචියෙහි උපදිනව නේ කියල කෙනකුට හිතෙන්නට පුළුවන්. ඔව්, ඒක නියතියක් විදියට ඒක සිද්ධ වෙනව දුගතියට යනව කියන එක. හැබැයි කුසල් බලවත් වීම

මත එහි විපාක ස්වභාව වෙනස් වෙන්න පුළුවන්කම තියෙනව. ඒ කුසලය බලවත් වුණොත් එහි විපාක ස්වභාවය වෙනස් වෙන්න පුළුවන්කම තියෙනව.

අජාසත්ත රජ්ජුරුවෝ තමාගේ පියා ඝාතනය කලා. ආනන්තරිය අකුසල කර්මයක් සිද්ධ කලා. ඔහු දුගතියට නියතයි. ඒකෙන් ඔහුට මිදෙන්නට පුළුවන්කමක් තිබුණේ නෑ. හැබැයි අවීචියට යන්න හිටිය කෙනා ඊට වඩා දුක අඩු ආයුෂය අඩු පදුම නරකයේ ඉපදුනා. අවීචියේ තරම් දුක නැති ඒ වගේම ආයුෂය අඩු පදුම කියන නරකයෙහි ප්‍රතිසන්ධිය ලැබුවේ. එතකොට ඒ මොකක් බලවත් වීම තුළද? කුසලය බලවත් වීම තුළ. පසුව භාග්‍යවතුන් වහන්සේ සරණ ගිහිල්ල, අපරිමිත බුද්ධ ස්නේහයක් උපදවා ගෙන, බුදුරජාණන් වහන්සේ පිළිබඳව මහා ශ්‍රද්ධාවක් ඇති කරගෙන, උපස්ථාන කරල, මහා සංඝරත්නයට දන් පැන් පූජා කරගෙන, පසුව ධර්ම  සංගායනාවන්ට උපකාර කරල, ඒ සිද්ධ කරගත්ත මහා කුසලය හේතුවක් වුණා අර අකුසලය හොලවා දමන්නට. මහා භයානක බලසම්පන්න අකුසලයටත් ඒ කුසලයන් බලපෑම් ඇති කලා.

ඒ නිසා අවීචියෙහි ප්‍රතිසන්ධිය ගන්න තිබ්බ එක, අවීචියෙහි ප්‍රතිසන්ධිය නොලබා ප්‍රතිසන්ධිය ගත්තේ කොහෙද? පදුම නරකයේ. ඉතින් ඒක තමයි එහි තියෙන බල පැවැත්වීම කියන එක. ඉතින් ඒ නිසා වරදවා ගැනීම් වල, උපරිම වරදවා ගත්ත කෙනකුට වුණත් කුසල් කරන්න පුළුවන්කම තියෙනව. ඒක මේ කුසලයෙහි තියෙන වටිනාකම පෙන්වා දීම සඳහා මම මේ කරුණු පැහැදිලි කලේ.

එතකොට මෙතනදි වඩාත්ම අපේ මාතෘකාවට අවධානය යොමු කරන කොට අපිට දකින්න පුළුවන්කම තියෙන්නේ එයා කරන හැම කුසලයක්ම අරක යටපත් කරගැනීම සඳහා කරන කොට

ඒ උපනිස්සය ප්‍රත්‍යයෙන් එය ප්‍රත්‍යය වෙනවා අකුසලය අර කුසලය සිද්ධ කිරීම සඳහා.

**පිතරං ජීවිතා වොරොපෙත්‍වා, අරහන්තං ජීවිතා වොරොපෙත්‍වා, දුට්ඨෙන චිත්තෙන තථාගස්ස ලොහිතං උප්පාදෙත්‍වා, සංඝං භින්දිත්‍වා - තස්ස පටිඝාතත්‍ථාය දානං දෙති සීලං සමාදියති උපොසථ කම්මං කරොති.**

ඉතින් මෙන්න මේ වගේ අවස්ථාවලදී අපිට දකින්නට පුළුවන්කම තියෙනව **පිතරං ජීවිතා වොරොපෙත්‍වා,** පියාගේ ජීවිතය තොර කරල, **අරහන්තං ජීවිතා වොරොපෙත්‍වා,** රහතුන් වහන්සේලා ජීවිතයෙන් තොර කරල, ඊට පස්සේ **දුට්ඨෙන චිත්තෙන තථාගස්ස ලොහිතං උප්පාදෙත්‍වා,** ඒ වගේම කිපුණු සිතෙන් බුදු සිරුරින් ලේ  සෙලවීමට ලක් කරල, ඊට පස්සේ **සංඝං භින්දිත්‍වා,** සංඝයා බිඳල එබඳු අවස්ථාවලදී ඒව දුරු කරගැනීම සඳහා දානය දෙනව, කුසල් රැස් කරනව. එහෙම අවස්ථාවලදීත් අර කුසලය තමයි  මූලික වෙන්නේ. අකුසලය තමයි උපනිස්සය ප්‍රත්‍යයෙන් අර කුසල් සඳහා හේතුව සකස් කරල තියෙන්නේ.

එතකොට මෙන්න මේ විදියට අකුසලය කුසලය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යය වන අවස්ථා පිළිබඳව අපිට දකින්නට පුළුවන්කම තියෙනව. එතකොට මේව වරදවා ගන්නට එපා ආනන්තරිය අකුසල් කියන දේවල් පිංකම් වලින් පමණක් මේව යටපත් කරන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. අකුසල විපාක අනිවාරයෙන්ම විපාක පිණිස එනවමම තමයි. භාවනා කිරීමක් ධ්‍යාන ඉපදවීමක් මාර්ග ඵල ආදිය ඉපදවීමක් ඔහුට ඒ භවයෙදි කළ නොහැකියි. ඒ නිසා තමයි මෙතන දක්වන්නේ  නැත්තේ ඒ වගේ  පඤ්චානන්තරිය කලහම, අර කලින් කියපු අනිකුත් අකුසල් කරපු  කෙනකුට පුළුවන් නේ ධ්‍යාන උපදවන්න, සමාපත්ති උපදවන්න, විදර්ශනාව වඩන්න පුළුවන් කියල එහෙම

කිච්චනේ, හැබැයි මෙතනදි ඒ දේවල් දක්වන්නේ නෑ. ඇයි දක්වන්නේ නැත්තේ? හේතුව තමයි පඤ්චානන්තරිය අකුසලයක් කරපු කෙනකුට කිසිඳු කලක ඒ දේවල් උපදවන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒක තමයි හේතුව බවට පත්වන්නේ.

*(ධ්‍යාන මාර්ගයන් ආවරණය කරන ආවරණීය ධර්ම තුනක් දක්වා ඇත. (1) **කම්මාවරණ, කර්මාවරණයන් යනු පස් වැදෑරුම් ආනන්තරිය කර්මයන්ය, (2) කිලෙසාවරණ, කිලෙසා වරණයන් යනු නියත මිච්ඡා දිට්ඨියයි, (3) විපාකාවරණ, විපාකවරණ යනු අහේතුක ප්‍රතිසන්ධියෙනි.** මේවායින් යුක්ත පුද්ගලයාට ධ්‍යාන මාර්ගයන් ආවරණය වේ)*

ඊට පස්සේ අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව යම්කිසි අවස්ථාවලදි මේ ආකාරයෙන් අකුසල කර්මයන් මුල් කරගෙන සිදුවුණ අවස්ථාවන්හී දී ඕනෑම මොහොතක කුසල් උපදවනව නම්, යම්කිසි අකුසලයක් තේරුම් අරගෙන ඒක ප්‍රහාණය කිරීම සඳහා වැයම් ගන්න මොහොතක් අපි ගත්තොත්, ඒ වෑයම් කිරීම කියන එක කුසලය. අර අකුසලය දුරු කරගන්න තමයි ඒ වෑයම සිද්ධ කරන්නේ. එතකොට ඒ කෙලේසය දුරු කරගැනීම සඳහා වැයම් කරන මොහොතෙදි කෙලේසය තමයි උපනිඃශ්‍රය වුණේ. ඒ සඳහා අර විදර්ශනා වැඩීම එහෙම නැතිනම් භාවනා කිරීම් ආදී දේවල් වලට. ඒ හැම අවස්ථාවකදිම ක්‍රියාත්මක වන ක්‍රියාත්මක වීම තමයි අකුසලය දුරු කිරීම සඳහා කුසලයෙහි ක්‍රියාත්මක වීම. එතකොට ප්‍රත්‍යය අකුසලය. ප්‍රත්‍යයුත්පන්නය කුසලය බවට පත්වෙල තියෙනව. ඉතින් මෙන්න මේ ආකාරයට ක්‍රියාත්මක වීම අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

ඒ වගේම අද දවසෙදි අපිට නියමිත මාතෘකාව දිහාවට අපි යම් පමණකට හෝ හැරුණොත් අපි කතා කරන්නට නියමිත වුණේ අව්‍යාකෘත ධර්මයන් පිළිබඳව. එතකොට අව්‍යාකෘත ධර්මයන්

පිළිබඳව කතා කරන කොට අව්‍යාකෘත ධර්මයන් මුල් කරගෙන අව්‍යාකෘතයක් උපදින ආකාරය පිළිබඳව අපි හඳුනා ගන්නට යෙදුනා. අව්‍යාකෘත ධර්මයක් මුල් කරගෙන කොහොමද අව්‍යාකෘතයක් උපදිනව කියල කිව්වේ.

යම්කිසි අවස්ථාවලදි **අරහං ඵලං - ගරුංකත්වා පච්චවෙක්ඛති,** රහතන් වහන්සේ ඵලය ගරු කරගෙන ප්‍රත්‍යවේක්ෂා කරනව. ප්‍රත්‍යයවේක්ෂා කිරීම ක්‍රියා සිතක්. ඵල සිත කියන එක අව්‍යාකෘත සිතක්. එතකොට මේ සිත් දෙකම එකක් අනිකට උපනිඃශ්‍රය වීම තුළ තමයි උපදින්නේ. ඵලය උපනිඃශ්‍රය කරගෙන තමයි අර ආවර්ජනා කිරීම එහෙම නැතිනම් ඒ පිළිබඳ මෙනෙහි කිරීම කියන එක ප්‍රත්‍යයවේක්ෂණයන් සිද්ධ කරන්නේ. අන්න ඒ අවස්ථාවෙදි ඵල සිත කියන එක ප්‍රත්‍යය වෙන කොට ආවර්ජනා සිත ප්‍රත්‍යයෝත්පන්නය බවට පත්වෙනව. නිර්වාණය කියන එක ප්‍රත්‍යය බවට පත්වෙන කොට ඒක ගරු කරගෙන කරන ප්‍රත්‍යවේක්ෂණය කියන එක ප්‍රත්‍යයෝත්පන්නය බවට වෙනව. මෙන්න මේ ආකාරයට අපිට එය තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව. ඒ වගේම එහි අනන්තරූපනිස්සයෙහි ක්‍රියාකාරිත්වයත් අපි තේරුම් ගත්තා.

**පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො** කියල යම් කුසල චිත්ත වීථියක ඉපදුනු කුසල ජවනයන් ගැන කියනව වගේම මෙතනදි අපි කතා කරන්නේ අව්‍යාකෘත නිසා, අව්‍යාකෘත සිත් උපදින අවස්ථාව. යම්කිසි විදියකින් හිතන්නකෝ ක්‍රියා ජවන වීථියක් කියල. එතකොට ක්‍රියා ජවනයක් පළමු ක්‍රියා ජවනය දෙවෙනි ක්‍රියා ජවනයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දෙවෙනි එක තුන්වෙනි එකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. තුන හතරට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. මෙතන ක්‍රියාත්මක වෙන්නේ මොකද්ද උපනිස්සය ප්‍රත්‍යය හැටියට

අනන්තරූපනිස්සය. ඊට අනතුරුව උපදිනව. එතකොට අනන්තර ප්‍රත්‍යයත් උපනිස්සය ප්‍රත්‍යයත් කියන මේ දෙකම ප්‍රත්‍යය වෙලා තියෙනව. ඒ පිළිබඳව අපි පැහැදිලි කරගන්නට යෙදුනා.

ඒ වගේම **කායිකංසුඛං - කායිකස්ස සුඛස්ස කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.** කායික සුඛය කියන එක කායික සුඛටත් කායික දුකටත් ඵල සමාපත්තියටත් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියල ඒ ධර්මයන් පිළිබඳව අපි ප්‍රධාන වශයෙන් මීට පෙර හඳුනාගන්නට යෙදුනා.

ඒ වගේම අබ්‍යාකතයක බලවත් උපකාරය ලබා ගෙන නැවත කුසල් ඉපදවීම කියන එකත් සිද්ධ වන්නට පුළුවන්කම තියෙන දෙයක්. අව්‍යාකෘතයක උපකාරී බව ලැබ ගෙන නැවත කුසල් පහළ වීම කියන එක.

**අබ්‍යාකතො ධම්මො - කුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.** අව්‍යාකෘත ධර්මයක් කුසල ධර්මයන් උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ කරනව. අව්‍යාකෘත ධර්මයක් නැවත කුසලයන් උපදවන්නට ප්‍රත්‍යය වීම සිදු කරණු ලබනව. එතකොට කොහොමද ඒ ප්‍රත්‍යය වීම සිද්ධ කරන්නේ? අව්‍යාකෘත ධර්මයක් කුසල් උපදවන්නට ප්‍රත්‍යය වීම සිද්ධ කරන්නේ කොහොමද? අන්න ඒක තමයි එතනදි වැදගත් වෙන්නේ. අව්‍යාකෘත ධර්මයක් කුසල් උපදවන්නට ප්‍රත්‍යය වන අවස්ථා පිළිබඳව දැක්කහම අර ආරම්මණ - අනන්තර - පකතූපනිස්සය කියන උපනිස්සය ප්‍රත්‍යයන්ගේදී අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව ආරම්මණූපනිස්සය වශයෙන් කොහොමද ප්‍රත්‍යය වන්නේ කියන එක.

*ආරම්මණූපනිස්සය*

**සෙක්ඛාඵලං - ගරුංකත්‍වා පච්චවෙක්ඛන්ති.**
**නිබ්බානං - ගරුංකත්‍වා පච්චවෙක්ඛන්ති.**
**නිබ්බානං - ගොත්‍රභුස්ස, වොදානස්ස, මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

යම්කිසි විදියකින් **සෙක්ඛාඵලං - ගරුංකත්‍වා පච්චවෙක්ඛන්ති.** සේඛ ආයයීන් වහන්සේලා ඵලය ගරු කරගෙන ප්‍රත්‍යවේක්ෂා කරනව. ***සේඛ ආයයීන් වහන්සේලා කියල කියන්නේ සෝවහන් සකදාගාමී අනාගාමී ඒ රහතුන් වහන්සේලා නොවන ඊට පහළින්, අරිහත් ඵලයට පත් නොවුණ, රහත් භාවයට පත් නොවුණු අනිකුත් මාර්ගස්ථ සහ ඵලස්ථ පුද්ගලයෝ අපි සේඛ ආයයීන් වහන්සේලා කියල අපි හඳුනාගන්නව.*** මෙන්න මේ සේඛ ආයයීන් වහන්සේලා අර තමන් ලබා ගත්ත ඵලය ගරු කරගෙන මෙනෙහි කරන කොට ඒ මෙනෙහි කරන ආවර්ජනාව කුසලයක්. ඒ ආවර්ජනාව කරන්න උපදින අර ඵල සිත, ඵලය කියන අවස්ථාව, ඒක විපාක සිතක්. එතකොට ඒ විපාකය තමයි අර ආවර්ජනාවට උපනිඃශ්‍රය භාවය ඇති කරල තියෙන්නේ. ඒ ආවර්ජනාවට උපනිඃශ්‍රය භාවය ඇති කරල තියෙන්නේ මොකද්ද? අර ලබා ගත්ත ඵලය කියන අවස්ථාව තමයි උපනිඃශ්‍රය භාවය ඇති කරල තියෙන්නේ. එතකොට ඒ ඵල සිත ප්‍රත්‍යය වෙන කොට ආවර්ජනා සිත ප්‍රත්‍යයෝත්පන්නය බවට පත්වෙනව. එතන මොකද්ද ක්‍රියාත්මක වන ප්‍රත්‍යය ශක්තිය. උපනිස්සය ප්‍රත්‍යය ක්‍රියාත්මක වෙනව. අර අව්‍යාකෘත ධර්මයක් නැවත කුසලයක් උපදවන්නට ප්‍රත්‍යය වීම කියන එක තුළ.

ඒ වගේම **නිබ්බානං - ගරුංකත්‍වා පච්චවෙක්ඛන්ති.** උන් වහන්සේලා නිර්වාණය ගරු කරගෙන, නිර්වාණය මූලික කරගෙන ප්‍රත්‍යයවේක්ෂා කරනව නම් අන්න එබඳු අවස්ථාවල.

ඒ වගේම **නිබ්බානං - ගොත්‍රභූස්ස,** නිර්වාණය ගොත්‍රභූ සිතට, **වොදානස්ස,** වොදාන සිතට, **මග්ගස්ස,** මාර්ග සිතට **උපනිස්සය පච්චයෙන පච්චයො,** උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනව. මෙන්න මේ වගේ අවස්ථාවලදී අපිට උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය හඳුනාගන්නට පුළුවන්. මේ ක්‍රියාත්මක වන්නේ ආරම්මණූපනිස්සය. නිවන අරමුණු කරන එක තමයි, ආරම්මණයක් විදියට තමයි උපනිඃශ්‍රය වෙලා තියෙන්නේ. එහෙනම් ආරම්මණය කියන තැනදී අපි දන්නව දැන් ඒක මෙතන ඇවිල්ල යෙදෙන්න ඕනේ නැති දෙයක් හැටියට. ඒක යෙදිල හේතුවක් වෙලා එහෙම නෙමෙයි. අරමුණු කිරීම තුළ අරමුණු බවට පත්කර ගෙන තමයි මේ සිත පවතින්නේ. ඒ නිසා ඒකට කියනව ආරම්මණූපනිස්සය කියල. ඒ නිසා නිර්වාණයත් එලයත් ඒ වගේම අර නිර්වාණය, ගොත්‍රභූ ආදී සිත් වලටත් ඒ විදියටම ආරම්මණය වීම තුළ උපනිස්සය භාවයෙන් ප්‍රත්‍යය වන බව අපට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

## *අනන්තරූපනිස්සය*

ඒ වගේම අනන්තරූපනිස්සය. අනන්තරූපනිස්සය කියන කොට අපි දන්නව අනතුරුවම උපදින අවස්ථා මොනවද කියල.

**ආවජ්ජනා - කුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.** ආවර්ජනාව කියන එක කුසල ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. එතකොට යම්කිසි විදියකින් ආවර්ජනාව කියන සිත කුසලයන්ට. ඒ කියන්නේ කොයි වගේ අවස්ථාවලද? දැන් අපි නිකම් සිතක සාමාන්‍ය යෙදීම අපි අරගෙන බැලුවොත් එහෙම අපි ව්‍යවස්ථාපනය කරන සිතක් තියෙනව නේ. එතකොට සම්පටිජ්ජන - සන්තීරණ - වොත්ථපන සිත් කියල අපි සාමාන්‍යයෙන් සිත් බෙදන කොට කතා කරනව. එතකොට එතන ව්‍යවස්ථාපන සිත, වොත්ථපන සිතට පස්සේ මොනවද උපදින්නේ? ජවන් සිත්. එතකොට හිතන්නකෝ

වීථියේ උපදින්නේ කුසල ජවන කියල. එතකොට අන්න ඒ අවස්ථාවේ වොත්ථපන සිත ප්‍රත්‍යය වෙලා තියෙනව අර කුසල සිත උපදින්නට උපනිස්සය ප්‍රත්‍යය භාවයෙන්. අනන්තරූපනිස්සය තමයි එතනදි ක්‍රියාත්මක වෙලා තියෙන්නේ.

දැන් අපි ඕක පැහැදිලි කරගත්තොත් එහෙම **පටිසම්භිදාමග්ගප්‍රකරණයේ තියෙන චරියානානත්ත ඤාණයට අනුව.** *(බු. ජ. ත්‍රි. පටිප්‍ර (1) පිටු 152)* දැන් චරියානානත්ත ඤාණයට අනුව අපිට හම්බවෙනව විඤ්ඤාණචරියාවන්. එතකොට අර විපාක ක්‍රියා කියන අව්‍යාකෘත කුළකයකට දාල කතා කරන්න පුළුවන් ටික මුලින් හම්ම්බවෙනව. මොකද්ද? **රූපෙසු දස්සනත්ථාය අවජ්ජනකිරියබ්‍යාකතා. රූපය දැකීම සඳහා ආවර්ජනා කරන ක්‍රියා අව්‍යාකෘතය උපදිනව. රූපෙසු දස්සනත්ථාය, රූපය දැකීම ඇති කරන චක්ඛු විඤ්ඤාණ සිත උපදිනව.**

**රූපෙසු දිට්ඨත්තා අභිනිරොපනා,** ඊට පස්සේ දැකපු දේ අරමුණට ඔසවා තැබීම, නැගීම් විදියට උපදවන මනොධාතු සිත උපදිනව. ඊට පස්සේ **රූපෙසු අභිනිරොපිතත්තා මනොවිඤ්ඤාණ ධාතු.** අරමුණට නැගපු බැවින් ඒක දැන ගැනීම් වශයෙන් උපදින මනෝවිඤ්ඤාණ ධාතු සිතක් උපදිනව. ඊට පස්සේ උපදින සිත මොකද්ද? ඊට පස්සේ උපදින සිත **කුසලස්ස ජවනත්තාය ආවජ්ජනාකිරියබ්‍යාකතා.** අකුසලයක් නම් රාගස්ස ජවනත්තාය. හැබැයි මෙතනදි වෙන්නේ **කුසලස්ස ජවනත්තාය ආවජ්ජනාකිරියබ්‍යාකතා** කියල. එතකොට **කුසලස්ස ජවනත්තාය ආවජ්ජනාකිරියබ්‍යාකතා.** කුසලය ඉපදවීම සඳහා තමයි මේ අරමුණ උපදින්නේ. ආවර්ජනාව කියන සිත උපදින්නේ මොකකටද? කුසල ජවනය උපදවන්නට. එතකොට අර කුසල ජවනය උපදින්න උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ මොකද්ද? **ඒ කුසල ජවනය උපදින්නට උපනිස්සය**

**ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙන්නේ වෙන දෙයක් නෙමෙයි අර ආවර්ජන සිත.**

ආවර්ජන සිත ක්‍රියා සිතක්. හුදු ක්‍රියා මාත්‍රික සිතක්. ඒක අව්‍යාකෘත ධර්මයක්. කුසලයකුත් නෙමෙයි ඒක. අකුසලයකුත් නෙමෙයි. ඒක අව්‍යාකෘත ධර්මයක් ක්‍රියා සිත කියන එක. ඒ හුදු ක්‍රියා මාත්‍රික ආවර්ජනා කරපු එකට අනතුරුව තමයි අර කුසල ජවන සිත පහළ වන්නේ. අන්න ඒ කුසල ජවන සිත (කුසල සිත) කියන එක උපදවන්නට අර ආවර්ජන සිත ප්‍රත්‍යය වෙලා තියෙනව. මොකක් විදියට ද? අනන්තරූපනිස්සය වශයෙන්. අනතුරුවම උපදවල තියෙනව ඊළඟ සිත. ඒ නිසා අනන්තරූපනිස්සය වශයෙන් අව්‍යාකෘතයක් කුසලයකට ප්‍රත්‍යය වන්නට පුළුවන්කම තියෙනව. එතකොට ඒ යෙදීම පිළිබඳව ඔබට තේරුම් ගන්නට පුළුවන් අන්තරූපනිස්සය කියන එකේ ස්වභාවය.

අපි දන්නව එක වීථියක අකුසල් කුසල් යෙදෙන්නේ නෑ. හැබැයි මේ අව්‍යාකෘත සිත් සහ කුසල් සිත් යෙදෙන්න බැරිකමක් ඇත්තේ නෑ. ඒ නිසා තමයි මේ ක්‍රියා අව්‍යාකෘතයට අනතුරුව අර යෙදුනු කුසලය කියන සිත ඉපදිල තියෙනව. එතන මේ පෙර හටගත්ත අව්‍යාකෘතය කියන එක, ඒ කියන්නේ **කුසලස්ස ජවනත්තාය කිරියාබ්‍යාකතා** කියපු එක, කුසලය ජවනය කිරීම සඳහා අරමුණු කරනව කියන එක, ඒ ඇතිවුණ ක්‍රියාව ප්‍රත්‍යය වුණා උපනිස්සය ප්‍රත්‍යය විදියට අර කුසල ජවනය උපදවන්නට. ඒක තමයි අපිට ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්නය හැටියට තේරුම් ගන්නට පුළුවන්කම තියෙන්නේ. ප්‍රත්‍යය බවට පත්වුණේ මොකද්ද? අර ක්‍රියා අව්‍යාකෘත සිත. ප්‍රත්‍යයෝත්පන්නය බවට පත්වුණේ කුසල අවස්ථාව, කුසල සිත.

## *පකතූපනිස්සය*

ඊට පස්සේ අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව පකතූපනිස්සය. පකතූපනිස්සය කියල කියන්නේ මොකද්ද? පකතූපනිස්සය කියල කියන්නේ අර අපි දන්නව පකෘති වශයෙන් ඇතිවෙන උපනිඃශ්‍රය භාවය කියන එක.

**කායිකං සුඛං උපනිස්සාය - දානං දෙති. සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති. අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

**කායිකං සුඛං උපනිස්සාය - දානං දෙති.** කෙනෙක් කායික සුඛය උපනිඃශ්‍රය කරගෙන දානය පුජා කරනව. ඒ වගේම **සීලං සමාදියති**, සිල් සමාදම් වෙනව. ඒ වගේම **උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති. අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.** කායික සැපය උපනිඃශ්‍රය කරගෙන දානය දෙනව. එබඳු අවස්ථාවලදි කායික උපනිඃශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව ඒ දන් දීමට, සිල් රැකීමට, සමථ විපස්සනා ආදී භාවනා කිරීමට, ධ්‍යාන, අභිඥා උපදවන්නට, ඒක ප්‍රත්‍යය වෙලා තියෙනව. ඒ කියන්නේ නිරෝගී බව තිබුණහම, සැපවත් බව තිබුණහම ඒක තමයි ප්‍රත්‍යය වෙලා තියෙන්නේ දානේ දෙනව කියන එකට. හදිසියේ කායික සැපවත් බව නැති වුණොත් මොකද වෙන්නේ? දානේ දෙන්න එන්නේ නෑ. සිල් සමාදන් වෙන්නේ. නෑ. භාවනා කරන්නේ නෑ. ඇයි? කායික සැපවත් බව නැනේ.

හැබැයි මෙතනදි කතා කරන්නේ මොකද්ද? අර කායික සැපවත් බව තියෙන අවස්ථාවක එහෙම කරනව. ඒක හොඳ ද වැරදි ද, අපි කොහොමද කරන්න ඕනේ කියන පදනම නෙමෙයි මේ

කතා කරන්නේ. එහෙම අවස්ථාවකදි අර කායිකව දැනෙන දුක්ඛ වේදනාව කියන එක උපනිඃශ්‍රය කරගෙන තමයි මේ වර්තමානයේ ඒ කුසලය කියන දේ සිද්ධ වෙලා තියෙන්නේ. කායික සැපය උපනිඃශ්‍රය කරගෙන තමයි වර්තමානයෙහි දන් දෙනව කියන කුසල් සිත ඉපදුනේ. එතකොට එතනදි කායික සැපය කියන එක මුල් වුණා නම් ඒ අවස්ථාවකදි මොකද්ද වුණේ? අර අව්‍යාකෘතයක් කුසලයට උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම. එතනදි වුණේ මොකද්ද? පකතූපනිස්සය කියන එක.

**කායිකං දුක්ඛං උතු භොජනං සෙනාසනං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති, උපොසථ - ඣානං - විපස්සනං - අභිඤ්ඤං සමාපත්ති උප්පාදෙති.**

ඒ වගේම **කායිකං දුක්ඛං,** කායික දුක මුල් කරගෙන යම්කිසි කෙනෙක් දන් දෙනව. කායික දුක මුල් කරගෙන යම්කිසි කෙනෙක් සිල් රකිනව. ලෙඩක් වෙලා මරණාසන්න මොහොතකට පැමිණිනු කෙනෙක් වෙන්න පුළුවන්, තමන් මැරෙනව කියල තේරුම් ගත්ත කෙනෙක් වෙන්න පුළුවන්, අර ලෙඩ වීම මුල් කරගෙන, කායිකව දැනෙන වේදනාව මුල් කරගෙන එයා හිතනව, මම මේව තියාගෙන වැඩක් නෑ. මම මේව දන් දෙන්නට ඕනේ. නැතිනම් මම හොඳ සීලයක් රකින්නට ඕනේ. මගේ හිත භාවනාවක මම පිහිටුවා ගන්නට ඕනේ. මම විදර්ශනාව වඩන්නට ඕනේ. මේ විදියට එයා උත්සාහවත් වෙනව. අර උපදවන කුසල් සිත් වලට පදනම වෙලා තියෙන්නේ මොකද්ද? කායික දුක්ඛය. කායික සැපය කෙනකුට පදනම වෙන්න පුළුවන් කුසලයට. කායික දුක්ඛය පදනම වෙන්න පුළුවන්කම තියෙනව. ඒ හැම අවස්ථාවකදිම ක්‍රියාත්මක වෙන්නේ මොකද්ද? උපනිස්සය ප්‍රත්‍යය. කායික සැප කායික දුක උපනිඃශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව ඒ උපදින කුසල ධර්මයන් උපදවන්නට කියන එකට.

ඒ වගේම **උතු භොජනං,** සෘතු භෝජනයන් **සෙනාසනං,** සේනාසන, ඒ කියන්නේ තමන් වාසස්ථානය කියන එක උපකාර වෙනව සමහර අවස්ථාවලදි අර කියපු විදියට සිල් රකින්නට, භාවනා කරන්නට, සමථ විපස්සනා කරන්නට, ධ්‍යාන උපදවන්නට. එතකොට එබඳු රූපයන්ගේ ක්‍රියාකාරිත්වය කියන දේ උපකාර වෙන කොට ඒ කුසල් කරන්නට උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය තමයි ඒ හැම තැනකමක් අපිට හඳුනාගන්නට දකින්නට පුළුවන්කම තියෙන්නේ. උපනිස්සය ප්‍රත්‍යයෙහි ක්‍රියාකාරිත්වය නැති වුණොත් අපිට ඒක දකින්න පුළුවන්කමක් ඇත්තේ නෑ. එහෙම ක්‍රියාත්මක වන බව හඳුනාගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නෑ. ඉතින් මෙන්න මේ විදියට අපිට දකින්න පුළුවන්කම තියෙනව අව්‍යාකෘත ධර්මයක් මුල් කරගෙන කුසල ධර්මයක් උපදිනව කියල. අව්‍යාකෘත ධර්මයක් මුල් කරගෙන කුසලයක පහළ වීම සිද්ධ වන අවස්ථා පිළිබඳව.

ඒ වගේම තමයි අපිට කෙටියෙන් කතා කරන්නට පුළුවන්කම තියෙනව අව්‍යාකෘත ධර්මයක් මුල් කරගෙන අකුසල් උපදින්නට පුළුවන්කම තියෙනව. කොයි විදියට ද? අර කතා කලා වගේම ආරම්මණ උපනිස්සය, අනන්තර උපනිස්සය පකතූපනිස්සය වශයෙන් මෙතනදි අකුසල ධර්මයන් උපදින්නට පුළුවන්කම තියෙනව.

## *ආරම්මණ උපනිස්සය*

එතකොට ආරම්මණ උපනිස්සය කියන කොට **චක්ඛුං - ගරුංකත්වා අස්සාදෙති, අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති. දිට්ඨි උප්පජ්ජති.** එතකොට යම්කිසි තැනකදි ඇස (ප්‍රසාද රූපය) ගරු කරගෙන, ඇස (ප්‍රසාද රූපය) මුල් කරගෙන ඒක ආස්වාදනය කරනව. රූප ආදී ආස්වාදනය කරනව. එතනදි ඇස ගරු කරගෙන තමයි ඒක සිද්ධ වන්නේ. අන්න එහෙම

අවස්ථාවලදි ඇස කියන රූපය අව්‍යාකෘත ධර්මයක් අභිනන්‍දනය කරනව කියන එක අකුසලයක්. එතකොට අර අව්‍යාකෘතය තමයි එයාගේ අභිනන්‍දනයට, හිත සතුටු වෙනව කියන එකට, එයා ගුණ කියනවා කියන දේවල් වලට මුල් වෙලා තියෙන්නේ. එහෙම අවස්ථාවලදි අව්‍යාකෘත ධර්මයක් අකුසලයකට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව. ඒ විදියටම අනිකුත් ආයතන පිළිබඳවමත් අපිට ගන්න පුළුවන්කම තියෙනව.

**අභිනන්‍දතීති - සප්පීතික තණ්හාභාවසෙන නන්‍දති. හට්ඨපහට්ඨො හොති, දිට්ඨාභිනන්‍දනායවා අභිනන්‍දති.** අභිනන්‍දති කියල කියන්නේ සප්පීතික තෘෂ්ණා වශයෙන් එහි සතුට උපදව ගන්නව කියන එක තමයි, ඒ කියන්නේ **හට්ඨපහට්ඨ භාවය** කියල කියනව අපි තුටු බව හිතේ සතුට කියල කියන්නේ. අන්න ඒක ඇති කරගන්නව. එතකොට මෙන්න මේ විදියට පීති සප්පීතික තෘෂ්ණාවෙන් ඒක ආස්වාදනය කරනව. ඒ කියන්නේ රූප ආදී ආස්වාදනය කරන කොට ඇස ආස්වාදනය කරනවා කියන සංඛ්‍යාවටම තමයි යන්නේ.

ඒ වගේම **සොතං, ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, පොට්ඨබ්බෙ, වත්ථුං විපාකබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්‍ධෙ - ගරුං කත්‍වා අස්සාදෙති අභිනන්‍දති. තං ගරුං කත්‍වා රාගො උප්පජ්ජති දිට්ඨි උප්පජ්ජති.** මේ විදියට රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ වස්තුව, වස්තු රූපය කියන කොට හදය වත්ථු රූපය ආදී දේ. ඊට පස්සේ යම්කිසි ආකාරයකට විපාක අව්‍යාකෘත ධර්ම, විපාක ස්කන්ධ ටික තියෙනව නම්, විපාක අවස්ථා ටික තියෙනව නම් ඒ වගේම ක්‍රියා අවස්ථාවන් තියෙනව නම් අන්න ඒ විපාක, ක්‍රියා කියන මේ ධර්මයන් පොදුවේ ගත්තහම ඒව ආස්වාදනය කරන කොට, මේව මේ නම් වශයෙන් කතා කලාට ඔබේ ජීවිතේ තුළ පොදුවේ යෙදෙන අවස්ථා පිළිබඳව කතා

කරන්න තියෙන්නේ කොහොමද? ඔබ දෙයක් පිළිබඳව ආසාවෙන් කල්පනා කරන කොට, ඔබ දකින්න කැමති රූපයක් පිළිබඳව ආස්වාදනය කරනව. ඒ අවස්ථාවේ ක්‍රියාත්මක වෙලා තියෙන්නේ ඕක තමයි. ධර්මයන්ගේ ක්‍රියාකාරිත්වය දිහා බැලුවහම ප්‍රත්‍යය සහ ප්‍රත්‍යයෝත්පන්න භාවයන් දිහා බැලුවහම මේ ක්‍රියාකාරිත්වය තමයි ඔබට එතනදි හඳුනාගන්නට තියෙන්නේ. වෙනත් දෙයක් නෙමෙයි. මේ ක්‍රියාකාරිත්වය ඔබට එතනදි දකින්න තේරුම් ගන්නට පුළුවන්කම තියෙනව. ඒ වගේම ඒ අවස්ථාවලදි අර අව්‍යාකෘත වුණ රූපය අර ඉපදෙන ආස්වාදනය කියන අකුසලයට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව ආස්වාදනය කරන මොහොතෙදි.

## *<u>අනන්තරූපනිස්සය</u>*

**ආවජ්ජනා - අකුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.**

ඒ වගේම ආවජ්ජනා ආදී අවස්ථාවන් දිහා අපි බැලුවහම **ආවජ්ජනා - අකුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.** ආවර්ජනා කරන කියන අවස්ථාවෙදි අකුසල ස්කන්ධයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව. දැන් අපි මුලින් ඉගෙන ගත්තනේ ආවර්ජනා සිත කොහොමද ප්‍රත්‍යය වෙන්නේ කියල. ආවර්ජනා ක්‍රියා සිතක් කියලා අපි දැක්කා. අර අපි විඤ්ඤාණචරියා - අඤ්ඤාණචරියා - ඤාණචරියා කියල කතා කරන අවස්ථාවෙදි අඤ්ඤාණචරියන් උපදින කොට රූපය දැක්කා. දැකල අරමුණ හිතට ගත්ත. අන්න ඒ ගත්ත අරමුණ අරහයා නැවත අකුසල් උපදවනව. ඒ කියන්නේ **රාගස්ස ජවනත්තාය ආවජ්ජනකිරියබ්‍යාකතා** කියන තැන. රාගය ඉපදවීම සඳහා ආවර්ජනා කරනව කියන අවස්ථාවෙදි රාගය ඉපදවීම සඳහා කරන ආවර්ජනාව ක්‍රියා සිතක්. රාග සහිත සිත ඒක අකුසල සිතක්. ඒ අවස්ථාවෙදි ආවර්ජනා ක්‍රියාව කියන

අව්‍යාකෘත ධර්මය අකුසලය උපදවන්නට උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙලා තියෙනව. මේ විදියට අනන්තරූපනිස්සයෙහි ක්‍රියාකාරිත්වය අපිට හඳුනාගන්නට පුළුවන්කම තියෙනව.

***පකතූපනිස්සය***

ඒ වගේම **කායිකං සුඛං උපනිස්සාය පාණං හණති.** තමන් ඉන්න රෝගිබව හෝ කායික සැපය මුල් කරගෙන සත්තු මරණව, හොරකම් කරනව, අර අකුසල් සිද්ධ කරනව නොයෙක් ආකාරයට. එබඳු අවස්ථාවලදිත් මොකද්ද වෙලා තියෙන්නේ? අර අව්‍යාකෘතයක් අකුසලයට ප්‍රත්‍යය වෙලා තියෙනව.

**කායිකං දුක්ඛං,** කායික දුක, **උතු, භොජනං,** උතු භෝජනය, **සෙනාසනං,** ඒ වගේම තමන් ඉන්න පරිසරය, ඒ වගේ දේවල් උපනිඃශ්‍රය වෙනව මිනිසුන්ට අකුසල් කරන්නට. ඒ අවස්ථාවලදිත් ක්‍රියාත්මක වෙලා තියෙන්නේ අව්‍යාකෘතයක් අකුසලයට උපනිස්සය ප්‍රත්‍යය විදියට ප්‍රත්‍යය වනවා කියන දේ තමයි ඒ සෑම තැනකදිම සිද්ධ වෙලා තියෙන්නේ.

මෙන්න මේ ආකාරයෙන් අපිට උපනිස්සය ප්‍රත්‍යයෙහි භාවිතය පිළිබඳව හඳුනාගන්නට පුළුවන්කම තියෙනව. අපිට මේ උපනිස්සය ප්‍රත්‍යය තේරුම් ගැනීම කියන එක. මේ සූවිසි ප්‍රත්‍යයන්ගේ විශාලතම ප්‍රත්‍යය තමයි උපනිස්සය ප්‍රත්‍යය. විශාල ලෙස විග්‍රහ වන ප්‍රත්‍යය.

ඉතින් මේ ප්‍රත්‍යය හරියට තේරුම් ගත්තොත් එහෙම මේ කියපු ආකාරයන් පිළිබඳව අපිට විශාල ධර්ම කාරණා සමූහයක් නිරවුල් කරගන්නට පුළුවන්කම තියෙනව වගේම තමන්ගේ සිත දියුණු කරගන්නට කැමති කෙනකුටත් මේක ප්‍රධාන වශයෙන්ම වැදගත්

වන කරුණු කාරණා සමූහයක් මේ තුළ ඇතුළත් වෙලා තියෙනව.

ඉතින් ඒ හැම දේ සඳහාම ඔබ අප්‍රමාදිව කටයුතු කරන්නට කියල ඔබට බොහොම කල්‍යාණ මිත්‍ර බවෙන් සිහිපත් කරනව.

**සාදු සාදු සාදු**